පෙරදිග සංගීතය

12 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

පෙරදිග සංගීතය 12 වන ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

පෙරදිග සංගීතය

12 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2009 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

පෙරදිග සංගීතය
12 වන ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
(2009 වසරේ සිට ක්‍රියාත්මක වේ)

© ජාතික අධ්‍යාපන ආයතනය

ප්‍රථම මුද්‍රණය - 2009

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය -

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

වර්ෂ 2007 දී 6 සහ 10 යන ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8, හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස(උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්න්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එමනිසා 12 සහ 13 වන ශ්‍රේණි වල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් අවස්ථා සම්පාදනයේ දී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත්වනු ඇත.

අ.පො.ස (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10, 11 ශ්‍රේණි) විෂයමාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළයුතු ඉගෙනුම් හා ඉගැන්වීම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස(උ.පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරයාගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගෙනුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවා යි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන්ට නිසි මඟ පෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැළැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබාදෙන්නේනම් කෘතඥ වේ.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය.

උපදේශනය :	මහාචාර්ය ලාල් පෙරේරා	-	අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය.
	විමල් සියඹලාගොඩ මහතා	-	සහකාර අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය.
අධීක්ෂණය :	සුදත් සමරසිංහ මහතා	-	අධ්‍යක්ෂ (සෞන්දර්ය) ජාතික අධ්‍යාපන ආයතනය.
විෂය සම්බන්ධීකරණය: ජානකී පතිරණගේ මහත්මිය		-	ව්‍යාපෘති කණ්ඩායම් නායක (සංගීත) ව්‍යාපෘති නිලධාරී ජාතික අධ්‍යාපන ආයතනය.

විෂයමාලා කමිටුව :

අභ්‍යන්තර

සුදත් සමරසිංහ මහතා	-	අධ්‍යක්ෂ (සෞන්දර්ය) ජාතික අධ්‍යාපන ආයතනය.
ජානකී පතිරණගේ මහත්මිය	-	ව්‍යාපෘති නිලධාරී ජාතික අධ්‍යාපන ආයතනය.

බාහිර

මහාචාර්ය අමරා රණතුංග මහත්මිය	-	සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය.
ගුණපාල විතානගේ මහතා	-	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය රත්නපුර.
ශාන්තා රමණී ඩයස් මහත්මිය	-	ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය ගම්පහ.
කේ. කේ. එස්. ජයවික්‍රම මහත්මිය	-	ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය පිළියන්දල.
ආර්. ඩී. පෙරේරා මහතා	-	ගුරු සේවය-පුෂ්පදාන බාලිකා විද්‍යාලය මහනුවර.
ඊ. ඒ. ප්‍රේමසිරි මහතා	-	ගුරු සේවය-තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය, හොරණ.
ජී. රංජිත් ප්‍රියන්ත සිල්වා මහතා	-	ගුරු සේවය-ජනාධිපති විද්‍යාලය මිනුවන්ගොඩ. බත්තරමුල්ල1
හර්ෂණ සියඹලාපිටිය	-	කුළි/සාරනාථ මහා විද්‍යාලය කුළියාපිටිය.

පිටකවර නිර්මාණය හා සිතුවම්	-	රවීන්ද්‍ර තේනුවර මයා සහකාර ව්‍යාපෘති නිලධාරී - ජාතික අධ්‍යාපන ආයතනය
පරිගණක සැකසීම	-	ආර්. ආර්. කේ. පතිරණ මිය ජාතික අධ්‍යාපන ආයතනය
වෙබ් අඩවිය	-	www.nie.lk
විවිධ සහාය	-	ලක්ෂ්මි පෙරේරා, මාලනී වික්‍රමනායක අයි. පී. නවරත්න, ඩී. ජේ. පණ්ඩිතරත්න

පටුන

		පිටුව
1.0	**විෂය නිර්දේශය**	
	1.1 හැඳින්වීම	1
	1.2 සංගීත විෂයයේ අරමුණු	2
	1.3 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය	3 - 8
2.0	**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය**	
	2.3 ක්‍රියාකාරකම් සන්තතිය	10-242
3.0	**තක්සේරුව හා ඇගයීම හැඳින්වීම**	243
	ඇගයීම	244

විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා දැක්වීමට යෝජිත සැලැස්ම

ශ්‍රේණිය	වාරය	නිපුණතා මට්ටම්	කාලච්ඡේද
12 ශ්‍රේණිය	1 වාරය	1.1.1.-.2.1.4	108
	2 වාරය	2.2.1 - 5.1.5	92
	3 වාරය	6.1.1 - 10.1.4	100
13 ශ්‍රේණිය	1 වාරය	1.0 - 2.0	116
	2 වාරය	3.0 - 6.0	87
	3 වාරය	7.0 - 11.0	97

1.0 විෂය නිර්දේශය

1.1 හැඳින්වීම

උසස් පෙළ හදාරන සිසුන් තුළ සෞන්දර්ය හා රසාස්වාදය පිළිබඳ උසස් චින්දනයක් ඇතිකිරීම, නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම, ව්‍යවහාරික සංගීතය හා රංග කලා හා බැඳි සංගීතාංග හඳුන්වාදීම, විශ්ව සංගීතය රසවිඳීම පිළිබඳ ශික්ෂණය දියුණුකිරීම, වාදන හැකියා වර්ධනය කිරීම, දේශීය සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කිරීම මෙන් ම නව තාක්ෂණික උපකරණ හා සම්බන්ධ ප්‍රායෝගික හැකියා වර්ධනය කිරීමෙන් සංගීතය හා බැඳි මනෝවිද්‍යාත්මක ජීව විද්‍යාත්මක හා භෞතික විද්‍යාත්ක හැකියා වර්ධනය කරගත් ප්‍රායෝගික වැඩ ලෝකයට ඵලදායක පුද්ගලයකු නිර්මාණය කිරීමත් මෙම උසස් පෙළ විෂය නිර්දේශය මඟින් අපේක්ෂිත ය.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගොඩ නගා ඇති වුවද කිසියම් ශිෂ්‍යයකු වාදනය මූලික කොට ගෙන මෙම විෂයයන් හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මඟින් සියලුම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැකිය.

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයය ඉගෙනුමෙන් දරුවනට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගනු වස් 6 - 11 ශ්‍රේණි සඳහා පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 8 ක් හඳුන්වා දී එම නිපුණතාවන්ට අනුව එක් එක් ශ්‍රේණියේ දී ලඟා විය යුතු යැයි අපේක්ෂිත නිපුණතා මට්ටම් ද පෙළ ගස්වා ඇති අතර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරණ සිසුවකු තුළ තව දුරටත් වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 11 ක් නව විෂය නිර්දේශයෙන් හඳුන්වා දී ඇත. ඒ අනුව නව එම නිපුණතාවන් කරා ලඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සිසුන් මෙන්ම ඒ සඳහා සුදුසුකම් නෙලබන සිසුනගේ ද තම පෞද්ගලික ජීවිතය තුළ අත්‍යවශ්‍යයෙන් ම ගොඩනඟා ගත යුතු මෙම නිපුණාවන්ගෙන් ලබන ප්‍රායෝගික අත්දැකීම දිගු කාලීන ජීවිත පුරුද්දක් බවට පත්කර ගැනීමට මෙමඟින් හැකියාව ලැබෙනු ඇත.

6-11 ශ්‍රේණිවලදී අධ්‍යාපනය කළ විෂය කරුණු මාතෘකා හා සම්බන්ධ විෂය කරුණු තව දුරටත් ගැඹුරෙන් විචාරාත්මකවත් තර්කානුකූලවත් නිර්මාණශීලී බවකිනුත් අධ්‍යයනයට ඉඩ සැලසීම උසස් පෙළ නිර්දේශයේ දී ඔබට හැකිවනු ඇත.

එක් එක් ක්‍රියාකාරකම් වලදී රැස්කරගන්නා තොරතුරුවලට අමතර ව සිසුන් ස්වයං අධ්‍යයනයට යොමුකර පුස්තකාල සහ අන්තර්ජාලය වැනි මාර්ග පරිශීලනය කරමින් පුළුල් පරාසයක දැනුම සහ තොරතුරු රැස්කර ගැනීමට සිසුන් මෙහෙයවීම ද ගුරුවරයා සතු වගකීමකි.

1.2 විෂයයේ අරමුණු

පරිසරය ඇසුරින් වින්දන ශක්ති වර්ධනය කරගැනීම

පරිසරයෙහි සියලු සංසිද්ධින් මිනිස් ජීවිතය හා බැඳී පවතී. ශිෂ්‍යයා තුළ පරිසරය හා බැඳි සෞන්දර්යාත්මක වටිනාකම් පිළිබඳ අවධියක් ඇතිකිරීමෙන් පරිසරයානුබද්ධ ව වින්දන ශක්ති වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

නිර්මාණාත්මක චින්තනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරගැනීම

ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු හා අවස්ථාවන්හි දී නිර්මාණශීලී ව කටයුතු කිරීම සඳහා අවශ්‍ය චින්තන ශක්තිය වර්ධනය හා ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා උසස් නිර්මාණ කෘති බිහිකිරීමේ හැකියා වර්ධනය කරගැනීම

ඵලදායි දිවි පැවැත්මට අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය කරගැනීම

ජීවිතය ඵලදායි ලෙස ගත කිරීමේ හැකියාව මෙන් ම යම් කාර්යයක දී කාර්යක්ෂම ව කටයුතු කිරීමේ හැකියාව ද අවශ්‍ය වේ. එමෙන් ම අන්‍යෝන්‍ය සුහදතාවය සහ එකිනෙකා පිළිබඳ ගෞරවණීය හැඟීමකින් යුතු ව කටයුතු කිරීමේ හැකියාව ලැබීම වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනය එහි දී අපේක්ෂා කෙරේ.

දේශීය අනන්‍යතාවයන් හඳුනා ගැනීම හා අගය කිරීම

දේශීය සංස්කෘතික අංග හඳුනාගැනීමෙන් දේශාභිමානී හැඟීමකින් යුතුව සහ දේශීය අනන්‍යතාවයකින් යුතු ව කටයුතු කිරීම පිළිබඳ උදාර හැඟීම් සමුදායක් වර්ධනය කිරීම වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය සෞන්දර්ය විෂයානුබද්ධ දැනුම ලබාදීම මෙහි දී අපේක්ෂා කෙරේ.

විචාර ශක්ති වර්ධනය කරගැනීම

විවිධ සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ විවිධ වැඩසටහන් ප්‍රචාරය කරන අතර හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීමට හැකි උසස් රසඥතා වර්ධනයක් මෙහි දී අපේක්ෂා කෙරේ.

මාර්ගෝපදේශනය උපකරණයක් ලෙස භාවිත කිරීම

ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සම්පාදනය කරන්නන්ට ගුරු දෙගුරුන්ට හා පාසල් ශිෂ්‍යයන්ට සහ මින් ඔබ්බට ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් කරන්නන්ට මෙම විෂය නිර්දේශය මාර්ගෝපදේශයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.6 පෙරදිග සංගීත 12 ශ්‍රේණිය

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	කාලච්ඡේද
1.0 සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.	1.1 රාගධාරි සංගීතයට අදාළ සම්භාව්‍ය ගායනයක් /වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.	• ශ්‍රැතියේ පිහිටීමේ අභ්‍යාස සහ ස්වසන අභ්‍යාස • උචිත ශ්‍රැතිය තෝරාගැනීමේ අභ්‍යාස • උච්ච මන්ද්‍ර සප්තක කරා විහිදුන ස්වර අභ්‍යාස • කටහඬ පාලනය පිළිබඳ අභ්‍යාස • ගායනයේ දී සිරුරේ ඉරියවු (ස්වරාලය, උගුර, පිටකොන්ද, මුහුණ) හෝ වාදනයේ ඉරියවු සහ හස්ත සාධන අභ්‍යාස • රාගධාරි සංගීතයේ ශිල්පාංග ඇතුළත් (ගමක්, මීන්ඩ්)ස්වර අභ්‍යාස	12
	1.2 උත්තරභාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයේ /වාදනයේ යෙදෙයි.	• රාග විස්තර, ගායන සමය. මුඛ්‍යාංග, සමප්‍රකෘතිරාග • භාගේශ්‍රී, භීම්පලාසි, දේස්, තිලක්කාමෝද්, භෛරව කාලිංගඩා සහ ආශාවරි ජෞනපුරි යන රාගවල සමවිෂමතා සිද්ධාන්ත සහ ප්‍රායෝගික වශයෙන් • භාගේශ්‍රී, දේස්,තිලක්කාමෝද්, ජයජයවන්ති, බිහාග් යන රාගවල සර්ගම් ලක්ෂණ ගී සහ මධ්‍යලය ගීත.	29

	1.3 සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගි වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍යය ප්‍රදර්ශනය කරයි.	• ආලාප සහ ආලාප වර්ග • තාන සහ විවිධ තාන වර්ග • මීන්ඩ්, ගමක්, බන්, මූර්කි, උපජ්, ඤලා,මුබඩා, තිහායි (සිද්ධාන්තික සහ ප්‍රායෝගික) • නිර්දේශිත රාගයන්හි විවිධ ආලාප වර්ග, විවිධ තාන වර්ග, සුවිශේෂ ස්වර සංගති, ගායනය /වාදනය • රාග විස්තර හෝ කෙටි ආලාප බණ්ඩ	28
	1.4 රිද්මයේ සහ තාලයේ ගතිලක්ෂණ පැහැදිළි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියා ප්‍රදර්ශනය කරයි.	• රිද්මය සහ තාලය • උතුරු ඉන්දීය තාල සංකල්පය (ගති, මිති, ලය) සහ තාල පදයක කොටස් • දේශීය තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප ප්‍රායෝගික ව භාවිතය • කර්ණාට තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු • ත්‍රිතාල්, ඤප්තාල්, දීප්චන්දි දාදරා හඳුනාගැනීමේ අභ්‍යාස සහ සමගුණ, දෙගුණ, තාල නිරූපණය. • ත්‍රිතාල්, ඤප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත්වන අයුරු තබ්ලාවකින් වාදනය කර ප්‍රදර්ශනය කිරීම. • බටහිර තාල.	24

2.0 විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.	2.1 සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස්කරයි.	• සංගීතය (විවිධ නිර්වචන) • ලෝක සංගීතයේ වෙනස්කම් හා ඊට බලපෑ හේතු (භාරතීය, අපරදිග, චීන, අග්නිදිග ආසියානු ගැමිලෑන් සංගීතය, මැදපෙරදිග ඉස්ලාමික් සංගීතය) කෙටියෙන් හැඳින්වීම. • පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති, දෙකෙහි ස්වභාවය Melody Harmony සිද්ධාන්තය ස්වර සාධනය)	15
	2.2 භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹෙයි.	• භාරතීය සංගීතයේ ස්වභාවය • උත්තර සහ දක්ෂිණ පද්ධති වල සමවිෂමතා • උතුරු ඉන්දීය ගායන ශෛලීන් (ධ්‍රැපද්, ධමාර්, ඛ්‍යාල්, තරාණා, චතුරංග, භජන්, ගzසල් ප්‍රායෝගික කොටස් ඇසුරින් තර්කානුකූලව සහ සන්සන්දනාත්මකව අධ්‍යයනය) • දකුණු ඉන්දීය ගායන ශෛලීන් (තිල්ලානා , වර්ණම්) ප්‍රායෝගික කොටස් ඇසුරින් තර්කානුකූල අදහස්	33

3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.	3.1 වාදන දක්ෂතා ප්‍රසංගාත්මක ව ප්‍රදර්ශනය කරයි.	• ස්වර පුවරු භාණ්ඩ වාදනය (උසස් පෙළ මට්ටමට ගැලපෙන ලෙස) • තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩ හෝ තබ්ලාව වාදනය (උසස් පෙළට උචිත ලෙස) • වාදනය කරනු ලබන සුසර කර ගත යුතු සංගීත භාණ්ඩ තනිව සුසර කර ගැනීමේ අභ්‍යාස	19
4.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කර ගැනීමට හුරුවෙයි.	4.1 රාගධාරි සංගීත ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ගායන/වාදන විශ්ලේෂණාත්මක ව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි.	රාගාශ්‍රිත අධ්‍යතන සරල ගී (හංස රාජිනී - (සුනිල් එදිරිසිංහ) මුවමුක්තලතා - (එඩ්වඩ් ජයකොඩි) හෝපලු වනපෙත (වික්ටර් රත්නායක,) මම දෙවිඳුනි දෙවොලට - (සුජාතා අත්තනායක) මන්නාරම් කන්‍යාරමේ - රශ්මි සංගීතා ඇවිලුණු ගිනි දැල් - (සනත් නන්දසිරි) වස්දඬු රාවේ (අමරා රණතුංග) ආසාවරී මනමෝහණී (සුදත් සමරසිංහ) ලොවේ සැමදා- හරුන් ලන්ත්‍රා සඳ සරා කුමාරි සුදත් සමරසිංහ රාගාශ්‍රිත නාට්‍ය ගී (ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙන්) ලොවේ සැමදා - හරුන් ලන්ත්‍රා.	12

5.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.	5.1 ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන/වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.	• ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු • ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී උඩරට - පහතරට - සබරගමු වශයෙන් ගැමි ගී ගායනාවල වෙනස්කම් (ශාන්තිකර්ම ගී ඇසුරින්) • අනාසාතාත්මක මෙහෙ ගී (ගැල්, පැල්, පාරු, බඹර පතල්) ගද්‍ය හා පද්‍ය කොටස් රැගත් - ටීකාසීපද,	28
6.0 සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.	6.1 ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.	• ශ්‍රී ලංකාවේ සංගීතයේ ප්‍රභවය සහ විකාශය (අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, දඹදෙනි යුගය, මහනුවර යුගය සංක්ෂිප්ත තොරතුරු) • ශ්‍රී ලංකාවේ සංගීතය පිළිබඳ මූලාශ්‍ර මගින් හෙළිවන තොරතුරු (කැටයම් සහ වාමන රූප ඇසුරින්)	18
7.0 ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.	7.1 ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ /වාදනයේ යෙදෙයි.	සොකරි, කෝළම්, නූර්ති, නාඩගම් රංග ශෛලීන් • එම රංග සම්ප්‍රදායන්හි ගීත ගායනය /වාදනය. නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද භාණ්ඩ • තෝඩායම, ඉන්නිසය පොතේසින්දුව, උරුට්ටුව යන අංග ඇතුළත් ගීත ප්‍රායෝගිකව • දොහොරාව, රාගධාරි පසුබිම, වාදිත (ගත්) ගීත වශයෙන් යොදාගැනීම සනාථ කිරීමට ගීත ප්‍රායෝගිකව	24 8

08. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.	8.1 රිද්මය, තාලය, ලය සහ ස්වර නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල නිදසුන් මඟින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.	• රිද්මයේ විවිධ ගති ලක්ෂණ සහ ප්‍රකාශනය. • තාලය සහ ලය නිර්මාණයක දී වැදගත් වන අයුරු • ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය සහ Scale නිර්මාණයක්දී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම්.	11
	8.2 කටහඬ නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.	• කටහඬෙහි විවිධ තල (Soprano,Alto,Tenor,Bass) • සරල ප්‍රස්තාර කොටස් ඇසුරින් විවිධ හඬතල භාවිතයෙන් ප්‍රායෝගික ක්‍රියා. • හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු.(Violin Family,Brass Family)	18
9. සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.	9.1 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.	• කෝමළ නිෂාදය සහ කෝමළ ගාන්ධාරය ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණය (B flat, E flat, Major Scale, Minor scale (Melodic and Harmonic) • මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණය. (F..Major, F.Minor G.Major Scale G..Minor scale (Melodic and Harmonic)	
10. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම සහ ජීවවිද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.	10.1 නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ හා නිර්මාණයේ දී භාවිත කරයි.	• පරිගණකය සංගීත අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන් • පරිගණකය සංගීත නිර්මාණයේ මෙවළමක් වශයෙන් • සංගීතය ගබඩා කිරීමේ නිර්මාණය කිරීමේ සහ හැසිරවීමේ මෙවළමක් ලෙස විද්‍යුත් ස්වර පුවරුව (Electronic Key Board) සංගීත භාණ්ඩවල ධ්වනිගුණය කෙරෙහි බලපාන හේතු	21

2.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අයත් උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.1 : ස්වසන අභ්‍යාස හා ශ්‍රැතියේ පිහිටීමේ අභ්‍යාස ප්‍රගුණ කරමු.

ඉගෙනුම් ඵල :
- ගායනයේ නිවැරදි ඉරියව් හඳුනා ගනියි.
- දීර්ඝ ස්වසනය පුහුණු කර ගනියි.
- නිවැරදි ශ්‍රැතියෙහි පිහිටා ස්වර අභ්‍යාස කරයි.

කාලය : කාලච්ඡේද 02 යි.

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයා ගත් පුළුන් කැබැලි හා ඉටිපන්දම්
- තාම්පුරාවක් , ශ්‍රැති පෙට්ටියක් හෝ සර්පිනාවක්.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

- අ.පො.ස (සා.පෙ) පන්තිවල දී රාගධාරී සංගීතය පිළිබඳව උගත් කරුණු ශිල්පීයත්වය කරා දියුණු කර ගැනීමට මග පාදනුයේ උසස් පෙළ පන්තිවල දී ය. එම නිසා ගායනයේ නිවැරදි ඉරියව් , ස්වරාලයේ නිවැරදි භාවිතය, ශරීරයේ අංග ප්‍රත්‍යාංග නිවැරදිව පවත්වා ගැනීම, ආදී කරුණු වඩා ගැඹුරින් ගායනයේ ප්‍රබලතා ඇති කිරීමට යොදා ගැනීම කෙරෙහිත් මෙම පළමු ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ.

- ගායනයට ඉතා අත්‍යවශ්‍ය ස්වසනය ප්‍රශ්වාසය නිවැරදිව සිදු කිරිම, ආශ්වාසය දීර්ඝ කාලයක් රඳවා ගැනීමේ ශක්තිය දියුණු කිරීම හා පාලනයකින් යුතුව ප්‍රශ්වාසය මුදා හැරීම ප්‍රගුණ කිරීම මෙම පළමු ක්‍රියාකාරකමින් අපේක්ෂිතය.

- ශ්‍රැතිය මත හොඳින් පිහිටා යමෙකු ගායනයක් (සරල/ ශාස්ත්‍රීය) ඉදිරිපත් කරන්නේ නම් එය රසවත් වනු ඇත. එමනිසා සිසුන්ගේ ශ්‍රැතිය මත පිහිටීමේ කුසලතාව වර්ධනය කිරීමද මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. මෙම අත්‍යවශ්‍ය අභ්‍යාස නිතිපතා ප්‍රගුණ කිරීමෙන් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගත හැකි වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- ඇමුණුම 01 හි ප්‍රවේශය භාවිතයට ගන්න. (ඔබට සුදුසු ප්‍රවේශයක් යොදා ගැනීමට නිදහස ඇත.) ස්වසන ශක්තිය වර්ධනය කරනු ලබන අභ්‍යාසයන්හි සිසුන් යොදවන්න. අංක 01 සිට 06 දක්වා ඇති අභ්‍යාස නිවසේදී පුහුණුවීමට උපදෙස් දෙන්න. මේ සඳහා ක්‍රියාකාරකම් 01 හි ඉදිරිපත් කර ඇති අභ්‍යාස භාවිත කළ හැකි ය.

- ඇමුණුම 02 හි ප්‍රවේශය භාවිතය ට ගන්න. ශ්‍රැතිය මත ස්ථිරව පිහිටා ගායනයක් ඉදිරිපත් කිරීමේ ශක්තිය දියුණු කර ගැනීම සඳහා ශ්‍රැතියේ පිහිටීම ශක්තිමත් කරනු ලබන අභ්‍යාසයන්හි සිසුන්ව යොදවන්න. මේ සඳහා ක්‍රියාකාරකම් 02 හි ඇතුළත් අභ්‍යාස භාවිත කළ හැකිය. කාලඡේදය තුළ සිසුන්ට ඉගැන්විය හැකි අභ්‍යාස උගන්වා ඉතිරි අභ්‍යාස නිදහස් කාලඡේදයක දී උගන්වන්න නිවසේ දී දිනපතා අලුයම පිබිදී මෙම අභ්‍යාසයන්හි යෙදීමට උපදෙස් දෙන්න.

(කාලච්ඡේද 01)

ඇමුණුම 01

- ප්‍රවේශය

  ඔබ විසින් නම් කරන ලද ගීයක් ගයන අතර තම හුස්ම ගීතය ගායනයට බලපාන අයුරු අවධාරණය කිරීමට පොළඹවන්න. එම හුස්ම ජීවය රදා පැවතීමට ද හේතුවන බව අවධාරණය කරමින් ගායනයට හුස්මෙන් ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් 01 - ස්වසන අභ්‍යාස

- සිසුන්ව ආනාපානසති භාවනාවෙහි යොදවන්න.
- දිනපතා උදෑසන පිබිදුනු වහාම මෙම භාවනාවෙහි යෙදීමට උපදෙස් දෙන්න.

සැ. යු මෙම ක්‍රියාකාරකමින්

- මානසික ඒකාග්‍රතාවයකින් යුතුව හුස්ම හැසරවීම ප්‍රගුණ කිරීම අපේක්ෂිතය.

ක්‍රියාකාරකම් 01.02

පියවර 01 - සිසුන් විසින් සපයාගත් පුළුන් කැබැල්ල ඔබට හුරු අතේ මාපටඟිල්ලේ හා දබරඟිල්ල අතර රඳවාගෙන උඩට යන සේ එයට පිඹීමට උපදෙස් දෙන්න.

පියවර 02 උඩට මුදාහල පුළුන් කැබැල්ලට නැවත නැවත පිඹිමින් හැකිතාක් වේලා බිමට නොවැටෙන සේ ඉහළම රඳවා ගැනීමට උපදෙස් දෙන්න.

සැ. යු - මෙම ක්‍රියාකාරකමෙන්

- දීර්ඝ හුස්මක් ගැනීම පුහුණු කිරීම අපේක්ෂා කෙරේ.
- පාලනයකින් යුතුව හුස්ම පිට කිරීම පුහුණුවීම අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් 01.03

- දැල්වූ ඉටිපන්දමක් ගෙන එහි දැල්ලට නොනිමෙන සේ ඒකාකාරීව චලනය වන අයුරින් පිඹීමට යොමු කරන්න.

සැ.යු.මෙම ක්‍රියාකාරමෙන් ද ක්‍රියාකාරකම් 01.02 හි අපේක්ෂිත ඉගෙනුම් ඵල අත්කරගත හැක.

ක්‍රියාකාරකම් 01.04

- ශ්‍රැතියේ පිහිටා පහත දැක්වෙන ස්තෝත්‍රයේ වැඩි කොටසක් එක් හුස්මට නොනවත්වා ගායනයට යොමු කරන්න.
- බුද්ධ ස්තෝත්‍රය (ඒ භාග්‍යවතුන් වහන්සේ .....)

බුද්ධ ස්තෝත්‍රය

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

ඒ භාග්‍යවතුන් වහනසේ සියළු පූජාවන් ලැබීමට සුදුසුය යන අරුතින් අරහත් නම් වන සේක. සියල්ල තමන්ගේ ඥාණයෙන් මනා කොට දැනගත් සේක. ප්‍රඥාවෙන් හා සීල ආදී චරණ ධර්මවලින් සම්පූර්ණ වන සේක. යහපත් ගමනින් හා වදනින් යුතුවන සේක. අන් අයට හික්මවන්නට නො හැකි වූවන් හික්මවීමෙහි හැමටම වඩා සමත් වූ සේක. දෙව් මිනිසුන් සහිත සියල්ලන්ටම ගුරු වූ සේක. සත්‍ය අවබෝධ කළ සේක. සියළු පව් නැසූ සේක.

මම නිවන් දකින තෙක් බුද්ධරත්නය සරණ යමි
මම නිවන් දකින තෙක් ධම්ම රත්නය සරණ යමි
මම නිවන් දකින තෙක් සංඝ රත්නය සරණ යමි



මම නිවන් දකින තෙක් බුද්ධ රත්නය සරණ යමි
සස නිසස නිසරි ස-- ග-ග ග - ග රි - ස රි - ග

1	2	3	4	5	6	7	8
ස	සරි	සරිග	සරිගම	සරිගමප	සරිගමපධ	සරිගමපධනි	සරිගමපධනිස
9	10	11	12	13	14	15	16
ස	සනි	සනිධ	සනිධප	සනිධපම	සනිධපමග	සනිධපමගරි	සනිධපමගරිස

- මෙහි එක් මාත්‍රාවක් තුළට අයත් ස්වර සංඛ්‍යාව එක් හුස්මක් තුළ ගායනා කිරීමට උපදෙස් දෙන්න. ගායනා කර පෙන්වන්න.

සැ. යු - මෙම ක්‍රියාකාරකමින් එක් හුස්මක් තුළ වැඩි ස්වර සංඛ්‍යාවක් ගායනා කිරීමට අපේක්ෂිතය.

ක්‍රියාකාරකම් 01.06

- ස ..... සස - සස - ස, සස- සස - ස, සස-, සස-ස
  ඕම් s s s නමඃ ශිවාsයා, නමඃ ශිවාsය, නම ඃ ශිවාsය,

එක් හුස්මක් තුළ 'නමඃ ශිවාය දීර්ඝව යන කොටස වැඩි වාර ගණනක් ගැයීමට පොළඹවන්න.

සැ. යු - එක් හුස්මක් දීර්ඝ කාලයක් රඳවා ගෙන ගායනා කිරීමේ හැකියාව දියුණු කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් 01.07

එම්. ජී. පෙරේරා ශූරීන්ගේ ගීත ශික්ෂක ග්‍රන්ථයේ 21 වන පිටුවෙහි සඳහන් වන ස්වසන අභ්‍යාසයන්හි යෙදීම සඳහා සිසුන්ව දැනුවත් කරන්න.

ඇමුණුම 02

ප්‍රවේශය

විවිධ ශ්‍රැති මත ගැයෙන සරල ගීත කිහිපයක ස්ථායි කොටස් පටිගත කරගෙන විත් සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න. එම ගීත නිර්මාණයේ දී පාදක කොටගෙන ඇති, ශ්‍රැතිවල විවිධත්වය පිළිබඳව ස්වර පුවරුවක ආධාරයෙන් පැහැදිලි කරන්න.

ගායනයක් ඉදිරිපත් කිරීමේ දී පාදක ශ්‍රැතිය කුමක් වුවත් ඒ මත ස්ථාවරව රැඳී සිට ගැයීමේ වැදගත්කම පැහැදිලි කරන්න. වාදනයකදී ද ශ්‍රැතිය මත නිවැරදිව පිහිටීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කරන්න. සිසුන්ගේ අදහස් විමසන්න.

ක්‍රියාකාරකම 02.

ක්‍රියාකාරකම් 02.01

තාම්පුරාවක් හෝ ශ්‍රැතියක් භාවිතා කරමින් සඩ්ජය(ස) ස්වරය ගායනා කරන්න. උපදෙස් දෙන්න.

සැ. යු

- එක් හුස්මක් අවසාන වනතෙක් සඩ්ජ ස්වරයෙහි රැඳී සිටීමට උපදෙස් දෙන්න.
- හඬෙහි ආරම්භයෙහි තිබූ බර බව හා හඬ ප්‍රමාණය (ශබ්දය) අවසානය දක්වාම රැක ගැනීමට උපදෙස් දෙන්න.
- ඝ ස්වර භාවිතයෙන් ගැයුවාට පසුව, 'ආ','ඈ' 'ඌ' වැනි ස්වර භාවිතයෙන් ගායනයට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම් 02.02

- උච්ච ස්වරය (ස) වෙනුවට 'ඕම්' අක්ෂරය ගැයීමට පොළඹවන්න.

  ස - - - - - -

  ඕම් S S S S S S

ක්‍රියාකාරකම් 02.03

(ශ්‍රැතිය පිළිබඳව අවධානය යොමු කරමින් ගයන්න)



සිංහල අරුත -

අප දෙපිරිසම සුරක්ෂිත වෙත්වා - එක්ව පෝෂිත වෙත්වා
අප දෙපිරිසම එක්ව වීර්ය වඩමු - අපේ ඉගෙනීම දීප්තිමත් වෙත්වා
අභිමතාර්ථය සාර්ථක වෙත්වා - අපි එකිනෙකාට වෛර නොකරමු.

ඇගයීම -

ආරෝහණ, අවරෝහණ එක හුස්මට කිහිප වාරයක් 'ආ'කාරයෙන් ගායනය කරන්න.

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අදාළ සම්භාව්‍ය ගායනයක් , වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.2 : ගැළපෙන ශ්‍රැතිය තෝරා ගනිමු.

ඉගෙනුම් ඵල :
- ගායනය සඳහා ගැළපෙන ශ්‍රැතිය හඳුනා ගනියි.
- සප්තක තුනෙහි ම වැඩි ස්වර ප්‍රමාණයක් ගායනා කිරීමේ හැකියාව ලබයි.
- ගායනයට සුදුසු ස්වර පරාසය හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 01

ගුණාත්මක යෙදවුම් : සර්පිනාවක් , තාම්පුරාවක්

ගුරුවරයාට උපදෙස් : එක් එක් පුද්ගලයා ගේ උගුරේ හා ස්වර තන්තුවල පිහිටීම අනුව මන්ද්‍ර හා උච්ඡ සප්තකය කරා යා හැකි දුර ප්‍රමාණය එකිනෙකට වෙනස්වේ. එසේ වුවද පෙරදිග සංගීත පද්ධතිය තුළ සෑම ගායකයකුටම තමාගේ පාදක ශ්‍රැතියේ සිට අවම වශයෙන් මන්ද්‍ර මධ්‍යමය දක්වාත්, උච්ඡ පංචමය දක්වාත් ගායනා කිරීමට හැකි විය යුතුවේ.

සිසුන්ගේ ස්වර පරාසය පිළිබඳව අධ්‍යයනය කර , අවම මන්ද්‍ර සප්තකයේ පංචමයේ සිට තාර සප්තකයේ වැඩි ස්වර ප්‍රමාණයක් ගායනා කිරීමට හැකියාව ලැබෙන ස්වරය ශ්‍රැති ස්වරය ලෙස තෝරා දීමට කටයුතු කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. මෙසේ සිසුන්ට ගැළපෙන ශ්‍රැති ස්වරය තෝරා දෙනුයේ විශේෂයෙන්ම පෞද්ගලිකව සාර්ථකව අභ්‍යාසයේ යෙදීම සඳහා ය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී පන්තියේ සියලුම සිසුන්ට ගැළපෙන පොදු ස්වර ශ්‍රැති ස්වරය ලෙසට භාවිතා කළ හැකි ය. බොහෝ විට මන්ද්‍ර කෝමළ නිෂාදය ශ්‍රැති ස්වරය ලෙස යොදා ගැනේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :ඇමුණුම අංක 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතා කරන්න. එක් එක් සිසුවාට ගායනා කළ හැකි ස්වර පරාසය වටහාගෙන ඔහුට හෝ ඇයට ගැළපෙන ශ්‍රැති ස්වරය තෝරාදීම සඳහා ඇමුණුම අංක 01 හි ඇතුළත් ක්‍රියාකාරකම භාවිතා කළ හැක. එහිදි සිසුන් ලවා මන්ද්‍ර ස්වර ගයවා ස්වර පරාසය වටහා ගන්න. උච්ඡ ස්වර ගයවා උච්ඡ සප්තකයේ ස්වර පරාසය වටහා ගන්න. වැඩිම ස්වර පරාසයක් ගායනා කිරීමට හැකියාව ලැබෙන ස්වරයක් ඔහුගේ හෝ ඇයගේ ශ්‍රැති ස්වරය ලෙස තෝරා දෙන්න. එම ශ්‍රැතියේ සිට පුහුණුව තුළින් තම ස්වර පරාසය පුළුල් කර ගත යුතු බව අවධාරණය කරන්න.

පහත ක්‍රියාකාරකමේ දී මුල් අවස්ථාවේදී ශ්‍රැති ස්වරය ලෙස මධ්‍ය සඩ්ජය භාවිතා කරන්න. ස්වර ගායනයේදී පුළුල් කර ගත යුතු දිසාව (මන්ද්‍ර උච්ඡ) අනුව ශ්‍රැතිය ස්වරය වෙනස් කරන්න. අපහසුතා ඇත්නම් වෙනත් ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස යොදා ගන්න.

ඇමුණුම අංක 01

ප්‍රවේශය : ඉන්දීය ශාස්ත්‍රීය ගායිකාවක් වන පර්වීන් සුල්තානා වැනි සප්තක තුනම ඇසුරු කරන ගායිකාවකගේ හෝ වෙනත් ගායකයකුගේ ශාස්ත්‍රීය ගායනයක සප්තක තුනම ඇසුරු කරන කොටස් සිසුනගේ ශ්‍රවණයට සළස්වන්න. එහි සප්තක තුන ඇසුරු කිරීම පිළිබඳව සිසුන් හා සාකච්ඡා කරන්න. නැතහොත් 'රත්න දීප ජන්ම භූමි වැනි මන්ද්‍ර, මධ්‍යය උච්ච ත්‍රි සප්තකයම ඇසුරු කරන සුදුසු ගීයක් විවිධ ශ්‍රැතිවලින් ගායනා කර මන්ද්‍ර හා උච්ච ස්වර නිවැරදිව ගායනය කළ හැකි ශ්‍රැතිය එක් එක් සිසුවාට වෙන වෙනම තෝරා පහදා දෙන්න.

ක්‍රියාකාරකම අංක 01



උච්ච සවර අභ්‍යාස



ඇගයීම - පහත සඳහන් ස්වර අභ්‍යාසය ගයන්න.

1. ස ධ නි ප, ධ ම ප නි, ධ ස

2. රි නි ස ධ, නි ප ධ ම, ධ ම ප නි, ධ ස තාර සප්තකය සඳහා ද සුදුසු අභ්‍යාසයක් යෙදා ගන්න.

ක්‍රියාකාරකම් සැලසුම -03

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අයත් උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.3 : උච්ච හා මන්ද්‍ර ස්වර සප්තකයන්හි ස්වර ගයමු.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාවක් හෝ තාම්පුරාවක්

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් : ප්‍රාසංගිකව භාව පූර්ණ ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා නිවැරදිව හුස්ම ගැනීම, දීර්ඝ ස්වසනය, හුස්ම රඳවා ගැනීම, පාලනයකින් යුතුව මුදා හැරීම මෙන්ම, සප්තක තුනෙහිම ස්වර ගායනා කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම ශාස්ත්‍රීය සංගීතයේ ඉතා වැදගත් අංගයකි. ඉතා පටු ස්වර පරාසයක් තුළ ගායනය කරන අයෙකුට වුව ද කැපවීමෙන් කරනු ලබන සතත අභ්‍යාසයෙන් තම ස්වර පරාසය පුළුල් කරගත හැකි ය.

තමා ගයන ශ්‍රැතියේ සිට මන්ද්‍ර, මධ්‍ය හා උච්ච සප්තක හොඳින් ඇසුරු කිරීමේ හැකියාව උසස් ගායකයෙකු තුළ තිබිය යුතු සුවිශේෂී ගුණාංගකයකි. සිසුන් තුළ ද මෙම උසස් ගුණාංගය වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිත ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- මීට පෙර ස්වසන අභ්‍යාස සඳහා යොදා ගත් ක්‍රියාකාරකම් නැවත මතකයට නංවන්න. ඇමුණුම 01 හි සඳහන් ස්වර අභ්‍යාස පියවරින් පියවර පුහුණු කරවන්න. එක් අභ්‍යාසයක් හොඳින් තහවුරු වූ පසුව ඊළඟ අභ්‍යාසය පුහුණු කරවන්න. තාලානුකූලව පුහුණු කරවීමෙන් ස්වර ඥාණය මෙන්ම තාලඥාණයද වර්ධනය කර ගනිමින් රසවත් ලෙස ගායනය කිරීමේ කුසලතාව ලැබෙන බැවින් අවධානයෙන් යුතුව පුහුණුවීම් කරවන්න.

  නිශ්චිත කාලච්ඡේදය තුළ පුහුණු විය හැකි අභ්‍යාස සංඛ්‍යාව පුහුණු කර , සෙසු අභ්‍යාස නිදහස් කාලච්ඡේදයන්හි පුහුණුවීමට උපදෙස් දෙන්න.

ඇමුණුම 01

- උච්ච සහ මන්ද්‍ර සප්තකයන්හි ස්වර ඇතුළත් අභ්‍යාස



නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අයත් සම්භාව්‍ය ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.4 : හඬ පාලනයෙන් යුතුව ගයමු.

ඉගෙනුම් ඵල :
- උසස් තත්වයේ ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග හඳුනා ගනියි.
- පද මාලාවෙන් නිරූපනය වන අර්ථය, භාවාත්මක නිරූපනය කිරීම සඳහා කටහඬ පාලනය කරගන්නා අයුරු අවබෝධ කර ගනියි.

කාලය : කාලච්ඡේද 01 යි

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව , තාම්පුරාවක්

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් : යථාරූපී හා ව්‍යවහාරික සංගීත සම්ප්‍රදායන්ට අයත් ගායනාවක් ඉදිරිපත් කිරීමේ දී තම කට හඬ භාව ප්‍රකාශනයට අවශ්‍ය පරිදි පාලනය කර ගනිමින් රසාලිප්ත ගායනාවක් ඉදිරිපත් කිරීමට හැකියාව ලබාදීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. පැරණි විද්වතුන් ඉදිරිපත් කර ඇති ගායන දෝෂ අතර දක්වෙන
- මහත් ශබ්දයෙන් ගී ගැයිම
- වෙව්ලන ස්වරයෙන් ගී ගැයිම
- කපුටකුගේ හඬ වැනි කර්කෂ හඬින් ගී ගැයීම
- බියටපත් එළුවකුගේ හඬමෙන් කෑ ගසමින් ගී ගැයීම
- නාසික ස්වරයෙන් මහත් ශබ්දයෙන් ගී ගැයීම

වැනි දෝෂවලින් මිදීමෙන් සාර්ථක භාව පූර්ණ ගායනයක් සඳහා මඟ හෙළිවනු ඇත. 'රස හීන භාවයෙන් ගී' කීමද ගායන දෝෂයක් බව අවධාරණය කොට ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතයට ගන්න. ක්‍රියාකාරකම් අංක 01 හි සිසුන් යොදවන්න. පළමු ක්‍රියාකාරකම තුළින් පාලනයකින් යුතුව හඬ හැසිරවීම හුරුකිරීම පිළිබඳව සැළකිලිමත් වන්න.

- දෙවන ක්‍රියාකාරකම තුළදී පළමු ක්‍රියාකාරකමෙන් ලද හුරුව භාවාත්මක ගායනයක් ඉදිරිපත් කිරීමට භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා හුරුව ලබා දෙන්න.

ඇමුණුම 01

- **ප්‍රවේශය**

  සිංහබාහු නාට්‍යයේ එන 'ගල්ලෙන බිඳලා' යන ගීතය සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න. එම ගීතයේ පදමාලාවෙන් ප්‍රකාශිත අර්ථය භාවාත්මකව නිරූපණය කිරීම සඳහා කටහඬ භාවිතා කර ඇති ආකාරය පිළිබඳව සිසුන් හා සාකච්ඡා කරන්න. (සංවේදීව ගයන කොටස් - ඇයි සුදු දුවණිය

  ආවේගශීලීව ගයන කොටස - සොහොයුරා නම් ඔළ මොළ ගති ඇත.)

ක්‍රියාකාරකම් අංක 01

පියවර අංක 1- නිල් අහස් තලේ, එකට සතුටු සාගරේ වැනි පද හතරෙන් යුත් ගීතයක් තෝරා ගන්න.

පියවර අංක - 02

පළමු පේළිය ඉතා අඩු හඬින් ආරම්භකර පේලියෙන් පේලියේ හඬ ක්‍රමයෙන් වැඩිවන ලෙස ගායනා කිරීමට හුරු කරවන්න.

මේ උදා සංඛ්‍යා මගින් ගීතයේ පාදය නිරූපණය වෙයි.

i	නිල් අහස් තලේ අගේ	1
ii	නෑ වළාකුළු	2
iii	ලස්සනයි පුරා හදේ	3
iv	රැස් විහිදිලා	4

මෙම සංඛ්‍යා මගින් පෙන්වා ඇත්තේ හඬ වැඩි විය යුතු පිළිවෙළ ය.

පියවර අංක 03

හඬ අඩු වැඩිවන පිළිවෙල විවිධ අයුරින් වෙනස් කර ගයවන්න.

	◯	◯	◯	◯	
උදා -	4	2	3	1	හඬ අඩු වැඩිවන ප්‍රමාණ
	i	ii	iii	iv	ගී පාද
	◯	◯	◯	◯	
	2	4	1	3	හඬ අඩුවැඩිවන ප්‍රමාණ
	i	ii	iii	iv	ගී පාද

ක්‍රියාකාරකම් අංක 02

පටිගත කළ ගීතය ශ්‍රවණයට සලස්වන්න.

'ගල්ලෙන බිඳලා' ගීතය හඬ පාලනයකින් යුක්තව භාව ප්‍රකාශනය සහිතව ගායනය කිරීමට පොළඹවන්න. අංක 01 සඳහන් වන තැන ඉතා මෘදු හඬකි. අංක 4 සඳහන් වන තැන වේගවත් මෙන්ම වැඩි හඬක් පෙන්වයි. අවශ්‍ය තන්හි භාව නිරූපණය වන පරිදි හඬ අඩු වැඩි කරමින් ගයා පෙන්වමින් සහය වන්න.

ගල්ලෙන බිඳලා ලෙන් දොර හැරලා
4
සිංහබා සිංහබා සිංහබා
2 3 4
මා සොඳුර, මා සොඳුර - මා සොඳුර
2 2 1
සිංහ සීවලී මා ප්‍රිය දියණිය
4 2 2
ගල්ලෙන බිඳලා ලෙන් දොර හැරලා
2
ගොසින් හැමදෙන නැතේ කිසිවෙක්
2
මම දැන ගතිමි මම සැක කළෙමි
1
සිංහ බා සිංහ බා සිංහ බා
2 2 4

ලෙනතුළ නොවෙති
පෙරළා නො එති } 3
මම දැන ගතිමි මම සැක කළෙමි
4 3 2 1
සුරතල් දියණිය මොළකැටි වදනින්
මා සනසන්නිය අහර පිසන්නිය } 1
කවන්නිය, පොවන්නිය, මා ගැන බිය වන්නිය
2 2 3 2
වනයේ දුකක් විඳ අසන්නිය, සොයන්නිය
2 3 2 2 1

ඇත් ගොසින් ය ඇත් ගොසින් ය
4
ඇයි සුදු දුවණියෙ නුඹවත් නොසිටියෙ
2
සොහොයුරා නම් ඔළ මොළ ගති ඇත
4
නුඹ මෙන් මුදු නැත.
4

ඇගයීම - හඬ පාලනයකින් යුක්තව භාව ප්‍රකාශ සහිතව ගායනය කළ හැකි නාට්‍ය ගීත කිහිපයක් තෝරා ගෙන ඉහත ආකාරයෙන් සුදුසු අංක යොදා පද වෙන් කරන්න.

මූලාශ්‍ර - ගීත ශික්ෂක පිටු අංක 33-34 - එම්. ජී. පෙරේරා-
සංගීතය පිටු අංක 123 -124 ප්‍රේමවංශ හපුවලාන

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අයත් සම්භාව්‍ය ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.5 A : නිවැරදි ඉරියව්වෙන් හිඳ ගයමු.

ඉගෙනුම් ඵල :
- ගායනයේ නිවැරදි ඉරියව් හඳුනා ගනියි.
- ගායනයේ ගුණ හා දොස් හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් : ඛ්‍යාල් ගායනයක් ඇතුළත් වීඩියෝ පටයක් හෝ VCD, DVD තැටියක හෝ නිවැරදි ඉරියව්වේ ගායනයක යෙදෙන ඡායාරූපයක්.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් : 6 වන ශ්‍රේණියේ සිට ගායනය හැදෑරූ සිසුන් නිවැරදි ඉරියව්වෙහි පිහිටා ගායනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව යම් අවබෝධයක් හා හුරුවක් ලබා ඇත. ඔවුන් ලද එම දැනුම හා පුහුණුව උසස් පෙළට ගැළපෙන අයුරින් තව දුරටත් වර්ධනය කර ගනිමින් ගායනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය දැනුම හා හුරුව ලබා දීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය.

ස්වරාලය පුහුණු කිරීමේ අභ්‍යාසවල යෙදෙන අතරම මනස හා කය ඉහිල් කරනු ලබන අභ්‍යාසයන්හි යෙදීම වත්මන් ලොවතුළ දක්නට ලැබෙන නව ප්‍රවණතාවයකි . ඉහිල් වූ මනසකින් හා සිරුරකින් ඉතා පහසුවෙන් නිවැරදි ඉරියව් අනුගමනය කළ හැකි බව පහදා දීම අපේක්ෂිතය.

ඉහිල් වූ සිරුරක් හා මනසක් ඇතිව නිවැරදි ඉරියව්ව මත පිහිටා ප්‍රාසාංගික ගායකයකු වීමට අවශ්‍ය උපදෙස් ලබාදීම ද අපේක්ෂිතය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතයට ගන්න.
  නිවැරදි ඉරියව්වෙ හි පිහිටා ගායනය කළ යුතු බව' පුරාණයේ සිටම ශිෂ්‍යයාට අනාවරණය කොට ඇති පුරාතන ග්‍රන්ථ පරිශීලනයෙන් පෙනේ. පහත පළමු ක්‍රියාකාරකමෙහි දැක්වෙන්නේ එවැනි කරුණු ඇතුළත් ග්‍රන්ථයන් ගෙන් ගත් උපුටනයන්ය. එම කියවීම් පත්‍රිකාව සිසුන් අතට පත් කරන්න. ඒවා කියවීමට සළස්වන්න. ඒවායේ ඇති තොරතුරු අනුව ගායනයේ නිවැරදි ඉරියවු සකසා ගත යුතු ආකාරය ඔබගේ වචනයෙන් ප්‍රායෝගිකව ප්‍රදර්ශනය කරමින් පහදා දෙන්න.

  (කාලය විනාඩි 40 යි)

- සිසුන් මෙතෙක් අධ්‍යයනය කළ රාගධාරී ගීතයක් ඉහත විස්තර කරන ලද නිවැරදි ඉරියව්වල පිහිටා ගායනා කිරීමට පොළඹවන්න.

  (විනාඩි 40 යි)

ඇමුණුම 01

- **ප්‍රවේශය**

  නිවැරදි ඉරියව්වේ පිහිටා ගායනයක් ඉදිරිපත් කරන වීඩියෝ පටයක් හෝ තැටියක් සිසුන්ට නැරඹීමට සලස්වන්න. ඡායාරූපයක් පෙන්වන්න. නැතහොත් නිවැරදි ඉරියවුවේ පිහිටා ගායනයේ යෙදෙන අයුරු ගුරුවරයා විසින් ආදර්ශමත් ව පෙන්වන්න.

ක්‍රියාකාරකම් අංක 01.01

පහත දක්වා ඇති කියවීම් පත්‍රිකාව සිසුන්ට කියවීමට සලස්වන්න.
එහි ඇතුළත් තොරතුරු පිළිබඳව සිසු අවධානය යොමු කරවමින් අවශ්‍ය උපදෙස් ප්‍රායෝගිකව ලබා දෙන්න.

කියවීම් පත්‍රිකාව
(මෙය කට පාඩම් කිරීමට නොවේ)

පහත දැක්වෙන පත්‍රිකාව කියවා ගායන දෝෂ පිළිබඳ ඔබේ බසින් කෙටි ලිපියක් සකසන්න.

ගායන දෝෂ

ගී කීමෙහි සිදුවන හෝ සිදුකරණ දොස් ගායනදෝෂ වෙති. ඒවා පස්විස්සක් වෙති. ගායකයා මෙම දෝෂයන්ගෙන් සර්වප්‍රකාරයෙන්ම වැළකිය යුතුයි. එම දෝෂයෝ, සංදෂ්ටය, උද්ඝෂ්ටය, ශීත්කාරිය, භීතය, ශංකිතය, කම්පිතය, කරාලීය, විකලය, කාකීය, විතාලය, කරභය, උද්වඩය, කෙඩම්බකය, තුම්බකීය, වක්‍රීය, ප්‍රසාරිය, නිමීලකය, විරසය, අප ස්වරය, අව්‍යකතය, ස්ථානභ්‍රෂ්ටය, මිශ්‍රකය, අව්‍යවස්ථිතය, අනවධානය, අනුනාසිකය යනුවෙනි.

1. දත්මිටිකමින් හෝ දත් නියවමින් ගී කීම **දෂ්ටය** නම් දෝෂයයි.
2. විරසවූ උද්ඝෝෂණයෙන් හෙවත් කොමලතාදියෙන් විරහිතවූ මහත් ශබ්දයෙන් ගීකීම **උද්ඝෂ්ට** නම් දෝෂය වේ.
3. අධික සන්තෝෂයෙන් හෝ වේදනාවෙන් යුක්තවූ අවස්ථාවකදි මෙන් පොපියන (වේව්ලන) තොල් ඇතිව ගායනය කිරීම ශීත්කාරි නම්දෝෂය වේ. ශීතයෙන් හෝ මූර්ඡාවෙන් පෙළෙන අවස්ථාවකදි හෝ සුසුම්ලන ප්‍රස්ථාවකදී කථාකරණ ආකාරයෙන් වෙව්ලන තොල් ඇතිව ගී කීමෙන් මෙම දෝෂය ඇතිවන බවත් දක්වන ලද්දේය. ඇතැම් කෙනෙක් ශීත්කාරී වෙනුවෙන් සුත්කාරී යනු යොදති. නිද්‍රෝපගත අවස්ථාවකදී ඇතිවන දීර්ඝ නිශ්වාසය (තදින් හුස්ම පිට කිරීම) සමාන ශබ්දයක් නගා ගී කීමෙන් සුත්කාරී දෝෂය ඇතිවන බවත් දත යුතුයි.
4. භය සහිතව ගී කීම භීත නම් දෝෂය වේ.
5. සැක සහිතව ගායනය කිරීම ශංකිත නම් දෝෂයයි
6. ශබ්දය සහ ශරීරය (හෝ එහි යම් යම් අවයව) කම්පනය කිරීමෙන් ගායනය කිරීම කම්පිත නම් වේ.
7. මුහුණ උඩට නගා ගෙන ගී කීම කරාලි නම් වේ
8. ශ්‍රැතියෙන් අඩුව හෝ වැඩිව ගී කීම විකල නම් දෝෂය වේ.
9. කාකයෙකුගේ කාකී ස්වරයෙන් හෙවත් කෂ්ට ශබ්දයෙන් ගී කීම කාකී නම් දෝෂය වේ.

10. තාල විව්‍යුතභාවයෙන් හෙවත් නියමිත තාලයෙන් තොරව ගී කිම විතාලයි.
. ලයභේදයද මීටම ඇතුළත් වේ.
11. හිස අත්හිස (කර) මත්තෙහි තබාගෙන ගී කීම කරහ නම් දෝෂය වේ.
12 එලුවෙකු බිය පත් වූ විට නගන ශබ්දය මෙන් ශබ්දනගා ගී කීම උද්වඩ දෝෂය වේ.
13. නලළෙහිද මුහුණෙහි සහ ග්‍රීවයෙහි ද නහර පුම්බාගෙන ගී කීම ඩොම්බක නම් දෝෂය වේ.
14. තුම්බකාකාරයෙන් හෙවත් ලබුගෙඩියක් සේ පිපුණු ග්‍රීවාය ඇතිව ගී කීම තුම්බකී නම් දෝෂයයි.
15. ග්‍රීවයේ පිටුපස වක්කරගෙන ගී කීම වක්‍රී නම් දෝෂය වේ.
16. මුඛ ප්‍රසාරණය කරමින් හෙවත් මුඛය බොහෝ සේ හැරීමෙන් හෝ පළල් කිරීමෙන් ගී කීම ප්‍රසාරි නම් දෝෂයයි. ඇතැම් කෙනෙක් ගාත්‍ර ප්‍රසාරණයකරමින් හෙවත් ශරීරයේ අවයව දිගුකරමින් ගී කීම ප්‍රසාරී දෝෂයයි කියති.
17. නිමීලිත ඇස් ඇතිව හෙවත් ඇස් පිය හෙළමින් කී කීම නිමීලක දෝෂයයි.
18 රස හීනභාවයෙන් හෙවත් කරුණා ආදී යම් යම් රස භේදකොට ගායනය කිරීම විරස දෝෂයයි. අසන්නවුන්ගේ චිත්තානුරංජනය නොවන පරිදි ගී කීමත් විරස දෝෂයයි සැළකිය යුතුයි.
19. වර්ජ්‍ය ස්වර ඇසුරු කරමින් හෝ විවාදී අනියමිත සවර ආශ්‍රය කරමින් ගී කීම අපස්වරදෝෂය වේ.
20. අව්‍යක්තාකරයෙන් හෙවත් ගීතයේ අක්ෂර හෝ වචන නොපැහැදිලි ලෙස උච්චාරණය කරමින් ගී කීම අව්‍යක්ත නම් දෝෂයයි
21. මන්‍ද්‍ර මධ්‍ය සහ තාර යන ස්ථානත්‍රය නිසි පරිදි ඇසුරු කිරීමට ශක්ති නොමැතිව ගී කීම ස්ථාන භ්‍රෂ්ට නම් දෝෂය වේ.
22. මන්‍ද්‍ර සහ මධ්‍යාදී වශයෙන් නිශ්චය කරගත් ස්ථානයක් නොමැතිව ගායනය කිරිම අව්‍යවසථිත දෝෂය වේ . මන්‍ද්‍රස්ථානත්‍රය පිළිබඳව නියම රීතියට හෝ ව්‍යවහාරයට අනුකූල නොවන පරිදි ගී කීමෙන් ද මෙම දෝෂය සිදුවන බවත් දත යුතු ය. සමහර ගීතයෝ මන්‍ද්‍ර ස්ථානයෙන් ආරම්භ කටයුතු වෙති. සමහරක් මධ්‍ය ස්ථානයෙන් සහ සමහරක් තාර ස්ථානයෙන්ද ආරම්භ කටයුතු වෙත්. මෙම ස්ථාන නියමය උල්ලංඝනය කිරීම අව්‍යවස්ථිත දෝෂයයි දත යුතු යි. ස්ථායි සහ අන්තරා ආදී ගීතයේ කොටස් පිළිබඳ මන්‍ද්‍රාදී ස්වර සම්බන්ධ නියමය කඩකිරීමද මෙම දෝෂයේ අංගයකැයි සැළකිය යුතුයි.
23 රාග මිශ්‍ර කිරීමෙන් හෙවත් භේදකිරීමෙන් ගී කීම මිශ්‍රක නම් දෝෂය වේ.
24 ආරෝහණය, අවරෝහණය, ස්ථායි සහ සංචාරී යන ලක්ෂණ ගැන නිසි ප්‍රකාර අවධානයක් හෙවත් සැලකිල්ලක් නොමැතිව ගායනය කිරීම අනවධාන නම් දෝෂයයි.
25 නාසික ශබ්දයෙන් ගී කීම අනුනාසික දෝෂය වේ.

කිසියම් හින්දුස්ථානි සංගීතාචාර්යවරයෙක් විමලය, චාලකය, ආන්දෝලය, එක, දෘෂ්ටිය, ඌධවගාමීය, පාදපය සහ සාවකය යන අතිරේක දෝෂ සප්තකයකුදු දක්වති. ගී කියන අවස්ථාවේදී එහි (එම කාරණයෙහි) සිත නොයොදා අනික කාරණයක් ගැන සිත යොමු කරමින් ගී කීම විමල නම් දෝෂය වේ. අත් ඔබ මොබ චලනය කරමින් හෙවත් වනමින් ගී කීම චාලක නම් දෝෂය වේ. හිස වනමින් ගී කීම ආන්දෙල නම් දෝෂයයි. එකම පර්ශ්වයක් බලාගෙන ගී කීම එකදෘෂ්ටිනම් දෝෂය වේ. මුඛය උඩට ඔසවා ගී කීම ඌධවීගාමී නම් දෝෂයයි. රාගය සහ තාලය පිළිබඳව කිසිම දැනීමක් නොමැතිව ගී කීම පාදප නම් දෝෂයවේ. (ගීතයේ) පද්‍යරචනාවේ අර්ථාවබෝධ කරනොගෙන ගායනය කිරීමට සාවක නම් දෝෂයයි.

ක්‍රියාකාරකම් අංක .02

පහත කරුණු සැළකිල්ලට ගෙන නිවැරදි ඉරියවුවේ පිහිටා රාගධාරී ගීතයක් හෝ සරල ගීතයක් ගායනය කරමින් අත්හදා බලන්න.

1. පද්මාසනයෙන් අසුන් ගන්න
2. පිට කොන්ද ඍජුව තබා ගන්න
3. මුහුණ පහතට නවා ගැයීමෙන් ස්වරාලයේ ක්‍රියාකාරිත්වය අවහිර වන බැවින් මුහුණ කෙළින් තබා ගන්න.
4. නිදහසේ ආශ්වාස ප්‍රශ්වාස කළ හැකි පරිදි පපු ප්‍රදේශය ඍජුව තබා ගන්න.
5. මුහුණේ ප්‍රසන්නතාවය හා භාව ප්‍රකාශනය පිළිබඳව සැළකිලිමත් වන්න.
6. ගීතයක් ඉදිරිපත් කිරීමේදී සිරුර ඉහිල්ව තබාගෙන ගයන්න.
7. මානසික ඒකාග්‍රතාවයකින් යුතුව ගැයීමට සිතට ගන්න.

ගායනයේ ගුණ

1 ගායනයට සුදුසු මධුර කට හඬින් ගායනය කිරීම
2 ස්වර සහ ශ්‍රැති පිළිබඳ හොඳ අවබෝධයක් ඇතිව ගායනය කිරීම.
3 ලය සහ තාලය පිළිබඳ හසළ දැනුම
4 රාග පිළිබඳ නිවැරදි දැනුම
5 තම ප්‍රතිභා ශක්තියෙන් තාන සහ ආලාප ආදිය විචිත්‍ර ලෙස ගැයීම
6 රාගයක රංජකත්වය ගැන සැළකිලිමත් වීම.
7 උච්චාරණය පැහැදිළි වීම.
8 ආත්ම විශ්වාසයෙන් යුක්තව ශාන්තව ගායනය කිරීම.
9 සප්තක තුන ම පැහැදිළිව ඇසුරු කිරීමේ හැකියාව.
10 අසන්නාගේ රුචිකත්වයට සරිලන සේ ගායනය කිරීම.

ඇගයීම - සාර්ථක ගායනයක් සඳහා නිවැරදි ඉරියව් පැවැත්ම වැදගත් වේ'' මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

මූලාශ්‍ර - ගීත ශික්ෂක - එම්. ජී. පෙරේරා- (පිටු අංක 83 -84)

ක්‍රියාකාරකම් සැලසුම -06

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායනවාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 11 : රාගධාරී සංගීතයට අදාළ සම්භාව්‍ය ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගතයුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.5-B : නිවැරදි ඉරියව්වෙන් වයමු.

ඉගෙනුම් ඵල : • වාදනයේ නිවැරදි ඉරියව් හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : සිසුන් විසින් සපයාගත් වාද්‍ය භාණ්ඩ - ස්වර පුවරුවක් සමූහ වාදනයක් ඇතුළත් වීඩියෝ දර්ශනයක් හෝ වාදක මණ්ඩලයක ඡායා රූපයක්.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් : වාද්‍ය භාණ්ඩ නිර්මාණයේ දී මිනිස් සිරුරේ හැඩය, පරිමාණය අවයව වැනි කරුණු කෙරෙහි සැළකිල්ල යොමු කොට ඇත. පහසුවෙන් භාණ්ඩය ග්‍රහණය කරගැනීමේ ක්‍රම වේදය එහි උපතේදීම තීරණය වී ඇත. නිසගයෙන් උපන් එම ක්‍රම වේදය වාද්‍ය භාණ්ඩය හැසරවීමේ නිවැරදි ඉරියව්ව වී ඇත. එම නිවැරදි ඉරියව්වෙන් වාදනය කිරීමෙන් පහසුවෙන් හා සාර්ථක ලෙස වාදනයෙහි යෙදිය හැකිය. මෙවැනි කරුණු පිළිබඳව සිසු අවධානයට යොමු කර සිසුනට දක්ෂ වාදකයින් වීමේ භාග්‍ය ලබා ගැනීමට අවශ්‍ය ශක්තිය ලබා දීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතා කරන්න. 7 ශ්‍රේණියේ වයලීනය, සිතාරය හා බටනලාව සඳහා ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරකමෙහි ඇතුළත් රූප සටහන් හා උපදෙස් භාවිත කළ හැක. සිසුන් වාදනය කරන සියලුම භාණ්ඩයන්හි නිවරදි ඉරියව් පෙන්වීම සඳහා පින්තූර භාවිතා කරන්න. පහසුකම් සපයාගත් හැකිනම් වීඩියෝ දර්ශන පෙන්වීමෙන් ඵලදායිතාවය වැඩිවනු ඇත.

සෑම භාණ්ඩයක්ම වාදනය කිරීමේදී

- අසුන් ගන්නා අයුරු
- භාණ්ඩය රඳවා ගන්නා අයුරු
- වාදනය කරන ආකාරය යනාදී කරුණු යටතේ සිසුන්ගේ ඉරියව් නිවැරදි කළ යුතු ය.

ඇමුණුම් 01

ප්‍රවේශය - ප්‍රවීන වාදකයින් සහභාගිවන සමූහ වාදනයක වීඩියෝ දර්ශනයක් පෙන්වන්න. එහි නිවැරදි ඉරියව් භාවිතයෙන් වාදනය කරනු ලබන වාදකයින් පිළිබඳව සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම අංක 1-

ක්‍රියාකාරකම් සංවර්ධනයේ දී ඇති උපදෙස් අනුව කටයුතු කරමින් ඔබට ගැළපෙන අයුරින් සැකසූ ක්‍රියාකාරකමක සිසුන් යොදවා අවශ්‍ය අපේක්ෂාවන් ලඟා කර ගන්න.

ඇගයීම - ඔබ වයන සංගීත භාණ්ඩයේ රූප සටහනක් වාදන ඉරියව් පැහැදිලිවනසේ ඇඳ දක්වන්න.

ක්‍රියාකාරකම් සැලසුම -07

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 : රාගධාරී සංගීතයට අයත් සම්භාව්‍ය ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.6 : ගමක් හා මීන්ඩ් අභ්‍යාස ගයමු.

ඉගෙනුම් ඵල :
- රාගධාරී සංගීතයට අයත් ප්‍රධාන ශිල්පාංග තුනක් හඳුනා ගනියි.
- ස්වර අභ්‍යාස ගායන පුහුණුව තුළින් එම ශිල්පාංග ප්‍රගුණ කරයි.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාවක් හා තාම්පුරාවක්
- ඇමුණුම 01

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් : හින්දුස්ථානී රාගධාරී, සංගීතයට අයත් ප්‍රධානව ශිල්පාංග දෙකකි 'මීන්ඩ් හා ''ගමක්'' එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොකඩවා ගමන් කිරීම මීන්ඩ් වන අතර ස්වර කම්පනය කරමින් ස්වර වෙන්ව ඇසෙන පරිදි ගායනා කිරීම 'ගමක්' වේ. හින්දුස්ථානි රාගයන්හි ගති ලක්ෂණ මතු කරනු සඳහා 'මීන්ඩ්' හා 'ගමක්' යන ගායනා අලංකාර ක්‍රම උපකාරිවේ.

'මීන්ඩ්' භාවිතය රාගයට අනුකූලව සිදුවිය යුතු ය. කිසියම් රාගයක් මින්ඩ් ප්‍රධාන ගැයීමද තවත් රාගයක මීන්ඩ් නොයොදා ගැනෙන අවස්ථා ද ඇත. උභය ශිල්පාංග භාවිතය සමබරතාවයකින් යුතු රාගද ඇත.

ප්‍රවීණ ශිල්පීන්ගේ ගායනයේදී සවන් දීමෙන් මෙම ශිල්පාංගයන්ගේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ හොඳින් අධ්‍යයනය කළ හැක. මේ පිළිබඳ මනා අවබෝධයක් හා පුහුණුවක් උසස් පෙළ සිසුන්ට උගන්වන ගුරුවරයෙකු ගුරුවරියක වන ඔබ සතුව ද තිබිය යුතුම ය.

ගායනය ඉතා මෘදු එහෙත් ස්ථාවර හඬක් නිකුත් වන තෙක් අභ්‍යාස කිරීමට උපදෙස් දෙන්න. ගමක් ගායනයේ දී කට (තොල්) නොසොල්වා උගුර ආශ්‍රිත ස්වර කම්පනය කරමින්. ගායනය කළ යුතු බවට ප්‍රායෝගික උදාහරණ සහිතව උපදෙස් දෙන්න.

ඉහත විස්තර කරන ලද මීන්ඩ් හා ගමක් ගායනය හා භාවිතය පිළිබඳව අවබෝධයක් මෙන්ම හුරුවක් ලබා දීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතයෙන් පාඩමට පිවිසෙන්න. ක්‍රියාකාරකම 01 හි දැක්වෙන මීන්ඩ් හා ගමක් අභ්‍යාස සිසුනට හුරු කරවන්න. පළමු කාලඡේදය මීන්ඩ් සඳහාත් දෙවන කාලච්ඡේදය ගමක් සඳහාත් භාවිතා කරන් (කාලය විනාඩි 40 යි)

- මීන්ඩ් අභ්‍යාසයේ යොදවන්න. මීට අමතරව මීන්ඩ් හා ගමක්, මධ්‍යලය ගීතයක් මගින් උභය ශිල්පාංග භාවිතයට හුරු කරවන්න.

(කාලය විනාඩි 40 යි)

ඇමුණුම අංක 1

- **ප්‍රවේශය**

  ඛ්‍යාල් ගීතයක් ශ්‍රවණයට සලස්වන්න. එහි ගමක් හා මීන්ඩ් යොදාගෙන ඇති අවස්ථා පිළිබඳව අවධානය යොමු කර ඒ පිළිබඳව සිසුන් හා සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් අංක 02

ගමක අභ්‍යාස

පහත ස්වර අභ්‍යාස සියල්ල

පියවර i ස්වරාකාරයෙන් පුහුණු කරවන්න.

පියවර ii 'අ' ස්වරය යොදා (ආකාරයෙන්) පුහුණු කරවන්න.

1. ආරෝහණය - ස රි ග ම ප ධ නි ස්
   අවරෝහණය :- ස් නි ධ ප ම ග රි ස

2. සරිගගරිස
   සරිගමමගරිස
   සරිගමපපමගගරිස
   සරිගමපධධපමගරිස
   සරිගමපධනනිධපමගරිස
   සරිගමපධස්ස්නිධපමගරිස

3 සරි ගගරි ස
   සරිගමමගගරිස
   සරිගමපපමමගගරිස
   සරිගමපධධපපමමගගරිස
   සරිගමපධ නිනිධධපපමමගගරිස
   සරිගමපධනිස්ස්නිනිධධපපමමගගරිස

4. ආරෝහණය :- සස, රිරි, ගග, මම, පප, ධධ, නිනි, ස්ස්
   අවරෝහණය: ස්ස්, නිනි, ධධ, පප, මම, ගග, රිරි, සස

5 ආරෝහණය : සසස, රිරිරි, ගගග, මමම, පපප, ධධධ, නිනිනි, ස්ස්ස්
   අවරෝහණය : ස්ස්ස්, නිනිනි, ධධධ, පපප, මමම, ගගග, රිරිරි, සසස

6 ආරෝහණය : සසසස, රිරිරිරි, ගගගග, මමමම, පපපප, ධධධධ, නිනිනිනි, ස්ස්ස්ස්
   අවරෝහණය : ස්ස්ස්ස්, නිනිනිනි, ධධධධ, පපපප, මමමම, ගගගග, රිරිරිරි, සසසස

ක්‍රියාකාරකම් අංක 01

මින්ඩ් අභ්‍යාස

පහත සඳහන් අභ්‍යාස පළමුව ස්වරාකාරයෙන් හා දෙවනුව ආකාරයෙන් පුහුණු කරවන්න.



ඇගයීම - ඔබ කැමති රාගධාරී ස්වර ප්‍රස්තාරයක් ලියා, එහි ඇතුළත් ගමක්, මීන්ඩ්, ස්වර අදාළ සංකේත මගින් පැහැදිලි කරන්න.

මූලාශ්‍ර - ගීත ශික්ෂකඃ පිටු 13 සිට 26 - එම්. ජී. පෙරේරා

ඇගයීම -01

01. ආවරණය කරණ නිපුණතා මට්ටම -

01.01රාගධාරී සංගීතයට අදාළ සම්භාව්‍ය ගායනයක්/ වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කරගතයුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

02. විෂය සන්ධාරය -

- ස්වසන හා ශ්‍රැතියේ පිහිටීමේ අභ්‍යාස
- උචිත ශ්‍රැතිය තෝරා ගැනීමේ අභ්‍යාස
- උච්ච මන්ද්‍ර සප්තකය කරා විහිදුවන ස්වර අභ්‍යාස
- කටහඬ පාලනය පිළිබඳව අභ්‍යාස
- ගායනයේ දී හා වාදනයේ දී අනුගමනය කෙරෙන නිවැරදි ඉරියව්
- රාගධාරී සංගීතයේ ශිල්පාංග (ගමක්/මීන්ඩ්) ඇතුළත් ස්වර අභ්‍යාස.

03. උපකරණයේ ස්වභාය.

- ප්‍රායෝගිකව ගායනයේ යෙදවීම
- ප්‍රායෝගිකව වාදනයේ යෙදවීම

04. කාලය - කාලච්ඡේද 02

04. අරමුණු

- උචිත ශ්‍රැතිය තෝරාගෙන නිවැරදිව ශ්‍රැතිය මත පිහිටා ගායනය කරයි.
- ගායනයේ දී නිවැරදිව ආශ්වාස ප්‍රශ්වාස කරයි.
- නිවරදි ඉරියව්වේ පිහිටා ගයයි.
- නිවැරදි ඉරියව්වේ පිහිටා වාදනය කරයි.
- කට හඬ මනා පාලනයකින් හසුරුවා භාවාත්මකව ගයයි.

05. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

පහත සඳහන් සිසු උපදෙස් පත්‍රිකාව සිසුන් අතට පත් කර එහි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවමින් ඇගයීමට ලක් කරන්න.

සිසු උපදෙස්

1 පියවර - (ආශ්වාස ප්‍රශ්වාසය හා ශ්‍රැතියේ පිහිටීම සඳහා)

ස - ස රි	ස රි ග ම	ප - ස රි	ග ම ප ධ
ස රි ග ම	ප ධ නි -	ස රි ග ම	ප ධ නි ස්

i. ඉහත ස්වර ඛණ්ඩ නිවැරදි ශ්‍රැතියේ පිහිටමින් ගායනය කරන්න.
ii. වැඩිම ස්වර ප්‍රමාණයක් එක හුස්මකට ගයන්න.

2 පියවර (ශාස්ත්‍රීය ශිල්පාංග)

ස - - -රි	ගගරිරිසම	පප මම ගග රි-	ස - ම -

උපදෙස්

1. දෙවන විභාගයට අයත් මාත්‍ර 4 ගමක් ශෛලියෙන් ගයන්න.
2. තුන්වන විභාගයට අයත් මාත්‍ර 4 ගමක් ශෛලියෙන් ගයන්න.
3. හතරවන විභාගයේ ස සිට ම දක්වා මීන්ඩ් යොදා ගායනය කරන්න.

3. ඉහත පියවර 1 හා 2 නිවැරදි ඉරියව්වෙන් පිහිටා ගයන්න.
4 පහත දැක්වෙන ගී පද කොටස භාවාත්මකව ඉදිරිපත් කරන්න.

වෙසතුරු රජතුමා තම දරුවන් දෙදෙනා දන් දුන් බව දැනගත් මන්ද්‍රී දේවියගේ ශෝකාත්මක බව"

ඉහත භාවය මතුවන පරිදි පහත දැක්වෙන පාදය ශ්‍රැතියට ගායනය කරන්න. (උචිත තනුවක් යොදා ගන්න. මුල් තනුවම අත්‍යවශ්‍ය නැත.)

- " අනේ මගේ දරු දෙන්නා"

5. පියවර -තෝරාගත් ශ්‍රැතියක් මත "ඕම්" කාරය දීර්ඝවේලාවක් ගතවනසේ ගයන්න.

ඇගයීම් නිර්ණායක-

1. උචිත ශ්‍රැතියේ පිහිටා නිවැරදිව ගායනය කිරීම	ලකුණු 04
2. ගායනයේදී නිවැරදිව ආශ්වාස ප්‍රාශ්වාස කරයි	ලකුණු 04
3. නිවැරදි ඉරියව්වේ පිහිටා වාදනය කරයි	ලකුණු 04
4. නිවරදි ඉරියව්වේ පිහිටා ගායනය කරයි	ලකුණු 04
5. ඔම් කාරයේ දීර්ඝ බවට	ලකුණු 04

	ලකුණු 20

ක්‍රියාකාරකම් සැලසුම -08

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.2 : උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයේ වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 1.2.1 : රාග විස්තර උගනිමු.

ඉගෙනුම් ඵල :
- නිර්දේශිත රාගයන්හි රාග විස්තර හඳුනා ගනියි.
- රාග ලක්ෂණ සන්සන්දනය කිරීමේ කුසලතාවය ගනියි.
- රාගයන් හි ගායන සමය සෙවීමේ සිද්ධාන්තය හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 04 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාවක් හා තබ්ලාව

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :බාගේශ්‍රී සහ භීම්පලාසි, දේස්, තිලක්කාමෝද්, භෛරව, කාලිංගඩා, ආසාවරී සහ ජෞනපුරි යන රාගයන්හි විස්තර සහ එහි ස්වභාවය පිළිබඳව සිද්ධාන්තමය සහ ප්‍රායෝගික ව අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම මෙම ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිතය.

මීට අමතරව, රාගයන්හි ගානසමය මුඛ්‍යාංග සහ වාදි සංවාදී ඇතුළු වෙනත් ස්වර විශේෂ පිළිබඳ සංකල්ප හඳුනා ගැනීමේ කුසලතාවය ලැබෙන අතර එම සංකල්පයෙහි ඇති අවශ්‍යතාව වටහාගැනීමට හැකිවනු ඇත.

මේ සඳහා ක්‍රියාකාරකම අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ළඟාවී ඇති නිපුණතා මට්ටම විමසා බලා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකි ය. මෙම මාතෘකාව පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා පහත සඳහන් ග්‍රන්ථ පරිශීලනය කරන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- මීට පෙර අධ්‍යයනය කර ඇති මධ්‍යලය ගීත සහ රාග ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡාවක් කරන්න ඇමුණුම් අංක 01 හි දැක්වෙන වගුව අධ්‍යයනය කරමින් ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

  (කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 02 හි දැක්වෙන ගායන සමය ඇතුළත් චක්‍රය ප්‍රදර්ශනය කරන්න. ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. චක්‍රයෙහි සඳහන් විස්තර අනුව,ගාන සමය වර්ග කරගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු කරන්න. සකස් කරගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

  (කාලච්ඡේද 02)

- ප්‍රවේශය -

  තෝරා ගත් රාග දෙකක ආරෝහණ, අවරෝහණ හෝ මධ්‍යලය ගීත ගයා වයා දක්වමින් එහි ඇති වෙනස් කම් පිළිබඳව සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් අංක 01

- ඇමුණුම් 01 හි දැක්වෙන වගුව අධ්‍යයනය කිරීමට සලස්වන්න. රාගයන්හි විස්තර සහ සුවිශේෂි ලක්ෂණ පිළිබඳව ප්‍රායෝගිකව ගයා වයා දක්වමින් අවබෝධ කරවන්න.
  උදා -
  - ආරෝහණ, අවරෝහණවල වෙනස
  - ස්වර සංගතිවල වෙනස
  - විවාදි ස්වර යෙදෙන අයුරු
  - මුඛ්‍යාංගවල වෙනස
  - එකම ඨාටයකින් උපදින රාග
  - වාදි සංවාදි ස්වර සමාන වන රාග
  - ගාන සමය සමාන වන රාග

  යන කරුණු පිළිබඳව සටහනක් ගොඩ නගා ගැනීමට යොමු කරවන්න.

- රාග කිහිපයක සංගති හෝ මුඛ්‍යාංග ගයා /වයා දක්වමින් විමසන්න.
- අහඹු ලෙස ඉදිරිපත් කරන රාගවල ආරෝහණ අවරෝහණ ගයා වයා පෙන්වීමට අවස්ථාව සලස්වන්න.
- මුඛ්‍යාංගය යන සංකල්පය පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම අංක 02

ප්‍රවේශය - ස්වර සප්තකය සරිගම / පධනිස් වශයෙන් ගෙන කොටස් දෙකට බෙදෙන අයුරු සහ පූර්ව කොටස, උත්තර කොටස යනුවෙන් බෙදෙන අයුරු පිළිබඳව සාකච්ඡාවක් කරන්න.

- ඇමුණුම් අංක 02 හි දැක්වෙන චක්‍රය සහ කියවීම් පත්‍රිකාව අධ්‍යයනයට සලස්වන්න. ගායන සමය ප්‍රහාර අටකට බෙදෙන අයුරු අවධාරණය කරමින් චක්‍රයෙහි සඳහන් විස්තර පිළිබඳව ද පැහැදිලි කරන්න. රාගයක වාදි ස්වරය, ගාන සමය, සොයා ගැනීමට වැදගත් වන බව පැහැදිලි කරන්න. පහත සඳහන් නිදර්ශක ක්‍රියාකාරකම් හි යොදවන්න.
  - ගාන සමය යන සංකල්පය පැහැදිලි කරන්න.
  - දිනයේ ප්‍රහාර 8 කට බෙදෙන අයුරු නම් කරන්න.
  - පූර්ව රාග උත්තර රාග ගැයෙන කාලය නම් කරන්න
  - ශුද්ධ රි, ධ සහ කෝමළ රි ධ යෙදෙන රාග ගැයීමට නියමිත කාලයන් නම් කරන්න.
  - සන්ධි ප්‍රකාශ රාග වර්ග නම් කරන්න.
  - සන්ධි ප්‍රකාශ රාග ගැයෙන කාලය නම් කරන්න.
  - නිර්දේශිත රාගවල ගායන සමය ලකුණු කරන්න.
  - නිර්දේශිත රාග ඇසුරෙන් පූර්වාංග වාදි සහ උත්තරාංග වාදී රාග ලකුණු කරන්න.
  - පරමේල ප්‍රවේශක සහ සමප්‍රකෘති රාග නම් කරන්න.
  -

ඇමුණුම් අංක 1

රාග ලක්ෂණ

රාගය	ඨාටය	ආරෝහණ-අවරෝහණ	ජාතිය	වාදී-සංවාදී	ලක්ෂණ	ගායනසමය
කාපෝදී	කාපි	ස, රි ග්‍රි ග, ම, ග, ම ධ, ධ නි ස්, ස්, නි ධ, ම, ග, ම, ග, රි, ස	ඖඩව - සම්පූර්ණ හා - සම්පූර්ණ	ග - ස	ස, නි ධ, ස ධ, ස, ධ, ප, ග, ස,	රාත්‍රී මුල්භාග ප්‍රහරය
නීලම්බරි	කාපි	නි ස, ග, ම, ප, ධ, නි ස් ස්, නි ධ ප, ම, ග, ස	ඖඩව සම්පූර්ණ	ම - ස	නි ස, ම, ග, ප, ධ, ම, ග, ම, ග, ස,	දිවා මුල්භාග ප්‍රහරය
දේශ්	ඛමාජ්	ස, රි ම ප, ධ, නි ස්, ස්, නි ධ ප, ධ, ම, ග, රි, ග, ස,	සම්පූර්ණ	රි - ප	රි ම ප, නි ධ ප, ධ ප, ම, ග රි, ග, ස,	රාත්‍රී මුල්භාග ප්‍රහරය
නීලරේවා - මෝදී	ඛමාජ්	ස, රි, ග, ස, රි ම ප ධ, ධ ප, ස ස්, ප, ධ ම ග, ස, රි ග, ස, ස නි	සම්පූර්ණ සම්පූර්ණ	රි - ප	ග, නි ස රි ග, ස, රි ප ම ග ස, නි	රාත්‍රී දෙවන ප්‍රහරය
සොරට	සොරට	ස, ඌ ග ම ප ධ, ධ ස් ස්, නි ධ ප, ම ග ඌ ස	සම්පූර්ණ	ධ - ඌ	ස, ග, ම ප, ධ ප,	උදෑසන කාලය (ප්‍රාතඃ කාලය)
කාලිංගඩා	සොරට	ස ඌ ග ම, ප ධ ස් ස්, නි ධ ප, ම ග ඌ ස	සම්පූර්ණ	ප ස (ඌ) (ග)	ධ ප, ග ම ග, නි, ස රි ග, ම	රාත්‍රී අග්‍රභාග ප්‍රහරය
ආභෝගි	ආභෝගි	ස, රි ම ප, ධ ස් ස් නි ධ ප, ම ග, රි ස	ඖඩව සම්පූර්ණ	ධ - ග	රි, ම, ප, නි ධ ප,	දිවා දෙවන ප්‍රහරය
ඡායානට්	ආභෝගි	ස, රි ම, ප, ධ නි ස් ස් නි ධ, ප, ම ග, රි ස	ඖඩව සම්පූර්ණ	ධ - ග	ම ප, නි ධ ප, ධ, ම ප ග, රි ම ප,	දිවා දෙවන ප්‍රහරය
ජයජයවන්ති	ඛමාජ්	ස, රි රි, රි ග රි ස නි ධ ප, රි, ග ම, ප ධ ස් ස් නි ධ ප, ධ ම, රි ග රි ස	සම්පූර්ණ	රි - ප	රි ග රි ස, නි ධ ප, රි,	රාත්‍රී දෙවන ප්‍රහරය
කිරවාණි	කිලාවළි	ස ග, ම ප, නි ස් ස්, නි ධ ප, ම ග, රි ස	ඖඩව සම්පූර්ණ	ග - නි	නි ස, ග ම ප ග ම ග, රි ස,	රාත්‍රී දෙවන ප්‍රහරය

ඇමුණුම් අංක 2

උත්තර භාරතීය සංගීතයෙහි ගාන සමය ඇතුළත් චක්‍රය



කියවීම් පත්‍රිකාව

ගාන සමය යනු ගැයීමට උචිත කාලයයි. වේලාවයි. දිනයක එය කිසියම් රාගයක් ගැයීමට නියමිතව ඇති කාල පරාසය විස්තර කරයි. මෙම සිද්ධාන්තයට අනුව රාග ගානසමය පිළිබඳව කාල වගුව දෙකොටසකට බෙදේ. දවසේ පැය 24 මේ අනුව දෙකට බෙදන අතර එය ප්‍රථම භාගය මධ්‍යහ්න 12 සිට මධ්‍යම රාත්‍රි 12 දක්වාද දෙවන භාගය මධ්‍යම රාත්‍රි 12 සිට මධ්‍යහ්න 12 දක්වාද වෙන්වේ. මින් ප්‍රථම භාගය පූර්වභාගය යනුවෙන් ද දෙවන භාගය උත්තරභාගය යනුවෙන්ද හැඳින්වේ. සංකේතාත්මකව එය මෙලෙස දැක්විය හැකි ය.

දවසේ පැය 24

මධ්‍යහ්න 12 — පූර්ව භාගය

මධ්‍යම රාත්‍රි 12 — උත්තරභාගය

භාත්ඛණ්ඩේ පඬිතුමා සියලු රාගයන්, මෙම ගානසමය න්‍යායට අනුව වර්ග 2 ට බෙදාලීය. ඒ මෙසේ ය.

1. පූර්වාංගවාදීරාග - සප්තකයේ පූර්වභාගයෙහි එනම් එහි ප්‍රථම ස්වර සතර අතරේ දී වාදි ස්වරය පිහිටි රාග උදා - දේස්, තිලක්කාමෝද්
   උදා - ස රි ග ම
2. උත්තරාංගවාදී රාග - සප්තකයේ පශ්චිම භාගයෙහි හෙවත් එහි අවසාන භාගයෙහි අන්තර්ගත ස්වර අතරේ වාදි ස්වරය පිහිටි රාග - උදා - ආසාවරී, ජෞනපූරි
   උදා - ප ධ නි ස් -

මෙම ඉහත කී රාග දෙවර්ගයන් ගැයීමට නියමිත සමය කාලය නිර්ණය මෙලෙස දැක්විය හැක.

ගාන සමය සිද්ධාන්තය

පූර්වාංගවාදිරාග — ගාන සමය — මධ්‍යහ්න 12 සිට මධ්‍යම රාත්‍රි 12 තෙක්

උත්තරාංගවාදී රාග — ගාන සමය — මධ්‍යම රාත්‍රි 12 සිට මධ්‍යහ්න 12 දක්වා

සන්ධි ප්‍රකාශ රාගයන්හි ධෛවතය හා රිෂභය කෝමළ ව යෙදේ. එම රාග ගායනකළ යුතු ගානසමයන් දෙකක් ඇත. එනම්, උදය සන්ධිය (පෙ.ව 4.00 සිට රාත්‍රි 7.00 දක්වා) වේ. එම ගායන සමය තීරණය කිරීමට රාගයේ යෙදෙන මධ්‍යමය හේතුවක් වේ. කෝමළ රි, ධ සමග ශුද්ධ මධ්‍යමය යෙදේ නම් එම රාගය උදය සන්ධියේ ද, ත්‍රීව්‍ර මධ්‍යමය යෙදේ නම් සන්ධ්‍යා සන්ධියේ ද ගායනය වාදනය සිදුවේ.

රාගධාරී සංගීතයේ දී "ම" ස්වරය ගානසමය තීරණය සඳහා ද බලපාන නිසා මධ්‍යමය " සමය දර්ශක" නැතහොත් " අද්ව දර්ශක" ස්වරය ලෙස ද හැඳින්වේ.

ඇගයීම - බාගේශ්‍රී - හිම්පලාසි, දේස් -තිලක්කාමෝද්, භෛරව-කාලිංගඩා, ආසාවරි -ජෞනපූරි යන රාග යුගලයන්ගේ සමවිෂමතා ලියන්න.

මූලාශ්‍ර - සම්භාව්‍ය සංගීත ඩිප්ලෝමා - ප්‍රේමදාස මුදුන්කොටුව
රාගධාරී සිංහල ගීත - ශාන්ති ගීත දේව

ක්‍රියාකාරකම් සැලසුම -09

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.2 : උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමතා හඳුනා ගනිමින් ගායනයේ / වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 1.2.2 : සම ප්‍රකෘතිරාග හඳුනාගනිමින් , එහි සම විෂමතා සොයමු.

ඉගෙනුම් ඵල :
- සම ප්‍රකෘති රාග යන සිද්ධාන්තය හඳුනා ගනියි.
- නිර්දේශිත රාගයන්හි සමප්‍රකෘති ලක්ෂණ හඳුනා ගනියි.
- එම රාගයන්හි සම විෂමතා හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 08 යි

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාවක් හා තාම්පුරාවක්
- ඇමුණුම 01

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

- බාගේශ්‍රී හා හිම්පලාසි යන රාග සමප්‍රකෘති රාග නොවේ. එහෙත් එම රාග දෙක අතර සැසැඳීමක් කළ හැකිය. බාගේශ්‍රී හා හිම්පලාසි යන රාග දෙකෙහි සම විෂමතා සැසැඳීම සහ දේස් - තිලක්කාමෝද්
  - භෛරව - කාලිංගඩා
  - ආසාවරි - ජෞනපුරී යන සමප්‍රකෘති රාගවල සම විෂමතා පිළිබඳ අවබෝධය ලබාදීම මෙම ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිතය.
- මීට පෙර ක්‍රියාකාරකම්වල දී ගාන සමය, මුඛ්‍යාංගය, වැනි සංකල්ප පිළිබඳව පැහැදිලි කළ පරිදි 'සම ප්‍රකෘති රාග' යන සංකල්පය පිළිබඳව හඳුනාගැනීමේ හැකියාව ඇති කිරීමත් අපේක්ෂිතය. ඒ අනුව, සමප්‍රකෘති රාගවල සම විෂමතා හඳුනාගැනීමටත්, රාග සංගති ගයා/ වයා දැක්වීමටත් හැකිවනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- බාගේශ්‍රී සහ හිම්පලාසි යන රාග දෙකෙහි සම විෂමතා සිද්ධාන්ත වශයෙන් හා ප්‍රායෝගිකව ඉදිරිපත් කරවන්න. ඇමුණුම් අංක 01 හි දැක්වෙන වගුව අධ්‍යයනයට යොමු කරවන්න ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න. රාග සංගතිවල වෙනස් කම්, ගයා/වයා පන්තියට ඉදිරිපත් කිරීමට සහායවන්න.

  (කාලච්ඡේද 02)
- දේස් සහ තිලක්කාමෝද් යන රාග සමප්‍රකෘතිවන අයුරු අවබෝධ කරවන්න. එම රාග දෙකෙහි ස්වර සංගති, රාග ස්වභාවය ඇසුරෙන් සාකච්ඡා කරන්න. ස්වර සංගති ගායනයට/ වාදනයට යොමු කරවන්න. සම විෂමතා වගු ගත කරවන්න. ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න.

  (කාලච්ඡේද 02)
- ආසාවරී සහ ජෞනපුරි රාග යුගලයෙහි සම ප්‍රකෘතිලක්ෂණ පැහැදිලි කරන්න. රාග සංගති, මුඛ්‍යාංග, සහ රාගවලට අයත් සුවිශේෂී ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව ඉදිරිපත් කරන්න. සම විෂමතා වගුගත කරවන්න. පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

  (කාලච්ඡේද 02

- භෛරව කාලිංගඩා රාග යුගලයෙහි සම ප්‍රකෘති ලක්ෂණ පැහැදිලි කරන්න. රාග සංගති, මුඛ්‍යාංග සහ රාගවලට අයත් සුවිශේෂී ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව ඉදිරිපත් කරන්න. සම විෂමතා වගුගත කරවන්න. පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

කියවීම් පත්‍රිකාව

රාගයන්හි සුවිශේෂී ලක්ෂණ

රාග	විශේෂ ස්වර සංගති	සුවිශේෂී ලක්ෂණ
බිලහරි	•ස නි ධ නි ස •ස් ධ නි ධ •ධ ග, ධ ග ම ග ස •ස ම ග, ධ ස් ධ •ධ ස ධ ග, ධ ග ම ග ස •ග ධ ධ නි ස් •ධ නි ස් – ධ් ග් ම් ග් ස්– •ස් නි ධ ධ •ධ නි – ධ ග, ධ ග ම ග ස	• ස්ධ, ධ්ධ, ස්වර අතර සම්බන්ධතා මැනවි මිශ්‍රයෙන් යෙදේ. • ම්, ග, ස්වර ආරෝහණයේදී දුර්බල වේ. • ඇද්ධ නිසාදත් විවාදී ස්වරයක් ලෙස යෙදේ. • ඔබව ස්ථිර, තාවකාලික-සම්පූර්ණ, සහ අසම්පූර්ණ ස්ථිර මිශ්‍රයෙන් ප්‍රකාරතුන්ට අයත්. • පූර්වාංග මාදී රාගයකි. • සංවාදය ආගන්තුකව යෙදේ.
කේදාරගුණ	ස්නි ස්ධ, ධ ග, ග ම ග ස, ග්ස ග ධ, ධ ස ග, ස්ධ ග් ම් ග් ස්, ධ ග ම ග ස, ග්ස ධ, ධ ග, ග ධ, ස නි – ස් – ධ ග ස, ස් නි – ස් – ස නි ස ග් ම් ස් – ස් නි ධ – ස, ධ ස ග –, ස්ධ ග ම ග ස –	• ස්ග, ධ්ග ම ස්ග ස්ග ස්වර සම්බන්ධතාවය අත්‍ය. • ස්නි ස්නි ස, ග ම ග ස, ස්නි ධ ග, ස්නි ස්, ග ධ ග ධ ග, ධ ග ම ග ස, • ස්ග්ස් යොදා ගැනීම විශේෂ ලක්ෂණය • පූර්වාංගමාදී රාගයකි. • ගෙනෙන්නේ රාගයේ සෙවණ රාගයට සහ ප්‍රකෘතියේ වේ.
දේශ්	• ස ග් ම ප • ම ප ධ ම ග ම් • ම් ග් ස • ම් ම ප ධ – ම ග ම ග, ග් ස • ම් ම ප ග් ස් – • ප ග් ස් ම් ධ – ප, • ග් ස් ම් ග් – ග් ස් – • ස් ග් ධ ප – • ප ධ ම ග ම් – • ම ග ග් ස –	• ම්ධතාව ඉතා තාක්ෂණ සහගතයි. • ආරෝහණයේදී ම්ධතාව මිශ්‍රව යෙදේ. • සෙස්සම් අංග කාලානුරූපවත් යෙදේ. • ආරෝහණයේදී ග, ධ, දුර්බල වේ. • පූර්වාංගමාදී රාගයකි. • සන්තතිය ග, විවාදී ලෙස යෙදේ ම්ග්ම් • දේශ්, සම්පූර්ණ ස්ථිර රාගයක් වේ. (ග, ධ) අනුනාදයිමය සෙදීමයෙන් ආරෝහණයේ යොදා ගනී.)
සිලුන්තාවෙල්	ස ග ම ස් ග් ම් ස ග් ග – ස, ම් ම් ස ග් ම ස, ග ම ස් ග ස ග ග ස ග ස ස ම් – ග් ධ ප ධ, ධ ප ස් – ස් – ප ධ – ධ ග – ස ම් ස –	• ආරෝහණ ආරෝහණයේදී ධ්‍යුව යෙදේ. • පූර්වාංග මාදී රාගයකි. • කුමිරි වාදනය සඳහා විශේෂයෙන් රාගයකි. • ස් ප ධ, විවාදී ලෙස යෙදේ • ග, ස, ම්, ස්වරවල තානය වේ.

රාගය	විශේෂ ස්වර සංගති	සුවිශේෂී ලක්ෂණ
සොරට	• ස ඊ - ඊ ස • ග් ස ග(ම) ඊ ස • ග(ම) ඊ ඊ ස • ස ඛ් - ග් ස - • ග ම පධ ප • ගම පධ - ග් ස • ස් ග් ධ් ප • ම ග(ම) ඊ ඊ ස	• රිෂභය සහ කෛවතය ආන්දෝලනය නොවේ. • (ඊ් ඊ් ස, ඛ් ග් - ස, ග(ම) ඊ් ඊ් ස) • කෝමල ගාන්ධාරය විවාදී වෙයි • උදය සන්ධි ප්‍රකාශ රාගයකි. • උත්තරාංග වාදී රාගයකි.
කාලිංගඩා	• ග් - ස ඊ ග • ග ම ග - ඊ - ස • ධ - ප, ගමග • පධ, පධ, ග් ස් • ස් ග් ධ, ස් ග් ධ - ප • ගම ග ඊ ස	• උදය සන්ධි ප්‍රකාශ රාගයකි. • ගාන්ධාරය බහා කොන්වීට තනිව නොවේ. • උත්තරාංග වාදී රාගයකි. • ධ්, ධ, ආන්දෝලනය නොකෙරේ. • මධ්‍ය සහ උච්ච සන්ධානවලදී ගීතයෙන් ඇසුණු නොවේ.
ආභෝගී	ස මග් ම ප ම ප ධ, ම ප, ම ග - ම ස ධ් ම ප ග් ධ - ප ස ධ් ග් - ධ - ප ප ධ - ධ - ස ධ් ම ප, ධ ධ ප ම ග - ප ම ප ධ - ධ - ස් ප ග් - ධ් - ස්, ධ් ග් ධ - ප -	• කෛවතය සුපලව වෙයි (ග ප ග් ධ, ග් ධ, ප, ප ධ ම, ප ග - ධ - ස) • සන්ධි ප්‍රධාන නොව තෙවන රාගයකි. • උත්තරාංගවාදී රාගයකි.
ජෝගතුරි	ධ් ම ප ග් ධ ප ම ප ධ ග් - ස් ස් ග් ධ ප ප ධ ග් ස් ධ් ග් ධ ප ප ග් - ධ් ස් ග් ස් ධ් ධ - ප ප ධ ග් ස් ග් ස - ධ ප ධ ධ ප ම ප ග - ධ - ස	• කෝමල ගාන්ධාරය මැදි මගලොන් ආරෝහණ, අවරෝහණවලදී වෙයි. • ම ප ග, ධ් ම ප නිතර වෙයි. • උත්තරාංගවාදී රාගයකි. • සම ප්‍රකෘතික රාගයකි. • ධ ධ ප ම ප, නිතර වෙදෙන සංගති වේ.

ක්‍රියාකාරකම් සැලසුම -10

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : උත්තර භාරතීය සංගීතයට අයත් රාග, කිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයේ / වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 12.3 : 'රාගධාරී ගී ගයමු වයමු' (සර්ගම්, ලක්ෂණ, මධ්‍යලය)

ඉගෙනුම් ඵල :
- නිර්දේශිත රාගවලට අයත් සර්ගම් ගායනය/වාදනය කරයි.
- රාගලක්ෂණ සන්සන්දනය කරයි.
- මධ්‍යලය ගීත ගායනය/ වාදනය කරයි.

කාලය : කාලච්ඡේද 15 යි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව, තබ්ලාව

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

- බාගේශ්‍රී. දේස්, තිලක්කාමෝද්, ජයජයවන්ති, බිහාග් යන රාගවලට අයත්, සර්ගම්, ලක්ෂණ ගී සහ මධ්‍යලය ගීත වාදිත, ප්‍රායෝගිකව ගායනය /වාදනය පුහුණු කරවීම. මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය. මේ අනුව සර්ගම් පුහුණුව මගින් රාග සංගති පිළිබඳ අවබෝධය ද ලක්ෂණ ගීත පුහුණුව මගින් අදාළ රාගයන් හි ලක්ෂණ හඳුනා ගැනීමේ කුසලතාව ද මධ්‍යලය ගීත පුහුණුව තුළින්, රාග ස්වභාවය පිළිබඳව ද මනා අවබෝධයක් ලැබෙන අතර, රාග රස වින්දන ශක්තිය වර්ධනය වී, නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.
- මේ සඳහා නිර්දේශිත එක් රාගයකින්, සර්ගම්, ලක්ෂණ ගී සහ මධ්‍යලය ගී පුහුණුව සඳහා කාලච්ඡේද 03 බැගින් රාග 5 සඳහා කාලච්ඡේද 15 ක් යොදාගන්න.
- රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදා ගන්න.
- සිංහල ගීත මෙන්ම, අභිමතය පරිදි, හින්දි බසින් රචිත ගීත වුව ද මේ සඳහා යොදා ගත හැකි ය.
- ශ්‍රැතිය, ස්වර ස්ථාන, ස්වර සංගති, තාලය රැක ගැනීම සහ මිහිරිතාවය, රසභාවය, පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරී මේ කාර්යයෙහි යොදවන්න.
- ගීත තෝරා ගැනීම සඳහා පහත සඳහන් ග්‍රන්ථ පරිශීලනය කරන්න.

- මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ලම, අවසානයේ දී කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ළඟාවී ඇති නිපුණතා මට්ටම පිළිබඳව සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- බාගේශ්‍රී රාගයට අදාළ , සර්ගම්, ලක්ෂණ ගීතය සහ මධ්‍යලය ගීතය යොදා ගනිමින් රාගධාරි සංගීතයේ සුවිශේෂී තත්වයන් මතුකරමින් හා ශිල්පීය දක්ෂතා වර්ධනය වන අයුරින්, ගායනය / වාදනයෙ හි යොදවන්න.

(කාලච්ඡේද 03 යි)

- දේස් රාගයට අදාළ සර්ගම්, ලක්ෂණ ගීතය සහ මධ්‍යලය ගීතය, රාගධාරි සංගීතයේ සුවිශේෂී ලක්ෂණ මතු කරමින් හා ශිල්පීය ප්‍රාගුණ්‍ය වර්ධනය වන සේ ගායනයෙහි/ වාදනයෙහි යොදවන්න.
  ගායන වාදන පන්තියට ඉදිරිපත් කරවන්න.

(කාලච්ඡේද 03 යි)

- තිලක්කාමෝද් රාගයට අයත්, සර්ගම්, ලක්ෂණ ගීතය සහ මධ්‍යලය ගීතය ගායනයේ/ වාදනයෙහි යොදවන්න. දේස් රාගයෙන් වෙන්කර හඳුනාගැනීමේ කුසලතාව, ප්‍රායෝගිකව වටහා දෙන්න. රස භාවය මතු වන සේ, රාගධාරී ශිල්ප ක්‍රම යොදා ගනිමින් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 03 යි)

- ජයජයවන්ති රාගයට අයත් සර්ගම්, ලක්ෂණ ගීතය සහ මධ්‍යලය ගීතය , රාගධාරි ශිල්ප ක්‍රම භාවිත කරමින් ශිල්පීය කුසලතා වර්ධනය වන අයුරින් ගායනයෙහි, වාදනයෙහි යොදවන්න. ඒකල වශයෙන් පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

(කාලච්ඡේද 03 යි)

- බිහාග් රාගයට අදාළ සර්ගම්, ලක්ෂණ ගීතය සහ මධ්‍යලය ගීතය ගායනයෙහි වාදනයෙහි යොමු කරවන්න. මුලින් අධ්‍යයනය කල රාග වලින් වෙනස් වන ස්වභාවය පිළිබඳව වටහා දෙන්න. විවාදි ස්වරය යොදාගන්නා ආකාරය පිළිබඳ අවබෝධ කරවමින් ශිල්පීය දක්ෂතා වර්ධනය වන ආකාරයට ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 03 ය

- ඇමුණුම් අංක 01 හි දක්වෙන සර්ගම් මේ සඳහා තෝරා ගන්න.
- ඇමුණුම් අංක 02 හි දක්වෙන මධ්‍යලය ගීත වලින් කැමති ගීතයක් තෝරාගන්න.

ඇමුණුම 01

- පහත දක්වෙන සර්ගම් මුල් පාදයන්ට අයත් , සර්ගම් ගීත යොදාගන්න.

1.	බාගේශ්‍රී රාගය	රි ස x	නි̇ ධ̇ නි̇ 2	ස - 0	ම ග ග 3
2.	දේස් රාගය	නි ධ ප ම 2	ග රි ග ස 0	රි රි ම ප 3	නි නි ස̇ - x
3.	තිලක්කාමෝද්	නි̇ ප̇ නි̇ ස x	රි ග නි̇ ස 2	රි ග රි ප 0	ම ග නි̇ ස 3
4	ජයජයවන්ති	ප̇ ප̇ x	රි රි රි 2	රි රි 0	රි ග ස 3
5	බිහාග් රාගය	ග - ස - x	- ග - ම 2	ප නි - ප 0	- ග - ම 3

ඇමුණුම අංක 02

පහත සඳහන් හින්දි ගීත ඇතුරින්, කැමති මධ්‍යලය ගීත තෝරා ගත හැකි ය. සිංහල, බසින් රචිත ගීත යොදාගන්නේ නම්, භාවික ගීත, බ්‍යාල ගීත, අභිනව මූලික ගීත, රාගධාරී සිංහල ගීත, බ්‍යාල ගීත පොත් වලින් මධ්‍යලය ගීත තෝරා ගත හැකි ය.

1. බාගේශ්‍රී රාගය - 1. බල්මා මෝරේ තෝරේ සංග
   2. කෞන කරත තොරි බිනති පියරවා
   3. යේ හෝ දාය දාය ගර ලා ගුං

2. දේස් රාගය 1. මේ හාරේ බන බන ඩාරඩාර
   2. රබගුණා ගායරේ තු මනා
   3. රමාපති රාම තුමිර බව චරනා
   4. පාරල ගාදේ

3. තිලක්කාමෝද් 1. නීර භරන කෙසෙ ජාංඋං සබී අබ

4. ජයජයවන්ති 1. දාමිනි දමකේ ඩර මොහෙලාගී
   2. රේ ගන ජායේ කාරි බදරියා

5. බිහාග් 1. අබ හුං ලාලන මෙකා ජුග බීතගයේ
   2. බාල මුරේ මොරෙ මනකේ
   3. බාජොරෙ මොරෙ පායල ජනන ජනන

ඇගයීම - ඒ ඒ කාලච්ඡේද අවසානයේ ප්‍රායෝගික කොටස් ඒකල ව හෝ කණ්ඩායම් වශයෙන් ගැයීමට වැයීමට යොමු කරන්න.

- ඉහත රාගයන්ගේ සුවිශේෂ ලක්ෂණ හතර බැගින් ලියන්න.

මූලාශ්‍ර - ක්‍රමික පුස්තක මාලිකා III කාණ්ඩය
සම්භාව්‍ය සංගීත ඩිප්ලෝමා - ප්‍රේමදාස මුදුන්කොටුව
බ්‍යාල ගීත - ආනන්ද ජයසිංහ
භාවික ගීත - වින්සන්ට් සෝමපාල
රාගධාරී සිංහල ගීත - ශාන්ති ගීත දේව

ඇගයීම - 02

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 1.2

උත්තර භාරතීය සංගීතයට අයත් රාගකිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයේ වාදනයේ යෙදේ.

2. විෂය සන්ධාරය -

නිර්දේශිත රාගවල සර්ගම්, ලක්ෂණ ගී සහ මධ්‍යලය ගී ගායනය / වාදනය නිර්දේශිත රාගවල රාග විස්තර සහ එහි සම විෂමතා හඳුනා ගැනීම.

3. උපකරණයේ සවභාවය

ප්‍රායෝගිකව ගායනයේ / වාදනයේ යෙදවීම.

4. කාලය කාලච්ඡේද 02

5. අරමුණු -

- රාගධාරී ගීත නිවැරදිව ගායනය / වාදනය කරයි.
- රාග ස්වභාව පැහැදිළි කරයි.
- රාගයන්ගේ සම විෂමතා පැහැදිලි කරයි.
- රාගාධාරී සංකල්ප කිහිපයක් පිළිබඳව පැහැදිලි කරයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- බාගේශ්‍රී, දේස්, තිලක්කාමෝද්, ජයජයවන්ති බිහාග් යන රාගවලට අයත් සර්ගම්, ලක්ෂණ, ගී හා මධ්‍යලය ගී අතරින්

1 අහඹුලෙස තෝරාගත් රාගයකට අයත් සර්ගම් ගීතයක් ගායනයට සලස්වන්න.

2 සර්ගම් ගීතය අයත් රාගය හැර ඉතිරි රාග හතරෙන් අහඹුලෙස තෝරාගත් රාගයට අයත් ලක්ෂණ ගීතයක් හෝ මධ්‍යලය ගීතයක් ගායනයට සලස්වන්න.

3. ඉහත රාග 5 න් 4කට අයත් ස්වර සංගති 4 ක් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

4. සමප්‍රකෘති රාග සන්සන්දනය කරවන්න.

5. ඉදිරියේ දැක්වෙන ප්‍රශ්න 8 ඉදිරිපත් කර වාචිකව හෝ ලිඛිතව පිළිතුරු ලබා ගන්න. (එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් පිළිතුරු 8 ට ලකුණු හතරකි)

1 රි ප වාදි සංවාදී වන රාග නම් කරන්න.

2 රාත්‍රී කාලයේ දී ගැයීමට නියමිත රාග නම් කරන්න.

3 ම ස වාදී සංවාදී වන දිවාකාලයේ ගැයෙන රාග නම් කරන්න.

4 ධ නි රි, රි ග රි ස ස්වර සංගතියේ යෙදෙන රාගය සොයන්න.

5 ඖඩව - සම්පූර්ණ ජාති රාග තුනක් නම් කරන්න.

6 නිෂාදය දෙආකාරයෙන් ම යෙදෙන රාගය නම් කරන්න.

7 ග ම ගි ස, නි ප වශයෙන් මීන්ඩ් සහිත ස්වර සංගති යෙදෙන රාගය නම් කරන්න.

8 දේස්, තිලක්කාමෝද්, රාග දෙකෙහි ආරෝහණයේ දැක්වෙන ප්‍රධාන වෙනසක් නම් කරන්න.

නිර්ණායක -

1	සර්ගම් ගීතය නිවැරදිව ගායනය කිරීම	ලකුණු 04
2	ලක්ෂණ ගීතය හෝ මධ්‍යලය ගීතය නිවැරදිව ගායනය / වාදනය කිරීම	ලකුණු 04
3	රාග සංගතිවලට අයත් ස්වර ඛණ්ඩ හතරට	ලකුණු 04
4	සම ප්‍රකෘති රාග දෙකක් සසඳමින් ඉදිරිපත් කරන ස්වර ඛණ්ඩ දෙකට	ලකුණු 04
5	ප්‍රශ්න අටකට පිළිතුරු සැපයීමට	ලකුණු 04

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.3 : සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.3.1 : ආලාප වර්ග සහ තාන වර්ග හඳුනා ගනිමු.

කාලය : කාලච්ඡේද 04 යි

ඉගෙනුම් ඵල :
- ආලාප සහ තාන නිර්වචනය කරයි.
- ආලාප වර්ග සහ තාන වර්ග හඳුනා ගැනීම කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාවක් හා තබ්ලාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :
- ආලාප සහ ආලාප වර්ග
- තාන සහ තාන වර්ග, පිළිබඳව සිද්ධාන්තමය වශයෙන් අවබෝධය ලබා දීම මෙම ක්‍රියාකාරකම මගින් අපේක්ෂිත ය. මේ සඳහා සිද්ධාන්ත කොටස් ඇතුළත් වනසේ කියවීමේ පත්‍රිකා ඔබ විසින් සකස්කර ගත යුතු ය.
- කියවීම් පත්‍රිකාවලට අනුකූලවන සේ, කාර්ය පත්‍රිකාවක් සකස් කොට කණ්ඩායම්වලට බෙදා දීමට හැකිවන පරිදි සකස් කරගන්න.
- ක්‍රියාකාරකම් අවසානයේ දී සිසුන්ගේ අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට අවශ්‍ය තොරතුරු නිවැරදි කර දීමට සහාය වන්න.
- ආලාප, ආලාප වර්ග, තාන, තාන වර්ග යන කරුණු පිළිබඳව සටහනක් ගුරුවරයා විසින් ගොඩනගා ගත යුතු වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

ප්‍රවේශය - ආලාප සහ තානාලංකාර ඇතුළත් වන සේ නිර්දේශිත රාගයක මධ්‍යලය ගීතයක් ශ්‍රවණයට යොමු කරවන්න. (ගුරුවරයා ගායනය කර දක්වමින් හෝ ශ්‍රව්‍ය පටයක් මගින්)

- ගුරුවරයා විසින් සකස් කළ පත්‍රිකාව සහ කාර්ය පත්‍රිකා කණ්ඩායම් අතරේ බෙදා දෙන්න.
- ආලාප වර්ග වලට අදාළ වන සේ තෝරාගත් රාගයකින් ප්‍රායෝගිකව ගායනය කරමින් පැහැදිලි කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම් අංක 02 ට අයත් පත්‍රිකා බෙදා දෙන්න.
- තාන වර්ග හඳුන්වා දෙමින්, විවිධ තාන ගායනා කර දක්වමින් පැහැදිලි කරන්න.

(කාලච්ඡේද 02)

ක්‍රියාකාරකම් අංක 01 හි ආලාප සහ ආලාප වර්ග පිළිබඳව, ගුරු වරයා විසින් සකස් කරගත් කියවීම් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න. පහත දැක්වෙන මාතෘකා අනුව කෙටි සටහනක් ගොඩ නගන්න.

- ආලාප යන්න නිර්වචනය කරන්න.
- ආලාප වර්ග හඳුන්වන්න.
- එක් එක් ආලාප වර්ගයට නිදසුන් දක්වන්න.
- 'තාන' යන්න නිර්වචනය කරන්න.
- තාන වර්ග නම් කරන්න.
- එක් එක් වර්ගයට අයත් තාන නිර්මාණය කරන්න.
- නිර්දේශිත රාගයකට අදාළ වන සේ එක් එක් වර්ගයට අයත් වන ලෙස එක් තානා ලංකාරය බැගින් නිර්මාණය කරන්න.
- ශිෂ්‍යයා කැමති ආලාප වර්ගයක් හා තානාලංකාර වර්ගයක් තෝරාගෙන නිර්දේශිත රාගයකට අනුව තම හැකියාවන් ප්‍රායෝගිකව ඉදිරිපත් කරන්න.

ඇගයීම -

- ආලාප ගායනයක සුවිශේෂ ලක්ෂණ මොනවා ද?
- තානාලංකාර ගායනයෙහි දැකිය හැකි සුවිශේෂතා මොනවා ද?

මූලාශ්‍ර -

- පෙර දිග සංගීතය - බී. එස්. විජේරත්න
- සිද්ධාන්ත සම්භාව්‍ය සංගීතය - ශාන්ති ගීත දේව

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.3 : සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.3.2 : රාගධාරි සංගීතයේ ශිල්ප ක්‍රම හඳුනා ගනිමු.

ඉගෙනුම් ඵල :
- හින්දුස්ථානි සංගීතයේ ගායන වාදන ශිල්ප හඳුනා ගනියි.
- එම ශිල්ප ක්‍රම ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමේ කුසලතාවය ලබයි.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් :
- සංගීත - ප්‍රේමවංශ හපුවලාන
- පෙරදිග සංගීත ශාස්ත්‍රය - බී එස්. විජයරත්න
- රාග සංකල්ප - ජාතික අධ්‍යාපන ආයතනය - දුරස්ථ ගුරු පුහුණු පාඨමාලාව.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- හින්දුස්ථානි සම්භාව්‍ය සංගීතයේ ගායන වාදන ශෛලීන් සඳහා භාවිත කරන මීන්ඩ්, ගමක්, ඛන්, මුර්කි උපජ්, ඣලා, තිහායි වැනි සුවිශේෂී ශිල්ප ක්‍රම පිළිබඳ සිද්ධාන්තමය සහ ප්‍රායෝගික වශයෙන් හඳුනාගනිමින් ගායනවාදන ඉදිරිපත් කිරීමේ කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිතය.

- මීන්ඩ් , ගමක් , ඛන් , මුර්කි යන සංකල්පයන්හි ස්වභාවය පැහැදිලි කිරීම සඳහා එක් කාලච්ඡේදයක්ද උපජ්, ජලා, මුඛඩා සහ තිහායි යන ශිල්ප ක්‍රම පැහැදිලි කිරීම සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.

- ඉහත සඳහන් ශිල්ප ක්‍රම ඇතුළත් ගායන / වාදන කෘතියක් සුදානම් කරගන්න.

- මෙම ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධය , ප්‍රායෝගික වශයෙන් දැනුවත් කරවීම වඩා වැදගත් ය.

- රාගධාරි ගයන වාදන විස්තාරණයේ දී මුඛඩාව සහ සමග්‍රහය වැනි අංග යොදාගන්නා අයුරු

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය-

- ඇමුණුම් අංක 01 හි සඳහන් කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න. මීන්ඩ්, ගමක් , ඛන් , මුර්කි යන පාරිභාෂික පද පිළිබඳ ව අදහස් දැක්වීමට එක් එක් ශිෂ්‍යාට අවස්ථාව දෙන්න. සිසුන් සමග එක් එක් සංකල්පය පිළිබඳව සාකච්ඡා කරන්න. මීන්ඩ් හා ගමක් පිළිබඳව ප්‍රායෝගික අධ්‍යයනයක මීට පෙර යෙදී ඇති ආකාරය මතකයට නගන්න.

- ඇමුණුම අංක 02 හි දැක්වෙන පහත දැක්වෙන ස්වර සංගති ගායනය / වාදනය කර දක්වමින් ශිල්ප ක්‍රම පිළිබඳව ප්‍රායෝගිකව අභ්‍යාසයෙහි යෙදෙන්න.
(කාලච්ඡේද 01)

- උපජ්, ඣලා, මුඛඩා, තිහායි යන කොටස් ඇතුළත් වාද්‍ය ඛණ්ඩයක් ශ්‍රවණයට සළසා එම සංකල්ප පිළිබඳව සිසුන්ට අදහස් දක්වන්න. එවැනි පහසුකම් නොමැති නම් ඉහත කොටස් ඇතුළත් වන සේ වාදන කොටස් ඔබ විසින් ඉදිරිපත් කර එම සංකල්ප පිළිබඳ කෙටි සටහන් සිසුන් ලවා ගොඩ නගන්න.

- ඉහත සඳහන් එක් ශිල්ප ක්‍රමයක් හෝ වාදනය කර පෙන්වමින් සිසුන් දැනුවත් කරන්න. ශිල්ප ක්‍රම වල ස්වභාවය පිළිබඳව සාකච්ඡා කරන්න.
(කාලච්ඡේද 01)

- මෙම ක්‍රියාකාරකමේ දී සාකච්ඡා කළ සංකල්පවලින් අහඹු ලෙස තෝරාගත් සංකල්ප පිළිබඳව අදහස් දැක්වීමට හා නිදර්ශනාත්මකව ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

ඇමුණුම් අංක 01

කියවීම් පත්‍රිකාව

රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම -

මීන්ඩ් :- එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නො කඩවා පවත්වා ගනිමින්, හඬ පාලනය කරමින් කරනු ලබන ගායනය වාදනය මීන්ඩ් නමින් හැඳින්වේ. මෙහි දී ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොබිඳී ගායනය වාදනය කිරීම සිදුවේ. රාග ගායන වාදනයෙහි දී , ස්වර ආරෝහණ සහ අවරෝහණ දෙපක්ෂයටම උචිත හා අදාළ පරිදි මීන්ඩ් යොදා ගැනේ.

උදා- තිලක්කාමෝද් රාගයෙහි ස ප භාගේශ්‍රී රාගයේ ධ ම මීන්ඩ් ස්වර සංගතිය. [සරෝද්, සාරංගී, වයලින් වැනි භාණ්ඩයන්ගෙන් කෙරෙන මීන්ඩ් වාදනය 'සුත්' නමින් හැඳින්වේ.] ගායන හා වාදන ශෛලීන්හි විවිධත්වය නිසා නම් දෙකකින් හැඳින්වුවත් ධවනියෙහි කිසිදු වෙනසක් නොවේ.

ගමක් :- ස්වර විචිත්‍රකරන, අලංකාරවත් කරන සෑම ක්‍රමයකටම සාමාන්‍යයෙන් ගමක යැයි කිව හැකි ය. හින්දුස්ථානී සංගීතයේ ස්වර කම්පනය කළ යුත්තේ වෙනත් ස්වරයන්ගේ ආධාරයෙනි. ඒ අනුව ස්වර චලනය කරමින් ගායනය කිරීම ගමක් යැයි හැඳින්විය හැකි ය. පැරණි ග්‍රන්ථවල ගමක 15 ක් පිළිබඳ සඳහන් වේ. වර්තමානයේ හින්දුස්ථානි සංගීතයේ භාවිත වන 'තාන' ගායන වාදනයෙහි දී ගාම්භීර ප්‍රකෘතියෙන් යුතුව හඬ ලෙලවා මිහිරි ලෙස ගැයීම ගමක් වේ.

බන් :- රාගයන්ගේ රස නිෂ්පත්තිය සඳහා ඇතැම් ස්වරයක් තවත් ස්වරයක අල්ප ස්පර්ශයක් ඇතිව භාවිත කරනු ලැබේ. මෙය බණ්නමින් හැඳින්වේ. මෙය ගායනයේ දී මෙන්ම වාදනයේ ද යෙදේ. යම්කිසි ස්වරකට පළමුවෙන් ලැබෙන ස්වරය හෝ පහසුව ලැබෙන ස්වරය 'බන්' වශයෙන් යොදාගත හැකි ය. මෙසේ ස්වර කිහිපකට ඇතින් පිහිටි ස්වර වුවද ස්පර්ශ කළ හැකි ය. එය කළ යුත්තේ මනා පුහුණුවකින් පසුවය. ස්වර ලියා දැක්වීමේ දී ප්‍රධාන ස්වරයට වම් පසින් කුඩාවට ස්පර්ශ කරන ස්වරය ලියා දැක්විය යුතු ය. උදා ම ප, ධ ස, ග රි, රි ග.

උපජ් :- රාගයක් ඉදිරිපත් කිරීමේ දී කරනු ලබන නිර්මාණාත්මකව ක්ෂණිකව ගොඩනගා ගන්නා නාද විග්‍රහ උපජ් ලෙස කෙටියෙන් හැඳින්වේ.

උදා - කිසියම් ඛ්‍යාල් හෝ ගත් වාදනයක මුඛඩා කොටස විවිධ ආකාරයෙන් විවිධ නාද මාලාවන්ට හෝ විවිධ ලයකාරීත්වයෙන් හෝ ඉදිරිපත් කිරීම.

මුර්කි :- කිසියම් ස්වරයක් එහි දෙපස ඇති ස්වර ඇසුරු කොට ගනිමින් චලනය කොට ගැයීම මුර්කි ලෙස හැඳින්වේ. බොහෝ විට මුර්කි ස්වර ලෙස යොදා ගනුයේ ස ම ප යන ස්වරයන්ය. මෙහි දී මුර්කි වන සවරය . මැදි කොට දෙපස ස්වර චලනය වේ. මුර්කි ස්වරය ලිවීමේ දී ස්වරය වරහන් තුළ යොදනු ලැබේ.

උදා - (ස) සසරි(**ස**)නිපම - මමප(**ම**)ගම ප - පපධ**ප**මප

මුඛඩා - ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමස්ථානයට ප්‍රවිශ්ට වන තෙක් ගැයෙන කොටස මුඛඩා නමින් හැඳින්වේ.

තිහායි මුඛඩාව හෝ නිශ්චිත ස්වර කොටසක් , තෙවරක් ගායනය හෝ වාදනය කර දක්වමින් සමස්ථානයට පැමිණීම.

ඇමුණුම අංක 02

මීන්ඩ්

1. නි̣ ස ග ම ග ස, ස නි̣ ප̣ ප̣ නි̣ ස - බිහාග්

ස ම , ම ග රි ස, ස ගම ධ ම ග, ම, ග, රි, ස - භාගේශ්‍රී

2. ගමක් (පහත තාන ගමක් අනුසාරයෙන් ගැයීය/ වැයීය හැකි ය)

නි̣සගගරිස, ගමපනිනිප ගමගගරිස - බිහාග්

මමරිස, පපමමරිස, නිනිපපමමරිස - බ්‍රින්ද්‍රවනීසාරංග

ඛන්

ᵃනි̣ ස, රි ᵍග රි ස, ᵑ̣ධ̣ - නි̣ ᵍරි - ජයජයවන්ති

ᵃ නි̣ ස , ᵃම ග රිස, ᵃනි̣ ධ̣ ස, ᵃම ග, ᵃරි ස - බාගේශ්‍රී

මුර්කි

නි̣ ස ග ම (ප), ග ම ග - ස, (ස) නි̣, ප̣ නි̣ ස - බිහාග්

නි̣ ස රි ම ප, (ප) ම ප ම රි , (ස) නි̣ ප̣ නි̣ ස - බ්‍රින්දාවනී සාරංග

ඇගයීම -

- ඔබ ඉගෙනගත් රාග ඇසුරින් මීන්ඩ්, ගමක්, ඛන්, මූර්කි වැනි සුවිශේෂ ක්‍රම ශිල්ප යෙදී ඇති තැන් පැහැදිලි කර දක්වන්න.
- උපජ්- ඣලා - මුඛඩා - තිහායි යන සංකල්ප පැහැදිලි කරන්න.

මූලාශ්‍ර -

- සංගීත - ප්‍රේමවංශ හපුවලාන
- පෙරදිග සංගීත ශාස්ත්‍රය - බී. එස්. විජයරත්න
- රාග සංකල්ප - ජාතික අධ්‍යාපන ආයතනය - දුරස්ථ ගුරු පුහුණු පාඨමාලාව.

Upaj (Upajna to be created)

The term refers to improvisation on a short phrase from a musical composition. the product being discribed as upaj in order to stress the aspect of creativity in the venture.

A concise Dioctionary of Hindustani Music
Ashok Da Ranade - 2006
Page - 275

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.3 : සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.3.3 : ආලාප හා තානාලංකාර සමග මධ්‍යලය ගීත ගයමු වයමු.

කාලය : කාලච්ඡේද 15 යි

ඉගෙනුම් ඵල :
- ආලාප වර්ගවලට අදාළව ආලාප ඉදිරිපත් කරයි.
- තාන වර්ගවලට අදාළව තාන ඉදිරිපත් කරයි.
- නිර්දේශිත රාගවලට ආලාප තාන් ඉදිරිපත් කරයි.

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: බාගේශ්‍රී, දේස් . තිලක්කාමෝද්, ජයජයවන්ති බිහාග් යන රාග පහට අදාළ ව ආලාප, තාන් සහ විශේෂ ස්වර සංගති පිළිබඳව ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමේ කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිතය. ඉහත ක්‍රියාකාරකම තුළින් අධ්‍යයනය කළ ආලාප වර්ග සහ තානවර්ග වලින් පහක් හෝ හයක් සෑම රාගයකින්ම ආවරණය වනසේ පුහුණු කළ යුතු ය. රාගවලට සුවිශේෂ වූ ස්වර සංගතීන් යෙදෙන පිළිවෙළ ප්‍රායෝගිකව දැනුවත් කළ යුතු වේ. විශේෂ ස්වර සංගති හා ආරෝහණ අවරෝහණ ස්වරූපයන් පදනම් කරගෙන සිසුන් සමග කෙටි ආලාප ඛණ්ඩ ගොඩ නැගෙන ක්‍රියාකාරකම් හා ගායනය / වාදනය හුරු කරවන්න.

එක් රාගයකට කාලඡේද 03 බැගින් රාග 5 ට කාලච්ඡේද 15 කි. මෙහි දක්වෙන්නේ භාගේශ්‍රී රාගයට අදාළව ක්‍රියාකාරකම් සංවර්ධන කිරීමයි.

- දේස්, තිලක්කාමෝද්, ජයජයවන්ති, බිහාග් යන රාග සඳහා ද තාන, ස්වර සංගති හා ආලාප ඉහත ක්‍රම ශිල්ප අනුගමනය කරමින් ගායනය / වාදනය අභ්‍යාසවල යොදවන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- බාගේශ්‍රි රාගයේ මධ්‍යලය ගීතයට ගැළපෙන සේ මෙතෙක් සිසුන් විසින් අධ්‍යයනය කළ තානාලංකාර වර්ග වලට ද අදාළ වනසේ ගුරුවරයා විසින් ගොඩ නඟාගත් තානාලංකාර ගායනයේ /වාදනය අභ්‍යාසයන්හි යොදවන්න. සුදුසු තානාලංකාර නිර්මාණය කරගන්න.

  (කාලච්ඡේද 01)

- බාගේශ්‍රී රාගයේ විශේෂ ස්වර සංගති කිහිපයක් මතු කර ගනිමින් ඒවායේ ඇති රාග ස්වභාවය, ආරෝහණ අවරෝහණ ස්වරූපය වාදි සංවාදී, ග්‍රහ, අංශ, න්‍යාස ස්වර පිළිබඳ අවධානය යොමු කරවමින් ස්වර සංගති හතරක් වත් යොදා ගන්න. මේ පිළිබඳව ඔබට මග පෙන්වීමට ඇමුණුම් අංක 01 යටතේ විශේෂ ස්වර සංගති ඇතුළත් සටහනක් යොදා ඇත.

  (කාලච්ඡේද 01)

- බාගේශ්‍රී රාගයේ රාගභාවය, රාග රසය, ගති ලක්ෂණ මතුවන ආකාරයේ ආලාප ඛණ්ඩ කිහිපයක් නිර්මාණය කර ගන්න. මෙම ආලාප ඛණ්ඩ පූර්වාලාප වශයෙන් සහ මධ්‍යලය ගීතය සමග මධ්‍යාලාප යොදා ගැනීමට මග පෙන්වන්න.

(කාලච්ඡේද 01)

ඇමුණුම් 01

පහත දැක්වෙන රාග විස්තාරය උදාහරණයට ගනිමින් අනෙකුත් රාග සඳහා ද, රාග සංගති විදහා දැක්වෙන පරිදි වර්ධනය කරමින් රාග විස්තාර සකස් කරගන්න. මෙම රාග විස්තාර, වරෙක ආලාපයක් ලෙස ද, පල්ටාවක් ලෙසද, තානාලංකාර ලෙසද, යොදා ගැනීමට ඇති හැකියාව සිසුන්ට මගපෙන්වන්න. ගුරුවරයාට අවශ්‍ය පරිදි, ස්වර විස්තාර සංශෝධන කරගත හැකි ය.

උදා - දේස් රාගයට අයත් ස්වර විස්තාර :-



ඇගයීම -

රාග	ආලාප කොටසක් ලියන්න	පල්ටාවක් ලියන්න	තානාලංකාරයක් ලියන්න
බිහාග්			
තිලක්කාමෝද්			
ජයජයවන්නි			
භාගේශ්‍රී			

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.3 : සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.3.4 : රාග විස්තාර කරමින් ආලාප ගයමු.

ඉගෙනුම් ඵල :
- නිර්දේශිත රාගවලට අදාළව කෙටි ආලාප ඛණ්ඩ හඳුනා ගනියි.
- නිර්දේශිත රාගවල රාග විස්තර හඳුනා ගනියි.
- රාගවිස්තර ගායනා කරයි.
- ආලාප ගායනා කරයි.

කාලය : කාලච්ඡේද 05 යි

ගුණාත්මක යෙදවුම් :
- සර්පිනාව/ තාම්පුරාව
- සංගීත ගුරුවරයා - මොඩියුලය ජාතික අධ්‍යාපන ආයතනය

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: බාගේශ්‍රී, දේස් , තිලක්කාමෝද් ජයජයවන්ති, බිහාග් සහ නිර්දේශිත රාගවලට අදාළව, රාග විස්තාර හෝ කෙටි ආලාප ඛණ්ඩ සකස් කිරීම සහ ප්‍රායෝගිකව ගායනය / වාදනය කිරීමේ කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකම තුළින් අපේක්ෂිතය.

මීට පෙර අධ්‍යයනය කළ ශිල්ප ක්‍රම පිළිබඳ ව මතකයට නංවමින්, රාග ස්වභාවය, රාග භාවය, ප්‍රදර්ශනය කිරීම සඳහා එහි ඇති වැදගත්කම ගැන අවබෝධ කරවන්න.

පූර්වාලාප, මධ්‍යාලාප (බඩත් ආලාප) පිළිබඳ දැනුවත් කරන්න.

එක් රාගයකින් ආලාප ඛණ්ඩ සකස් කරමින් ප්‍රායෝගිකව ඉදිරිපත් කිරීමට එක් කාලච්ඡේදය බැගින්, රාග 05 ට කාලච්ඡේද 05 ක් යොදා ගන්න.

නිදසුන් සහිත ඇමුණුම් 01 කියවීම් පත්‍රිකාව උපකාර කරගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- බාගේශ්‍රී රාගයේ ආරෝහණ, අවරෝහණ ස්වර ගායනය / වාදනයට සලස්වන්න. එහි ස්වර රටාව අනුව, එක් එක් ස්වරය යොදාගනිමින්, ස්වර විස්තාර වන බව පැහැදිලි කරන්න. ඒ අනුව කෙටි ආලාප ඛණ්ඩ සාදාගන්නා අයුරු ප්‍රායෝගිකව ගයා වයා පෙන්වන්න. කියවීම් පත්‍රිකාව නිදසුන් ලෙස යොදා ගනිමින් සිසුන් ලවා කෙටි ආලාප ඛණ්ඩ සකස් කරවන්න. පන්තියට ඉදිරිපත් කරවන්න.

(කාලච්ඡේද 01)

- දේස්, තිලක්කාමෝද්, ජයජයවන්ති සහ බිහාග් යන රාග වලින් ද ඉහත සඳහන් ක්‍රම ශිල්ප අනුගමනය කරමින් ගායනය / වාදනය අභ්‍යාසයේ යොදවන්න.

(කාලච්ඡේද 04)

.ක්‍රියාකාරකම් අංක 01:-

- නිවැරදිව ශ්‍රැතියෙහි පිහිටුවන්න.
  බාගේශ්‍රී රාගයෙහි ආරෝහණ අවරෝහණ ස්වර ගයා වයා දක්වමින්, ස්වර විස්තාරවන පිලිවෙළ පැහැදිලි කරන්න. ඇමුණුම් අංක 01 හි දැක්වෙන කියවීම් පත්‍රිකාව අධ්‍යයනයට සලස්වන්න. කෙටි ආලාප ඛණ්ඩ සකස් කරවන්න.
  සිසුන් සකස් කරගත් ආලාප ඛණ්ඩ මධ්‍යලය ගීතය ගැයීමට පෙර, පූර්වාලාප වශයෙන් ඉදිරිපත් කරවමින් ගීතය මැද තාලය පිළිබඳ අවධාරණය කරමින් මධ්‍යාලාප භාවිත කරන අයුරු නිදසුන් මගින් පෙන්වන්න. පන්තියට ඉදිරිපත් කරවීමට සහාය වන්න.

- දේස්, තිලක්කාමෝද් , ජයජයවන්ති සහ බිහාග් රාග සඳහා ද ඉහත සඳහන් ක්‍රම ශිල්පය අනුගමනය කරන්න.

ඇමුණුම් 01

නිර්දේශිත රාගවලට අයත් රාග විස්තර

ගුරුවරයා විසින් සකස් කරන ලද රාග විස්තාර උදාහරණයට ගනිමින්, අනෙකුත් රාග සඳහා ද රාග සංගති විදහා දැක්වෙන පරිදි වර්ධනය කරමින් රාග විස්තාර සකස් කරන්න. එම රාග විස්තාර ආලාපයක් ලෙසද පල්ටාවක් ලෙසද තානාලංකාර ලෙස ද යොදා ගැනීමට සිසුන් පුහුණු කරවන්න. අවශ්‍ය පරිදි ඔබට සංශෝධනය කර ගත හැකි ය.

ඇගයීම -

- නිර්දේශිත රාගවලට අයත් කෙටි ආලාප ඛණ්ඩයක් බැගින් ලියන්න.

ඇගයීම 03

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගීවන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍ය ප්‍රදර්ශනය කරයි.

2. විෂය සන්ධාරය -

ආලාප වර්ග, තාන වර්ග මීන්ඩ්, ගමක් , මුර්කි, ඛන්, උපජ්, ඣලා, මුඛඩා සහ තිහායි යන ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධය, කෙටි ආලාප, සුවිශේෂ ස්වර සංගති.

3. උපකරණයේ සවභාවය

ශිල්ප ක්‍රම පිළිබඳ පැහැදිලි කිරීම
ප්‍රායෝගිකව ගායනයේ / වාදනයේ යෙදීම

4. කාලය කාලච්ඡේද 02

5. අරමුණු -

- ශිල්ප ක්‍රම පිළිබඳව පැහැදිලි කරයි.
- නිර්දේශිත රාගයන්හි කෙටි ආලාප ඛණ්ඩ ලියා දක්වයි.
- නිර්දේශිත රාගවල මධ්‍යලය මධ්‍යලයට ගීතවලට අයත් විවිධ තාන වර්ග භාවිත කරමින් ගායනය/වාදනය කරයි.
- රාගවලට අයත් ස්වර සංගති ලියා දක්වයි.
- ස්වර සංගති ගායනය/වාදනය කරයි.
- සංකල්ප වල වෙනස්කම් ලියයි.

6 උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- ආලාප සහ තාන යොදා ගනිමින් මධ්‍යලය ගීත ගායනය වාදනය කිරීමට සලස්වන්න.
- රාගවලට අදාළ වන සේ කෙටි ආලාප ඛණ්ඩ ලිවීමට සලස්වන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු රැස් කරන්න.
  - තෝරා ගන්නා ලද රාගයට අදාළව තාන වර්ග වලට අයත් තානාලංකාර 4 ලියන්න.
  - ගායනයේ දී යොදා ගන්නා ශිල්ප ක්‍රම 2 ක් පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
  - වාදනයේ දී යොදා ගන්නා ශිල්ප ක්‍රම 2 ක් පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
  - තෝරාගත් රාගයට අදාළව කෙටි ආලාප ඛණ්ඩයක් ස්වර 30 කට නො අඩුව ලියා දක්වන්න.

නිර්ණායක -

1	තෝරාගත් ගීතය, පූර්වාලාප සහ මධ්‍යාලාප වශයෙන් ගායනය/ වාදනය කිරීමට	ලකුණු 04
2	තෝරාගත් ගීතය තානාලංකාර සමඟ ගායනය/ වාදනය කිරීමට	ලකුණු 04
3	අහඹු ලෙස නම් කරන ලද ශිල්ප ක්‍රමයක් ප්‍රායෝගිකව ගයා/වයා දැක්වීමට	ලකුණු 04
4	සංකල්ප පිළිබඳ වෙනස පැහැදිලි කිරීම	ලකුණු 04
5	තෝරාගත් රාගවල සංගති කිහිපයක් ලිවීමට හෝ කෙටි ආලාප ඛණ්ඩයක් ලිවීමට	ලකුණු 04

ක්‍රියාකාරකම් සැලසුම -15

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.1 : රිද්මයේ හා තාලයේ වෙනස දකිමු.

ඉගෙනුම් ඵල :
- රිද්මය සහ තාලය නිර්වචනය කරයි.
- රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ හඳුනා ගැනීම කරයි.
- රාගවිස්තර ගායනා කරයි.
- ආලාප ගායනා කරයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :
- තබ්ලාවක් හා වෙනත් සුදුසු තාල වාද්‍ය භාණ්ඩයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: මෙම සංකල්ප පැහැදිලි කිරීම තුළින් නිර්මාණශීලීව සිතීමට යොමු කිරීම මින් අපේක්ෂා කෙරේ. අනාසාතාත්මක ගීතයක ඇත්තේ රිද්මයකි. ආසාතාත්මක ගීතවල රිද්මය හා තාලය යන දෙකම ඇත. එමනිසා එවැනි සංකීර්ණමය සංකල්පයක් පිළිබඳව විචාරශීලීව කරුණු සාකච්ඡා කරන්නටත් ස්වභාවික පරිසරයේ ඇති රිද්මය හා තාලාත්මක ගති ස්වභාවයන් ගවේෂණයට යොමු කිරීමටත් මෙහිදී අපේක්ෂිතය. මහගම සේකර මහතාගේ රිද්මය ග්‍රන්ථය පරිශීලනය කිරීම මෙහිදී වැදගත්වනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- රිද්මය හා තාලය පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. රිද්මයේ හා තාලයේ සමානතා, අසමානතා හා වෙනස දැක්වීම ඇමුණුම අංක 01 හි සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

කාලච්ඡේද -02

ඇමුණුම් - 01

ප්‍රවේශය - ආසාතාත්මක ගීතයක කොටසක් හා අනාසාතාත්මක ගීතයක කොටසක් ගයා පෙන්වන්න. එම ගීත දෙකෙහි තාලය පිළිබඳ වෙනස සාකච්ඡා කරන්න.

පහත සඳහන් පින්තූර සටහන් දෙක ඉදිරිපත් කරන්න. එහි ඇති වෙනස්කම් හඳුනාගන්න. රිද්මය හා තාලය පිළිබඳ සටහනක් ගොඩ නැගීමට අවස්ථා දෙන්න.

රිද්මයම, යම්කිසි ආකාරයක සංවිධිත බවකින් යුක්තවීම තාලයයි.



- පින්තූර සටහන් දෙක අතර ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න.
- පරිසරයේ රිද්මය ඇති ස්ථානවලට නිදසුන් දෙන්න.
- තාලය හා රිද්මය යන්න කෙටියෙන් හඳුන්වන්න.
- පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
  - එකිනෙක රිද්මයට ආවේනික ලක්ෂණ ඇති බව
  - එක් එක් රිද්මයක් අතර නිශ්චිත සමාන බවක් නැති බව
  - එකම වර්ගයක වස්තූන් හා අවස්ථාවන් අතර සිද්ධි සංසිද්ධි වල රිද්මය එකිනෙකට සමාන බව.

  එක් එක් ශාකවල ඇති ආවේණික ලක්ෂණ රිද්මය -
  - කොට්ටම්බා/ පොල් /
  - අරලිය/ උණ පඳුරු

  පොල් ගසේ රිද්මය - පොල් ගස

  විදුලි කොටන ආකාරය -

ඇගයීම : රිද්මය හා තාලය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම් සැලසුම -16

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.2 : උතුරු ඉන්දීය තාල පදවල ගති, මිති, ලය යන සංකල්පයන්හි වෙනස දකිමු.

ඉගෙනුම් ඵල :
- තාලවල විවිධ ගති ලක්ෂණ හඳුනා ගැනීම කරයි.
- ගති, මිති, ලය යන සංකල්පවල වෙනස හඳුනා ගැනීම කරයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : තබ්ලාවක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: තාල වල විවිධ ගති ලක්ෂණ හඳුනා ගැනීම මින් අපේක්ෂා කෙරේ. එක් එක් තාල පද වලින් එක් එක් ආකාරයේ ගති ලක්ෂණ මතුවෙන අතර තාල රසභාවයන් ද වෙනස් වේ. නිදසුනක් ලෙස එක ම තාල පදය ශාස්ත්‍රීය ගායනයේ දී හා සරල සංගීතයේ දී යොදා ගන්නා ආකාරය වෙනස් ය. ඒ අනුව එකිනෙක තාල පදවල ගති, මිති, ලය, යන සංකල්පවල ඇති වෙනස සාකච්ඡා කිරීම අපේක්ෂිතය.

කාලච්ඡේද -02

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- තාල පදවල සමාන අසමානතා දක්වමින් කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

ඇමුණුම් අංක 01

ප්‍රවේශය : ඒක්තාලය හා චෞතාලය තබ්ලාවෙන් වයා පෙන්වන්න. නැතහොත් ශ්‍රවණයට සලස්වන්න.

- පහත සඳහන් වගුවේ යොදා ඇති තාල පද හා සම්බන්ධව යේකා ශබ්දනගා කියන්න. වගුවේ ඇති විස්තර මතු කරමින් එකිනෙක තාලපදවල ගති ලක්ෂණ පැහැදිලි කරන්න. උච්චාරණය කරන්න.
- තබ්ලාවකින් වයා පෙන්වන්න නැතහොත් ශ්‍රවණයට සලස්වන්න.
- තාල පදයක කොටස් වන සම්, බලි, අනුතාල, වල ඇති අවශ්‍යතාවය රාග රසභාව ඉදිරිපත් කිරීම සඳහා තාලස්ථාන ද ඉවහල් වන අයුරු පහදා දෙන්න.
- රිද්මයානුකූල ආලාප වැනි දේවල් ඉදිරිපත් කිරීමේ දී නැවත සමග්‍රහයට පැමිණීම සඳහා බලිය අවශ්‍ය වන බව පහදන්න.

තාල පදය	ගති	මිති	ලය
එක්තාල් /චෞතාල්	වෙනස්	සමානයි	සමානයි
ත්‍රිතාල්/ පංජාබ්	වෙනස්	සමානයි	සමානයි
රූපක්	වෙනස්	සමානයි	සමානයි
තිලවඩා / ත්‍රිතාල්	වෙනස්	සමානයි	වෙනස්
දීපචන්දි / ධමාර්	වෙනස්	සමානයි	වෙනස්
රූපක් / දීප්චන්දි	වෙනස්	වෙනස්	සමානයි

එක් එක් තාලපදයේ ගති ලක්ෂණ වෙනස්වීමට හේතු සාකච්ඡා කරන්න.

- අවනද්ධාක්ෂරවල වෙනස්කම් නිසා තාලපදය කණට ඇසෙන ගුණය එකිනෙකට වෙනස්.
- වාදන ශිල්පක්‍රම (සංවෘත- විවෘත බව)
- අවනද්ධාක්ෂර සංයෝගය (ධ්‍රිං ධ්‍රිං ධ්‍රගෙ තිරිකිට)
- මාත්‍රා බෙදී ඇති ආකාරය (පංජාබ් / ත්‍රිතාල්)
- එක සමාන මිශ්‍ර බෙදීමක් වුව ද එක් විභාගයක් තුළ ඇති අවනද්ධාක්ෂර සංයෝගය වෙනස් බව ගති ලක්ෂණය වෙනස්වීමට හේතු ය.
  වාදනයට නියමිත ලය වෙනස් කමද ගති ලක්ෂණය වෙනස්වීමට හේතුවේ.
  (ත්‍රිතාල්/ තිලවඩා)
  (ඒක්තාල් - විලම්භ/ ධ්‍රැත)

ඇගයීම -

- ඒක්තාල් හා චෞතාල් අතර සම විෂමතා දක්වමින් සංසන්දනය කරන්න.
- ත්‍රිතාලයේ යෙදෙන තාල සංඥා නම් කර ඒ එක් එක් සංඥාවෙන් ඉටුවන කාර්යයන් පැහැදිලි කරන්න.
- ආලාප - තානාලංකාර සංසන්දනය කර දක්වන්න.

ක්‍රියාකාරකම් සැලැස්ම -17

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ හා තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.3 : දේශීය තිත් තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත් රූප ප්‍රායෝගිකව භාවිත කරමු.

ඉගෙනුම් ඵල :
- දේශීය තිත් තාල පද්ධතිය හඳුනා ගැනීම කරයි.
- තිත්වලට අදාළ බෙර පද අධ්‍යයනය කරයි.
- දෙතිතේ ප්‍රභේද සමග හින්දුස්ථානි තාල සංසන්දනය කිරීමේ කුසලතාවය ලබා ගනියි.
- ප්‍රායෝගිකව තාලපද ඉදිරිපත් කරයි.

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් :
- තාලම්පටක්, උඩරට සහ පහතරට බෙරයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

දේශීය තිත් තාල පද්ධතිය ගැන තරමක් ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. තාලම්පට තිත්, තෙයි ධ්වනීන් හා බෙරපද පිළිබඳව සිද්ධාන්තමය හා ප්‍රායෝගික අධ්‍යයනය මෙමගින් ලබාදිය යුතු ය. තිත් රූප ප්‍රස්තාර කිරීමත් ප්‍රායෝගිකව අත්තල යොදා පෙන්වීමත් මෙම පාඩමෙන් අපේක්ෂිතය. ආවේනික බෙරවලින් වාදනය කර පෙන්වීමෙන් මෙම පාඩමෙහි ගුණාත්මක බව වැඩිවේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- පහල ශ්‍රේණිවලදී ඉගෙන ගත් තිත් ප්‍රභේද පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න. තනි තිතේ හා දෙතිතේ තිත් රූප වලට අදාළ බෙරපද අත්තල යොදා පෙන්වන්න.
- හෙළ ගී මග පොතෙන් අදාළ අංකවලට අයත් පිටු ඡායා පිටපත් කර සිසුන්ට තොරතුරු සපයන්න.

කාලච්ඡේද 01

- ඇමුණුම අංක 01 ක්‍රියාකාරකමෙහි යොදවන්න.

කාලච්ඡේද 01

ඇමුණුම් - 01

පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡාන මෙහෙයවන්න.

- තනිතිතේ ප්‍රභේද හා උඩරට පහතරට සබරගම් බෙර පද
- දෙතිතේ ප්‍රභේද හා උඩරට පහතරට සබරගමු බෙර පද
- තිත්තෙයි ධ්වනීන් හා ඒවායේ භාවිතය
- තනිතිතේ හා දෙතිතේ ප්‍රභේද සමග හින්දුස්ථානි තාල සංසන්දනය
- සංඛ්‍යාත්මකව තනිතිත, දෙතිත, තුන්තිත හා සිව්තින් ගොඩ නැගෙන අයුරු

ප්‍රවේශය - පහත සඳහන් කරුණු යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

- මාත්‍ර 2, 3 සහ 4 මත් කැටි තනිව හා මිශ්‍රව යොදා ගනිමින් තිත් රූප ගොඩනැගෙන අයුරු. අංක යොදා ගනිමින් පැහැදිලි කරන්න (12 / 1 2 / 1 2/ 1 2) ආදී වශයෙන් තාලම්පට භාවිත කරන්න.

ඇගයීම -
- දේශීය තිත් තාල පද්ධතියට සවිස්තරව දක්වා තාල රූපය අංකන කර දක්වන්න.
- දෙතිතේ තිත් රූප 03 ලියා දක්වන්න.

මූලාශ්‍ර -
- ඩබ්. බී. මකුලොලුව- හෙළ ගීමග පිටු අංක 59-76

නිපුණතාව 08 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ හා තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.4 : කර්ණාටක තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු විමසමු.

ඉගෙනුම් ඵල :
- කර්ණාටක තාල පද්ධතිය පිළිබඳව හඳුනා ගනියි.
- කර්ණාටක තාල සංකේත සහ මාත්‍රා බෙදෙන අයුරු පිළිබඳව අධ්‍යයනය කරයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : මෘදංගයක රූප සටහනක් තාල පද ගොඩ නැගීම දක්වූ දෘශ්‍ය උපකරණයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: ඉතා සංකීර්ණ තාල පද්ධතියක් වන කර්ණාටක තාල පද්ධතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මේ පාඩම තුළින් අපේක්ෂිතය එහි තාල සංඥා තාල රූප සහ රිද්ම රටා පිළිබඳ සිසුන් දැනුවත් වීම මෙයින් බලාපොරොත්තු වේ. මින් ලබන දැනුම පසු කාලයේ තම නිර්මාණ කාර්යයන්හිදී යොදා ගැනීමට සිසුන්ට හැකිවනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- හින්දුස්ථානි හා දේශීය තාල පද්ධතීන් පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දක්වෙන ක්‍රියාකාරකමෙහි යොදවන්න.

කාලඡේද 01

ඇමුණුම් 01

ප්‍රවේශය - පහත දක්වෙන තාල රූපයක් අත්තල යොදා පෙන්වන්න.

තිශ්‍රජාති මධ්‍ය තාලය

1 0 1
3 2 3

/ 1 2 3 / 1 2 / 1 2 3 /

තිශ්‍රජාති තිපුට තාලය

1 0 0
3 2 2

/ 1 2 3 /1 2 /1 2 /

පහත දැක්වෙන කරුණු ඔස්සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- කර්ණාටක තාල හින්දුස්තානි තාල වලට වඩා වෙනස්වන ආකාරය
- කර්ණාටක තාල පද්ධතියේ ප්‍රධාන තාල 07
- තාල ලිවීමට යොදාගන්නා සංකේත 06
- ලඝු සංකේතයට යෙදෙන මාත්‍රා සංඛ්‍යාවේ වෙනස්කම් මත ගොඩනැගෙන ජාති 05
- ප්‍රධාන තාල 07 සහ ජාති 05 වර්ග වී ගොඩ නැගෙන තාල 35 සහ ඒ හා සම්බන්ධ තාල සංකේත, මාත්‍රා බෙදෙන අයුරු.
- සම්පූර්ණ මාත්‍රා ගණන දැක්වෙන වගුවක් නිර්මාණය
- උතුරු ඉන්දීය තාල පිළිබඳ ලිපි ක්‍රමය අනුව කර්ණාටක තාල කිහිපයක් අංක හා සංකේත මගින් ලියා දැක්වීම.
- කර්ණාටක තාල වලට ගැලපෙන පරිදි තාල නම් කිරීම.
  (තිශ්‍ර ජාති, චතුශ්‍ර ආදී වශයෙන්)
- ආවේණික උච්චාරණයෙන් සහිතව අත්තල යොදා පෙන්වීම.

ඇගයීම -

- කර්ණාටක තාල හා හින්දුස්ථානි තාල අතර සංසන්දනයක් කරන්න.
- කර්ණාටක තාල ලිවීමේ දී යොදාගන්නා සංකේත ලියා හඳුන්වන්න.

මූලාශ්‍ර -

- ප්‍රේමවංශ හපුවලාන - 'සංගීත' - පිටු අංක 115 - 120 ද
  වින්සන්ට් සෝමපාල - 'දසතාල ලක්ෂණ' - පිටු අංක 81 -91

ක්‍රියාකාරකම් සැලසුම -19

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.5 : ත්‍රිතාල්, ජප්තාල්, දීප්චන්දි, දාදාරා හඳුනා ගැනීමේ අභ්‍යාස හා සමගුණ දෙගුණ නිරූපණය කරමු.

ඉගෙනුම් ඵල :
- හින්දුස්ථානි සංගීත පද්ධතියේ එන තාල කිහිපයක් හඳුනා ගනියි.
- තාල පද ගුණ කරමින් ඉදිරිපත් කරයි.

කාලය : කාලච්ඡේද 04 යි

ගුණාත්මක යෙදවුම් :
- තබ්ලාවක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :
- මෙම තාල මීට පෙරද සිසුන් අධ්‍යයනය කර ඇත. නමුත් 12 වසරේ දී තව දුරටත් එම තාල පද විශ්ලේෂණය කරමින් අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. ඊට අමතරව සමගුණ, දෙගුණ හා සිව්ගුණ නිරූපණයද සිසුන් තුළ ඇති කළ යුතු කුසලතාවයකි.
- සුදුසු වගුවක් හෝ ක්‍රමවේදයක් යොදා ගනිමින් එකිනෙක තාලපද අතර සන්සන්දනයක් කරන්න.
- සමගුණ දෙගුණ අභ්‍යාසයන්හි යොදවන්න.

සැලකිලිමත් විය යුතු කරුණු:
- තාලපදවල නිවැරදි අක්ෂර උච්චාරණය
- නිවැරදිව අතැඟිලි හැසිරවීම
- සුදුසු ලය භාවිතා කිරීම.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -
- ත්‍රිතාල් , ජප්තාල්, දීප්චන්දි, දාදරා යන තාලපද අත්තල යොදා පෙන්වන්න. සිසුනට අත්තල යොද පෙන්වීමට අවස්ථාව දෙන්න.

  කාලය වි. 40
- ඉහත තාල පද දෙගුණ කර අත්තල යොදා පෙන්වන්න. සිසුන්ට එක් එක් තාලයෙහි දෙගුණ අත්තල යෙදීමට සහායවන්න. තබ්ලාවෙන් සමගුණ වයන අතර දෙගුණ උච්චාරණය කිරීමට සලස්වන්න.

  කාලය වි. 80
- තාලපද සමගුණ හා දෙගුණ වශයෙන් ලිවීමට සලස්වන්න. දෙගුණය ලිවීමේ දී මාත්‍රාවක් තුළ අක්ෂර කිහිපයක් යෙදෙන අයුරු නිරීක්ෂණයට යොමු කරන්න.

  කාලය වි. 40

ඇගයීම -
- දීප්චන්දි තාලය සමගුණ දෙගුණ වශයෙන් ලියා දක්වන්න.
- ජප්තාලය සමගුණ දෙගුණ වශයෙන් අත්තල යොදා පෙන්වන්න.

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.6 : ත්‍රිතාල්, ජප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අව නද්ධාක්ෂර නිකුත් වන අයුරු, තබ්ලාවෙන් වාදනය කර ප්‍රදර්ශනය කරමු.

ඉගෙනුම් ඵල :
- තාල පදවල අවනද්ධක්ෂර හඳුනා ගනියි.
- තාල පද සරලව වාදනය කිරීමේ කුසලතාව ලබා ගනියි.

කාලය : කාලච්ඡේද 06 යි

ගුණාත්මක යෙදවුම් : තබ්ලාවක් - අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන දක්වා ඇති දෘශ්‍ය උපකරණයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: තාලපදවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු හා එම ස්ථාන හඳුනාගැනීම පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. තබ්ලාවක් හා තබ්ලාවේ රූප සටහනක් භාවිතයෙන් මෙම පාඩම සංවර්ධනය කිරීම කළ හැක. මෙහි දී 10 වසර තබ්ලා වාදන පාඩම ද වැඩිදුර පරිශීලනය කරන්න. හොඳ තබ්ලාවක් සපයා ගැනීමත්, එය හොඳින් සුසර කර ගැනීමත්, නිවැරදි අවනද්ධාක්ෂර ඉපදවීමත් පිළිබඳව ගුරුවරයා සැළකිලිමත් විය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- නියමිත තාල තබ්ලාවෙන් වාදනය කර පෙන්වන්න. නිවැරදි අක්ෂර ඉපදවීම පිළිබඳ සැලකිලිමත් වන්න. ඇමුණුම අංක 01 හි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරන්න.

  (කාලච්ඡේද 01)

- දාදරා, ත්‍රිතාල් යන තාල පද දෙකින් එකක් තබ්ලාවකින් සරලව වාදනය කිරීමට පුහුණුකරන්න. නැතහොත් එම තාල පදවලට අයත් වන ලෙස සරල රිද්ම රටා වාදනය පුහුණු කරගන්න.

  (කාලච්ඡේද 03)

- නිර්දේශිත තාලපද තබ්ලාවෙන් මධ්‍යලය සහ විලම්භය යොදාගනිමින් වයා, ශ්‍රවණය මගින් හඳුනා ගැනීමේ අභ්‍යාසවල යොදවන්න.

  (කාලච්ඡේද 01)

- නිර්දේශිත තාලපදවලට අයත් ගීත/ වාදිත යොදාගනිමින් ඒවා කුමන තාලවලට අයත්දැයි හඳුනාගැනීමේ අභ්‍යාසවල යොදවන්න.

  (කාලච්ඡේද 01)

ඇමුණුම් අංක 01

පහත දැක්වෙන කරුණු ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- තබ්ලාවේ අක්ෂර උපදින ස්ථාන
- දායාවේ සහ බායාවේ නාදයේ වෙනස
- නියමිත තාල පදවල අක්ෂර උපදින ආකාරය හා ඒවායේ හඬෙහි වෙනස
- අවනද්ධාක්ෂර ගොඩනැගෙන ආකාරය
- දායාවෙන් පමණක් උපදින අක්ෂර
- බායාවෙන් පමණක් උපදින අක්ෂර
- දායාවෙන් සහ බායාවෙන් උපදින අක්ෂර සංයෝගයෙන් උපදින අක්ෂර
  (දෘශ්‍ය උපකරණයක් මගින් අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන දක්වන්න. සෘජුව අත්දැකීම් ලබා ගැනීමට කටයුතු කරන්න.)

ඇගයීම -

- තබ්ලාවේ මුහුණතේ රූප සටහනක් ඇඳ අවනද්ධාක්ෂර උපදින ස්ථාන දක්වන්න.
- දාදරා තාලය තබ්ලාවකින් වයා පෙන්වන්න.

මූලාශ්‍ර -

- ඩී. ආර්, පීරිස් - සම්භාව්‍ය තාල දීපනී
  විජයරත්න රණතුංග - තබ්ලාව
  චානක පීරිස් - තබ්ලා ධ්වනි

ක්‍රියාකාරකම් සැලසුම -21

නිපුණතාව 1.0 : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.4 : රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියාවන් ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 1.4.7 : **'' බටහිර තාල අධ්‍යයනය කරමු''**

ඉගෙනුම් ඵල :
- බටහිර තාල වර්ග පිළිබඳව හඳුනා ගනියි.
- පෙරදිග සහ අපරදිග තාල සංකේත හා වටිනාකම් පිළිබඳ ව හඳුනා ගනියි.
- ගීතයේ ලය අනුව තාල රූපය සොයා ගැනීමේ කුසලතාවය ලබා ගනියි.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව හෝ විද්‍යුත් ස්වර පුවරු භාණ්ඩයක්, ඇමුණුමේ සඳහන් දෘශ්‍ය උපකරණ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: 10, 11 ශ්‍රේණි වල දී බටහිර තාල පිළිබඳ සිසුන් තරමක් අධ්‍යයනය කර ඇත. එම කරුණු නැවත මතකයට නගා ගනිමින් සංකීර්ණ තාල දක්වා බටහිර තාල ගොඩ නැගීම පිළිබඳ අධ්‍යයනයට මග සැළසීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය.

බටහිර තාල වර්ග පිළිබඳවත්, එකිනෙක තාල නම්කිරීම හා සංකේත මගින් ප්‍රස්තාර කිරීම පිළිබඳවත්, හින්දුස්ථානී තාල සමග සංසන්දනය කිරීමත්, පෙරදිග ප්‍රස්තාරයක් බටහිර ප්‍රස්තාරයකට පෙරළීමේ දී තාලයට නියමිත සකේත හා වටිනාකම් හඳුනා ගැනීමටත්, ගීතයක ගැයෙන ලය අනුව එහි තාල රූපය තීරණය කිරීමටත් හා මෙම ක්‍රියාකාරකම අවසානයේ සිසුනට හැකිවනු ඇත. මීට අමතරව විද්‍යුත් ස්වර පුවරු වල දක්නට ලැබෙන තාල හඟවන විවිධ නම් තේරුම් ගැනීමට ද හැකිවනු ඇත.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලඟාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

- 10, 11 ශ්‍රේණි වලදී අධ්‍යයනය කර ඇති බටහිර තාල පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

(කාලඡේද 02)

ඇමුණුම 01.

ප්‍රවේශය.

01. පහත දැක්වෙන්නේ ආචාර පෙළපාළියක දී බටහිර තූර්යවාදක කණ්ඩායමක '' බේස්ඩ්‍රම්, ටෙනර් ඩ්‍රම්ස් සහ සයිඩ් ඩ්‍රම්ස් වාදනය කළ තාල රූපයක්. එය සරලව නිරූපනය කර පෙන්වන්න.

		වම් දක් වම් .... / වම් දක් වම් ... /
බේස්ඩ්‍රම්	:-	ඩුම් ඩුම් ඩුම් ... / ඩුම් ඩුම් ඩුම් .... /
සයිඩ්ඩ්‍රම්ස්	:-	ටක්ටක ටක්ටක ටක්ටක ටකටක/ටක්ටක ටක්ටක ටක්ටක ටකටක/

වම් දක් වම් .... / වම් දක් වම් ... /
ඩුම් ඩුම් ඩුම් ... / ඩුම් ඩුම් ඩුම් ... /
ටක්ටක ටක්ටක ටක්ටක ටකටක/ටකටක ටකටක ටක් ... /

02. එම තාල රූපයේ මාත්‍රා බෙදෙන අයුරු සිසුන් විමසන්න. විෂුත් ස්වර පුවරු වල එම තාල රූපය March යනුවෙන් නම් කර ඇති බව පහදා දෙන්න.

ක්‍රියාකාරකම 01.

01. පහත දැක්වෙන පත්‍රිකාව කියවන්න.



02. මෙහි සරල තේරුම මෙසේය. බටහිර සංගීතයේ දී තාලය හඟවන සංකේතය නම්කරන්නේ '' ටයිම් සිග්නේචර් '' යනුවෙනි. එය රේඛාමණ්ඩලය තුළ ඉහලින් සහ පහළින් යොදන අංක දෙකක් මගින් දැක්වේ. පහළ අංකයේ දැක්වෙන වටිනාකමින් සෙමිබ්‍රිව් එකකට යෙදෙන සංකේත (Quality) ඉහළ අංකයේ දැක්වෙන ප්‍රමාණයක් (Quantity) විභාගයකට යෙදේ ය, යන්න ටයිම් සිග්නේචරයෙන් අර්ථ ගැන්වේ. තාලයේ වේගය නැතහොත් ලය

ද. මෙයින් ගම්‍ය වේ. රේඛා මණ්ඩලයක ප්‍රස්තාර කිරීමේ දී මුලින් ම ක්ලෙෆ් එකද. ඊලඟට ස්කේලය හඟවන කී සිග්නේචරයද, අවසානයේ ටයිම් සිග්නේචරයද පිළිවෙලින් යෙදීම සම්මත ක්‍රමයයි.

03. බටහිර තාල '' සිම්පල් ටයිම් '' සහ '' කම්පවුන්ඩ් ටයිම් '' යනුවෙන් වර්ග දෙකකි. මේ එක් වර්ගයක් නැවත කොටස් තුනකට බෙදේ. ඩ්‍යුපල්, ට්‍රිපල්, කොඩ්රපල් යනු (Duple , Triple, Quadruple) එම කොටස් තුනයි. මේ එක් කොටසකින් තාලරූප තුන බැගින් ගොඩ නැගේ. මේ අනුව සිම්පල් ටයිම් 9 ක්ද, කම්පවුන්ඩ් ටයිම් 9 ක් ද ගොඩ නැගේ

04. පහත දැක්වෙන වගු අධ්‍යයනය කරන්න. එහි එක් වර්ගයකට කොටස් තුනක් බැගින් ඇතුළත් වේ. එහි Two Two Time තාලරූපය Minim වලින්ද, Two Four Time තාලරූපය Crotchet වලින්ද, Two Eight Time තාලරූපය Quaver වලින්ද, ගොඩ නැගේ. Semibraeve එකකට Minim දෙකකි. Semibreave එකකට Crotchet හතරකි. Semibreave එකකට Quaver අටකි.

මේ අනුව Minim වලින් ගොඩනැගෙන තාල වල ඇත්තේ අඩු ලයකි. Crotchet වලින් ගොඩනැගෙන තාල වල ඇත්තේ මධ්‍යලයකි. Quaver වලින් ගොඩනැගෙන තාල වල ඇත්තේ වැඩි ලයකි. මේ අනුව දන්නෝ බුදුන්ගේ ගීතය ප්‍රස්තාර කිරීමට වඩාත් සුදුසු තාලය වන්නේ Four Two Time තාලරූපයයි. මක්නිසාද, එය අඩු ලයකින් ගැයෙන නිසාවෙනි. මේ නිසා මාත්‍රා හතරෙන් හතර බෙදුන නිසාම එය Four, Four ටයිම් වන්නේ නැත. එම ගීතයේ ලය අඩු නිසා ෆෝටූ ටයිම් වලට වඩාත් ගැලපේ.

වගුව අංක 01.







05. පහත දක්වෙන වගු අධ්‍යයනය කරන්න. එහි '' කම්පවුන්ඩ් ටයිම් '' යන තාල රූප ගොඩ නැගෙන අයුරු දක්වා ඇත. සිම්පල් ටයිම් වලදී මෙන් එක් වර්ගයකට කොටස් තුනක් බැගින් ඇතුළත් වේ. සිම්පල් ටයිම් වලදී විභාගයක ඒකක සංඛ්‍යාව දෙකෙන් බෙදෙන අතර, කොම්පවුන්ඩ් ටයිම් වලදී එය තුනෙන් බෙදේ. වටිනාකම් තීරණය වන්නේ Dotted Notes වලින්ය. ඒ අනුව ඩ්‍යුපල් ටයිම් වලදී ඩොටඩ් නෝට්ස් දෙකක් ද, ට්‍රිපල් ටයිම් වලදී ඩොටඩ් නෝට්ස් තුනක්ද, කොඩ්රූපල් ටයිම් වලදී ඩොටඩ් නෝට්ස් හතරක්ද වශයෙන් වටිනාකම් තීරණය වේ.


Compound Duple Time
Six Four Time
Six Eight Time
Six Sixteen Time


Compound Triple Time
Nine Four Time
Nine Eight Time
Nine Sixteen Time


Compund Quadraple Time
Twelve Four Time
Tweleve Eight Time
Tweleve Sixteen Time

06. හින්දුස්ථානී තාල බටහිර තාල සමග සන්සන්දනය කරන්න. ත්‍රිතාල් දාදරා කෙහෙර්වා , ලාවණී යන තාල වලට ගැලපෙන බටහිර තාල නම්කරන්න. දීප්චන්දි සහ ජප්තාල් තාල පද වලට ගැලපෙන බටහිර තාල ඉහත නැත. සංඛ්‍යා දෙකක ප්‍රමාණයන්ගෙන් යුත් විභාග දෙකක් බටහිර තාල වල යෙදෙන්නේ නැත. ඒ අනුව ජප්තාලයේ 1 සහ 2 විභාග වලට හිමි මත් ගණන 5 කි. එම සංඛ්‍යාවට ගැලපෙන ලෙස Five Four Time යනුවෙන් තාල රූපයක් ගොඩ නැගේ. දීප්චන්දි තාලයේ 1 සහ 2 විභාග වලට හිමි මත් ගණන එකතුව 7 කි. එම තාලයට ගැලපෙන ලෙස Seven Four Time යනුවෙන් තාල රූපයක් ගොඩ නැගේ. ඒ අනුව ඣප් තාලයට සහ දීප්චන්දි තාලයට අයත් ගී පාද දෙකක් බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

07. විද්‍යුත් ස්වර පුවරුවක Style වශයෙන් දක්වා ඇති විවිධ තාල රූපවල නම් ඉහත දක්වා ඇති තාල රූප වලට වර්ග කරන්න. (Waltze , Swing , march, ආදී)

ඇගයීම -

- හින්දුස්ථානි තාල හා බටහිර තාල සංසන්දනය කරන්න.
- මාත්‍රා 3 /3 තාල රූපය බටහිර ක්‍රමයට ලියා දක්වන්න.

මූලාශ්‍ර -

- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London) RUDI MENTS AND THEORY OF MUSIC (Royal Schools of Music)
- ජාතික අධ්‍යාපන ආයතනයෙන් ප්‍රකාශිත දූරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාවේ '' තාල සංකල්ප '' මොඩියුලය

ඇගයීම 04

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම :

රිද්මයේ සහ තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් විවිධ තාල පද්ධතිවල ස්වභාවය හඳුනාගනිමින් තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

2. විෂය සන්ධාරය : රිද්මය සහ තාලය
උතුරු ඉන්දීය තාල
දේශීය තිත්තාල
කර්ණාටක තාල
බටහිර තාල
තබ්ලාවේ අක්ෂර නිකුත් කිරීම

3. උපකරණයේ ස්වභාවය: ප්‍රායෝගික ක්‍රියාකාරකම්
ලිඛිත

4. කාලය : කාලච්ඡේද 02

5. අරමුණු :

- රිද්මයේ හා තාලය අතර වෙනස පැහැදිලි කරයි.
- විවිධ සංගීත පද්ධතිවලට අයත් තාල නම් කරයි.
- එක් එක් තාල පද්ධතිවල පද පිළිබඳව පැහැදිලි කරයි
- දේශීය හා විදේශීය තාලපද්ධතිවල ආකෘතිය පිළිබඳ සංසන්දනාත්මක අදහස් දක්වයි.
- හින්දුස්තානි තාලපද තබ්ලාවේ නිකුත් වන අයුරු පැහැදිලි කරයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :

- රිද්මයේ හා තාලයේ වෙනස දැක්වීම සඳහා උදාහරණයක් දැක්වීමට අවස්ථාව දෙන්න.
- උතුරු ඉන්දීය තාලයක් සමදෙගුණ වශයෙන් අත්තල යොදා පෙන්වීමට අවස්ථාව දෙන්න.
- දේශීය තිත් තාල පදයක් අත්තල යොදා පෙන්වීමට සලස්වන්න.
- කර්ණාටක තාල හා බටහිර තාල ප්‍රස්තාර කිරීමට සලස්වන්න.
- තබ්ලාවේ අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න.

නිර්ණායක :

1. රිද්මය හා තාලය වෙන්කොට දැක්වීමේ උදාහරණ දැක්වීම	ලකුණු 04
2. තාලය නිවැරදිව අත්තල යෙදීමට හා ගුණ කිරීමට	ලකුණු 04
3. දේශීය තිත් තාල පදය නිවැරදිව දැක්වීම	ලකුණු 04
4. කර්ණාටක හා බටහිර තාල ප්‍රස්තාර කිරීමට	ලකුණු 04
5. තබ්ලාවේ අක්ෂර 04 ක් උපදින ස්ථාන නිවැරදිව දැක්වීම	ලකුණු 04

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.1 : අරුත් නගමු. මියැසි වරුණ

ඉගෙනුම් ඵල :
- සංගීතය සඳහා ඇති විවිධ නිර්වචන හඳුනා ගනියි.
- සංගීතය සඳහා පොදු නිර්වචන සකස් කරයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : නියමිත ශ්‍රව්‍ය පට CD හෝ VCD අදාල ධාවන යන්ත්‍ර සමඟ

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: සංගීතය යනු කුමක් දැයි පෙරදිග සහ අපරදිග පැරණි මෙන්ම නූතන විචාරකයන් විවිධාකාර නිර්වචන ඉදිරිපත් කොට ඇත. එම නිර්වචන ගොනු කොට සංගීතය සඳහා පොදු සම්මතයක් ගොඩ නගා ගැනීමට සිසුන් යොමු කරලීම මෙහි දී අපේක්ෂා කෙරේ. එහි දී කලාවක් වශයෙන් සංගීතයෙහි ඇති විශේෂත්වය එහි ප්‍රායෝගික ස්වරූපය මත පිහිටා සනාථ කරලිය යුතු ය. ඉගෙනුම් සම්පත් උපරිම වශයෙන් භාවිත කොට සංගීතය පිළිබඳව දක්වා ඇති විචාරක මත සහ සිසුන් දක්වන අදහස් අතර සංවාදයක් ගොඩ නැගීම මෙහිදී කළ යුතු ය.

එබැවින් සිසුනට ශ්‍රවණය කිරීමට සැලැස්වීම සඳහා පහත දැක්වෙන කොටස් ඇතුළත් ශ්‍රව්‍ය පට හෝ සංයුක්ත තැටි අදාළ ධාවන යන්ත්‍ර සමඟ සපයා ගත යුතු වේ.

- ආලාප සහ ඩෝඩ් ආලාප, ඇතුළත් ශාස්ත්‍රීය වාදන (සන්තූර්, බටනලා, සිතාර්, වීනා, සාරංගි, සරෝද්, ක්ෂණායි, වයලීන්)
- බටහිර සංගීත සංධ්වනියකින් උපුටා ගත් කොටස්.
- දේශීය සහ විදේශීය සම්භාව්‍ය චිත්‍රපට, ඔපෙරා (ගීත නාටක) මුද්‍රා නාට්‍ය (බැලේ) ආදියෙහි අන්තර්ගත තේමා වාදන, ගීත හෝ සංගීත ඛණ්ඩ පෙර දිග සහ අපරදිග සායනික සංගීත (Clinical Music හෝ Relaxational Music වැනි සංගීත ඛණ්ඩ

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- සංගීතය යනු කුමක්දැයි විස්තර කරලීම සඳහා ඇමුණුම් අංක 1 හි දැක්වෙන ප්‍රවේශය යොදාගන්න. සුවිශේෂතා සාකච්ඡා කරන්න. ඇමුණුම් අංක 02 හි දැක්වෙන කියවීම් පත්‍රිකාව ඉදිරිපත් කරන්න. ඒ ඇසුරින් අංක 02 ක්‍රියාකාරකමෙහි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

කාලච්ඡේද 01

ඇමුණුම - 01

ප්‍රවේශය - සංගීතය යනු කුමක් ද සහ එහි ඇති විශේෂත්වය පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එය සාරාංශ ගත කරන්න.

ක්‍රියාකාරකම අංක 01

- පෙර දිග සහ අපරදිග යන සංගීත සම්ප්‍රදායන්ට අයත් ගායන වාදන සහිත සංගීත ඛණ්ඩ කිහිපයක් සහ Relaxational Music හෝ සායනික සංගීතයට අයත් සංගීත ඛණ්ඩයක් ශ්‍රවණයට යොමු කරන්න. ඒ ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සාකච්ඡා කරන්න.
- සංගීත නිර්මාණයක් සිදුවන්නේ ත් එම නිර්මාණ රසිකයා වෙත පැමිණෙන්නේත් කුමන මාධ්‍යයක් ඔස්සේ දැයි පෙන්වා දෙන්න.
- සංගීතඥයාගේ නිර්මාණ ක්‍රියාවලිය සහ රසිකයා ගේ වින්දන ක්‍රියාවලිය අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න.

ඇමුණුම අංක 02

- සංගීතය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචන හා විචාරක මත ඇසුරෙන් සංගීතය සඳහා අර්ථ කථනය ගොඩනැගීමට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා ඇමුණුම අංක 02 හි දැක්වෙන කියවීම් පත්‍රිකාව ඉදිරිපත් කරන්න.

කියවීම් පත්‍රිකාව

- 'ගීත' යන වචනයට 'සං' යන උපසර්ගය එක්වීමෙන් සංගීතය යන වචනය සෑදී ඇත. මනා, යහපත් සමූහ යන අර්ථ ' සං' යන උපසර්ගයෙන් ගම්‍ය කරවයි. ගයනු ලබනුයේ යමක් ද ඒ ගීතයේ (ගා, ඉති, ඉති ගීතං) මේ අනුව බලන විට මනා වූ ගායනය, යහපත් වූ ගායනය, එසේත් නැත හොත් සාමූහික ගායනය සංගීතය වශයෙන් සැලකිය හැක.

- 'ගීතං වාද්‍යං තථා නෘත්‍යං - ත්‍රයං සංගීත මුච්‍යතේ' යනුවෙන් සාරාංග දේව සිය සංගීත රත්නාකරයේ දක්වා ඇත්තේ ගායනය, වාදනය , නර්තනය යන අංගත්‍රයේ මනා වූ සංකලනය සංගීතය යි ' යන අදහසිනි.

  මෙහි දී ගායනය අනුව වාදනයත් වාදනය අනුව නර්තනයත් සිදු වන බවද ඒ අනුව ගායනය ප්‍රධාන වන බවද එහි දී තව දුරටත් විස්තර කර ඇත. තවද ස්වරයන්ගේ සම්‍යක්යෝගය - ස්වරයන් මනා කොට යොදා ගැනීම සංගීතය ලෙස ද සමූහ වශයෙන් ගැයීම හා යහපත් ගීතයද සංගීතය ලෙසද භාරතීය විචාරකයෝ දක්වා ඇත.

  කෙසේ වෙතත් අපරදිග සංගීතය තුළ සංගීතය වශයෙන් සලකන්නේ ගායනය සහ වාදනයන් පමණක් බවත් නර්තනය වෙනම කලාවක් වශයෙන් සලකන බවත් පෙනේ. 'හැඟීම් හෝ ආවේගයන්ට බලපාන ලෙස කටහඬින් හෝ සංගීත භාණ්ඩ මගින් රිද්මය හා තනුව හා ස්වර සුසංයෝගය ඇති වන පරිදි Music යන්න අරුත් ගන්වමින් Universal English නම් ශබ්ද කෝෂයෙහි දක්වා ඇත. තවද විවිධ දාර්ශනිකයන් සහ අධ්‍යාපනඥයින් සංගීතය පිළිබඳව විවිධ අදහස් දක්වා ඇත.

- රිද්මය හා තාලය පිළිබඳව ඇති අවදි බව පුද්ගලයාගේ අභ්‍යන්තරයට ඇතුළත් ව ආත්මය මනාව හැඩ ගැසීමට උපකාරී වන බැවින් සංගීතය පුහුණුව අන් සියල්ලටම වඩා වැදගත් ය. '' ප්ලේටෝ.

- 'සදාචාරයේ නීති රීති නම් කලාවේ නීති රීති ය. මනා සංගීතය මිනිසාගේ ආත්මයට කථා කරන භාෂාවයි. මිනිස් හදවතේ ඇති ඉතාම උත්තුංග වූ භාවයන් ප්‍රබෝධ කරවීම මෙහිලා එය සමත් වේ. සදාචාරත්වය හා සංස්කෘතික ව්‍යවසායන් ගේ නියම ප්‍රතිඵල ලැබිය හැක්කේ සංගිතය නැමැති යෝද උද්වේගී ශක්තියේ පිටිවහල ලැබුණොත් පමණක් බවට කිසිම සැකයක් නැත'' රොබට් ෂුවන්

- හොඳ සංගීතය තරම් ළදරු වියේ සිට වැඩිහිටි විය දක්වා ජනතාවගේ භාවයන් පෝෂණය කරන තවත් බලවේගයක් නොමැති - මැක්ස් වේල හේස්.

ක්‍රියාකාරකම් අංක 02

- කියවීම් පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු ඇසුරින් සංගීතය සඳහා පොදු වූ ත් සාධාරණ වූත් අර්ථ කථනයක් ගොඩ නගන්න.

- එය පන්තිය වෙත ඉදිරිපත් කරන්න.

- සියලු දෙනාට එකඟ විය හැකි අර්ථ කථනයක් සාකච්ඡා ඇසුරෙන් ගොඩ නගන්න.

ඇගයීම : - සංගීතය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචන උපයෝගී කර ගනිමින් වර්තමානය සඳහා ගැලපෙන නිර්වචනයක් ගොඩනගන්න.

ක්‍රියාකාරකම් සැලසුම 23

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.1 : විශ්ව සංගීතයේ විෂමතාවල සුල මුල සොයමු.

ඉගෙනුම් ඵල :
- විවිධ සංගීත පද්ධති අතර, ඇති වෙනස හඳුනා ගනියි.
- මහා සංගීත සම්ප්‍රදායන් වශයෙන් සැලකෙන සංගීත පද්ධති හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : 'හෙළ ගී මග'ප්‍රස්තාවනාව - ඩබ්. ඩී. මකුලොලුව, පාට පැන්සල් පෙට්ටි.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

ලොව පුරා විසිරී සිටින විවිධ ජන සමූහයන් අතර විවිධ සංගීත සම්ප්‍රදායන් භාවිත වේ. ඒ අතරින් එකී සංගීත පද්ධතියක් තවත් සංගීත පද්ධතියකින් වෙන් කොට හඳුනා ගත හැකි අනන්‍ය ලක්ෂණ කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳව සිසුනට අවබෝධයක් ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ. මිනිසා ජීවත්වන ජන සමාජයේ සංස්කෘතිය සමග සංගීතය ද බැඳී පවතින බැවින් සංස්කෘතිය සැකසීම සඳහා බලපානු ලබන බොහෝ කරුණු සංගීතය කෙරෙහි ද බලපාන බව පෙන්වා දිය යුතුය. එබැවින් ඒ ඒ සංගීත පද්ධති බිහි වූ සහ සුලභව භාවිතා කරනු ලබන ජන සමාජයනට අයත් දේශගුණික සහ භූගෝලීය වැනි පාරිසරික සාධක, භාෂාව, ආගම , සිරිත්, විරිත් , ආචාර ධර්ම අත් පත් කරගනු ලැබූ ඥාණ සම්භාරයන්, ආර්ථික හා දේශපාලනික ව්‍යුහයන් ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ එක් රැස් කරගනු ලැබූ කරුණු ශිෂ්‍යයන් ගේ ප්‍රාප්ති මට්ටමට උචිතවනපරිදි සකස් කර ගැනීම ගුරුවරයාගේ වග කීම වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- මහා සංගීත සම්ප්‍රාදයන් වුල සංගීත සම්ප්‍රදායකින් වෙන් කොට හඳුනා ගත හැකි අයුරු සාකච්ඡා කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන කියවීම් පත්‍රිකාව ඉදිරිපත් කරන්න. සුවිශේෂතා සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

- එක් සංගීත සම්ප්‍රදායන් තවත් සංගීත සම්ප්‍රදායකින් වෙනස්වීම කෙරෙහි බලපාන හේතු පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ සඳහා ඇමුණුම අංක 02 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගත හැකි ය. අංක 01 ක්‍රියාකාරකමෙහි යොදවන්න. සාර්ථක කර ගැනීම සඳහා සහාය වන්න.

- කලාපවලට අයත් රටවල් ඇසුරින් ගොඩ නැගුණු මහා සංගීත සම්ප්‍රදායන් පවතින බව හඳුන්වා දෙන්න. මෙතෙක් උගත් කරුණු සමාලෝචනය කොට වගුව සම්පූර්ණ කිරීමට සහාය වන්න.

කාලච්ඡේද 02

ඇමුණුම අංක - 01

කියවීම් පත්‍රිකාව

- සංගීතය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවිධ නිර්වචන සහ විචාරක මත ඔස්සේ එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ යම් අවබෝධයක් ඔබ මේ වන විට ලබා ඇත. ඒ අනුව ලොව පුරා විවිධ සංගීත ශෛලීන් සහ සම්ප්‍රදායන් දක්නට ලැබෙන බවටද පිළිගනී
  ඒ අතරින් සමහර සංගීත සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ සහ ඇසුරු කරන ජන සමූහයන් දිනෙන් දින පටුවන අතර තවත් සමහර සංගීත සම්ප්‍රදායන්හි එය දිනෙන් දින පුළුල් වන බවත් දක්නට ලැබේ. එසේ දිනෙන් දින පුළුල් වෙමින් ව්‍යාප්ත වන්නා වූ සංගීත සම්ප්‍රදායන් බොහොමයක

  - ඊටම අදාළ සංගීත ව්‍යාකරණයක්
  - ඉතිහාසය හා සිද්ධාන්ත
  - ලිඛිත ක්‍රමයක්
  - සංගීත ශිල්පීන් සහ නිර්මාණ කෘති (සංගීත භාණ්ඩ ද ඇතුළත්)
    ආදිය දක්නට ලැබෙන අතර ඉතිහාසය පුරා නිරන්තරයෙන් සිදු කළ පර්යේෂණ, අත්හදා බැලීම්සහ සාධනීය උත්සාහයන් ඒ කෙරෙහි බලපා ඇත. එබඳු සංගීත සම්ප්‍රදායන් මහා සංගීත සම්ප්‍රදායන් ලෙස පිළිගැනෙන අතර එම සියළු සංගීත සම්ප්‍රදායන් චූලසංගීත සම්ප්‍රදායන් ලෙස සැලකේ.

ක්‍රියාකාරකම 01

- මහා සංගීත සම්ප්‍රදායන් වීමට අවශ්‍ය සාධක මොනවාදැයි දක්වන්න.
- චුල සංගීත සම්ප්‍රදායන්හි දැකිය හැකි ලක්ෂණතා මොනවා ද ?
- ඔබ දන්නා මහා සංගීත සම්ප්‍රදායන් හා චුල සංගීත සම්ප්‍රදායනට නිදසුන් දක්වන්න. සාකච්ඡා කරන්න.
- මහා සම්ප්‍රදායන් තවත් මහා සංගීත සම්ප්‍රදායකින් වෙනස් වන්නේ කෙසේ ද ?

ඇමුණුම - 01

ප්‍රවේශය -

- පෙරදිග සංගීතයට අයත් ගායනයක් හෝ වාදනයක් සහ බටහිර සංගීතයට අයත් ගායනයක් හෝ වාදනයක් නිරීක්ෂණයට යොමු කරන්න.

ක්‍රියාකාරකම 02



රටවල නාමාවලිය (2 වන රූපය හා බැඳේ)

1. ඉන්දියාව
2. ශ්‍රී ලංකාව
3. පකිස්තානය
4 නේපාලය
5 බංගලාදේශය
6 හංගේරියාව
7 පෝලන්තය
8 ඔස්ට්‍රියාව
9 බෙල්ජියම
10 මහා බ්‍රිතාන්‍ය
11 ජර්මනිය
12 ඉතාලිය
13 ග්‍රීසිය
14 චීනය
15 ඉරාකය
16 සෞදි අරාබිය
17 ජෝර්දානය
18 සිරියාව
19 වියට්නාමය
20 තායිලන්තය
21 මියන්මාරය
22 මැලේසියාව
23 ඉන්දුනීසියාව

රටවල් දක්වන ලද ලෝක සිතියම ප්‍රදර්ශනය කොට ඒ ඒ කලාප වලට අයත් රටවල් වෙන් කර ගැනීමට සහාය වන්න. මීළඟට පහත දැක්වෙන අයුරින් රටවල් කලාප 5 ක් ලෙස වෘත්ත යොදා ගනිමින් වෙන් කරන්න. කලාප 5 පහත දැක්වෙන අයුරින් නම් කරන්න.

A. - කලාප - අයත් රටවල් 6. 7, 8, 9, 10, 11, 12, 13
B. - කලාප - අයත් රටවල් 6. 15, 16, 17, 18
C. - කලාප - අයත් රටවල් 1, 2, 3, 4, 5
D. - කලාප - අයත් රටවල් 19, 20, 21. 22, 23
E. - කලාප - අයත් රටවල් 14

එම කලාප වලට අයත් රටවලට විශේෂිත ආහාර පාන, ඇඳුම් පැළඳුම්, නිවාස , ජීවන වෘත්තීන්, සිරිත් විරිත් කෙරෙහි දේශගුණය, භූගෝලීය පිහිටීම හා ස්වභාවික සම්පත්හි බලපෑම සාකච්ඡා කරන්න.

- එම රටවල භාවිත භාෂාවන් සහ ආගම් ද, සංස්කෘතියද සංගීතය සමඟ බද්ධ වන ආකාරය සැකෙවින් සාකච්ඡා කරන්න.
- මෙතෙක් රැස්කර ගත් තොරතුරු පන්තිය වෙතට ඉදිරිපත් කිරීමට හා සංවර්ධනාත්මක අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- (මේ සඳහා අවශ්‍ය නම් පාසලේ සමාජ අධ්‍යයනය, භූගෝලය, ඉතිහාසය වැනි විෂයයන් භාර ගුරුවරුන්ගේ සහාය ලබා ගන්න.)
- පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරගැනීමට මඟ පෙන්වන්න.

කලාපය	අයත් රටවල්	භාෂාවන්	ආගම	දේශගුණය හා භූගෝලීය පිහිටීම	සිරිත් විරිත්	සංගීතයට කළ බලපෑම	ප්‍රචලිත සංගීත සම්ප්‍රදාය
A							
B							
C							
D							
E							
F							
F							

ඇගයීම -

- ලෝකයේ පවතින සම්භාව්‍ය සංගීත පද්ධති වෙන් කර ලියා දක්වන්න.
- බංගලාදේශය, තායිලන්තය, මියන්මාරය, ඉරාකය, ජපානය, ජර්මනිය, යන රටවල පවතින මහා සංගීත සම්ප්‍රදායන් වෙන් කර හඳුන්වා දෙන්න.

මූලාශ්‍ර -

- හෙළ ගී මග ප්‍රස්ථාවනාව - ඩබ්. බී. මකුලොලුව
- ලංකාවේ සංගීත සම්භවය - සී. ද. එස්. කුලතිලක

ක්‍රියාකාරකම් සැලසුම 23

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.1 : විශ්ව සංගීතයේ විෂමතාවල සුල මුල සොයමු.

ඉගෙනුම් ඵල :
- විවිධ සංගීත පද්ධති අතර, ඇති වෙනස හඳුනා ගනියි.
- මහා සංගීත සම්ප්‍රදායන් වශයෙන් සැලකෙන සංගීත පද්ධති හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : 'හෙළ ගී මග'ප්‍රස්තාවනාව - ඩබ්. ඩී. මකුලොලුව, පාට පැන්සල් පෙට්ටි.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

ලොව පුරා විසිරී සිටින විවිධ ජන සමූහයන් අතර විවිධ සංගීත සම්ප්‍රදායන් භාවිත වේ. ඒ අතරින් එකී සංගීත පද්ධතියක් තවත් සංගීත පද්ධතියකින් වෙන් කොට හඳුනා ගත හැකි අනන්‍ය ලක්ෂණ කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳව සිසුනට අවබෝධයක් ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ. මිනිසා ජීවත්වන ජන සමාජයේ සංස්කෘතිය සමග සංගීතය ද බැඳී පවතින බැවින් සංස්කෘතිය සැකසීම සඳහා බලපානු ලබන බොහෝ කරුණු සංගීතය කෙරෙහි ද බලපාන බව පෙන්වා දිය යුතුය. එබැවින් ඒ ඒ සංගීත පද්ධති බිහි වූ සහ සුලභව භාවිතා කරනු ලබන ජන සමාජයනට අයත් දේශගුණික සහ භූගෝලීය වැනි පාරිසරික සාධක, භාෂාව, ආගම , සිරිත්, විරිත් , ආචාර ධර්ම අත් පත් කරගනු ලැබූ ඥාණ සම්භාරයන්, ආර්ථික හා දේශපාලනික ව්‍යුහයන් ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ එක් රැස් කරගනු ලැබූ කරුණු ශිෂ්‍යයන් ගේ ප්‍රාප්ති මට්ටමට උචිතවනපරිදි සකස් කර ගැනීම ගුරුවරයාගේ වග කීම වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- මහා සංගීත සම්ප්‍රාදයන් වුල සංගීත සම්ප්‍රදායකින් වෙන් කොට හඳුනා ගත හැකි අයුරු සාකච්ඡා කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන කියවීම් පත්‍රිකාව ඉදිරිපත් කරන්න. සුවිශේෂතා සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

- එක් සංගීත සම්ප්‍රදායන් තවත් සංගීත සම්ප්‍රදායකින් වෙනස්වීම කෙරෙහි බලපාන හේතු පිළිබඳව සාකච්ඡා කරන්න. ඒ සඳහා ඇමුණුම අංක 02 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගත හැකි ය. අංක 01 ක්‍රියාකාරකමෙහි යොදවන්න. සාර්ථක කර ගැනීම සඳහා සහාය වන්න.

- කලාපවලට අයත් රටවල් ඇසුරින් ගොඩ නැගුණු මහා සංගීත සම්ප්‍රදායන් පවතින බව හඳුන්වා දෙන්න. මෙතෙක් උගත් කරුණු සමාලෝචනය කොට වගුව සම්පූර්ණ කිරීමට සහාය වන්න.

කාලච්ඡේද 02

ඇමුණුම අංක - 01

කියවීම් පත්‍රිකාව

- සංගීතය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති විවිධ නිර්වචන සහ විචාරක මත ඔස්සේ එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ යම් අවබෝධයක් ඔබ මේ වන විට ලබා ඇත. ඒ අනුව ලොව පුරා විවිධ සංගීත ශෛලීන් සහ සම්ප්‍රදායන් දක්නට ලැබෙන බවටද පිළිගනී
  ඒ අතරින් සමහර සංගීත සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ සහ ඇසුරු කරන ජන සමූහයන් දිනෙන් දින පටුවන අතර තවත් සමහර සංගීත සම්ප්‍රදායන්හි එය දිනෙන් දින පුළුල් වන බවත් දක්නට ලැබේ. එසේ දිනෙන් දින පුළුල් වෙමින් ව්‍යාප්ත වන්නා වූ සංගීත සම්ප්‍රදායන් බොහොමයක

  - ඊටම අදාළ සංගීත ව්‍යාකරණයක්
  - ඉතිහාසය හා සිද්ධාන්ත
  - ලිඛිත ක්‍රමයක්
  - සංගීත ශිල්පීන් සහ නිර්මාණ කෘති (සංගීත භාණ්ඩ ද ඇතුළත්)
    ආදිය දක්නට ලැබෙන අතර ඉතිහාසය පුරා නිරන්තරයෙන් සිදු කළ පර්යේෂණ, අත්හදා බැලීම්සහ සාධනීය උත්සාහයන් ඒ කෙරෙහි බලපා ඇත. එබඳු සංගීත සම්ප්‍රදායන් මහා සංගීත සම්ප්‍රදායන් ලෙස පිළිගැනෙන අතර එම සියළු සංගීත සම්ප්‍රදායන් චූලසංගීත සම්ප්‍රදායන් ලෙස සැලකේ.

ක්‍රියාකාරකම 01

- මහා සංගීත සම්ප්‍රදායන් වීමට අවශ්‍ය සාධක මොනවාදැයි දක්වන්න.
- චුල සංගීත සම්ප්‍රදායන්හි දැකිය හැකි ලක්ෂණතා මොනවා ද ?
- ඔබ දන්නා මහා සංගීත සම්ප්‍රදායන් හා චුල සංගීත සම්ප්‍රදායනට නිදසුන් දක්වන්න. සාකච්ඡා කරන්න.
- මහා සම්ප්‍රදායන් තවත් මහා සංගීත සම්ප්‍රදායකින් වෙනස් වන්නේ කෙසේ ද ?

ඇමුණුම - 01

ප්‍රවේශය -

- පෙරදිග සංගීතයට අයත් ගායනයක් හෝ වාදනයක් සහ බටහිර සංගීතයට අයත් ගායනයක් හෝ වාදනයක් නිරීක්ෂණයට යොමු කරන්න.

ක්‍රියාකාරකම 02



රටවල නාමාවලිය (2 වන රූපය හා බැඳේ)

1. ඉන්දියාව
2. ශ්‍රී ලංකාව
3. පකිස්තානය
4 නේපාලය
5 බංගලාදේශය
6 හංගේරියාව
7 පෝලන්තය
8 ඔස්ට්‍රියාව
9 බෙල්ජියම
10 මහා බ්‍රිතාන්‍ය
11 ජර්මනිය
12 ඉතාලිය
13 ග්‍රීසිය
14 චීනය
15 ඉරාකය
16 සෞදි අරාබිය
17 ජෝර්දානය
18 සිරියාව
19 වියට්නාමය
20 තායිලන්තය
21 මියන්මාරය
22 මැලේසියාව
23 ඉන්දුනීසියාව

රටවල් දක්වන ලද ලෝක සිතියම ප්‍රදර්ශනය කොට ඒ ඒ කලාප වලට අයත් රටවල් වෙන් කර ගැනීමට සහාය වන්න. මීළඟට පහත දැක්වෙන අයුරින් රටවල් කලාප 5 ක් ලෙස වෘත්ත යොදා ගනිමින් වෙන් කරන්න. කලාප 5 පහත දැක්වෙන අයුරින් නම් කරන්න.

A. - කලාප - අයත් රටවල් 6. 7, 8, 9, 10, 11, 12, 13
B. - කලාප - අයත් රටවල් 6. 15, 16, 17, 18
C. - කලාප - අයත් රටවල් 1, 2, 3, 4, 5
D. - කලාප - අයත් රටවල් 19, 20, 21. 22, 23
E. - කලාප - අයත් රටවල් 14

එම කලාප වලට අයත් රටවලට විශේෂිත ආහාර පාන, ඇඳුම් පැළඳුම්, නිවාස , ජීවන වෘත්තීන්, සිරිත් විරිත් කෙරෙහි දේශගුණය, භූගෝලීය පිහිටීම හා ස්වභාවික සම්පත්හි බලපෑම සාකච්ඡා කරන්න.

- එම රටවල භාවිත භාෂාවන් සහ ආගම් ද, සංස්කෘතියද සංගීතය සමඟ බද්ධ වන ආකාරය සැකෙවින් සාකච්ඡා කරන්න.
- මෙතෙක් රැස්කර ගත් තොරතුරු පන්තිය වෙතට ඉදිරිපත් කිරීමට හා සංවර්ධනාත්මක අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- (මේ සඳහා අවශ්‍ය නම් පාසලේ සමාජ අධ්‍යයනය, භූගෝලය, ඉතිහාසය වැනි විෂයයන් භාර ගුරුවරුන්ගේ සහාය ලබා ගන්න.)
- පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරගැනීමට මඟ පෙන්වන්න.

කලාපය	අයත් රටවල්	භාෂාවන්	ආගම	දේශගුණය හා භූගෝලීය පිහිටීම	සිරිත් විරිත්	සංගීතයට කළ බලපෑම	ප්‍රචලිත සංගීත සම්ප්‍රදාය
A							
B							
C							
D							
E							
F							
F							

ඇගයීම -

- ලෝකයේ පවතින සම්භාව්‍ය සංගීත පද්ධති වෙන් කර ලියා දක්වන්න.
- බංගලාදේශය, තායිලන්තය, මියන්මාරය, ඉරාකය, ජපානය, ජර්මනිය, යන රටවල පවතින මහා සංගීත සම්ප්‍රදායන් වෙන් කර හඳුන්වා දෙන්න.

මූලාශ්‍ර -

- හෙළ ගී මග ප්‍රස්ථාවනාව - ඩබ්. බී. මකුලොලුව
- ලංකාවේ සංගීත සම්භවය - සී. ද. එස්. කුලතිලක

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.3 : ලොව දිනූ සංගීත පද්ධති ලුහුඬින් හඳුනාගනිමු

ඉගෙනුම් ඵල :
- විවිධ සංගීත පද්ධතීන් වෙන් වෙන්ව හඳුනා ගනියි.
- එම සංගීත පද්ධති තුළ දකනට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුනා ගනියි.
- එම සංගීත පද්ධති තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 05

ගුණාත්මක යෙදවුම් :
- විශ්ව සංගීත ක්ෂේත්‍ර (සී. ද එස්. කුලතිලක)
- තොරතුරු ඇතුළත් ගවේෂණ පත්‍රිකාවල ඡායා පිටපත්
- ප්‍රශ්නාවලි සමඟ ඒ ඒ සම්ප්‍රදායන් හි ගායන වාදන ඇතුළත් ශ්‍රව්‍ය පට හෝ සංයුක්ත තැටි,
- අදාළ ධාවන යන්ත්‍ර සමග

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: මහා සංගීත සම්ප්‍රදායන් වශයෙන් පිළිගනු ලබන සංගීත පද්ධති පහක් මේ වන විට හඳුනාගෙන ඇත. ඒවා එකින් එක ගෙන ඉතා සරලව හා ලුහුඬින් හඳුන්වා දීම මෙහි දී අපේක්ෂා කෙරේ. එක් සංගීත පද්ධතියක් සඳහා එක් කාලච්ඡේදයක් පමණක් වෙන් කොට ඇති බැවින් ගුරුවරයාගේ පෙර සූදානම අත්‍යවශ්‍ය වේ. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය සඳහා කිසියම් සංගීත සම්ප්‍රදායකට අවශ්‍ය ශ්‍රව්‍ය පට හෝ CD තැටි සපයා ගත නොහැකි අවස්ථාවල ගවේෂණ පත්‍රිකා සකස් කිරීම සඳහා යොදාගනු ලැබූ ආශ්‍රිත ග්‍රන්ථයන්හි සඳහන් එකී සංගීත සම්ප්‍රදාය හා සම්බන්ධ රූප සටහන් ප්‍රස්තාර හෝ වෙනත් සුදුසු පින්තූර දෘෂ්‍යාධාර වශයෙන් භාවිතා කරන්න. ගවේෂණ පත්‍රිකා ද පරිශීලනය කර තිබීම වැදගත් ය. මෙහි දැක්වෙන සංගීත පද්ධති පිළිබඳ විස්තර සිසුන්ට කියවීම සඳහා පමණි. එක් එක් පද්ධතිය පිළිබඳ විස්තර අවසානයේ දැක්වෙන ප්‍රශ්නවලට ශිෂ්‍යයා ගොනු කරගත් පිළිතුරු පමණක් සටහන් ලෙස තබා ගැනීම ප්‍රමාණවත් ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- තෝරා ගත් සංගීත පද්ධතියේ ආවේණික ලක්ෂණ හඳුනා ගැනීම සඳහා කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. සුවිශේෂතා සාකච්ඡා කරන්න.

  ඒ ඒ සංගීත සම්ප්‍රදායන් සඳහා විස්තරාත්මක තොරතුරු අධ්‍යයනයට අවස්ථාව ලබා දෙන්න. ඇමුණුම අංක 02 ගවේෂණ පත්‍රිකාව ඉදිරිපත් කරන්න. ඒ ඇසුරින් එම ක්‍රියාකාරකම් හි යොදවන්න.

  කාලච්ඡේද 01

ඇමුණුම - 01

ප්‍රවේශය - භාරතීය සංගීත පද්ධතියට අදාළ කෙටි ශාස්ත්‍රීය ගායනයක් හෝ වාදනයක් ශ්‍රවණයට යොමු කරමින් එහි සුවිශේෂතා මතුකරමින් සාච්ඡාවක යෙදෙන්න.

සැ. යු - ගවේෂණ පත්‍රිකා ඡායා පිටපත් කර සිසුනට ලබා දෙන්න.

ගවේෂණ පත්‍රිකාව - 1

භාරතීය සංගීතය

ඉන්දියාව කේන්ද්‍ර කොටගෙන විකාශනය වී ඇති සංගීතය භාරතීය සංගීතය වශයෙන් සැලකේ ඉන්දියාව, පකිස්ථානය, ශ්‍රී ලංකාව , නේපාලය හා බංගලි දේශය ආදී රටවල ද ප්‍රචලිතව ඇති බැවින් භාරතීය සංගීතය පෙරදිග සංගීතය වශයෙන් ද හඳුන්වති. කෙසේ වෙතත් වේද ගායනා වලින් ඇරඹී වසර 2000 කට අධික කාලාන්තරයක් තිස්සේ වර්ධනය වී ඇති භාරතීය සංගීතය අද ලෝකයේ පවතින උසස් සංගීත සම්ප්‍රදායන් කිහිපයෙන් එකක් බවට පත් වී ඇත. නාදයෙන් ශ්‍රැතියත්, ශ්‍රැති වලින් ස්වරත් ස්වරයන් ගෙන් සප්තකයත්, සප්තකයෙන් මේලයත්, මේලයන් ගෙන් රාගයත් බිහිවන්නාවූ රාගධාරී පදනම භාරතීය සංගීතයේ ඇති ඉතාමත් වැදගත් ලක්ෂණයකි. 14 වන ශත වර්ෂයෙන් පසුව එල්ල වූ මෝගල් ආක්‍රමණ හමුවේ භාරතීය සංගීතය හින්දුස්ථානී සහ කර්ණාටක ආදී වශයෙන් දෙකඩ වුවද එකී රාගධාරී පදනම ආරක්ෂා වීම සැලකිය යුත්තකි. එමෙන්ම සංගීත භාණ්ඩ වර්ගීකරණය තුළ දක්නට ලැබෙන තත් සහ සුෂිර වශයෙන් වූ ස්වර වාද්‍ය ද ඝන සහ අවනද්ධ වශයෙන් වූ තාල වාද්‍යද යනුවෙන් කොටස් කර තිබුණ ආකාරයද භාරතීය සංගීතයටම විශේෂ වූවකි. එහෙත් මූලික ස්වර සාධන, මේල ක්‍රම, වාද්‍ය භාණ්ඩ, ගායන ශෛලීන් ශිල්ප ක්‍රම ආදි ලක්ෂණයන් සලකා බලන විට හින්දුස්ථානී සහ කර්ණාට යන සංගීත පද්ධති සැලකිය යුතු වෙනස් කම්වලින් යුක්ත බව පෙනේ. වෛදික යුගය, පශ්චාත් වෛදික හෙවත් හින්දු යුගය, මෝගල් යුගය සහ බ්‍රිතාන්‍ය යුගය ආදී වශයෙන් වර්ෂ 2000 කට අධික කාලයක් තුළ භාරතීය සංගීතය විවිධ යුග ඔස්සේ පරිණාමය වී ඇති අයුරු විමසා බැලීම ප්‍රයෝජනවත් ය.

වෛදික යනු වේදයකට අයත් යන්නයි. වේද යනු දැනුම හෙවත් ඥානයයි. ඍග්, යජුර්, සාම යන්නට පසුව එක් වූ අථර්වන් වේදයත් එක්වීමෙන් චතුර්වේදය ගොඩ නැගී ඇත. ශිල්පීය සංගීතයට අයත් ස්වර, ශ්‍රැති, ග්‍රාම, මූර්ඡනා, මේල ආදී න්‍යාය ධර්ම වේද ග්‍රන්ථ තුළ සඳහන්ව නැතත් සංගීතය හා බැඳි යාග ඉපැරණි සංගීත භාණ්ඩ, ගායනයේ ප්‍රාථමික අවස්ථා , වේද ග්‍රන්ථ තුළින් මතු කර ගත හැකිය. කෙසේ වෙතත් චතුර්වේදය අතරින් සංගීතයට වඩාත් සමීප වන්නේ සාම වේදයයි. උදාත්ත, අනුදාත්ත සහ ස්වරිත යනුවෙන් වූ නාදස්ථාන 3 ක් ඔස්සේ වේද ගීතිකා ගැයීම ද, ගීයක් ගැයීමෙහි දී අක්ෂර ඇදෙන ස්ථාන මෙන්ම. 1, 2, 3, 4 වශයෙන් අක්ෂර වලට ඉහළින් ස්වර ස්ථාන දක්වා තිබීමද 'ඕම්' අක්ෂරයෙන් වේද ගායනා ආරම්භ වීම ද එසේ මතු කරගත හැකි කරුණු අතර වේ. උදාත්ත යනු උස් වූ හඬත් , අනුදත්ත යනු පහත් වූ හඬත් සවරිත යනු ඉහත හඬ දෙකට අතර මැද හඬක් වශයෙන් සඳහන් වේ. වේද ගායනා හා සම්බන්ධ ගාන ග්‍රන්ථ ද පශ්චාත් වෛදික යුගයේ දී හමුවේ. කෙසේ වෙතත් වේද ගායනා සම්බන්ධයෙන් වඩාත් වැදගත් වන්නේ ආර්චික, ගාථික, සාමික සහ ස්වාරාන්තරික වැනි නාද අවස්ථාවන් යොදා ගනිමින් කරනු ලැබූ ගායනවන්ය. එහිදී කිසියම් ගායනයක් එක් ස්වරයකට සීමා වීම ආර්චික ලෙසද නාද අවස්ථා දෙකකින් යුක්ත වීම ගාථික ලෙසද අවස්ථා තුනකින් යුක්ත වීම සාමික ලෙස ද නාද අවස්ථා හතරකින් යුක්ත වීම ස්වරාන්තරික වශයෙන් ද සැලකුණි. ස්වාරාන්තරික යනු වේද ගායනයේ අවසන් අවස්ථාවය. එසේත් නැතහොත් භාරතීය සංගීතයේ රාග බිහිවීමට පෙර තිබූ අවස්ථා ය. කෙසේ වෙතත් වේද ගීත සඳහා සංගීත භාණ්ඩ භාවිත කළ බවත් නො පෙනේ.

භාරතීය සංගීතය තව දුරටත් විකාශනය වන ආකාරය හින්දු යුගයේ දී තවදුරටත් පැහැදිලි වනු ඇත. භරත මුනි විසින් සම්පාදිත 'නාට්‍ය ශාස්ත්‍රය' නම් කෘතිය එකල අතිශයින් වැදගත් ය. ඒ වන විට වෛදික ගායනා පැවැති තත්ත්වයට අමතරව භාරතයේ පැවැති අනෙක්

ගායන වාදන ක්‍රම, සංගීත භාණ්ඩ, නාද , ඝෘති, ග්‍රාම, මූර්චනා , ජාති , ගායකයින්ගේ ගුණ දොස්, වාදකයන්ගේ ගුණ දොස්, සමූහ වාදන හා විවිධ රස භාව ආදී සංගීතය හා සම්බන්ධ වැදගත් කරුණු රැසක් එහි අන්තර්ගතය. මීට අමතරව ක්‍රි. ව. 5 වන ශත වර්ෂයේ දී පමණ මාතාංග නම් පඬිවරයා ලියන ලද 'බෘහත් දේශී' නම් ග්‍රන්ථයේ ග්‍රාම, මූර්චනා සහ ජාති වලට අමතරව රාග ලක්ෂණ ද සහිතව මුල් වරට රාග විස්තර කොට තිබීම වැදගත් කරුණකි. තවද මාලාව, පහඩි මාන්ඩ්, භෛරව වැනි රාග ගෝත්‍රික ගී ඇසුරෙන් නිර්මාණය වී ඇති බව සඳහන් කිරීමද වැදගත් ලක්ෂණයකි. වාල්මීකීගේ රාමායනයද, ජයදේව ගේ ගීත ගෝවින්දය ද ප්‍රබන්ධ සාහිත්‍යයට අයත් වුවද සංගීතමය තොරතුරු වලින්ද යුක්තය. වේද ගායනා වලින් ඇරඹී රාග දක්වා වර්ධනය වී පැවැති භාරතීය සංගීතය 13 වන ශත වර්ෂය අවසානයත් සමග තවත් වැදගත් සන්ධිස්ථානයකට යොමු වන්නේ භාරතයට එල්ල වූ මෝගල් ආක්‍රමණත් සමඟ ය.

ක්‍රි. ව. 1800 පමණ වන තුරුම භාරතයේ උත්තර ප්‍රදේශය පාලනය කළේ මුස්ලිම්වරුන්ය . ඔව්හු කලාව ප්‍රිය කළ බැවින් භාරතයේ පැවැති සංගීතය තව දුරටත් පෝෂණය කරලීමට දායක වූහ. අල්ලා- උද්දීන් බිල්ජි, සුල්තාන් හුසේන්, ෂර්කි හා අක්බාර්, මොහමද් ෂාරංගිලේ වැනි රජවරුන්ගේ රාජ සභා සංගීතඥයින් දැඩි ලෙස ගෞරව සත්කාර කළහ. තාන්සේන්, සාරංග දේව, අමීර් කුෂ්රු, නායක බෛජු, රාම්දාස්, සදාරංග සහ අදාරංග වැනි සංගීතඥයින් එහි රාජ සභාවල සේවය කළ හ.

ධ්‍රැපද් ගායන ශෛලියේ ආරම්භකයා වන සාරාංග දේව පඬිතුමා විසින් රචිත සංගීත රත්නාකරය අතිශයින් වැදගත් කෘතියක් වන්නේ සමකාලීන භාරතීය සංගීතයේ දක්නට ලැබුණු උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු වශයෙන් වූ බෙදීම පිළිබඳ විස්තර ඇතුළත් වීම නිසාය. පර්සියන් ජාතික යෙකු වූ අමීර් කුෂ්රු වීනාව ඇසුරින් සිතාරයද, පඛ්වාජය ඇසුරින් තබ්ලාවද, ඩෝලයද වැනි සංගීත භාණ්ඩ නිර්මාණය කරමින්ද ත්‍රිතාල් දාදරා, සවාරි, අඩා චෞතාල්, ඣුම්රා වැනි තාලද කව්වාලි, ගසල්, තරාණා වැනි ගායන ශෛලීන්ද යමන් ආශාවරී පුරියා, පූර්වි, විලාස්ඛාන්, තෝඩි, බිලාවල් වැනි රාගද නිර්මාණය කරමින් භාරතීය සංගීතයට අමිල සේවාවක් ඉටු කළේ ය. ඛ්‍යාල් සහ භජන් වැනි ගායන ශෛලීන් හඳුන්වා දෙනු ලැබුවේද මෝගල් පාලකයකු වූ සුල්තාන් හුසේන් ෂර්කි (ක්‍රි. ව 1465 - 1533) රජතුමා විසිනි. මේ ආකාරයට මුස්ලිම් බලපෑම හමුවේ අරාබි පර්සියන් ආදී සංගීත සම්ප්‍රදායන් මිශ්‍ර වෙමින් භාරතීය සංගීතය උතුරු ඉන්දියානු සංගීතය හෙවත් හින්දුස්ථානි සංගීතය වශයෙන් ගොඩ නැගෙන විට මුස්ලිම් ආක්‍රමණ හමුවේ, පලාගිය ස්වදේශිකයන් විජය නගර්හි සිය රාජධානිය පිහිටුවා ගනිමින් සිය පාරම්පරික උරුමයන් රැකගැනීමට වෙහෙසුනහ. වේද ගායනා වලින් ඇරඹුණු භාරතීය සංගීතය එම ලක්ෂණයන්ගෙන් යුතුව කර්ණාට සංගීතය වශයෙන් දකුණු ඉන්දියාවේ පෝෂණය වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව ක්‍රි. ව. 1550 පමණ කාලයේ රාමාමාත්‍ය පඬිතුමා විසින් ලියන ලද '' ස්වර මේලකලානිධි'' නම් ග්‍රන්ථයද කර්ණටක සංගීතය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රැසක් ඇතුළත් කෘතින්ය. ගණිතමය ක්‍රමයක් මත කර්ණාට සංගීතයෙහි එන රාග මේල 72 ක් වටා ගොණු කොට ඇත්තේ ව්‍යංඛට මුඛීගේ 'චතුර් දණ්ඩි ප්‍රකාශිකා' නම් කෘතියේය. තවද වර්ණම් ගායන සඳහා තෙලිඟු බසින් ගීත සහස් ගණනක් නිර්මාණය කළ සංගීතඥයෙකු වන ත්‍යාග රාජා ද කර්ණාට සංගීතයේ වර්ධනය ට ලබා දී ඇති මෙහෙය පැසසිය යුතු ය. කෙසේ වෙතත් භාරතීය සංගීතයේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන මෝගල් යුගය ක්‍රමයෙන් මුස්ලිම්වරුන්ගේ බලය හීන වීමත් සමග ක්‍රි. ව. 1800 දී පමණ නිමා වන්නේ ය.

ක්‍රි. ව. 1800 දීපමණ ඇරඹෙන ඉංග්‍රීසි යුගය 19 වන සියවසේ මැද භාගය දක්වා පැතිර යයි. මෝගල් යුගයෙන් පසු සංගීතඥයන් අතර නොයෙකුත් මත භේද හටගන්නට විය. තම තමන් පිළිගත් න්‍යායන් තහවුරු කිරීමටත් අන් අයගේ මත බැහැර කිරීමටත් උත්සාහ කළ බැවින්ද විවිධ අර්බුද කාරී තත්තවයන් ගොඩනැගුනි. රාජ්‍ය අනුග්‍රහයද පෙර පරිදි නොලැබීම නිසා භාරතීය සංගීතය පරිහානිය කරා යොමුවන්නට විය. මේල හා රාග වර්ගීකරණයන් පිළිබඳව ඇති වූ එකී මත බේද ක්‍රමවත් කරන්නට යාමෙන් පරිහාණිය කරා ගමන් කරමින් තිබූ භාරතීය සංගීතය යලිත් වරක්

නවෝදයක් කරා යොමු කරලීමට හැකිවෙයි. ජයපුර්හි විසූ මහා රාජ වන 'ස්වයි ප්‍රතාප් සිං' පවත්වන ලද සංගීත සම්මේලනද ඒ ඇසුරින් සම්පාදිත 'සංගීත සාර' නම් ග්‍රන්ථයද එහි ප්‍රතිඵලයකි. බිලාවල් ඨාටය ශුද්ධ ඨාටය ලෙස පිළි ගැණුනේ ඉන් අනතුරුව ය. තවද ශ්‍රේෂ්ඨ සංගීතඥයන්ද, වටිනා සංගීත ග්‍රන්ථද සංගීත විද්‍යායතනයද බිහිවීම සැළකිය යුතු කරුණකි. ඒ අතර විෂ්ණු නාරායන භාත් ඛණ්ඩේ පඩිතුමාට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. හින්දුස්ථානි මේල 10 ක් බවට පරිවර්තනය කරන්නේ මෙතුමාය. මෙතුමා විසින් සම්පාදිත හින්දුස්ථානී සංගීත ශාස්ත්‍ර , ශ්‍රීමල් ලක්ෂ සංගීතම්, අභිනවගීත මංජරී , ක්‍රමික් පුස්තක් මාලිකා, යන කෘතිද එතුමා විසින් බිහි කළ ලක්නව් මාරිස් කොලේජ්, භාත්ඛණ්ඩේ සංගීත විද්‍යාලය, බැරෝඩා විද්‍යා පීඨය, මාධව සංගීත විද්‍යාලය වැනි සංගීත ආයතනද භාරතීය සංගීතය අත් කරගත් ප්‍රගතියට කදිම නිදසුන්ය. රවීන්ද්‍රනාත් තාගෝර්, විෂ්ණු දිගම්බර්, පලුෂ්කාර්, රතන් ජංකර්, අලව්දීන් ඛාන්, අලි අක්බර් ඛාන් වැන්නන් ගෙන්ද භාරතීය සංගීතයට ඉටු වූ මෙහෙය ද විමසිය යුතු ය.

භාරතීය සංගීතය තුළ දක්නට ලැබෙන සංගීත භාණ්ඩ මෙසේ දැක්විය හැකි ය.

තත්	සුෂිර	ඝණ	අවනද්ධ
හින්දුස්ථානි			
සිතාර්	බටනලාව	තාලම්පට	තබ්ලා
තාම්පුරා	ෂනායි	ගෙජ්ජි	ඩෝල් (ඩෝලක්)
සරෝද්	ශ්‍රැති මංජුසාව	ජල තරංග	ඩොල්කි
සාරංගි	සර්පිනා (හාර්මෝනියම්)	මර්කාස්	පඛ්වාජ්
දිල්රුබා		කාස්ඨතරංග	චෙංඩා
එස්රාජ්			බෝල්
සන්තූර්			නක්‍රා
ස්වර මණ්ඩල			
කර්ණාට			
වීණාව	නාදස්වරම්	තාලම්පට (නටුවාංගම්)	මෘදංග
තාම්පුරාව	බටනලාව	සපලක්කඩි	තවිල්
ගෝටු වාද්‍යම්	ශ්‍රැති මංජුසාව	ගෙජ්ජි	ගංජිරා
ඒක්තාර්		ඝටම්	මද්දල
			මෝර්සිං

ක්‍රියාකාරකම අංක 01

ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සාකච්ඡා කොට අනුපිළිවෙලින් ගොනු කරන්න.

i භාරතීය සංගීතයේ ප්‍රභවය කුමන ගායනා විශේෂයක් හා සම්බන්ධ ද ?
ii මෙම සංගීතයේ පරිණාමය බෙදා දැක්විය හැකි යුග කීයක් තිබේ ද? ඒ මොනවා ද?
iii උදාත්ත අනුදාත ස්වරිත යනු මොනවා ද ?
iv 'නාට්‍ය ශාස්ත්‍රය ' යන කෘතියේ දැක්වෙන සංගීතය හා සම්බන්ධව ලියවුණු වැදගත් කරුණු මොනවා ද?
v මුස්ලිම් බලපෑමත් සමගම භාරතීය සංගීතය තුළ ඇතිවුණු ප්‍රධානම වෙනස කුමක් ද ?
vi මෝගල් යුගයේ දී භාරතීය සංගීතයේ උන්නතියට දායක වූ විශිෂ්ට සංගීඥයන් හා ඔවුන්ගේ නිර්මාණ කෘති පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

vii කර්ණාට සංගීතය සහ හින්දුස්ථානි සංගීතය වඩාත් ක්‍රමවත් වූ ආකාරය සුවිශේෂ සංගීතඥයින්ගේ පර්යේෂණ සහ කෘති ඇසුරෙන් හඳුන්වා දෙන්න.

viii බ්‍රිතාන්‍ය යුගය ආරම්භ වනවිට භාරතීය සංගීතය තුළ දක්නට ලැබුණු ලක්ෂණ කෙටියෙන් දක්වන්න.

ix භාරතීය සංගීතයට භාත්ඛණ්ඩේ පඩිතුමා ගෙන් ලැබුණු දායකත්වය කෙටියෙන් පහදන්න.

x හින්දුස්ථානි සහ කර්ණාට යන පද්ධති දෙකට අයත් තත් සහ අවනද්ධ භාණ්ඩ 2 බැගින් ලියා දක්වන්න.

- ඔබ සපයන ලද පිළිතුරු, නිර්මාණය කළ ප්‍රශ්න සහ සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න. සාකච්ඡා කරන්න. සමාලෝචනයක යෙදෙන්න.

පහත දැක්වෙන අනුශිර්ෂ මත ඔබ අධ්‍යයනය කළ කරුණු ගොනු කරන්න.

1. භාරතීය සංගීතයේ විකාශයට වේද ගායනා පදනම් වූ අයුරු
2. භාරතීය සංගීතයේ විකාශයට ගෝත්‍රක ගී පදනම් වූ අයුරු
3. භාරතීය සංගීතයේ විකාශයට පද්‍ය ප්‍රබන්ධ ගී පදනම් වූ අයුරු
4. භාරතීය සංගීතයේ විකාශයට සංගීතඥයින්ගේ පරිශ්‍රමය පදනම් වූ අයුරු

ඇගයීම - මෝගල් යුගයේ යුග පුරුෂයා ලෙස හැඳින්වෙන අමීර් ඛුෂ්රු සංගීතයට කරනු ලැබූ සේවාව උදාහරණ සහිතව විස්තර කරන්න.

මූලාශ්‍ර -

- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - පිටු අංක 8 -14 දක්වා - සී. ද. එස්. කුලතිලක
- ජන සංගීත සිද්ධාන්ත - සී. ද. එස්. කුලතිලක
- ''විශ්ව සංගීත ක්ෂේත්‍ර' - සී. ද. එස්. කුලතිලක
- ජාතික අධ්‍යාපන ආයතනය -' සංගීත භාණ්ඩ වර්ගීකරණය' හා භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය, සංගීතයට පිවිසුමක් - මොඩියුල
- ජන සංගීත සිද්ධාන්ත- 9 -18 දක්වා පිටු

ඇමුණුම - 02

ගවේෂණ පත්‍රිකාව
අපර දිග සංගීතය

එංගලන්තය, ප්‍රංශය, පෘතුගාලය, ජර්මනිය, නෝර්වේ, ඉතාලිය, බෙල්ජියම, ග්‍රීසිය, ඕස්ට්‍රියාව, ආදී යුරෝපා මහාද්වීපයට අයත් රටවල් තුළ භාවිත වන සංගීතය. අපරදිග සංගීතය හෙවත් බටහිර සංගීතය ලෙස හැඳින්වේ. එහි ප්‍රභවය එක් රටකට සීමා කර දැක්විය නොහැකි අතර ඇතැම් මූලික සිද්ධාන්ත ග්‍රීසියටත් රෝමයටත් සම්බන්ධ කරලීමට ඇතැම් විචාරකයෝ යත්න දරති. ටර්පැන්ඩර්, පයිතගොරස්, ආකයිටස්, ඉයුක්ලිඩ් සහ ඇරිස්ටොක්සිනිස් යන ක්‍රි.පූ. යුගයට අයත් සංගීතඥයින්, ගණිතඥයින් සහ දාර්ශනිකයන් ගේ පර්යේෂණවලට අනුව ස්වර මිනුම් ක්‍රම, ස්වර මේල ක්‍රම ආදී සිද්ධාන්තර එවකට ග්‍රීසියේ ප්‍රචලිතව තිබීමත් ඊට පසු කාලීනව එම ඥාන සම්භාරයන් සෙසු යුරෝපා රටවල් විසින් අත්පත් කර ගැනීමත් එයට හේතු වශයෙන් දැක්විය හැක. කෙසේ වෙතත් බටහිර සංගීතය ආරම්භ වන්නේ දේවගීතිකා ගායනය ක්‍රමවත් කරලීමට දැරූ උත්සාහයන් හි ප්‍රතිඵල වශයෙනි. ක්‍රිස්තු ඇදහීම් ක්‍රම ස්ථාපිත මුල්ම යුරෝපා රට ඉතාලිය වන අතර රෝමයේ පවත්වන ලද දේව පූජා සඳහා ගැයිය යුතු ගීත ගැන මුලින්ම විචාරයක් කළේ මිලාන් නගරයේ විසූ ශාන්ත ඇම්බ්‍රොස් බිෂෝප් තුමාය (ක්‍රි. ව. 374 - 99) ඒවා ගැයීම සඳහා මෙතුමා නාද මාලි, හෙවත් 'මෝඩ්' සතරක් නිර්දේශ කළේ ය. මෙම 'මෝඩ්' සතර D.E.F සහ G යන ස්වර ස්ථාන වලින් ආරම්භවන ස්වර මාලිකා සතරකි. ගායනා ඉදිරිපත් කිරීමේ දී දෙපිලකට බෙදී එකම ගීතය මාරුවෙන් මාරුවට ගායන ඇන්ටි ෆොන්ල් හෙවත් ප්‍රති ශ්‍රවණ ක්‍රමය ඇම්බ්‍රොස් බිෂෝප්තුමාගේ නිර්දේශවලට අයත් වූයේ ය.

එසේ ගොඩනගන ලද දේව ගීතිකා ගායනය පියතුමා විසින් (ක්‍රි. ව. 509 -604) තව දුරටත් වර්ධනය කරනු ලැබීය. ඇම්බ්‍රොස් පියතුමාගේ 'මෝඩ්' සතරට තවත් ''මෝඩ්'' සතරක් එකතුකොට එක් එක් ගීත සඳහා ආරම්භක ස්වර (Recitatie Note) සහ අවසාන ස්වර ද මෙතුමා විසින් නියම කළේ ය. ''ස්කෝලා කැන්තෝරුවේ' නමින් ආයතනයක් බිහි කොට එහි දේව ගීතිකා ගායනය පුහුණු කළ ගායකයින් (Choristers) සෙසු යුරෝපා රටවල දේව ගීතිකා ගායනයට පිටපත් කර හැරීමට ද කටයුතු කළේ ය. ඔවුනගේ පහසුව සඳහා ගීත පිටපත් වල පේලි වලට ඉහලින් හඬ උස් පහත් කළ යුතු ස්ථාන දැක්වීම සඳහා සංකේත ක්‍රමයක් ද යොදා ගන්නා ලදී. එය බටහිර ස්වර ප්‍රස්තාර කමයේ ප්‍රාරම්භක අවස්ථාව ලෙස සැළකිය හැකි අතර සාන්ත ග්‍රෙගරි පියතුමා විසින් ක්‍රමවත් කරන ලද මෙම දේව ගීතිකා ගායන ව්‍යුහය ග්‍රෙගෝරියන් චාන්ට් හෙවත් ග්‍රෙගෝරියානු සජ්ජායනය වශයෙන් හඳුන්වන අතර එය 9 වන ශත වර්ෂය තෙක්ම පැවැතුණි.

බටහිර සංගීතය සම්බන්ධයෙන් වැදගත් වන මීළඟ පියවර සනිටුහන් වන්නේ ගීඩෝද ඇරෙස්සෝ (995-1450) පූජක තුමාගෙන් එවකට තනි රේඛාවක් දෙපස හඬ උස් පහත් වන ප්‍රමාණය අනුව සටහන් කළ සංකේත ක්‍රමයක් දක්වා වර්ධනය වී තිබූ ප්‍රස්තාර ක්‍රමය රේඛා 4 ක් දක්වා වර්ධනය කරන ලද්දේ ද උට්, රේ, මී, ෆා, සෝල්, ලා යනුවෙන් ස්වර 6 කි න් යුතු ස්වර මාලිකය සකස් කරන ලද්දේ ද ගීඩෝ ද ඇරෙස්සෝ පූජක තුමා විසිනි. මෙම ස්වර මාලිකයේ මූලට 'ඩෝ' යන්නද 7 අගට 7 වන ස්වර ස්ථානය ලෙස 'ටේ' යන්නද යොදා මුළු සාධනයම ' ටොනික් සොල්ෆා' යනුවෙන් නම් කරන ලද්දේ කර්විත් (1840) විසිනි. හාමනි ක්‍රමයේ මූලික පියවරක් වශයෙන් ප්‍රථම සහ සතර වන (සඩ්ජ - මධ්‍යම) ස්වර ස්ථාන පදනම් කොට හඬ තල දෙකකින් යුතුව ඉදිරි පත් කළ ගායනා සමාන්තර සංයෝජන (පැරලල් - හාමනි) ඕගනුම් වශයෙන් දක්වා තිබේ. ඕගනුම් ක්‍රමය මත ලියන ලද ප්ලේන් සෝං ගී රැසක් මේ වන විට දක්නට ලැබුණි. ඕගනුම් සැලැස්මට එකවර සමාන්තරව ගැයෙන තනු පාද දෙකක් තිබේ. මෙහි මුල් තනු පාදය ටෙනර් නමින්, එයට සමාන්තරව ඉහලින් ගැයෙන පාදය ඩුප්ලුම් නමින්ද හඳුන්වනු ලැබීය. ගීතයේ ටෙනර් නමින් වූ පාදයට ඉහලින් වෙනත් වචන සමූහයකින් සරසන ලද තවත් පාදයක් යෙදීමෙන්

(ඩුප්ලුම් වෙනුවට) මොටෙට් ගීත රටාව බිහිවිය. මෙම අමතර පාදය ගැයීමෙහිදී මූලික ගීත රටාව බිහිවිය. මෙම අමතර පාදය ගැයීමෙහි දී මූලික ටෙනර් පාදයට වෙනස් ලය මානයකින් එය ගයන ලදී. මෙම ක්‍රමය කල් යත්ම කවුන්ටර් පොයින්ට් නමින් ප්‍රචලිත විය. ප්ලේන්සොං ගීතයේ ඕගනුම් සැලැස්මට කවුන්ටර් පොයින්ට් ක්‍රමයද ඇතුළත් කිරීමෙන් ලබාගත් මොටෙට් ගීත රටාව නියම පොලි ෆොනික් හෙවත් බහුනාද ක්‍රමය ගෙන දුන්නේය. මේ සියල්ල දේවස්ථානය තුළ සිදු වූ පරිණාම අවස්ථා ලෙස සැළකිය හැකි ය.

මෙතෙක් දේවස්ථානයට සීමා වී තිබූ බටහිර සංගීතය මුල් වරට ගියොම් ද මැෂෝ නමැති සංගීතඥයා (1290 - 1377) මාස් සහ මොටෙට් වැනි දේව ගීතිකා පොදු ජන රස වින්දනය සඳහා යොදා ගනු ලැබීය. එතෙක් පල්ලිය විසින් තහනම් කරනු ලැබූ වාද්‍ය භාණ්ඩද ඒ සඳහා යොදාගනු ලැබීය. මේ වන විටත් රජ මාලිගවලත් ප්‍රභුවරුන් ගේ නිවෙස් වලත් වර්ධනය වෙමින් තිබූ වෙනම සංගීත ක්‍රමයක් දක්නට ලැබුණි. එය පවත්වා ගෙන යනු ලැබූ ගායකයන් කාව්‍ය සංගීතඥයින් වශයෙන් (Poet Mu sician) හඳුන්වා ඇත. මේ අනුසාරයෙන් උතුරු ඉතාලියේ බිහිවූ මැඩ්රිගල් ගීත විශේෂය ද බටහිර සංගීතය තුළ පරිවර්තනයක් කිරීමට සමත් විය. දේවස්ථාන රීතිවලින් බැහැර වූ සැම අතින්ම නිදහස් ගෘංගාරාත්මක ගීත විශේෂයක් වූ මැඩ්රිගල් ගීත 14 වැනි ශත වර්ෂයේ නිවෙස් වල ප්‍රිය සම්භාෂන සඳහා යොදාගන්නට විය. නිදහස් සිතුම් පැතුම්, උපහාසය, මානුෂික ආකල්ප, නාගරික මෙන්ම ගම්බද ජීවිතය, ආදරය, දේශපාලනය හා සමාජවාදී ආකල්ප පුනර්ජීවන යුගයේ ප්‍රතික්‍රියා වශයෙන් සංගීත තේමාව එක්වූයේ මැඩ්රිගල් මාධ්‍ය කොට ගෙනයි.

දේව ගීතිකා ගායන ක්‍රමවලට ජන සංගීතයේ ක්‍රම එක්කරමින් ද එතෙක් ලතින් භාෂාවෙන් වූ ගීතීකා වෙනුවට ඒ ඒ රටවල මව් භාෂාව ඒ සඳහා යොදාගත් යුතු යැයි දක්වමින් ද ආගමික විප්ලව කරමින් පෙරමුණට පැමිණි මාටින් ලුතර් පූජක තුමා බටහිර සංගීතය තවතවත් පෝෂණය කළ අයෙකි. එසේම බටහිර සංගීත සැලැස්මේ ආදි කතෘ වශයෙන් සැලකෙන රෙනේසාන්ස් යුගයේ බිහිවූ ශ්‍රේෂ්ඨ සංගීතඥයා වශයෙන් සැලකෙන ජොස්කෑන් ඩේප්‍රේ (1450 - 1521) සුවිශේෂ පුද්ගලයෙකි. විවිධ සංශෝධනයන්ට ලක්වෙමින් පැවැති බටහිර සංගීතයට ඉතාලියෙන් ඇරඹී ජර්මනියේ වර්ධනය වූ කැන්ටාටාව ට සමූහ ගායන මෙන්ම වාදනද ඇතුළත් විය. පසුව සමූහ සහ ඒකල යන ගායනා අංග ඇතුළත් වීමෙන්ද ගායකයන් හා වාදකයන් විශාල සංඛ්‍යාවක්ද යොදා ගනිමින් ද සංගීතමය වශයෙන් පෝෂණය වූ ඔරටෝරියෝ කැන්ටාටාව අභිබවා නැගී සිටියේ ය. 16 වන ශත වර්ෂයේ දී ගීත නාටකයෙන් බිහිවූ ගීත වාද්‍ය නෘත්‍ය යන අංගත්‍රයෙන්ම පෝෂණය වූ ඔපෙරාව අදත් යුරෝපයේ බහුතර ජනයාගේ වැදගත් විනෝදාංශයක් ලෙස පවතියි. බටහිර ඔපෙරාවෙන් සංගීතාංග රාශියක් බිහිවිය.

බටහිර සංගීතයේ අප විසින් හඳුනාගත යුතු මූලික ලක්ෂණ කීපයක් තිබේ. භාරතීය සංගීතයේ මෙන් නොව බටහිර සංගීතයේ සෑම ස්වරයක්ම අචල තත්වයෙන් පවතී. එක් ස්වරයකින් තවත් ස්වරයකට හඬ ගලා යාමේ 'මීන්ඩ්' ක්‍රමය බටහිර සංගීතයේ නැත. සෑම ස්වරයක්ම මුල්කොට ස්වර සංයෝජන ලබා ගත හැකි පරිදි ස්වර සාධනය ප්‍රමිත කර තිබීම මෙහි තවත් විශේෂ ලක්ෂණයකි. එසේම අති විශාල භාණ්ඩ සංඛ්‍යාවක් දක්නට ලැබීම ද බටහිර සංගීතයේ දක්නට ලැබෙන විශේෂය කි.

- ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සාකච්ඡා කොට අනුපිළිවෙලින් ගොනු කරන්න.
  - i බටහිර සංගීතයේ මූලික සිද්ධාන්ත සමඟ සම්බන්ධ වන රටවල් ලෙස පිළි ගැනෙන්නේ කුමන රටවල් ද?
  - ii කතෝලික දේවස්ථානය තුළ ගීතිකා ගායනය ක්‍රමවත් කරලීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස බටහිර සංගීතය බිහිවූ බව ශාන්ත ඇම්බ්‍රොස් බිෂෝප් තුමාගේ සහ ශාන්ත ග්‍රෙගරි පියතුමාගේ ක්‍රියාකාරිත්වයෙන් පිළිබිඹු වන අයුරු සරලව දක්වන්න.

iii බටහිර ස්වර ප්‍රස්තාර කරණයේ ආරම්භය සිදුවූ ආකාරය හඳුන්වන්න. එය වර්ධනය වූ අයුරු දක්වන්න.

iv බටහිර සංගීතය දේවස්ථානයෙන් බැහැර වී පොදු ජන වින්දනය සඳහා සංගීත රටා බිහිවීම ඇරඹුනේ කුමන වකවානුවකද ? එහි පුරෝගාමියා කව් ද?

v දේවස්ථානයෙන් පිටතට පැමිණි සංගීතය මැඩ්රිගල් සංගීතය තෙක් වර්ධනය වූ ආකාරයද මැඩ්රිගල් සංගීතයේ දක්නට ලැබුණු ප්‍රවණතාද කෙටියෙන් සඳහන් කරන්න.

vi ජර්මනියේ මාටින් ලූතර් පූජකතුමා දේවස්ථාන සංගීතය තුළ කරන ලද වෙනස්කම් කෙටියෙන් හඳුන්වන්න.

viii බටහිර සංගීතයේ දක්නට ලැබෙන සුවිශේෂතා ලැයිස්තුවක් පිළියෙල කරන්න.

- එම පිළිතුරු අතර දක්නට නොලැබුණු තවත් වැදගත් කරුණු පිළිතුරු බවට පත් කරමින් ප්‍රශ්න හතරක් නිර්මාණය කරන්න.
- ඔබ කියවූ ගවේෂණ පත්‍රිකාව සියළු වැදගත් කරුණු සහිතව වචන 150 ක් වන සේ සාරාංශ කරන්න.
- ඔබ සපයන ලද පිළිතුරු නිර්මාණය කළ ප්‍රශ්න සහ සාරාංශ පන්තියට ඉදිරිපත් කරන්න. සාකච්ඡා කරන්න. සමාලෝචනයක යෙදෙන්න.

ඇගයීම - බටහිර සංගීතය දේවස්ථානයෙන් බැහැර වී පොදු ජන වින්දනය සඳහා සංගීත රටා බිහිවීම පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

ඇමුණුම අංක 03

ගවේෂණ පත්‍රිකාව 03
චීන සංගීතය

චීන සංගීත සම්ප්‍රදායේ ප්‍රභවය ක්‍රි. පූ 2690 කට තරම් දුරාතීතයකට විහිදයයි. ලොව ඇති ඉපැරණිම ලිඛිත ඉතිහාසයද, පැරණිම රාජ සභා සංගීතයද චීන සංගීතය සතුවන අතර ඉපැරණි ස්වර මිනුම් ක්‍රමයක් ද ඊට අයත් ය. චීන සංගීතයේ විකාශය

1. ප්‍රාරම්භක යුගය - (ක්‍රි. පූ. 3000 සිට 14 වැනි ශත වර්ෂය දක්වා)
2. අන්තර් ජාතික යුගය - (ක්‍රි. ව. 05 වන ශත වර්ෂය සිට 09 වන ශත වර්ෂය දක්වා)
3. ජාතික යුගය (10 වන ශතවර්ෂයේ සිට 19 වන සියවස)
4. නූතන යුගය (20 වන සියවසේ සිට)

ආදී වශයෙන් යුග හතරකට අනුව සළකා බැලිය හැකි ය.

ප්‍රාරම්භක යුගයෙන් හමුවන තොරතුරු අතර එය වෘත්තාන්තයකට අනුව හුවං - ති රජතුමා ගේ (ක්‍රි. පූ. 2690) නියමයකට අනුව සංගීත ස්වර සකස් කිරීම සඳහා උණ බට සොයා ගැනීමට ලිං ලුං ඇමතිවරයා පිටත් කොට ඇත. ඔහු සමාන පරිධියකින් යුත් දිගින් වෙනස් 'බටනලා කිහිපයක් සකස් කර ගත්තේය. එහි මුල් නලාවෙන් නැගෙන හඬ හුවං - චුං (කහ ගණ්ඨාව) නමින් හැඳින්වීය. (මෙය කම්පන වාර 366 කින් යුත් තීව්‍ර මධ්‍යමයට සමීප වන තීරු 81 ක් හෙවත් සෙ.මි. 20 ක් පමණ දිග නලාවකි) එම මුල් නලාවේ දිගට 2/3 ක ප්‍රමාණය බැගින් අඩු වෙමින් යන්නාවූ බටනලා 6 ක්ද 2/3 බැගින් වැඩිවෙමින් යන්නා වූ බට නලා 6 ක්ද වශයෙන් නලා 12 ක් සකස් කර ගෙන ඇත. එහි එක් නලාවකින් එක් ස්වරය බැගින් උපදවා ගනු ලබන අතර ස්වර 12 ක් ඇත. මෙය චීන ස්වර සාදනයේ ආරම්භ ය විය. චීන ස්වර හඳුන්වන්නේ ලූෂූ (LU) නමිනි.

චීන සංගීතයේ මෙම ස්වර 12 මාස 12 වශයෙන් නිතර භාවිත වන ස්වර 5 (පංචටෝන) පංචම දිශා සංකේතවත් කිරීමෙන් ද නලාවල දිග අඩු වැඩි කිරීම සඳහා යොදා ගත් 2/3 සංඛ්‍යාතයෙහි 3 යන්නෙන් ස්වර්ගයන් 2 යන්නෙන් මිහිතලයත් සංකේතවත් කිරීමෙන්ද පෙනී යන්නේ චීන සංගීතය රස වින්දනයට පමණක් සීමා නොවී විශ්වය හා සම්බන්ධ භෞතික සිද්ධාන්ත හා සම්බන්ධ කොට ඇති බවය.

මැටි, ශෛල, ලෝහ, හම්, ලී ,උණ බම්බු, ලබු සහ සේදනූල් යන ද්‍රව්‍යයන් 8 මූලික වශයෙන් යොදා ගනු ලැබීමෙන් නිර්මාණය කරගත් සංගීත භාණ්ඩ එම ද්‍රව්‍යයන් අනුවම වර්ගීකරණය කර තිබීම (ෂුං අධිරාජ්‍ය සමය - ක්‍රි. පූ 2255 - 2206) ද චීන සංගීතයේ දක්නට ලැබෙන විශේෂත්වයකි.

- උණ බම්බු - පෑන් පයිප්, ෂෙං නැමැති මවුත් ඕගනය
- සේද - සියළු තත් වාද්‍ය භාණ්ඩ
- ශෛල - පියං - චිං (ස්වර තබන ලද ගල් පතුරු)

  වැනි භාණ්ඩ ඊට නිදසුන් ලෙස දැක්විය හැකිය .

රාජ සබා සංගීතය හා සම්බන්ධ පළමුවන රාජකීය සංගීත ආයතනය ක්‍රි පූ 141-87 සිට වුඩී රජතුමාගේ කාලයට අයත් ය. මෙය යුයි - පු (yeu - fu) වශයෙන් හඳුන්වා ඇත. ලියු නලාවල ඇති ස්වරයන් හි නිවැරදි බව සොයා බැලීම, සංගීත උත්සව පරිපාලනය, ජන ගී ලේඛනාගාරයක් ඇති කිරීම යනාදිය මෙම ආයතනයකට පැවරුණ ප්‍රධාන කාර්යයන් අතර වේ.

ප්‍රාරම්භක යුගයෙන් ලැබෙන මේ සියළුම තොරතුරු අතර වඩාත් වැදගත් වන්නේ චීන ස්වර මාලිකය පිහිටුවා ගත් ආකාරය යි. ලොව ඇති අන් ප්‍රධාන සංගීත පද්ධති ඔවුන්ගේ ස්වර මාලික තත් භාණ්ඩ අනුව සකස් කර ගෙන ඇති අතර චීනය එය බටනලා ඇසුරෙන් සකස් කරගෙන තිබේ.

අන්තර් ජාතික යුගයේ දී චීනයට විදෙස් රටවලින් සංගීත භාණ්ඩ ප්‍රවිශ්ට වන්නට විය. ක්‍රි.ව 60 දී පමණ චීනයේ බටහිර දේශ සීමාවෙන් ඇතුලු වූ භාරතීය මහායාන භික්ෂූන් වහන්සේ ලා තම ආගමික කටයුතු සඳහා ඇසිරියානු තත් භාණ්ඩ චීනයට රැගෙන ගියහ. මිසරයේ පැවැති සමහරක් තත් භාණ්ඩ සහ තාඩ්‍ය වර්ගයේ භාණ්ඩද ඒ අතර විය. චීනයට උතුරු දේශ සීමාවෙන් ඇතුලු වූ සතුරු හමුදා යුධ කාර්යයන් සඳහා යුධ බෙර වර්ග සහ විශාල ට්‍රම්පට් වර්ගයේ නලා වර්ග රැගෙන විත් ඇත.

චීන සංගීතයේ උච්ඡතම අවස්ථාව අයත් වන මෙම යුගයේ දී රාජ සබා සංගීතයද කැපී පෙනේ. සංගීතඥයන් වූ රජවරුද දක්නට ලැබේ සමහර රාජ සභාවලට වෘත්තීය සංගීත හා නාට්‍ය ශිල්පීන් 10.000 ක් පමණ සේවය යෙදී සිට ඇත අතර සංගීත භාණ්ඩ වර්ග 300 ද ඉක්මවා භාවිතා වී ඇත. මෙම යුගයේ දී රාජ සභා සංගීතයට අමතරව යුද කාර්යයන් සඳහා ද විහාරස්ථාන කටයුතු සඳහා ද මළවුන් ගේ උත්සව සඳහා ද ආදී වශයෙන් වෙන් වූ සංගීත කණ්ඩායම් පැවත ඇත. මෙම යුගයේ දී දක්නට ලැබෙන තවත් වැදගත් ලක්ෂණයක් නම් චීන භාෂාවේ ඇති උච්ඡාරණ නාද ක්‍රමය (Tonal language system) චීන සංගීතයට යොදා ගැනීමය. චීන පද්‍ය ගායනයේ ප්‍රබලව දක්නට ලැබුණු අවස්ථාව සහ සංකේත 04 කින් යුතු එම උච්ච නීච භාවය සහිත උච්ඡාරණ ක්‍රමය ෂෙන් යු වේ රජතුමා ක්‍රි. ව 441- 513 විසින් ක්‍රමවත් කොට ඇත. එය පිං සේ වශයෙන් නම් කොට ඇත.

ජාතික යුගය වශයෙන් තුන්වන යුගයේ දී චීන සංගීතය තුළ දක්නට ලැබෙන කැපී පෙනෙන ප්‍රවණතාවය වූයේ නාට්‍ය දෙසට යොමු වීම යි. චීන ඉතිහාසයේ උතුරු හා දකුණු වශයෙන් නාට්‍ය ක්‍රම දෙකක් විය. එයින් උතුරු නාට්‍ය ක්‍රමයට විදේශීය ලක්ෂණ ඇතුළු වූ අතර

i

දකුණු නාට්‍ය ක්‍රමය සාම්ප්‍රදායික ස්වරූපයෙන් පැවතුණි. නාට්‍ය ක්‍රමය නිසා චීන සංගීතය තුළ ඒකල ගායනයද, වාදනයද වර්ධනය විය. ක්‍රි. ව. 1280 දී පමණ මෝගල් බලපෑමක් සමඟ උතුරු චීන නාට්‍ය කලාව තුළට සාර් නාට්‍ය ක්‍රමයේ ආභාෂය ලැබුණි. 14 -17 ශත වර්ෂ වන විට චීන සංගීතයට යුරෝපා බලපෑම් ද ලැබෙන්නට විය. යුරෝපීය භාෂාවලින් පොත පත ලියන්නට වූයේ මේ අවදියේ දීය. චීන රාජ සභාවල පෙරෙයිරා, ජේද්‍රිනී වැනි යුරෝපීය සංගීතඥයින් සේවය කොට ඇත. 17 වන ශත වර්ෂයේ සිට ඔපෙරා වර්ධනය වන්නට විය. කැන්ටන්, ෆ්‍රිකියක්. ඇමොයි, ෂැංහායි සහ පීකිං වැනි ඔපෙරා ආයතන 300 කට ආසන්න සංඛ්‍යාවක් 17 වන ශත වර්ෂයේ මැද භාගය වන විට චීනයේ දක්නට ලැබුණි. ඒ අතර පිකිං ඔපෙරා කැපී පෙනේ. ඔපෙරාවෙන් බිහි වූ සංගීත ඛණ්ඩ අද චීන සමූහාණ්ඩුවේ සංගීත කණ්ඩායම් අතර ද භාවිතයට පත්ව ඇත. බටහිර යුරෝපීය සංගීතය චීනයට නොමදව ලැබීම ආරම්භ වන්නේ නූතන යුගයේ දී ය. 1949 කොමියුනිස්ට් ක්‍රමය ඇති වීමත් සමඟ ඉපැරණි චීන සංගීත ක්‍රම මතු කරගන්නට විය. බටහිර සංගීත ඛණ්ඩද පාරම්පරික භාණ්ඩ තුළින් නාද වන්නට විය. කොමියුනිස්ට් ක්‍රමය අනුව සංගීතය රජවරුන්, ධන කුවේරයන් ගේ විනෝදය සඳහා නොව පොදු ජනතාවගේ විමුක්තිය සඳහා කෙරෙන ප්‍රචාරක අරමුණු වලින් හැඩ ගැසිය යුත්තක් බව පිළි ගැනෙන්ට විය.

ක්‍රියාකාරකම 03.

- ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සාකච්ඡා කොට අනුපිළිවෙලින් ගොනු කරන්න.

i චීන සංගීතයේ පරිණාමය යුග කීයකට අනුව බෙදා දැක්වේ ද?
ii ඒ ඒ යුග අයත් කාල වකවානු සමග සඳහන් කරන්න.
iii චීන සංගීතයේ ස්වර හඳුන්වන නාමය සහ ස්වර සාධන යේ ආරම්භය කෙටියෙන් පැහැදිලි කරන්න.
iv චීන සංගීත භාණ්ඩ වර්ගීකරණයේ ඇති සුවිශේෂිතාව පැහැදිලි කරන්න.
v පළමුවන රාජකීය සංගීත කණ්ඩායම, එය අයත් යුගය හා එයට පැවරුණු කර්තව්‍යයන් සඳහන් කරන්න.
vi අන්තර් ජාතික යුගයේ දී චීන සංගීතයට එක් වූ වාද්‍ය භාණ්ඩ සහ ඒවා ප්‍රවේශ වූ ආකාරය පැහැදිලි කරන්න.
vii 'ෂෙන් යු' රජතුමා ක්‍රමවත් කළ ' පිංයේ ' ලෙස හැඳින්වෙන නාද ක්‍රමයේ සුවිශේෂතාවය පැහැදිලි කරන්න.
viii ජාතික යුග තුළ චීන සංගීතයේ දක්නට ලැබෙන පසු බිම පහදන්න.
කොමියුනිස්ට් සමූහාණ්ඩුව බිහිවීමෙන් පසුව දක්නට ලැබෙන ප්‍රවණතා මොනවා ද?
නූතන යුගයේ ආරම්භයේ දී දක්නට ලැබුණු බටහිර යුරෝපීය සංගීතයේ බලපෑම කෙබඳු වේ ද?

- එම පිළිතුරු අතර දක්නට නොලැබුණු තවත් වැදගත් කරුණු පිළිතුරු බවට පත් කරමින් ප්‍රශ්න හතරක් නිර්මාණය කරන්න.

- ඔබ කියවූ ගවේෂණ පත්‍රිකාව සියළු වැදගත් කරුණු සහිතව වචන 100 ක් වන පරිදි සාරාංශ කරන්න.
- ඔබ සපයන ලද පිළිතුරු, නිර්මාණය කළ ප්‍රශ්න සහ සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න. සාකච්ඡා කරන්න. සමාලෝචනයක යෙදෙන්න.

ඇගයීම - චීන සංගීතයේ ලක්ෂණ පැහැදිලි කරන්න.

ගවේෂණ පත්‍රිකාව

ප්‍රවේශය - ගමිලාන් සංගීතය

ජාවා සහ සුමාත්‍රා යන දූපත්වල ප්‍රභවය ලබා දැනට ඉන්දුනීසියාවේ පවතින ශිල්පීය සංගීතය ගමිලැන් නැතහොත් ගමිලාන් සංගීතය වශයෙන් හඳුන්වයි. මෙය විශ්ව සංගීත ක්ෂේත්‍රයක් නො එසේනම් මහා සංගීත සම්ප්‍රදායයක් ලෙස සැලකෙනුයේ මෑතක සිටය. ඕලන්දයේ ජාප් කුන්ස්ට් ඇමෙරිකාවේ මැන්ටල් හුඩ් සහ ජෝස් මැසිඩා වැනි සංගීත විද්‍යාඥයින් ගේ පර්යේෂණ බටහිර ප්‍රචලිත වීමෙන් ගමිලැන් සංගීතය ලෝක සංගීතය තුළ අවධානයට ලක්විය. මෙය ජාප් කුන්ස්ට් (1891-1960) දීර්ඝ පර්යේෂණයෙන් ගෙන් පසුව ලියන ලද 'Music in Java' නම් කෘතියෙන්ලොවට වටහාගත නොහැකි සිද්ධාන්ත රැසකින් යුතු සංගීත සම්ප්‍රදායක් බව පෙන්වා දී ඇත. ජන සංගීතයක් වශයෙන් පැවත වෙනම ලිඛිත ක්‍රමයකින් සහ පාරිභාෂිත වචන මාලාවකින් සමන්විත ගමිලැන් සංගීතය දීර්ඝ පාරම්පරික පසුතලයකින් යුතු සම්ප්‍රදායක් වශයෙන් අද වන විට පිළිගෙන ඇත.

ගමිලාන් සංගීතය වෙනස් කළ නොහැකි ස්වර සාධන දෙකකට සීමාවී ඇත්තේ එක් එක් ස්වරයක් සඳහා ලෝහ තහඩුවක් හෝ ලෝහ කෝප්පයක් බැගින් යොද ගන්නා නිසා විශාල ස්වර සංඛ්‍යාවක් නිපදවා ගැනීමට ඇති අපහසුව නිසා ය. එම ස්වර සාධන දෙක ස්ලෙන්ද්‍රෝ සහ පෙලොග් වශයෙන් නම් කොට ඇත. ස්ලෙන්ද්‍රෝ සාධනය ස්වර 05 කින්ද පෙලෝග් සාධනය ස්වර 07 කින්ද යුක්තය. මින් එක් ස්වර සාධනයකට අයත් භාණ්ඩ කට්ටලයකින් අනෙක් ස්වර සාධනයට අයත් ස්වර නිපදවා ගත නොහැකි වීම විශේෂයකි.

ඒ ඒ ස්වර සාධනයන්ට අයත් ස්වර නාම සමඟ මෙසේ දැක්විය හැකි ය.

ස්ලෙන්ද්‍රෝ සාධනයේ ස්වර s
ස්ලෙන්ද්‍රෝ නෙම් බරං ගුළු ඩඩා ලීමා

පෙලොග් නෙම් බරං පෙනුංගුලේ ගුළු ඩඩා පෙලොග් ලීමා

මෙම එක් ස්වර සාදනයකට අයත් භාණ්ඩ කට්ටලයකින් අනෙක් ස්වර සාධනයට අයත් ස්වර වාදනය කළ නොහැකිවීම සැළකිය යුතු කරුණකි . බටහිර හා භාරතීය ස්වර සාධනයට වඩා මෙම ස්වර සාධනයන් හාත්පසින්ම වෙනස් ය.

ඓතිහාසික තොරතුරු විමසා බලන විට ජාවා හා සුමාත්‍රා දූපත් වල 05 වන ශත වර්ෂයේ සිට 13 වන ශත වර්ෂය දක්වා හින්දු ආධිපත්‍ය පැතිර ඇති බව පෙනේ. ඒ අතර 09 වන ශත වර්ෂය තුළ පාලනයෙහි යෙදුනු ප්‍රභූන් සංගීතයට සහය දක්වා ඇත. රාමායනය ජාවා බසට පෙරළී ඇත්තේ ද මේ සමයේ ය. ප්‍රම්බ නම් විහාරස්ථානයට අයත් කැටයම් වල සිදර් (Zither) වර්ගයේ තත් භාණ්ඩ වාදකයන් දක්වා තිබේ. මෙම යුගයට අයත් එක් විස්තරයක සමහර වාදකයන් වීණා - රාවණා හස්ත නම් භාණ්ඩය වැයූ බවත් එහි දි රජ බිසව පවා ගීත ගැයූ බවත් සඳහන් වේ.
කෙසේ වෙතත් ගැම්ලැන් සංගීතය වාද්‍ය සංගීතය ප්‍රමුඛ කොට ගත්තකි. එහි ගායනය භාවිත වන්නේ වාද්‍ය සංගීතයේ සංවාදනය සඳහා යෙදෙන සංගීත ඛණ්ඩය ක ස්වරූපයෙනි. එබැවින් ගැම්ලැන් තුළ වාද්‍ය භාණ්ඩවලට හිමි වනුයේ සුවිශේෂ ස්ථානයකි. ඒ වායේ නිමාව මෙන්ම වාදන ශෛලීන් ද පස්වන ශත වර්ෂයට පෙර යුගයන් දක්වාද විහිද යන බවට සාක්ෂි ලැබී ඇත. වඩාත් වැදගත් වන්නේ එම සංගීත භාණ්ඩයන් ගේ සංයෝජන ක්‍රමයයි. එය ලෝකයේ අන් කවර රටක හෝ දක්නට නොලැබෙන්නෙකි. මෙහි සංවාදනයෙහි යෙදෙන භාණ්ඩ වලින් 80% ක් පමණම ඇත්තේ තාඩ්‍ය වාද්‍ය ගණයට අයත් ඒවාය. ලෝහමය නොවන සහ ලෝහමය සයිලපෝන වර්ග එහි බහුලව දක්නට ලැබේ. මැද පෙරදිග අරාබි

හා පසික සංස්කෘතීන් මගින් ලද සුලිං යන බට නලාවද, රේබාමය යන තත් භාණ්ඩයද, ඒ අතර වේ. ගැම්ලැන් සංවාදනයේ සුවිශේෂත්වය වන්නේ භාණ්ඩ සංයෝජනයයි. මෙය අංග තුනකින් දක්වන අතර ඒ ඒ අංගය සඳහා වෙන් වූ සංගීත භාණ්ඩ දක්වා තිබීමද විශේෂයකි.

i ස්වර තේමා වාදනය
ii අලංකාර වාදනය
iii වේගය හා රිද්මය දනවන වාදන

යනු එම අංග තුනයි. ස්ථිර ස්වර පුවරුවලින් නිම වී ඇති සියළු වාදන භාණ්ඩයන් උච්ඡ හා මන්ද්‍ර ස්වර වලින් සැදි තවත් සහාය වාද්‍ය භාණ්ඩයන් ගෙන් ද යුක්තව ඒ ඒ අංගය සඳහා වෙන් වෙන් වශයෙන් දක්වා තිබීම සැළකිය යුතු කරුණකි. ඒ අනුව ස්ථාවර තේමා වාදනය සඳහා වෙන්වූ භාණ්ඩය සරොන් වශයෙන් හඳුන්වන අතර මධ්‍ය ස්වර සාධනයට අනුව සරොනං බරුන් ද මන්ද්‍ර මධ්‍ය ස්වර සාධනයට අනුව සරොන් දෙමුං ද උච්ඡ ස්වර සාධනයට අනුව සරොන් පනෙරුස් ද ආදී වශයෙන් විවිධ ප්‍රමාණයන් ගෙන් භාණ්ඩ තුනක් භාවිත කෙරේ. එසේම අලංකාර ස්වර ඛණ්ඩ වාදනයද බොනං සහ ගෙන්දර් යන භාණ්ඩ වර්ග කට්ටල දෙකකට අනුව සිදු කෙරේ. එම එක් වර්ගයකට භාණ්ඩ තුන බැගින් තිබීම ද විශේෂයකි. රිද්මය සහ තාල වාදනය සඳහා කෙතුක් කෙනොං කෙම්පුල් හා ගොං යන වාද්‍ය භාණ්ඩ සතරක් යොදා ගැනේ. මෙම භාණ්ඩ වර්ග තාල රූපය කොටස් හතරකින් බෙදා ගෙන වාදනය කිරීම සඳහා වෙන් වී ඇත. උදාහරණයක් ලෙස මාත්‍රා 16 ක තාල රූපයක සෑම මාත්‍රා දෙකකට වරක් කෙතුක් ධ්වණිය ද, සෑම මාත්‍රා 6 කට වරක් කෙම්පුල ධ්වණිය ද, අවසාන මාත්‍රාවට ගොං ධ්වණිය ද යොදා වයනු ලබන අතර සෙසු මාත්‍රා කෙනොං ධ්වණියෙන් ද වැයේ. මෙම තාල විභාග වාදන ලක්ෂණය වෙන කිසිම සංගීත සම්ප්‍රදායක දක්නට නොලැබෙන ගැම්ලාන් සංගීතයටම ආවේණික වූ විශේෂ ලක්ෂණයකි. තවද එම භාණ්ඩ වර්ග සතර ක්‍රමයෙන් හඬ ගැඹුරු වන ආකාරයට පිහිටා ඇති බැවින් සංවාදාත්මක තාල රූපයන්ද බිහිවේ. කෙන්දං නමින් යුතු ලොකු කුඩා බෙර දෙකක් වයන්නා ගැම්ලාන් සංවාදනයේ අදෘශ්‍යමාන පාලකයා වන්නේ ය. වාද්‍ය ඛණ්ඩයේ වේගය පාලනය කරන්නේ මොහු විසිනි. එතරම් ඉතිහාසයක් නැති වුවද අරාබි කරයෙන් සංක්‍රමණය වූ සුලිං නැමැති බටනලාවත්, රෙබාබ් නම් තත් භාණ්ඩයත් ගායනයට සහාය වශයෙන් හෝ ගායනයක් වෙනුවට භාවිත කිරීම සඳහා යොදා ගැනේ.

තවද ගැම්ලාන් සංගීතකය ඔවුන් ගේ බැරිස්, වයංකුලිත්, ටොපේන් සහ අර්ජා වැනි පාරම්පරික නාට්‍ය ක්‍රම සඳහා අනිවාර්යෙන් ම භාවිතා කර ඇත. විහාරස්ථානවලට ප්‍රභූන් සතුවද ගැම්ලාන් වාදන කට්ටල පවතින අතර ක්‍රාටන් වශයෙන් හඳුන්වන්නේ උපරිම වාදක සංඛ්‍යාවක් (40) ඇති පූර්ණ ගැම්ලැන් වාදක කට්ටලයකි. එවැනි ක්‍රමවත් වාදක කට්ටල පහකටත් අධික සංඛ්‍යාවක් රාජ කුමාරවරුන් සතුවිය. ජාප් කුන්ස්ට් ගේ පර්යේෂණ ග්‍රන්ථවල දැක්වෙන අන්දමට ජාවා දූපතෙහි පමණක් ගැම්ලාන් වාදක කට්ටල 300 කටත් අධික සංඛ්‍යාවක් ඇති බව සඳහන් වේ.

ගැම්ලැන් සංගීතයේ තනුව යන්නට පතෙන් යනුවෙන් භාවිත කරන අතර එය භාරතීය සංගීතයේ රාග යන්නට සමීප වේ. නූතන ලෝකය සමඟ ගැටීම නිසා අද බාලි දූපත්වලින් ඇසෙන්නේ සෑහෙන දුරට වෙනස් වී ඇති ස්වර මාලිකයන් ගෙන් යුතු පෙර පැවැති සාම්ප්‍රදායික සංගීතයම නොවන බවද සැළකිය යුතු ය.

- ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සාකච්ඡා කොට අනු පිළිවෙලින් ගොනු කරන්න.

- එම පිළිතුරු අතර දක්නට නොලැබුණු තවත් වැදගත් කරුණු පිළිතුරු බවට පත් කරමින් ප්‍රශ්න හතරක් නිර්මාණය කරන්න.

i ගමිලෑන් සංගීතය වශයෙන් හඳුන්වනුයේ කුමන රටක පවතින කුමන සංගීතයක් ද?
ii ගමිලෑන් සංගීතය ලෝක සංගීතඥයින් ගේ සහ සංගීත ආයතනවල අවධානයට යොමු වූයේ කුමන විද්‍යාඥයින් ගේ පර්යේෂණවලින් පසුවද ?
iii ජන සංගීත ක්‍රමයක් ලෙසින් ඇරඹී ගමිලෑන් සංගීතය ලොව පිළිගත් සංගීත සම්ප්‍රදායක් බවට පත්වීමට බලපෑ සාධක මොනවා ද?
iv මෙම සංගීතයට අයත් ස්වර සාධනයේ දක්නට ලැබෙන විශේෂතා මොනවා ද?
v මෙම සංගීත ක්‍රමය තුළ දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩ පිළිබඳව හැඳින්වීමක් කරන්න.
vi ගමිලෑන් සංගීතයේ සුවිශේෂ අංගයක් වන වාද්‍ය භාණ්ඩ සංයෝජන කොටස් පිළිබඳව හැඳින්වීමක් කරන්න.
vii මෙම සංගීතයටම ආවේණික වූ තාල විභාග ක්‍රමය කෙටියෙන් විස්තර කරන්න.
viii ගමිලෑන් සංවාදනයේ අදෘෂ්‍ය මාන පාලකයා වයන භාණ්ඩය සහ ඔහුගේ කාර්ය භාරය පැහැදිලි කරන්න.
ix ගමිලෑන් සංගීතය හා සම්බන්ධ පාරම්පරික නාට්‍ය ක්‍රම මොනවා ද?
x ගමිලෑන් සංගීතයේ ක්‍රාටන් වශයෙන් කුමක් හඳුන්වන්නේ ද?

ක්‍රියාකාරකම 04

- එම පිළිතුරු අතර දක්නට නොලැබුණු තවත් වැදගත් කරුණු පිළිතුරු බවට පත් කරමින් ප්‍රශ්න හතරක් නිර්මාණය කරන්න.

- ඔබ කියවූ ගවේෂණ පත්‍රිකාව සියළු වැදගත් කරුණු සහිතව වචන 100 ක් වන පරිදි සාරාංශ කරන්න.

- ඔබ සපයන ලද පිළිතුරු නිර්මාණය කළ ප්‍රශ්න සහ සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න. සාකච්ඡා කරන්න. සමාලෝචනයක යෙදෙන්න.

ඇගයීම - ගමිලාන් සංගීතයේ විශේෂතා පැහැදිළි කරන්න.

ඇමුණුම් අංක 05

ගවේෂණ පත්‍රිකාව

ඉස්ලාමික සංගීතය

මැද පෙරදිගින් බිහි වූ ඉස්ලාමික සංගීතය, පාර්සික, අරාබි, තුර්කි, මිසර හා ග්‍රීක වැනි සම්ප්‍රදායයන් කිහිපයක් සංකලනය වීමෙන් සකස් වූවකි. 'මකාමත්' සංගීතය වශයෙන් ද ඉස්ලාමික සංගීතය හඳුන්වයි. ඉස්ලාම් ආධිපත්‍යය මැද පෙරදිග තහවුරු වීමට පෙර අරාබිය සහ පර්සියාවේ විසූ ගායක වහල් ස්ත්‍රීන් හා ඔවුන්ගේ කාව්‍ය ගායනා මකාමත් සංගීතයේ වර්ධනය කෙරෙහි බලා ඇති බව පෙනේ. අරාබි කරයේ කුලීන නිවෙස් වලද, වෙළඳ මධ්‍යස්ථාන වලද සේවය යෙදී සිටි ' මුගන්නියා' නම් ගායක වහල් ස්ත්‍රීන් පාර්සික රජවරුන් පවා තම සේවයේ රඳවා ගෙන තිබීම හා කාව්‍ය ගායනා සම්බන්ධයෙන් ඔවුන් ලබා ඇති කීර්තිය ඉතිහාස ගත වී තිබීම ද ඒ බව සනාථ කරවන්නේ ය. අෂාදා සහ ශාරින් (ක්‍රි. ව. 224 - 642) උරායිබ වැනි ගායක ස්ත්‍රීන් එසේ ඉතිහාසගත වූ අය අතර වෙති.

ඉස්ලාමිකයන් උපතෙහි සිට මරණය දක්වා ජීවිතයේ විවිධ අවස්ථාවන් වල සංගීතය යො දා ගෙන ඇත. උපතක දී අසාන් පාඨය ගායනා කළ යුතු ය. විශේෂ ස්ත්‍රීන් පිරිසක් ලවා ඩුඩුප් නැමැති රබන් වාදනය කරවිය යුතු ය. මරණයක දී ද ගීත ගායනා කළ අතර විශේෂ කුලී ස්ත්‍රීන් ලවා විලාප ගායනා කළ යුතු විය. එහෙත් මේ සියල්ලක්ම පාහේ කරනු ලැබුවේ ආගමික චාරිත්‍රයක් වශයෙන් විනා වින්දනීය අවශ්‍යතාවයක් නිසා නොවීම සැළකිය යුතු කරුණකි. මුස්ලිම් දේවස්ථාන වල අද පවා දිනකට හත් වරක් අසාන් (Azan) හෙවත් ආමන්ත්‍රණ පාඨය ගායනා කොට මහමත් තුමා විසින් මෙම ගායනය සඳහා ප්‍රථම වරට තෝරා ගන්නා ලද්දේ ඇබිසීනියානු වහල් ස්ත්‍රියක ගේ පුත්‍රයෙකු වූ බිලාල් නැමැත්තෙකු බව ඉතිහාසයේ සඳහන් ය. අල්ලා දෙවියන් වෙනුවෙන් යාඥා කිරීමට කැඳවන නිවේදනය වන එම ආසන් ගායනය ඉස්ලාමික ගායනයේ සියළුම අංග අන්තර්ගත ඉපැරණිතම ජන ගීතයක් බවද සඳහන් ය.

සංගීතය වින්දනීය කලාවක් වශයෙන් පෝෂණය කරලීමට මකාමත් ධර්මය තුළ අවස්ථාවක් නොවූ අතර මුල් යුගයේ සිටි ඉස්ලාම් පාලකයින් ද ඒ සඳහා එතරම් සැලකිල්ලක් නොදැක්වූ බවක් ද දක්නට ලැබේ. කෙසේ වෙතත් සිරියාවේ පැවැති ඉස්ලාමික රාජ්‍යය ක්‍රි. ව. 750 දී පමණ බැග්ඩෑඩයකට සංක්‍රමණනය වීමෙන් පසු එම තත්ත්වය වෙනස් වන්නට විය. මුස්ලිම් වරුන්ගේ නව පරිපාලනය ක්ෂේත්‍රයන් තුළින් බැග්ඩෑඩ් නගරය ශිල්ප කලා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රකට වන්නට විය. සංගීතය ද වින්දනීය කලාවක් වශයෙන් වැඩෙන්නට විය. බැග්ඩෑඩ් නගරයේ සිටි කාලිප් වරුන් විශාල සංගීතයෙන් වැඩි කොටසක් පාරසික සංගීතය පදනම් කර ගනිමින් වර්ධනය කර ගත්තක් විය. ග්‍රීක න්‍යායන් මත සැකසුණු පර්සියානුවන් ප්‍රගුණ කළ පාරසික සංගීතය ඉස්ලාමිකයන්ට දායාද කළ සංගීතඥයා වශයෙන් 'ටුවයිස්' වැදගත් වන අතර හෙතෙම ඉස්ලාමික සංගීතයේ ප්‍රථම පිරිමි සංගීතඥයා වන්නේ ය. පර්සියානු ජාතික ගායිකාවක වන අශාන් - අල් - මෙයිලා ද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. බැග්ඩෑඩ් සමයට අයත් වන ක්‍රි. ව. 750 -850 දක්වා වූ ශත වර්ෂය ඉස්ලාමික සංගීතයේ ස්වර්ණමය යුගයක් වශයෙන් සැළකිය හැකි ය. එම යුගයට අයත් ඉබ්‍රහිම් - අල් - මෝසීලි පර්සියාවට ගොස් එහි පැවති පැරණි සංගීත ක්‍රම ගැන අධ්‍යයනයක් කර ඇති අතර සංගීත ග්‍රන්ථ 100 කට ආසන්න සංඛ්‍යාවක් ඔහු විසින් රචනා කොට ඇති බව දැක්වේ. දක්ෂ ඌද් වාදකයෙකු සහ ගායකයෙකු වූ අල් මහිද් රාජ සභාවේ සේවය කළ ඉසාක් අල් මෝසිලී සංගීත ග්‍රන්ථ 19 ක් රචනා කොට ඇත. ඔහුගේ ප්‍රතිවාදියා වූ ප්‍රින්ස් ඉබ්‍රහිම් පර්සියාවෙන් ලත් නව ගායන ක්‍රම අගය කළ අතර ඉෂාක් අල් මෝසිලී පාරම්පරික

ගායනා අගය කරන්නෙක් විය. ''කිතබ් අල් මුසිකි අල් කබීර්'' නම් ග්‍රන්ථය සහ තාල රටා විස්තර කරන ''තිගබ් අල් ඉක්වාත් ' යන ග්‍රන්ථය රචනා කළ දාර්ශනිකයෙකු සහ ලියුට් වාදකයෙකු වූ අල් ඉෂ්ෆාහාන් ද 'කිතබ් අල් අඝානි අල් කබීර්'යන ග්‍රන්ථය රචනා කළ පර්සියාවේ උපන් තුර්කි ජාතික අල් ෆාරාබි ද , බැග්ඩෑඩ් ආයත තුළින් බිහිවූ ශ්‍රේෂ්ඨ සංගීතඥයින් දෙදෙනෙකි. බැග්ඩෑඩ්හි අවසාන කාලිප් තුමාගේ සේවයේ නියුතුව සිටි සුෆි අල් - දීන් එවකකට මුළු මහත් අරාබිකරයේම සිටි ශ්‍රේෂ්ඨ සංගීතඥයා වන අතර පළමු වරට සංගීත ඛණ්ඩ ප්‍රස්තාර කළ සංගීතඥයා ද වන්නේ ය. ඔහු විසින් ලියන ලද මකාමත් ස්වර මේල දිගු කලක් නොවෙනස්ව පැවැතුණි. තවද ඔහු විසින් මූලික මකාම් 12 ක් ද ඉන් නැගෙන අනු රටා 6 ක්ද දක්වා තිබීම ද විශේෂයකි.

ක්‍රි. ව. 1258 දී බැග්ඩෑඩ් නගරය මෝගල් හමුදා අතට පත්වීමෙන් පසු එහි පැවැති රාජ තන්ත්‍රය නැවතත් පර්සියාවට සංක්‍රමණය විය. මෙම දෙවැනි නාරසික යුගයේ දී පෙර මෙන් නොව ඉස්ලාමීය පාලකයෝ සංගීතයේ ප්‍රගතියට කටයුතු කළෝ ය. 14 වන ශත වර්ෂය වන විට පැයක ගෝනියානු ස්වර මාලිකය භාවිතයට එක් 1/2, 1/4 නූතන ටෝන ස්වර මාලිකය භාවිතය ඇරඹුනේ 17 වන ශත වර්ෂයේ දී ය. ඉස්ලාමික සංගීතය තුළ වරින් වර මකාම් 40 ක් පමණ සඳහන්ව ඇතත් ප්‍රධාන මේල වශයෙන් සැළකෙන්නේ 13 වන ශත වර්ෂය වන විට ස්වර වශයෙන් පෙළගැසී තිබුණ මකාම් 12 යි. එහි දස්ත්ගා වශයෙන් හැඳින්වෙන පාර්සික මේල සතක්ම ඇතුළත් ය. එම මකාම් දොළස 'ඌද්' නැමැති තත් භාණ්ඩය මත උත්පාදනය කොට ඇති ආකාරය ෆින්ගර් මෝඩ්ස් (Finger Modes) යනුවෙන් හඳුන්වයි.

බටහිර සංගීතයේ ලියුට් ( ) යන සංගීත භාණ්ඩය සඳහා භාවිත වන පදය 'අල් ඌද්' යන අරාබි පදයෙන් ජනිත වූවක් වන අතර ඌද් ' යන අරාබි පදයෙන් ජනිත වූවක් වන අතර ඌද් නමැති තත් භාණ්ඩය භාරතයේ වීණාවට සමාන වීමද සැළකිය යුතු කරුණකි. කෙසේ වෙතත් ඉස්ලාමික සංගීතයට අයත් අති විශාල භාණ්ඩ සංඛ්‍යාව පාරසික, තුර්කි, ස්පාඤ්ඤ, මිසර ආදී සම්භාවයන් ගෙන් යුක්ත බව පෙනේ. එය පහත දැක්වෙන භාණ්ඩ ලැයිස්තුවෙන් තව දුරටත් පැහැදිලිවේ.

තබ්ල් -	ආරාබි බෙරය
දාමුල්	තුර්කි බෙර වර්ගයක්
දාර්බුතා	අරාබි බෙර
තුන්බුක්	පාරසික - අරාබි බෙරය
නක්කාරෙත්	බෙරයක්
කර්ණ	පාරසික නලා
සූර්ණා	පාරසික නලා
සුර්නේයි	අරාබි නලා
ක්වාසාබා	අරාබි බටනලා
නෆීර්	නලා විශේෂයක්
සන්තූර්	තත් 64 සිදර් වර්ගය
ක්වානුත්	ස්පාඤ්ඤ සිදර්වර්ගය (සන්තීර් නමින් ද ඇත)
රබාබ්	ඉස්ලාමික - ස්පාඤ්ඤ පිඩ්ල් වර්ගය
කමත්වා	පාරසික - අරාබි, තත් භාණ්ඩයකි
ඌද්	අරාබි තත් 4 සහිත භාණ්ඩයකි
තුත්බූර්	ලියුට් වර්ගය, ස්වර දැවටුම් සහිත තත් භාණ්ඩයකි
කෙන්නාරා	(කින්නෝර්) හීබෘ තත් භාණ්ඩයක්
චල්පාර	තාල දැරීම සඳහා භාවිත වන පතුරු විශේෂයක් (Clappers)

කමන්වා	පාරසික - අරාබි තත් භාණ්ඩයකි.
කාසාන්	කුඩා තාලපොට
ජනක්	හාප් වර්ගයේ භාණ්ඩයක් (Upper chested Harp)
දුප්	කුඩා රබානක් වැනි භාණ්ඩයක්
මිඩ් රාබ්	තත් භාණ්ඩ වාදනයේ දී යොදාගන්නා ඇඟිලි දවටනය.

ඉස්ලාමික සංගීත ආකෘති අතර නවුබා (Nauba) ප්‍රධාන තැනක් ගනී. එම ගායන ආකෘතියට ක්වාල්, ගසල්, තරාණා සහ පුරු - දෘෂ්ටි නම් කොටස් හතරක් ඇති බවද තවත් සමහරු එය කොටස් පහකින් යුක්ත වන බවද දක්වති. එම සෑම ගායන කොටසක් අතරටම ටරික්වා නැමැති හැඳින්වීමේ කොටසක් වයනු ලැබේ. තවද ඉස්ලාමික සංගීතයේ තාකිබ් (Traqib) වශයෙන් හඳුන්වනු ලබන්නේ සෑම වාදනයකදීම ප්‍රධාන වාද්‍ය ඛණ්ඩය සමග හතරවන ස්වරය හෝ පස්වන ස්වරය (ම හෝ ප) යොදා ගත් තතත් මගින් නිතර වාදනය කිරීමය. මෙවැනි ඉස්ලාමික සංගීතයට ආවේණික වූ පාරිභාෂික පද කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

පාරිභාෂික පදය	**අදහස**
තාක්සිම් Traqsim	ආලාප ගායනය හෝ වාදනය
තුද්රි Tudhri	ඉහල ස්වර චලනය
යා සහ ලයිලි Traqib	ගායනයේ දී අලංකාර යෙදීම සඳහා යොදා ගන්නා ලදී.
නග්මාන් Nagmat	මේලයකට අයත් ස්වර පිළිවෙළ
අෂාබි Asabi	තනුව

ක්‍රියාකාරකම 05

- ගවේෂණ පත්‍රිකාව ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සාකච්ඡා කොට අනු පිළිවෙලින් ගොනු කරන්න.

i ඉස්ලාමික සංගීතය ලොව හඳුනාගෙන ඇත්තේ කුමන සංගීතයක් වශයෙන් ද?

ii එම සංගීතයේ සැකැස්මට බලපෑ අනෙකුත් සම්ප්‍රදායන් මොනවා ද?

iii ඉස්ලාමික සංගීතයේ ඉපැරණිම ජන ගීතය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

iv ඒ පිළිබඳව විස්තරයක් කොට මහමත් තුමා විසින් ම එම ගායනය සඳහා මුලින්ම පත් කළ අය හඳුන්වා දෙන්න.

v ක්‍රි.ව 750 දී පමණ ඉස්ලාමික රාජ්‍ය මධ්‍යස්ථානය සිරියාවේ සිට බැග්ඩෑඩ් නගරයට සංක්‍රමණය වීමෙන් පසුව ඉස්ලාමික සංගීතය පෝෂණය වූ අයුරු පැහැදිලි කරන්න. (එහි දී ප්‍රථම පුරුෂ සංගීතඥයා, පර්සියානු ජාතික විශිෂ්ටතම ගායිකාව, කාලිප් වරුන්ගේ මැදිහත් වීම, වෙනත් ශ්‍රේෂ්ඨ සංගීතඥයන් සහ ඔවුන්ගේ කෘති ආදිය පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය)

vi බැග් ඩෑඩයේ ඉස්ලාමික බලය අවසන් වීමෙන් පසු පර්සියානු සංස්කෘතික ලක්ෂණ ඔස්සේ ඉස්ලාමික සංගීතය පෝෂණය වූ අයුරු ලුහුඬින් දක්වන්න.

vii ෆින්ගර් මෝඩ්ස් (Finger Modes) යනුවෙන් හඳුන්වා දී ඇත්තේ මොනවා ද?

viii ඉස්ලාමික සංගීතයට විවිධ සම්ප්‍රදායන්ගෙන් එක් වූ වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

ix ඉස්ලාමික සංගීතයට අයත් ප්‍රධාන ගායන ආකෘතියක් නම් කොට එහි කොටස් ද දක්වන්න. ඒ සෑම කොටසකටම පෙර වයනු ලබන අංගයද හඳුන්වන්න.

x පහත දැක්වෙන අරුත් ගෙන දෙන ඒවා හඳුන්වනු ලබන ඉස්ලාමික සංගීතයට අයත් පාරිභාෂික වචන මොනවා ද?

ආලාප ගායනය හා වාදනය

ඉහළ ස්වර චලනය

ගායනයේ දී අලංකාර කරණය සඳහා යොදා ගන්නා අක්ෂර

මේලයකට අයත් ස්වර පිළිවෙල

තනුව

- එම පිළිතුරු අතර දක්නට නොලැබුණු තවත් වැදගත් කරුණු පිළිතුරු බවට පත්කරමින් ප්‍රකාශ හතරක් නිර්මාණය කරන්න.
- ඔබ කියවූ ගවේෂණ පත්‍රිකාව සියළු වැදගත් කරුණු සහිතව වචන 100 ක් වන පරිදි සාරාංශ කරන්න.
- ඔබ සපයන ලද පිළිතුරු, නිර්මාණය කළ ප්‍රශ්න සහ සාරාංශය පන්තියට ඉදිරිපත් කරන්න.

ඇගයීම -
- ඌද් නමැති සංගීත භාණ්ඩයට සමාන භාරතීය සංගීත භාණ්ඩය කුමක් ද?
- දේව පූජා සඳහා ගැයීය යුතු ගීත පිළිබඳ ව මුල්ම විචාරය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද ?

ආශ්‍රිත ග්‍රන්ථ - විශ්ව සංගීත ක්ෂේත්‍ර - සී. ද. එස්. කුලතිලක

ක්‍රියාකාරකම් සැලැස්ම -25

නිපුණතාවය 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

ක්‍රියාකාරකම 2.1.4 : පෙර අපරදිග මියැසියේ වෙනස විමසමු.

ඉගෙනුම් ඵල :
- පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි දක්නට ලැබෙන ප්‍රධාන වෙනස්කම් හඳුනා ගනියි.
- Melody සහ Harmony ඇසුරින් එම සංගීත පද්ධතිවල ප්‍රායෝගික ස්වභාවය හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් :
- පෙරදිග සහ අපරදිග ශාස්ත්‍රීය සංගීතයට අදාළ ගායන වාදන ඇතුළත් ශ්‍රව්‍ය පට, සංයුක්ත තැටි,
- දූලීකා, උදුම්බරා, අඳුරු කුටිය තුළ වැනි ගීතයක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක් අදාළ ධාවන යන්ත්‍රයක් සමඟ
- නියමිත උදාහරණයන් සහිත කියවීම් පත්‍රිකාවල පිටපත්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: පෙරදිග සහ අපරදිග යන සංගීත පද්ධති දෙකෙහි දක්නට ලැබෙන Melody සහ Harmony යන සිද්ධාන්තයන් ප්‍රායෝගිකව සරල ලෙස පැහැදිලි කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. Harmony සිදධාන්තය සම්බන්ධයෙන් 10 වන ශ්‍රේණියේ දී 6.2.1 ස්වර සුසංයෝග කරමු යන ක්‍රියාකාරකම යටතේ සිසුන් මේ වන විට යම් අවබෝධයක් ලබා ඇති බැවින්ද 13 වන ශ්‍රේණියේ දී 10.1 නිපුණතා මට්ටම යටතේ තව දුරටත් අත්දැකීම් ලබා ගැනීමට ඇති බැවින් ද, ඒ ඒ සංගීත පද්ධති තුල එකී සිද්ධාන්තයන් ගොඩ නැගුන පසුබිමක් , ව්‍යවහාර වන ආකාරයත් අවධානයට යොමු කරවීම මෙහි දී ප්‍රමාණවත් ය. කියවීම් පත්‍රිකා පවා ඍජු උදාහරණයන් ගෙන් සකස් කොට ඇත්තේ එහෙයිනි. එම කොටස් උපුටා ගනු ලැබූ කෘතීන් පිළිබඳව දැනුවත් කිරීම ද සිසුන්ගේ තොරතුරු සොයා යාමේ රුචියද ,විචාර ශක්තියද වර්ධනය කර ගැනීමට රුකුලක් වනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- පෙරදිග සංගීතය හා සම්බන්ධ Harmony සිද්ධාන්තය ප්‍රායෝගිකව පැහැදිලි කිරීම සඳහා ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. අංක 01 ක්‍රියාකාරකමෙහි යොදවන්න. ඒ සඳහා සහාය වන්න. සමාලෝචනයක යෙදෙන්න.

  (මිනිත්තු 30)
- අපරදිග සංගීතය හා සම්බන්ධ Harmony ප්‍රායෝගිකව පැහැදිලි කිරීම සඳහා ඇමුණුම අංක 02 හි දක්වන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. සහාය වන්න. සමාලෝචනය කරන්න.

  (මිනිත්තු 30)
- Melody සහ Harmony ව්‍යවහාරික සංගීතය තුළ භාවිත වී ඇති ආකාරය සඳහා ඇමුණුම් අංක 03 ප්‍රවේශය යොදාගන්න. ක්‍රියාකාරකම අංක 03 හි යොදවන්න. සහාය වන්න. සමාලෝචනය කරන්න.

  (මිනිත්තු 30)

- Melody සහ Harmony ඒ ඒ සංගීත පද්ධති තුළ ගොඩ නැගුණ පසුබිම ද එහි භාවිතය ද න්‍යායාත්මකව විමසීම සඳහා ඇමුණුම් අංක 04 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 04 හි යොදවන්න. ඒ සඳහා සහායවන්න. සමාලෝචනය කරන්න.

(මිනිත්තු 80)

ඇමුණුම 01

ප්‍රවේශය -

පෙරදිග සංගීතයට අදාළ ශාස්ත්‍රීය ගායනයක්, වාදනයක් ශ්‍රවණයට යොමු කරන්න. එහි සුවිශේෂතා හඳුනා ගැනීමට සහාය වන්න.

ක්‍රියාකාරකම අංක 01

- ශ්‍රවණය කරන ලද භාරතීය සංගීත පද්ධතියට අයත් ගායන හෝ වාදනය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු සාකච්ඡා කරන්න.
- ඒවා සුසර කොට ඇති ආකාරය අදාළ ගායනය හා වාදනය සමඟ ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.
- ආලාප/ගත්/ගීත/තානාලංකාර ආදියේ දී එක් වරකට ශ්‍රවණය වන ස්වර සංඛ්‍යාව දක්වන්න.
- ඒ අනුව ගායනය සහ වාදනය ගොඩ නැගී ඇති ආකාරය පැහැදිලි කරන්න. එය කෙසේ හැඳින්විය හැකි ද ?
- භාරතීය සංගීතය වඩාත් උචිත වන්නේ ඒකල ගායන/වාදන සඳහා ද, නැතහොත් සමූහ ගායන වාදන සඳහා ද?
- ඒ සඳහා බලපාන හේතු සහ ඒ අතරින් සුවිශේෂවන ලක්ෂණ අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.
  භාරතීය සංගීතය මෙලඩි යන සිද්ධාන්තය මත පදනම් වී ගොඩනැගී ඇති බව පැහැදිලි වනසේ සමාලෝචනයක යෙදෙන්න.
- සාකච්ඡා කරන ලද කරුණු සාරාංශ කරන්න. ඒ ඇසුරෙන් ශ්‍රවණය කරන ලද සංගීත ශෛලීයේ සුවිශේෂතා පංතිය වෙත ඉදිරිපත් කරන්න. සංවර්ධනාත්මක අදහස් දක්වමින් සමාලෝචනයක යෙදෙන්න. සියලු කරුණු සඳහා සුදුසු වගුවක් පිළියෙල කරන්න.

ඇමුණුම 02

ප්‍රවේශය -

(අපරදිග සංගීතයට ශාස්ත්‍රීය ගායනයක් හෝ වාදනයක් (සංධ්වනියකින් කොටසක හෝ ඔපෙරාවකින් කොටසක්) ශ්‍රවණයට යොමු කරන්න. එහි සුවිශේෂතා හඳුනා ගැනීමට සහාය වන්න.

ක්‍රියාකාරකම අංක 02

- අපරදිග සංගීතයට අදාළව ශ්‍රවණය කරන ලද දෑ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට සාකච්ඡා කරන්න.
- එක් වරකට ඇසෙන ස්වර සංඛ්‍යාව සම්බන්ධයෙන් මිනිස් කටහඬ සහ වාද්‍ය භාණ්ඩවලින් ලබා ඇති සහය කෙබඳු ද?
- පාදක ශ්‍රැති ස්වරය සම්බන්ධයෙන් ඔබේ අදහස කෙසේ ද?
- බටහිර සංගීතයේ ගායන වාදන ඒකල සහ සමූහ වශයෙන් සලකා බලනවිට වඩාත් උචිත වන්නේ කුමන ආකාරය ද ?
- ඒ සඳහා බලපානු ලබන සාධක මොනවා ද?
- ඒ අතරින් සුවිශේෂී සාධක ලෙස මතුවන්නේ කුමක් ද ?
- සාකච්ඡා කරන ලද කරුණු සාරාංශ කරන්න. ඒ ඇසුරින් ශ්‍රවණය කරන ලද සංගීත ශෛලීයේ සුවිශේෂතා පන්තිය වෙත ඉදිරිපත් කරන්න. සංවර්ධනත්මක අදහස් දක්වමින් සමාලෝචනයක යෙදෙන්න. සියලු කරුණු සඳහා සුදුසු වගුවක් පිළියෙල කරන්න.

ඇමුණුම- 03

ප්‍රවේශය - දුලීකා
අඳුරු කුටිය තුළ
එම්බා ගංගා
උදුම්බරා හිනැහෙනවා

ආදී ගීත අතරින් තෝරා ගත් ගීතයක් ශ්‍රවණයට යොමු කරන්න. එම ගීතය තුළ Medody හා Harmony භාවිත වී ඇති අයුරු අදාළ කොටස් අවධානයට යොමු කරමින් සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම අංක 03

'නිර්මාණකරණයේ දී ඒකල ගායන වාදන සඳහා Melody හා Harmony යන සිද්ධාන්තයද, සාමූහික ගායන වාදන සඳහා Melody හා Harmony යන සිද්ධාන්තයද යොදා ගැනීම උචිත ය. 'ඔබ මෙයට එකඟ වන්නේ ද නිදර්ශනාත්මකව කරුණු දක්වන්න.

ඇමුණුම්- 04

ප්‍රවේශය-

- පෙරදිග සංගීතයට අයත් ශාස්ත්‍රීය ගායනයක් හෝ වාදනයක් ශ්‍රවණයට යොමු කොට අනතුරුව බටහිර සංගීතයට අයත් සංධ්වනියකින් සහ ඔපෙරාවකින් කොටසක් ද ශ්‍රවණයට යොමු කරන්න. කියවීම් පත්‍රිකා i. ii, සහ iii යන කොටස් නිරීක්ෂණයට යොමු කරමින් Melodyසහ Harmony යන සංකල්පය කෙරෙහි සිසු අදහස් විමසන්න. සංවාදයක යෙදෙන්න.
- Melody සහ Harmony ලක්ෂණ දෙක මත පිහිටා සංගීත පද්ධති දෙක පිළිබඳව කෙරෙන තුළනාත්මක විග්‍රහයක් සහිතව පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

කියවීම් පත්‍රිකාව 01

පෙරදිග සංගීතය බටහිර සංගීතය මෙන් නොවේ. සෑම විටම භාවික හැඟීමක් කේන්ද්‍ර ස්ථානය කර ගෙන සිටී. ඒ සඳහා රාගය අවිය කොට ගනු ලැබේ. රාගානුකූලව නිරූපනය කරන නාදය වනන්නටත්, වගා කරන්නටත් විස්තර කරන්නටත්පොහොසත්ය. සංගීතඥයා දක්ෂයෙක් නම් තමා නිපදවන නාදයේ හාස්කමින් අසා සිටින්නා හැඟීමෙහි ඉතාම ගැඹුරේ සතැපැවිය හැකිය, නැළවිය හැකිය. සැනසිය හැකි ය. ශ්‍රව්‍ය නාදයෙන් ලොව්තුරු වින්දනය කරා ගෙන යා හැකිය.

රාග ගායනයේහි දී ප්‍රීණනය, උද්දාමය, උද්වේගය, ප්‍රබෝධය, සංවේගය, සෝකය වැනි ස්වභාවන් ඇති කිරීමට පිළිවන. සැබැවින්ම රාග ගායනයේ දී අසා සිටින්නාට වඩා ගායනය කරන්නා අධික රස මාධුර්යක් ලබා ගන්නේය. ඔහු තමන්ගේ හදවතේ පහළ වන අයුරු රසික ලෝකය වෙත පිවිසෙන්නේය. එම ලෝකය ඔහුගේ හදවතට ඉතාම සමීපය. එහි පසුවන ඔහු රාග රාගිණීන් ගායනය සැබෑ මානසික වින්දනය කරා පැමිණෙන විට ඔහුගේ ඇසි පිය වැසී යයි, නෙත් විහිදී යැයි, සිරුර ප්‍රාණවත් වෙයි. හද පිපි යයි. සැබැවින්ම එහි රසය මනසට පමණක් නොව සිරුරට ද දැනෙන්නේය.

මෙම හපන්කම කළ හැක්කේ අදහස් හෝ අභිරුචියක් හෝ නියත මනෝභාවයක් හෝ මවා ලන්නට සමත් ස්වරයන්ගේ ක්‍රමික සංකලනයෙනි. එයින් රාගයන් නිපදවා ගැනීමෙනි. එබඳු රාගයෙකින් මන පිනවන්නට කන සනහන්නට අපූරු හැකියාවක් ලැබේ. නාදයන්ගේ විභූතිමත් සංකලනයක් රාගය වශයෙන් ගණන් ගන්නට පුළුවන.

සාමාන්‍යයෙන් සප්තකයෙක ලද හැකි නියම ස්වර පද්ධතිය පිළිබඳ විධිමත් ආකෘතිය රාගයයි. ''රාගය විවරණය කරන සංගීත දර්පණය, ස්වරයෙන් හා වර්ණයන්ගෙන් විභූෂිත වූ යම්කිසි ධ්වනි විශේෂයක් වේද, ජනයන්ගේ මනස රංජනය කරන්නා වූ ඒ ධ්වනි විශේෂය රාග'' යැයි බුද්ධිමතුන් විසින් කියනු ලැබේ. රාගයක් වීමට ස්වරයන්ගෙත් වර්ණයන්ගෙත් විශිෂ්ට රචනාවක් අවශ්‍ය බව මෙයින් පෙනේ. මෙහි එන ස්වර වර්ණ යන පාරිභාෂිත ප්‍රයෝග විශේෂ අර්ථ ප්‍රකාශ කරන බව සැලකිය යුතු ය. රාගයක් වූ කලි නිබන්ධිත සංගීතමය රචනයක්ම නොවේ. ඒ ආනන්ද පූර්ණ සංගීතමය නාද ප්‍රවාහයක් පමණෙකි. එහි තාලයක් නොලැබේ. එම නාද මාලාව තාලයෙකින් තොර වූ ස්වර සමූහයක් පමණෙකි.

කියවීම් පත්‍රිකාව අංක 02

අපතාලාත්මක හෙවත් ප්ලේන්සොං ශෛලියේ ගායන ක්‍රමය කල්යත්ම එක්තරා නාද සංයෝජන රටාවක් අනුගමනය කරන්නට පටන් ගත්තේ ය. මෙම නාද සංයෝජන ක්‍රමය ප්‍රථම සහ සතරවන (සඩ්ජ- මධ්‍යම) ස්වර ස්ථාන පදනම්කොට වර්ධනය වූවකි. බහුතර සංඛ්‍යාවක් එක්වී දේවස්ථානයේ දී කළ ගායන මෙසේ හඬ තල දෙකකින් ඉදිරිපත් කිරීම සංගීත පරිණාමයේ දක්වා ඇත්තේ ඕගනුම් යනුවෙනි. ගීතයේ තනු වෙනස් නොකොට තල දෙකකින් කළ මෙම ගායනය පැරලල් හාමනි, සමාන්තර සංයෝජන නමින් ද හඳුන්වා තිබේ. ඕගනුම් නමින් මෙසේ හැඳින්වූයේ සමාන්තර නාද සංයෝජනයක් මිස නියම බහු ශබ්දික හෙවත් පොලිෆොනි ක්‍රමයක් නොවේ. එහෙත් එය හාමනි ක්‍රමයේ මූලික පියවර වශයෙන් සැළකිය යුතු ය.

ඕගනුම් යන්නට කොන්ඩක්ටස් (Conductus) යන්න ද යොදාගත් අවස්ථා තිබේ. මෙහි අර්ථය සංවිධානය කරන ලද යන්නයි. ඕගනුම් යන්නද ' ඕගයිස්ට'හෙවත් සංවිධානය කරන ලද යන අර්ථයෙන් සැදුනකි. මේ අතර ස්වර තුනක පරතරය (සඩ්ජ -ගන්ධාර) ඇතිව කළ සමාන්තර සංයෝජනය ගිමෙල් Gimel යනුවෙන් දක්වා තිබේ. මෙය විශේෂයෙන්ම එංගලන්තය වැනි රටවල බහුලව පැවැති ක්‍රමයයි.

ශ්‍රැති ස්ථාන දෙකකින් එකවර ගායනා කිරීමේ ඉහත කී ඕගනුම් යුගයට පෙර විසූ කැසියෝඩෝරියස් සහ ශාන්ත ඉසිඩෝර් වැනි පූජකයන්ගේ සටහන්වල හාමෝනියා සහ සිම්ෆෝනියා වැනි යෙදුම් දක්නට තිබිණ. එහෙත් සමහරු පවසන අන්දමට මෙම සමාන්තර සංයෝජන ක්‍රමය සංවිධානය කර ගැනීම ' ඕගන්' නැමැති සංගිත භාණ්ඩය මත සිදුවී යැයි සිතතොත් එය 8 වැනි ශත වර්ෂයට අයත් වේ ' ඕගන්' භාණ්ඩය කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට මුලින්ම ප්‍රංශයට ගෙන යන ලද්දේ 8 වැනි ශත වර්ෂයේ ආරම්භයත් සමගය. නලා ගණනක් එකවර නාද කරවීමේ ඕගන් භාණ්ඩයේ ව්‍යුහය ඈත පෙරදිග චීන මවුත්ඕගනයෙන් අනුකරණය කරගත් බව අනුමාන කළ හැක.

ළමා හා වැඩිහිටි පිරිමින් එක්වී ගායන කළ ශ්‍රැති ස්ථාන දෙකකින් ගැයීම නිතැතින්ම සිදුවූවකි. දේවස්ථාන ගායන සඳහා පුහුණුව ලැබූ කොරිස්ටර් නම් ගායකයෝ බොහෝවිට ළමා වයසේ සිටි පිරිමින් වූහ.

ඕගනුම් හෙවත් සමාන්තර සංයෝජන ක්‍රමය මත ලියන ලද ප්ලේන්සෝ ගීත රාශියක් මේ වනවිට බිහිවී තිබුණි. ඕගනුම් සැලැස්ම ඒ මත තවත් ගී රටාවක් බිහි කිරීමට මුල් වූයේ ය. ආගමික රචනා වලින් සමන්විත වූ මෙම ගී රටාව හඳුන්වා ඇත්තේ මොටෙට් නමිනි. මෙය ද දේවස්ථානය ඇතුළතම නිර්මාණය වූ සැලැස්මකි. ඕගනුම් සැලැස්මට එකවර සමාන්තරව ගැයෙන තනු පාද දෙකක් තිබේ. මෙහි මුල් තනු පාදය ටෙනර් නමින් ද, එයට සමාන්තරව ඉහළින් ගැයෙන පාදය ඩුප්ලුම් නමින් ද හඳුන්වනු ලැබීය. ගීතයේ ටෙනර් නමින් වූ පාදයට ඉහළින් වෙනත් වචන සමූහයකින් සරසන ලද තවත් පාදයක් යෙදීමෙන් (ඩුප්ලුම් වෙනුවට) මොටෙට් ගීත රටාව බිහිවිය. මෙම අමතර පාදය ගැයීමෙහි දී මූලික ටෙනර් පාදයට වෙනස් ලය මානයකින් එය ගයන ලදී මෙම ක්‍රමය කල්යත්ම කවුන්ටර්පොයින්ට් නමින් ප්‍රචලිත විය. ප්ලේන්සොං ගීතයේ ඕගනුම් සැලැස්මට කවුන්ටර් පොයින්ට් ක්‍රමයද ඇතුළත් කිරමෙන් ලබාගත් මොටෙට් ගීත රටාව නියම පොලිෆොනික් හෙවයත් බහුනාද ක්‍රමය ගෙන දුන්නේය. මේ සියල්ල දේවස්ථානය ඇතුළත සිදුවූ පරිණාම අවස්ථා බව පිළිගත යුතු ය. ඕගනුම් ගායනය මෙන්ම මොටෙම් ගායනය ද දේවස්ථානයේ පුහුණුව ලත් කොරිස්ටර් ගායකයන් විසින් කළයුතු විය.

කියවීම් පත්‍රිකාව අංක 03

ස්වර දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ එක විට ම උසුරුවීම බටහිර සංගීතයෙහි සිරිතෙකි. එහිලා අලංකරණය නිමැයෙනුයේ ස්වර යුග්මයෙකිනි. එසේ නැති නම් ස්වර සමූහයෙකිනි. භාරතීය සංගීතය, රාගානුකූලව තනි තනිව යෙදෙන ස්වරයන් ගෙන් අලංකාරය නිපදවයි. එය එකටෙක බැඳි ගත් නොයෙක් ස්වරයන්ගේ සම්බන්ධතාව මත පිහිටා සිටී. එය බැඳී පවත්නේ ශ්‍රැතියත් සමඟය. එම ධ්වනිය ආරම්භය වෙනස් නොවන්නකි.

බොහෝ විට ආධාර ෂඩ්ජය වශයෙන් ගැනෙන්නේ ශුද්ධ ෂඩ්ජය මැයි. සෑම රාගයක්ම එම ආධාර සඩ්ජයක් සමග සම්බන්ධය. හැඟීම් පළ කැරැනුයේ එයිනි. එබැවින් ආධාර ෂඩ්ජය ගැයුම්වැයුම් වලදී නිරන්තරයෙන්ම ඇසීමට පිළිවන් විය යුතු ය. සාමාන්‍යයෙන් ශ්‍රැතිය නොහොත් ආධාර ෂඩ්ජය නිපදවනු ලන්නේ තන්ත්‍රීය භාණ්ඩ වලිනි. අසන්නා එම ස්වරය වෙන් කොට වටහා ගන්නා තුරැ ඔහුට රාගයෙහි නියම රසය විඳ ගනු බැරිය. රාගාත්මක සංගීතයෙහි සැබෑ රස වින්දනයකට ඒ පිළිබඳව නිරවුල් දැනීමක් අවශ්‍ය වනුයේ මෙහෙයිනි.

භාරතීය සංගීතයෙහි ස්වර අතර සබඳකම නොසිඳීපවත්නේ, අවහිරයක් නැතිව නොකඩවා ගලා බස්නා දිය පාරක් පරිද්දෙනි. එය බටහිර සංගීතයෙහි ලැබෙන්නේ කඩින් කඩය. එයින් නාදයේ අඛණ්ඩතාව ආරක්ෂා වන මෙම ස්වරාන්තර සම්බන්ධතාව ඉතා අගය කොට සැලකෙන්නකි. ස්වභාවිකත්වය රැකෙන්නේ එයිනි.

බටහිර සංගීතයෙහි නියම ස්වර දොළසක් තිබේ. ගායක ගායිකාවන්ගේ කටහඬ පුහුණු කරවනුයේ ඊටම ය. එයින් පිට ස්වර සාධනයක් බටහිර ට නැත. අනුමානයෙන් හඬ සැකැස්මක් හෝ කඩහඬට ගැලපෙන ලෙස උච්චනීචතා භේදයක් පිහිටුවීමක් හෝ පියානෝවේ නොලැබෙන හෙයිනි. සංධ්වනී සංවාදනයට මුල් තැන දෙමින් වාද්‍ය සංගීතයම සංවර්ධනය කර ගන්නට ඔවුන් පෙළැඹී ගියේ ද මේ නියා විය යුතු ය.

මෙම කරුණු හේතු කොට ගෙන ඔවුන්ගේ වාද්‍ය සංගීතය ගාන සංගීතයට වඩා විශිෂ්ටව කැපී පෙනෙන්නට වී තිබේ. මේ වූ කලි පවිත්‍ර වූ රාගාත්මක සංගීතයෙන් අපේක්ෂා කළ යුත්තක් නොවේ. ඉන්දීය සංගීතයෙහි උච්චනීචතාව ක් පිහිටු වනුයේ ශ්‍රැතිය මතය. බොහෝ විට එම ශ්‍රැතිය ෂඩ්ජය ම වේ. එම උච්චනීචතාව ශ්‍රැතියෙහි කවර තැනෙකින් නමුදු පිහිටුවා ගන්නට පිළිවෙන. එම උච්චනීචතාව අනුව හඬ සකස් කර ගනු ලැබේ. මෙය ඒ ඒ ගායක ගායිකාවනට පෞද්ගලික වන්නක් විනා නොවෙනස් වන නිත්‍ය නියමක් නොවේ. අපරදිග සංගීතයෙහි මෙන් භාරතීය සංගීතයෙහි නිත්‍ය ස්ථාපිත ආධාර ෂඩ්ජයක් හෝ උච්චනීචතාවක් නොලැබේ.

ඉන්දීය සංගීතය නියමයට වඩා ප්‍රකෘතිය පිළි ගනි. එකිනෙකාගේ කටහඬ වෙනස්ව ලැබීම ස්වභාව ධර්මයට එකඟ ය. එ බැවින් නියමිත උච්චනීතාවකට කණ්ඨ ධ්වනිය පුහුණු කරනවාට වඩා ස්වභාවික කණ්ඨ ධ්වනිය සතු ශ්‍රැතියේ පිහිටා උච්චනීචතාවක් ගැනීම පෙරදිග වැසියනට ඉෂ්ටය. පළමු වැන්න. යාන්ත්‍රිකය, කෘත්‍රිමය, දෙවැන්න මානුෂිකය, ස්වභාවිකය.

ඇගයීම - බටහිර සංගීත ශිල්ප ක්‍රම යොදාගෙන නිර්මාණය වූ සරල ගීයක් උදාහරණයට ගනිමින්, එම ගීතයට එකී ශිල්ප ක්‍රම යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ විමසුමක් කරන්න.

ඇගයීම - 05

01. ආවරණය කරණ නිපුණතා මට්ටම -

සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.

02. විෂය සන්ධාරය -

- සංගීතය නිර්වචනය කරයි.
- ලෝක සංගීතය වෙනස්කම්වලට බලපෑ හේතු
- සංගීත පද්ධති - පෙරදිග, අපරදිග
- චීන, ඉස්ලාමික් , ගැමිලාන්
- පෙරදිග, අපරදිග, සංගීතයේ වෙනස්කම් මෙලඩි, හාමනි.

03. උපකරණයේ ස්වභාවය. - පැවරුම

04. කාලය - කාලච්ඡේද 02

- මෙම නිපුණාවයට අනුව මෙතෙක් අධ්‍යයනය කළ විෂයය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් හා සංවිධානය කරමින් සිසුන් විසින් කේවලව සකස් කරනු ලබන පොත් පිංචක්.

04. අරමුණු

- අධ්‍යයනය කළ කරුණු සංවිධානාත්මකව භාවිත කරයි.
- තව දුරටත් විෂයය කරුණු ගවේෂණය කරයි.
- තොරතුරු රැස් කරයි.
- රැස් කරගත් තොරතුරු සංවිධානාත්මකව හා නිර්මාණාත්මකව සංවිධානය කරයි.
- විෂයය කරුණු ක්‍රමවත් ගොනුවක් ලෙසට පිළියෙළ කරයි.

05. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- මෙම නිපුණතාවයට අනුව සිසුන් විසින් ඉටු කරනු ලබන සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි මෙම පොත් පිංචක් සකස් කරවා ගැනීම අපේක්ෂිතය.
- ආරම්භයේ දීම සිසුන්ට ඒ පිළිබඳව දැනුවත් කරන්න.

සිසුන්ට උපදෙස් -

- ගුරුවරයාගේ මඟ පෙන්වීම අනුව ඔබ අධ්‍යයනය කළ විෂයය කරුණු තව දුරටත් සංවර්ධනය කරමින් පරිශීලනයට සුදුසු පොත් පිංචක් සකස් කරන්න.
- පුස්තකාලය හා සම්පත් පුද්ගලයින් ප්‍රයෝජනයට ගන්න. කරුණු මෙසේ සංවිධානය කරන්න.
  - නම හා මුල් පිටුව
  - පිදුම
  - පටුන
  - අන්තර්ගතය පහත දැක්වෙන පරිදි කොටස් කරන්න.
  - සංගීත නිර්වචන
  - සංගීත සම්ප්‍රදායන් හි වෙනස්කම්වලට බලපා ඇති විවිධ හේතු
  - සංගීත පද්ධති (පෙරදිග, අපරදිග, චීන, ඉස්ලාම්, හැටිලෑන්ඩ් පෙර අපරදිග සංගීත ලක්ෂණ හා මෙලඩි හාර්මනි සිද්ධාන්තය

06. නිර්ණායක

1. තොරතුරු රැස්කිරීමේ ප්‍රමාණවත් බව	ලකුණු 04
2. කරුණුවල නිවැරදි බව	ලකුණු 04
3. සංවිධානය කිරීමේ ක්‍රමවත් බව	ලකුණු 04
4. නිර්මාණාත්මක බව	ලකුණු 04
5. ගුණාත්මක බව	ලකුණු 04

නිපුණතාවය 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 : භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම 2.2.1 : භාරතීය සංගීතයේ ස්වභාවය වටහා ගනිමු.

ඉගෙනුම් ඵල :
- භාරතීය සංගීත පද්ධති නම් කරයි.
- සංගීත පද්ධතිවලට අදාළ සුවිශේෂ ශිල්ප විස්තර කරයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම අංක 1 ට ඇතුළත් භාරතීය සංගීතයේ ප්‍රභේද ඇතුළත් දෘශ්‍ය උපකරණය
ඇමුණුම අංක 2 ට ඇතුළත් කියවීම් පත්‍රිකාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: භාරතීය සංගීතයේ ස්වභාවය පිළිබඳව අධ්‍යයනයක් කර පද්ධති දෙකේම ආවේණික ලක්ෂණ අවබෝධ කර ගැනීම මින් අපේක්ෂා කෙරේ. මේ සඳහා දී ඇති ඇමුණුම් අංක 01 දෘශ්‍යාධාරකය හා ඇමුණුම් අංක 02 යටතේ කියවීම් පත්‍රිකාව භාවිත කළ හැක. ඊට අමතරව ගුණාත්මක යෙදවුම් යටතේ දක්වා ඇති පොත්පත් ද පරිශීලනය කිරීමට සිසුන් උනන්දු කළ යුතුවේ. අනෙකුත් සංගීත පද්ධති වලින් භාරතීය සංගීතය වෙන්කොට හඳුනා ගැනීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිත ය.

ක්‍රියාකාරකම සංවර්ධනය

- ප්‍රවේශය ලෙස ඉදිරිපත් කර ඇති ඇමුණුම අංක 01 හි දක්වෙන දෘශ්‍ය උපකරණය ඉදිරිපත් කරන්න. එහි ඇතුළත් කොටස් පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න. බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කරවන්න.

කාලච්ඡේද 02

ඇමුණුම අංක - 01

ප්‍රවේශය -



භාරතීය සංගීතය කොටස් වශයෙන් බෙදන ආකාරය පිළිබඳව ඉහත සකස් කර ඇති දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරමින්, එම කොටස් පිළිබඳව සාකච්ඡාවක් මෙහෙයවන්න. ඊට පසු ඇමුණුම අංක 02 හි කියවීම් පත්‍රිකාව සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

ඇමුණුම - 02

කියවීම් පත්‍රිකාව

පහත දැක්වෙන සංක්ෂිප්ත කරුණු නිර්මාණශීලීව හා සාරවත් රචනාවක් ලෙස යොදමින් බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

- භාරතීය සංගීතය කොටස් දෙකකට බෙදෙන බව.
- මාර්ග හා දේශීය සංගීතය වශයෙන් බෙදෙන බව.
- මාර්ග සංගීතය දෙවියන් කරා ලඟාවීමට හැකි සංගීත ක්‍රමයක් බවත්, ඉන් පුද්ගලයෙකුගේ මානසික තත්වය දියුණු කිරීමට හැකියාවක් ඇති බව.
- දේශීය සංගීතය සාමාන්‍ය ජනතාව අතරේ පවතින සංගීත ක්‍රමයක් වන බව.
- දේශීය සංගීතය උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව.
- ඒකල ගායනයට ප්‍රබල තැනක් හිමිවන බව.
- පුද්ගල දක්ෂතා ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට ඉඩකඩ ලැබෙන බව.
- ලිඛිත ක්‍රමයට වඩා නිර්මාණාත්මක බවට විශේෂත්වයක් ලැබෙන බව.
- පද්ධති දෙකේම සංගීත ලක්ෂණ වෙන් වෙන්ව අවබෝධකරගත හැකි බව.
- සංගීත භාණ්ඩ යොදාගෙන කේවලව සම්පූර්ණ වාදනයන් ඉදිරිපත් කළ හැකි බව.
- එකිනෙකට වෙනස්වූ ගායන ශෛලීන් රාශියක් ඇති බව.
- මැදිරිගත සංගීත ක්‍රමයක් ඇති බවත් (Chember Music)
- මීන්ඩ් , ගමක්, ඛන් , මුර්කි ආදී ශිල්ප ක්‍රම භාවිත කරමින් කර්ණරසායන බවක් ඇති කිරීම සඳහා සුවිශේෂ ශිල්පාංග යොදා ගන්නා බව.
- විවිධ තාල සහිත තාල පද්ධතියක් භාවිත වන බව.
- සිසුන් සමග සාකච්ඡා කරන්න. සංවාදශීලී බව ගොඩනගන්න. "භාරතීය සංගීතයේ ස්වභාවය" යන මැයෙන් බිත්ති පුවත් පතකට සුදුසු ලිපියක් සකස් කරවන්න.
-

ඇගයීම -

- 'භාරතීය සංගීතයේ ස්වභාවය ' යන මාතෘකාව යටතේ කථාවක් පවත්වන්න.

මූලාශ්‍ර - 'සංගීත සංහිතා' - විමල් අභයසුන්දර,
'සංගීත - සංහිතා' - ප්‍රේමවංශ හපුවලාන

ඇගයීම 06

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

2. විෂය සන්ධාරය -

- භාරතීය සංගීතයේ ස්වභාවය
- උත්තර, දක්ෂින, භාරතීය සංගිත පද්ධතිවල සම විෂමතා
- උතුරු ඉන්දීය ගානය ශෛලින් -ධ්‍රැපද්, ධමාර් , ඛ්‍යාල් , ඛන්, ගසල්, තරානා, චතුරංග
- දකුණු ඉන්දීය ගායන ශෛලීන්
- තිර්ලානා, වර්නම්.

3. උපකරණයේ ස්වභාවය

පැවරුම

4. කාලය - **කාලච්ඡේද 02**

5. අරමුණු-

- භාරතීය සංගීතයේ ස්වභාවය අවබෝධ කර ගනියි.
- උත්තර භාරතීය පද්ධතියේ සුවිශේෂතා පැහැදිළි කරයි
- දක්ෂිණ භාරතීය පද්ධතියේ සුවිශේෂතා පැහැදිළි කරයි
- පද්ධතිවල විවිධතා පිළිබඳව තර්කානුකූලව අදහස් දක්වයි
- ධ්‍රැපද්, ධමාර්, ඛ්‍යාල්, තරානා, ගසල්, භජන්, චතුරංග, තිර්ලනා, වර්නම්, පිළිබඳ වෙනස්කම් පැහැදිලි කරයි.

5. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් - භාරතීය සංගීතයේ ස්වභාවය, පද්ධතිවල විශේෂතා හා ගායන ශෛලීන් පිළිබඳව ලිඛිතව සිසුන්ගෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු රැස්කරගෙන, පැවරුමක් ලෙස සකස් කරවන්න.

1 පියවර
- භාරතීය සංගීතයේ මූලික බෙදීම් දක්වන්න.
- උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සංසන්දනාත්මකව පැහැදිලි කරන්න.

2 පියවර
- ධ්‍රැපද්, ධමාර් යන ශෛලීන්ගෙන් ආරම්භය, ආකෘතිය හා සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරවන්න.

3 පියවර
- බඩාඛ්‍යාල්, චොටා ඛ්‍යාල් අතර සම විෂමතා දක්වන්න.

4 පියවර
- භජන්, ගසල් හා චතුරංග තරානා මෙම යුගල දෙකින් කැමති යුගලයක් සංසන්දනය කර දක්වන්න.

5 පියවර
- තිල්ලානා - වර්නම්
  ආරම්භය, ආකෘතිය හා සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

නිර්ණායක -

1	භාරතීය සංගීතයේ මූලික බෙදීම් හා උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සංසන්දනාත්මක පැහැදිලි කිරීමට	ලකුණු 04
2	ධ්‍රැපද් , ධමාර්, ගායන ශෛලීන්ගේ තොරතුරු පැහැදිලි කිරීමට	ලකුණු 04
3	බඩාඛ්‍යාල්, චොටාඛ්‍යාල් අතර සමවිෂමතා දැක්වීමට	ලකුණු 04
4	ගායන ශෛලීන්ගෙන් කැමති යුගලය සංසන්දනය කිරීමට	ලකුණු 04
5	තිල්ලානා - වර්නම් සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කිරීමට	ලකුණු 04

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 : භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම 2.2.2 : උත්තර භාරතීය, දක්ෂිණ භාරතීය පද්ධතිවල සම විෂමතා සසඳමු.

ඉගෙනුම් ඵල :
- උත්තර හා දක්ෂිණ භාරතීය පද්ධති දෙකේ ආවේණික ලක්ෂණ හඳුනා ගනියි.
- උත්තර හා දක්ෂිණ භාරතීය පද්ධතිවල සමවිෂමතා හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම අංක 1 ට අදාළ උත්තර භාරතීය රාගධාරී මධ්‍යලය ගීතයක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක් හා දක්ෂිණ භාරතීය සංගීතයේ 'වර්ණම්' ඇතුළත් ශ්‍රව්‍ය පටයක්
ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්
: උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සම විෂමතා සාකච්ඡාකර ඒ පිළිබඳව අවබෝධයක් ලබාදීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතවේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

භාරතීය සංගීත පද්ධතිය උත්තර හා දක්ෂිණ වශයෙන් කොටස් දෙකකට බෙදේ. ඒ පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ක්‍රියාකාරකම අංක 1 හි යොදවන්න. එයට සහායවන්න. ක්‍රියාකාරකමේ අවසානයේ දී ස්වර, රාග තාල සංගීත භාණ්ඩ ආදී ශීර්ෂ ඔස්සේ කර්ණාටක හා හින්දුස්ථානි සංගීත පද්ධති අතර සැසඳීමක් කරන්න.

(කාලච්ඡේද - 03)

ඇමුණුම - 01

ප්‍රවේශය - හින්දුස්ථානි හා කර්ණාටක ගීත ඇතුළත් කැසට් පටදෙක ශ්‍රවණයට සලස්වන්න.

ක්‍රියාකාරකම අංක 1

එම ශෛලීන් දෙක අතර ඔබට ශ්‍රවණය වුන වෙනස්කම්, පිළිබඳව විවෘතව අදහස් දක්වන්න.

ඇමුණුම - 02

ප්‍රවේශය - සපයා ඇති කියවීම් පත්‍රිකාව උපයෝගී කරගෙන සම විෂමතා සාකච්ඡා කරන්න.

ඇමුණුම - 02

කියවීම් පත්‍රිකාව

- පද්ධති දෙකේම ශුද්ධ හා විකෘති ස්වර 12 ක් යෙදෙන බව
- උත්තරභාරතීය ගීත ආකෘතිය ස්ථායි, අන්තරා බව
- උත්තරභාරතීය මේල 10 ක් යෙදෙන බව
- දක්ෂිණ භාරතීය ගීත ආකෘතිය පල්ලවි, අනු පල්ලවි, චරනම්, චිට්ටා ස්වරම් බව
- ඨාට අනුව රාග වර්ගවන බව
- ආලාප ගායනයට, තාලයකට බැඳී ගීත හා තානාලංකාර යෙදෙන බව.
- දක්ෂිණ භාරතීය මේල 72 ක් බව
- සප්තක 3 ම ඇසුරු කරන බව
- භාෂාවන්, සංගීත භාණ්ඩ හා තාල පද්ධතිය වෙනස්වන බව
- සරල හා ශාස්ත්‍රීය වශයෙන් ගායන ශෛලීන් භාවිත වන බව
- ගායන වාදන සඳහා ශ්‍රැතියක් පාදක කර ගන්නා බව
- විලම්බලය හා මධ්‍යලය ගීත යෙදෙන බව.

පහත දැක්වෙන කරුනු පිළිබඳව විස්තරාත්මක විමසීමක් කිරීමට අවධානය යොමු කරන්න.

- ස්වර නාම 12 වෙනස්කම්
- ආකෘතියේ වෙනස්කම්
- මේල සංඛ්‍යාවේ වෙනස්කම්
- සරල හා ශාස්ත්‍රීය වශයෙන් ගායන ශෛලීන් යෙදීම
- භාෂාවන් තාලපද්ධතිය හා සංගීත භාණ්ඩවල එකිනෙක වෙනස්කම්
- අවසානයේ උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතීන්ගේ සම විෂමතා සංසන්දනය කරමින් බිත්ති පුවත්පතකට සුදුසු සටහනක් ගොඩනගන්න.

ඇගයීම -

- උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතීන්ගේ ආකෘතිය , ස්වරනාම, භාෂාවන්, තාල, පිළිබඳව විමසීමක් කරන්න.

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 : භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම 2.2.3 : උතුරු ඉන්දීය ගායන ශෛලීන් ගයමු. තොරතුරු සසඳමු.

ඉගෙනුම් ඵල :
- ගායන ශෛලීන්ට අදාළ ගීත ගායනය කරයි
- ගායන ශෛලීන්ගේ තොරතුරු අධ්‍යයනය කරයි
- බඩාඛ්‍යාල් ගායනා පිළිබඳ දළ අවබෝධයක් ලබා ගනියි.

කාලය : කාලච්ඡේද 12

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව, තබ්ලාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: නිර්දේශිත විලම්බලය ගීතයක් ගායනය කිරීම හා ඛ්‍යාල් ගායන ශෛලියේ තොරතුරු අධ්‍යයනය කිරීම .

ඛ්‍යාල් තරානා, චතුරංග, භජන්, ගසල් යන ගායන ශෛලීන්ගේ ගීත ගායනය සහ තොරතුරු අධ්‍යයනය කිරීම මින් අපේක්ෂිතය. ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගායනා වෙනමම අධ්‍යයනය කරන නිසා බඩා ඛ්‍යාල් ගායනා පිළිබඳ ප්‍රයෝගිකව දළ අවබෝධයක් ලබා දීම ද අපේක්ෂිත ය. ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශිත ප්‍රායෝගික වැඩ සැලසුම ග්‍රන්ථයේ එන භජන් සහ ගසල් ගීත, ගායනය සඳහා යොදා ගත හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- භාගේශ්‍රී, මාල්කෞන්ස්, ජයජයවන්තී යන රාග අතරින් එකකට අයත් විලම්බලය ගීතයක් ගායනය සඳහා යොදා ගනිමින් ඛ්‍යාල් ගායනය පිළිබඳව සාකච්ඡාවක් කරන්න. බඩා ඛ්‍යාල්, චෝටා ඛ්‍යාල් , ශෛලීන් අතර සම විෂමකම් පිළිබඳව සාකච්ඡාවක් කරන්න.

  (කාලච්ඡේද 02)

- බ්‍රින්දාවනීසාරංග, දේස්, තිලක්කාමෝද් දේස් යන රාගවලින් එකකට අයත් තරානා ගීතයක් මේ සඳහා යොදා ගන්න. මධ්‍යලයේ සිට ද්‍රුතලය දක්වා ලය වැඩිකර ගායනයට යොමු කරවන්න. තරානා ගායනා ශෛලිය පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න.

  (කාලච්ඡේද 02)

- ඔබ කැමැති චතුරංග ගීතයක් මේ සඳහා යොදාගන්න. ඔබේ පහසුව සඳහා ඇමුණුම අංක 01 හි ගීතයක් යොදා ඇත. එම ගීතය ගායනය සඳහා යොදා ගනිමින් ගායන ශෛලිය පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න.

  (කාලච්ඡේද 02)

- තුමක චලිත රාමචන්ද්‍ර , තුම්බින මෝරේ, පයෝජී මෛනෙ , වෛශ්නු වජන් කෝ, පග ගුංගරුංබාංද මීරා නාචීරේ, රස්නා නිසදින යන භජන් ගීත වලින් එකක් ගායනයට යොදාගෙන එම ශෛලිය පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

  (කාලච්ඡේද 02

- ඔබ කැමති ගසල් ගීතයක් ගායනයට යොදාගන්න. එම ශෛලිය පිළිබඳව සාකච්ඡාවක් කරන්න. ගායන ශෛලීන් පිළිබඳ නම් කරන ලද පොත් පරිශීලනය කර තොරතුරු රැස්කරගෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම -

- විලම්බලය ගීතයක්, තරානා, භජන් ගීතයක් ගායනය කරන්න.
- ගසල් - භජන්, බඩා ඛ්‍යාල් - චොටා ඛ්‍යාල්, චතුරංග - තරාණා සංසන්දනය කරන්න.

මූලාශ්‍ර -

- සිද්ධාන්ත සම්භාව්‍ය සංගීතය - 1 ශාන්ති ගීත දේව
  සිද්ධාන්ත සම්භාව්‍ය සංගීතය - 11 ශාන්ති ගීත දේව
  සංගීත විමර්ශන - විශාරද දයාරත්න රණතුංග
  සංගීත - ප්‍රේමවංශ හපුවලාන
  පෙරදිග සංගීත ශාස්ත්‍රය - බී. එස්. විජේරත්න
  මෙම ග්‍රන්ථ පරිශීලනය කර තොරතුරු සපයා ගන්න.

ක්‍රියාකාරකම අංක 1

මෙතෙක් අධ්‍යයනය කළ ගායන ශෛලීන් පහත දැක්වෙන ආකාරයෙන් සන්සන්දනයට යොමු කරන්න. සටහනක් ගොඩනගන්න.

බඩා ඛ්‍යාල් - චොටා ඛ්‍යාල්
තරානා - චතුරංග
භජන් - ගසල්

(කාලච්ඡේද 02)

ඇමුණුම අංක 03

චතුරංග ගීතය

රාගය - භෛරවී තාලය - ත්‍රිතාල්



භජන් ගීතය

තුම්බින මෝරේ කෝන කබර හේ //
ගෝවර්ධන ගිරිදාරී //

කඩීසබා මෙමෙ ගොපද උචාරී //
රා කෝ ලාජ හමාරේ
ගෝවර්ධන ගිරි දාරී

මෝරෙ මුකුට පී තාඹර සීවේ //
කුංඩල කී චහි නාරී, නාරී.
ගෝවර්ධන ගිරි දාරී

මීරා කේ ප්‍රභු ගිරිධර නාගර //
චරන කමල බලි හාරී හාරී
ගෝවර්ධන ගිරිදාරී

(I) + ස්‍රී ස්‍ර -ඛ ස්‍ග්	ස - ස -	+ ග්‍ර -ග්‍ර ග	ග්‍ර ස්‍ග්‍ර ග් -
+ ග්‍ර -ග්‍ර් -ග්‍ර	ග ග් ස ස්‍ග්	ස - ස -	- - - -
+ ස්‍ර -ඛ ස්‍ග්	ස - ස -	+ ග්‍ර -ග්‍ර ග	ග්‍ර ස්‍ග්‍ර ග් -
+ ග්‍ර -ග්‍ර් -ග්‍ර	ග ග් ස ස්‍ග්	ස - ස ස්‍ස්‍ර	ස්‍ග්‍ර ග්‍ර ග්‍ර ග්‍ර
(II) + ග්‍ර -ග්‍ර ග	ග ම ග ම	ග් ම ග්‍ර්‍ග් ග්‍ර	ග ග් ස - ॥
+ ස්‍ර -ස්‍ර ස	ස්‍ර ස්‍ර ග ම	ස්‍ර ස්‍ර් - ස්‍ග්	ධ්‍ස ම්‍ස ග ග්
+ ග්‍ර -ග්‍ර් -ග්‍ර	ග ග් ස ස්‍ග්	ස - ස -	- - - -
ii වෙනි තොටයේ තාලමාත්‍රාවට iii වන තොටයද යෙදේ.			
(IV) + ම්‍ස -ස්‍ර ස්	ස්‍ර්‍ග් ග්‍ර් ස ස්	+ ස්‍ග්‍ර ස් ස්	ස්‍ස් ස්‍ග්‍ර් ධ්‍ස ම්‍ස ॥
+ ස්‍ස -ස්‍ර -ග්‍ර	ස්‍ර ස්‍ර -ග්‍ර ම	ස්‍ර ස්‍ර් - ස්‍ග්	ධ්‍ස ම්‍ස ග ග්
+ ග්‍ර -ග්‍ර් -ග්‍ර	ග ග් ස ස්‍ග්	ස - ස -	- - - -

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 : භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම 2.2.4 : ධ්‍රැපද්, ධමාර්, ගීත ගයා වෙනස වටහා ගනිමු.

ඉගෙනුම් ඵල :
- ගායන ශෛලීන්ගේ ගීත ගායනය කිරීම හා තොරතුරු අධ්‍යයනය කරයි.
- ධමාර්, ගීතය, සමගුණ වශයෙන් ගායනය කරයි.
- ධ්‍රැපද් ගීතයේ ගුණ කරමින් ගායනය කරයි
- ගායන ශෛලීන්ගේ වෙනස්කම් හඳුනා ගැනීම කරයි.

කාලය : කාලච්ඡේද 08

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව, තාම්පුරාව, තබ්ලාව, පක්වාජය

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: ධ්‍රැපද් ගීතයේ සමගුණය, දෙගුණය, තුන්ගුණය සහ ධමාර් ගීතයේ සමගුණය පමණක් ගායනය කිරීමේ හැකියාව හා එම තොරතුරු අධ්‍යයනය කිරීම මින් අපේක්ෂා කෙරේ. මෙම ගීත ගැයීමෙන් තාල භාවිතයෙහි කුසලතාවන් වර්ධනය කර ගත හැකි ය.

- මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලඟාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරවීමට පියවර ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- භාගේශ්‍රී, මාලකෞන්ස් . බහාර් යන රාගවලට අයත් ධ්‍රැපද් ගීත වලින් එකක් මේ සඳහා යොදා ගන්න. ඔබගේ පහසුව සඳහා ඇමුණුම අංක 1 යටතේ ධ්‍රැපද් ගීත නිදර්ශන වශයෙන් ඇතුළත් කර ඇත. අවම වශයෙන් ගීතයේ ස්ථායි කොටසෙහිවත්, සමගුණය, දෙගුණය හා තුන් ගුණය වශයෙන් ගුණ කිරීමට සිසුන් මෙහෙයවන්න. අදහස් දැක්වීමට හුරු කරන්න.

  (කාලච්ඡේද 04 යි)
- බිහාග්, ජයජයවන්ති, තිලක්කාමෝද් යන රාගවලට අයත් ධමාර් ගීත වලින් එකක් මේ සඳහා යොදා ගන්න. ඔබගේ පහසුව සඳහා ඇමුණුම අංක 2 යටතේ, ධමාර් ගීත නිදර්ශන වශයෙන් ඇතුළත් කර ඇත. අවම වශයෙන් ස්ථායි කොටසේ සමගුණය ගායනය කිරීමට පුහුණු කරවන්න.

  (කාලච්ඡේද 02 යි)
- ඇමුණුම අංක 03 ක්‍රියාකාරකමේ යොදවන්න. ධ්‍රැපද්, ධමාර්, එකිනෙක සැසඳීමට සිසුන් යොමු කරවන්න.

  (කාලච්ඡේද 03 යි)

ක්‍රියාකාරකම අංක 3

පුස්තකාල පොත් පරිශීලනය කර ඇමුණුම අංක 3 වගුව සම්පූර්ණ කරන්න. එක් රැස්කරගත් තොරතුරු අනුව ධ්‍රැපද්, ධමාර්, ගායන ශෛලීන් දෙක සංසන්දනය කර දක්වන්න.

ඇමුණුම 03

ගවේෂණයට අදාළ තොරතුරු	ධ්‍රැපද්	ධමාර්
ආරම්භය හා කාලවකවානු		
ආකෘතිය		
තාල පද්ධතිය		
සංගීත භාණ්ඩ		
විශේෂ ලක්ෂණ		

ඇගයීම -

- ඔබ ඉගෙනගත් ධ්‍රැපද් ගීතයේ ස්ථායි කොටස ඒකල/කණ්ඩායම් වශයෙන් ගායනය කරන්න. (සම, දෙගුණ, සිවු ගුණ, වශයෙන් ගුණ කරන්න.)
- ධමාර් ගීතයේ ස්ථායි කොටසේ සමගුණය, ඒකල/ කණ්ඩායම් වශයෙන් ගායනය කරන්න.

මූලාශ්‍ර -

- සිද්ධාන්ත සම්භාව්‍ය සංගීතය - ශාන්ති ගීතදේව
- සම්භාව්‍ය සංගීත ඩිප්ලෝමා - ප්‍රේමදාස මුදුන්කොටුව
- සංගීත - ප්‍රේමවංශ හපුවලාන

ඇමුණුම් 02

රාගය- භාගේ ශ්‍රී
ධ්‍රැපද් ගීතය

ප් ප් -	ස් ධ	ම ධ	ම -	ග් ම්	- ස
ආ ස	යෙ ර	ඛ්‍ර ස	මී ස	ර ගී	ස ර
×	०	2	०	3	4
රි ස	- ස්	ධ් ස	ස්ම ග	- ස්රි	- ස
ඇ යෝ	ස ඛ	ස ත	ග ර	ස යෝ	ස ස
×	०	2	०	3	4
ස්ස් ස	ම ග	ස්ධ ස්	ස් ස්	ස්ස් ම්	ස් -
ල ०	තා ස	ඛ ත	හ න	ඛ්‍ර ණ	යෝ ස
×	०	2	०	3	4
ම ස් -	ස් ප්	ම ධ	ම ග	ධ් ර්	ස -
රා ස	ඛ් ද්	යෝ ස	ඛ් ස	ඛ ත	ඇ යෝ ස
×	०	2	०	3	4
		ආරෝහණ			
ග් ම් ග	ම් ස්	ධ ස්	ස් ස්	- ස්	- ස්
ස්ං ඛ	ස ස	ස ත	ඛ ර	ස බෙ	ස යෝ
×	०	2	०	3	4
ස්ස් ස්	ස් ර්	- ස්	ස්ස් ස්	ස් ස්	ස් ධ
ස් ත	ස ර	ස ම	ඛං ස	ශ් ත	ර ත
×	०	2	०	3	4
ධ් -	ස් ස්	- ස්ම්	ග් ර්	ස් ර්	ස් ස්
ණ ස	තත ස්ත	ස ත	ඛං ම	ර ඛ්‍ර	ල බේ
×	०	2	०	3	4
ම් ස්	ස් ධ	ම ධ	ම ග	- ස්රි	- ස
ආ ස	ලො ත	ඛ්‍ර ස	ම ත	ස ගී	ස ර
×	०	2	०	3	4

ඇමුණුම් - 03

රාගය- බහාර් - ධ්‍රැපද් - චෞතාල් - ස්ථායි

ස්‌ ස්‌ ඛී යා 0	ග්‍ර ම ඛී යා 3	ම ග ඛෝ ස 4	ධ – ණා ස ×	ග් ස්‌ ස ස 0	ර් ස්‌ ස රි 2
ස්‌ – ඛී ස 0	ග්‍ර – ඛෝ ස 3	ප – ඛෝ ස 4	ග්‍ර ග්‍ර ර ම ×	ග්‍ර ර් ණ්‍ර ග ර	– ස ස ණ 2
ස ම ස රි 0	ම ප ස ර් 3	ම ග ප ධ 4	ධ ග් ප ධ ×	ස්‌ ග් ඛ ණ	ස්‌ ස්‌ ඛ ණ 2

අන්තරා

			ම ග ණ ධ ×	ධ – ඛෝ ස 0	ග් – ඊ ස 2
ස්‌ – ඛා ස 0	ග් ස්‌ ය ණ 3	– ස්‌ ස ණො 4	ස්‌ ග් ණො ස ×	ස්‌ ර් ණ බා 0	– ස්‌ ස ණ 2
ග් ග් ඛ ස 0	ස්‌ ග් ස ලී 3	– ධ ස රි 4	ග ම ග ණ ධ ×	ම ධ ස ණෝ 0	– ග් ස ම් 2
ස්‌ – ලේ ස 0	– ස්‌ ස ඛ්‍ර 3	– ස්‌ ස ණ 4	ර් ග් ස රි ×	ස්‌ ධ ප ල	ග් ස්‌ ඛ ණ 2

ඇමුණුම් - 03

රාගය- මාලාකෞන්ස් - ධ්‍රැපද් - චෞතාල්

ස්ථායි

ධ්‍ස් -	ස ධ්‍	- ධ්‍	ස -	ම ම	ම ම
ඌ ස	දැ ණෝ	ස වි	ස්ථා ස	ස ර	ඝ ර
0	3	4	x	0	2
ම -	ම ම	ග ග	ම්ග -	ම ධ	ධ -
ණෝ ස	ද්‍ බා	ස බෙ	ණෝ ස	ජ්‍ ස	ණෙ ස
0	3	4	x	0	2
ධ්‍ධ -	ධ්‍ධ් ධ	ම ම	ම්ග ම්ග	ම ග	ස ස
ඡ ස	ත්‍රං බා	ස ණා	ඛ ඩෝ	ස ගෘ	ස ත
0	3	4	x	0	2

ආරෝහණ

ම්ග ම	ධ්‍ -	ධ් ධ්	ස් -	ස් -	ස් ස්
ඡේ ස	ඡේ ස	ගු ධ්	ණෙ ස	ණෙ ස	ස ඛ
x	0	2	0	3	4
ධ්‍ස් -	ස් ස්	ධ්‍ධ ම්ධ	ධ් ධ්	ධ්‍ධ් ධ	ම ම
ඡ ස	ත ත	ය්‍ග ඡ්‍ග	ණ ධි	ඡ්‍ග ඛ	ස ත
x	0	2	0	3	4
ම්ග ග	ම ධ	ධ් -	ධ -	ධ් ධ	ම -
ගු රු	ඡේ ස	ජ්‍ ස	ස ස	ස ජ	ලේ ස
x	0	2	0	3	4
ම්ග ම්ග	ම ග	ස ස			
ය ජ	ස ගෘ	ඉ ත			
x	0	2			

ඇමුණුම් - 04

රාගය- ජයජයවන්නි.
ධමාර් ගීතය

ස්ථාඩ්

[illegible]	[illegible]	[illegible]	[illegible]

අන්තරා

	[illegible]	[illegible]	[illegible]

ඇමුණුම් - 05

රාගය- බිහාග් ධමාර් ගීතය

			ම ප ඡේ
ප ප ග ම ග ඛ ත මදු දි 3	ප - - ග ම මා ද ද නිගු ×	ප ප ප රි 2	ග - - යා ද ද 0
ස - ස ස ද ද කා ර 3	ස - - ග - ඥ ද ද ප ද ×	- ම ද ප 2	ප - - යා ද ද 0
නි - ස - සෝ ද ද ද 3	නි - - ප - රා ද ද ද ද ×	නි - ද ද 2	ප - ප ර ද, ඡේ 0

අන්තරා

	ප ප - ස - හ ර ද මා ද ×	- ස ද රි 2	ස ස - ප ඛ ද 0
ස ස ක්‍ර ද රි ඛ 3	ස ස - නි ප ත ර ද ප ර ×	ස නි ස මෝ ද 2	නි ප - හ ත ද 0
ග ම ප නි ඛ ඤ ර ඛේ	ස නි - ප - ලා ද ද ද ද	ග ම ද ද	ග ස, ප ර ද, ඡේ

නිපුණතාව 2.0 : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින්, විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 : භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම 2.2.5 : තිල්ලානා, වර්ණම්, ගයමු

ඉගෙනුම් ඵල :
- දකුණු ඉන්දීය ගායන ශෛලීන්ට අයත් ගීත ගායනය කරයි
- ගායනා ශෛලීන්ගේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව, මෘදංගය

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: දකුණු ඉන්දීය ගායන ශෛලීන් වන තිල්ලානා (තිලානා) වර්ණම් පිළිබඳව විචාරාත්මකව අදහස් දැක්වීම සඳහා අධ්‍යයනයෙහි යෙදීම මින් අපේක්ෂා කෙරේ. වර්ණම් ගායනය තුළින් සිසුන්ගේ ස්වර ගායන කුසලතාව තාල භාවිත හැකියා දියුණු කර ගත හැකි වේ. මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය නිකුත් කළ වර්ණම් හා තිලානා කැසට්පට යොදාගත හැකි ය.

1992 විෂයමාලා ප්‍රතිසංස්කරණයට අනුව ප්‍රකාශිත ගුරු අත්පොත්වල ඇතුළත් කේදාර්ගෞලෛ රාගයට අදාළ තිර්ලානා ගීතයක් ගායනයට යොදා ගන්න. තිල්ලානා පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. ඇමුණුම අංක 3 දක්වෙන කියවීම් පත්‍රිකාව උපයෝගී කර ගෙන ශෛලීන් දෙක පිළිබඳව කථාවක් පැවැත්වීමට උපදෙස් දෙන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- ගුරු අත්පොත්වල ඇතුළත් මෝහනම්, ශංකරාභරණ යන රාගයන්ගෙන් කැමති වර්ණම් ගීතයක් මේ සඳහා යොදා ගන්න. වර්ණම් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. ගීත ගායනයේ දී ගුරුවරයාගේ සහාය ලබා දෙන්න. කර්ණාටක ශෛලිය හැකි පමණින් අවධාරණය කරන්න.

- තිල්ලානා ගායන ශෛලියේ ස්වභාවය, එහි ඇති සුවිශේෂතා , රාග පදනම, ආකෘතිය, සංගීත භාණ්ඩ, ආදි තොරතුරු සාකච්ඡා කරන්න. ආධුනිකයකුට ඇති වැදගත්කම පැහැදිළි කරන්න. කේදාර් ගෞලෛ යන රාග අදාළව තිල්ලානා ගීතයක් නිදසුන් සඳහා යොදාගන්න. ඇමුණුම් අංක 3 හි දක්වෙන කියවීම් පත්‍රිකාව උපයෝගී කරගෙන ශෛලීන් දෙක පිළිබඳව ස්ව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

(කාලච්ඡේද 02)

ඇමුණුම් - 01

ප්‍රවේශය - වර්නම් කැසට් පටය ශ්‍රවණයට සලස්වන්න. කැසට් පටයේ ගීතය සමග ගායනය කරන්න. ගුරුවරයාගේ සහායද ලබා ගන්න.

ක්‍රියාකාරකම අංක 1- වර්නම් ගීතය කොටස් වශයෙන් ගායනය කරන්න.

ඇමුණුම - 02

ප්‍රවේශය - තිලානා කැසට් පටය ශ්‍රවණයට සලස්වන්න. කැසට් පටයේ ගීතය ගායනය කරන්න. ගුරුවරයාගේ සහායද ලබා දෙන්න.

ක්‍රියාකාරකම අංක 02

තිලානා ගීතය ගායනය කරන්න

ඇමුණුම -03

කියවීම් පත්‍රිකාව

වර්නම් -

- දකුණු ඉන්දීය ගායන ශෛලියකි
- ස්වරඥාණය ස්වර භාණ්ඩයක හස්ත සාධනය ලැබීමට කරනු ලබන අභ්‍යාස ක්‍රමයකි.
- පද වර්ණම් හා තාන වර්නම් වශයෙන් කොටස් දෙකකි.
- තාන වර්නම් සංකීර්ණය
- ශිල්පියාගේ ගායන කුසලතා පෙන්වීමට මේවා ගයයි. ලය වැඩියි
- කොටස් හතරකින් යුක්තවීම, පල්ලවි, අනුපල්ලවි, මුක්තායි ස්වරම් හා චරනම් වශයෙනි.
- ප්‍රසාංගික අවස්ථාවලදී වයලීනය, මෘදංගය, ප්‍රධාන කොට වෙනත් සංගීත භාණ්ඩ යොදා ගත හැකි ය.

තිලානා

- මෑත යුගයේ දකුණු ඉන්දියාවේ නිර්මාණය වූ ගායන ශෛලියකි.
- හින්දුස්ථානි සංගීතයේ තරානා ශෛලියට සමානය
- සාහිත්‍ය ප්‍රබන්ධයට වැදගත් ස්ථානයක් නොමැත, නාදිරිදිම්, නාත්‍රදිම් , දිම්තන වැනි මූලිකව ගැයේ.
- තාලය, ලය ප්‍රධානවේ.
- භරත නැටුම් ප්‍රසංගයක් අවසානයේ තිලානා ප්‍රසංගයක් ගායනය සඳහා යොදා ගනී.
- ගායනයට වඩා නර්තනයේදී ලය වැඩි කර ගයයි.
- චාපු, රූපක්, ආදි තාලම් වැනි තාල යොදා ගනී.
- රාග ආශ්‍රිත ගීත රචනා වී ඇත.
- මේ සඳහා දකුණු ඉන්දියාවේ ප්‍රසිද්ධ තිලානා නිර්මාණ ශිල්පීන් සිටියි.

ප්‍රචීන යුගයේ - ස්වාදි තිරනාල් මහරාජා
පූචි ශ්‍රී නිවාස් අයියං ගාර්

මෑත යුගයේ - බාල මුරලි ක්‍රිෂ්ණ (ගායකයෙකි)
ලාල් (කුඩිජෙයරාම්)

ක්‍රියාකාරකම 3

- මෙම කියවීම් පත්‍රිකාවට අමතරව ඔබද තොරතුරු රැස්කර ගන්න.ඒ අනුව තිල්ලානා, වර්නම් පිළිබඳව සංසන්දනාත්මකව කථාවක් පවත්වන්න.
- පහත දැක්වෙන ශිර්ෂ යොදා ගනිමින් සන්සන්දනාත්මක සටහනක් ගොඩ නගන්න.
  තරාණා - තිල්ලානා

ඇගයීම - තිල්ලානා, වර්ණම්, තරානා පිළිබඳව පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

ඇගයීම් 07

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයකට පෙළඹෙයි.

2. විෂය සන්ධාරයට -

උතුරු ඉන්දීය ගායන ශෛලීන්
(ධ්‍රැපද්, ධමාර්, ඛ්‍යාල්, භජන්, ගසල්, තරානා, චතුරංග) නිවැරදිව ගායනය ශෛලීන් පිළිබඳව අදහස් දැක්වීම.

3. උපකරණයේ ස්වභාවය -

ප්‍රායෝගිකව ගායනයේ යෙදවීම
ශෛලීන් පිළිබඳව අදහස් දැක්වීමේ ක්‍රියාකාරකම්

4. කාලය - කාලච්ඡේද 02

5. අරමුණු - උතුරු ඉන්දීය ගායන ශෛලීන්වල එන ගීත නිවැරදිව ගයයි.
ගීතවල ඇතුළත් සුවිශේෂ අංග පැහැදිලි කරයි.
එක් ශෛලියකින් තවත් ශෛලියක් වෙන්කර දක්වයි.
ගායන ශෛලීන් හි විවිධතා පිළිබඳව තර්කානුකූලව අදහස් දක්වයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් - ශ්‍රැතිය, ස්වර හා රාගධාරී ශෛලිය රැකගනිමින්, ධ්‍රැපද්, ධමාර් අනිවාර්යෙන්ම ගායනයට සලස්වන්න. තරානා, චතුරංග, භජන්, ගසල් යන ශෛලීන්ගෙන් කැමති ගීතයක් ගායනය කිරීමට සලස්වන්න

- එම ශෛලීන් පිළිබඳව ලිඛිතව, සිසුන් ගේ අදහස් දැක්වීමට අවස්ථාව සලස්වන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට ලිඛිතව හා ප්‍රායෝගිකව පිළිතුරු ලබාගන්න.
- ධ්‍රැපද් ගීතයේ සහ ධමාර් ගීතයේ ස්ථායි කොටස සමගුණ වශයෙන් ගයන්න.
- කැමති ස්ථායි කොටසක් ගුණකර පෙන්වන්න.
- තරානා, චතුරංග යන ගායන ශෛලීන්ගෙන් අභිරුචි ලෙස තෝරාගත් එක් ගීතයක් ගායනය කරන්න.
- වර්ණම් තිල්ලානා ශෛලීන්ගෙන් තෝරාගත් එක් ගීතයක් ගායනය කරන්න.

ඇගයීම හා තක්සේරුකරණය -

- ධ්‍රැපද්, ගීතය හා ධමාර් ගීතය සමගුණ නිවැරදිව ගායනය කිරීම — ල 04
- ධ්‍රැපද් හෝ ධමාර් ගීතයේ ගුණ කරමින් ගායනය කිරීම — ල. 04
- තරානා, චතුරංග අතරින් ගීතය ගායනය කිරීම. — ල. 04
- භජන්, ගසල් අතරින් තෝරාගත් ගීතය ගායනය කිරීම — ල. 04
- වර්නම්, තිල්ලානා අතරින් තෝරාගත් ගීතය ගායනය කිරීම — ල. 04

ක්‍රියාකාරකම් සැලැස්ම 31

නිපුණතාව 3.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 : වාදන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 : ස්වර පුවරුවෙන් ගීත වයමු.

ඉගෙනුම් ඵල : • ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් කෝඩ්ස් වාදනය කිරීම

කාලය : කාලච්ඡේද 06

ගුණාත්මක යෙදවුම් : සිසුන් විසින් සපයාගත් ස්වර පුවරු භාණ්ඩ

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: උසස් පෙළ සිසුන් සියලු දෙනාම 6 ශ්‍රේණියේ සිට ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයෙහි මූලික හුරුව ලබා ඇත. ඔවුන් ලත් දැනුම උපයෝගී කොටගෙන ඔවුන්ගේ දැනුම ඉදිරියට ගෙන යෑම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතයි.

ප්‍රසාංගිකව ස්වර පුවරුවක් වාදනය කිරීමේ දී ' chord' වාදනය අත්‍යවශ්‍ය. 'chord' සමග ගීතය වාදනය කිරීමේ හැකියාව මෙම ක්‍රියාකාරකමෙන් ලබා දීම අපේක්ෂිතය. ස්වර පුවරු භාණ්ඩ වාදනය පිළිබඳ ලියැවුණු විවිධ පොත් අද වෙළඳ පොලේ ඇති හෙයින් ඒවා පරිශීලනය කර ඔබගේ දැනුම වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍යය. 'chord' සමඟ ගීතයක් වාදනය කර ඇත. අවස්ථා පෙන්වීමේ හැකියාව තිබෙන්නේ නම් පාඩමේ ඵලදායිතාවය වැඩිවනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතයට ගන්න. chord එකක් නිර්මාණය වන ආකාරය ලුහුඬින් හඳුන්වා දෙමින් සාකච්ඡා කරන්න.
- major, Minor, 7th , Major 7th, Minor 7th, Diminish, Augmented වැනි chord වර්ග රාශියක් ඇති බව පහදා දෙන්න. අපට උසස් පෙළට වැදගත් Major හා minor බව වටහා දෙන්න.
- 12 ශ්‍රේණියට නම් කර ඇති C, F, G. B^b, E^b, යන Scale වලට අයත් Major minor chord වාදනයට යොමු කරන්න. 11 ශ්‍රේණියේ දී අධ්‍යයනය කළ කොටස් සිහිපත් කරන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 02 හි ඇතුළත් ප්‍රවේශයෙන් පිවිසෙන්න. II ක්‍රියා කාරකමින් C, F, G, Chord තුන C Major Scale එක සමඟ එකට වාදනය කරවන්න. වමතින් chord හා දකුණතින් ස්වර සප්තකය (Scale) වාදනය කරවන්න.

- ස්වර සප්තකය සමඟ වාදනය කිරීමට පෙරාතුව chord මාරුකිරීම හුරුවීම සඳහා රිද්මයානුකූල අභ්‍යාස කීපයකට යොමු කරන්න.

(කාලච්ඡේද 01)

- සුදුසු ප්‍රවේශයක් භාවිතා කරන්න. ඇමුණුම 03 හි ඇතුළත් ක්‍රියාකාරකම් දක්වෙන ගීත හෝ ඔබ විසින් සපයා ගත් වෙනත් සුදුසු ගීත කිහිපයක් chord සමඟ වාදනය කරවන්න.

(කාලච්ඡේද 02

- නිර්මාණශීලී ප්‍රවේශයකින් පිවිසෙන්න. උසස් පෙළට ගැළපෙන සරල ගීතයක් හෝ කීපයක් (තාලය අනුව) වාදනය කරවන්න.

(කාලච්ඡේද 02)

ඇමුණුම් - 01

ප්‍රවේශය - ඔබට chord සමඟ වාදනය කර පෙන්විය හැකි ගීතයක් ස්වර පුවරුව සහිත භාණ්ඩයකින් වාදනය කර පෙන්වන්න. (ස්වර පුවරු සිසුනට හොඳින් දර්ශනය වනසේ වයන්න.) chord නොමැතිව ගීතය පමණක් වාදනය කර පෙන්වන්න. ආකාර දෙක පිළිබඳ සිසුන්ගේ අදහස් විමසමින් සාකච්ඡා කරන්න. පහත දැක්වෙන වගුව සිසුන් ලවා සම්පූර්ණ කරවන්න.

ක්‍රියාකාරකම අංක 1-

කෝඩ් නාමය	Major chord	Minor chord
C		
F		
G		
E^b		
B^b		

මෙම chord වාදනයට පුහුණු කරවන්න.

ඇමුණුම - 02

ප්‍රවේශය - අහඹු ලෙස නම්කළ සිසුන් කීප දෙනෙකු ලවා පසුගිය පාඩමෙන් ඉගෙන ගත් chord වාදනය කරවන්න. සදොස් තැන් නිදොස් කරන්න.

ක්‍රියාකාරකම අංක 1- පහත සඳහන් chord තුන රිද්මයානුකූලව මාරු කිරීමට උපදෙස් දෙන්න

කෝඩ් නාමය	වමතින් වයන අයුරු Major	වමතින් වයන අයුරු Minor
C	ප̇ ස ග 5 2 1	ප̇ ස ග 5 2 1
F	ධ̇ ස ම 5 2 1	ධ ස ම 5̇ 2 1
G	ප̇ නි̇ රි 5 3 1	ප̇ නි̇ රි 5 3̇ 1

- මෙහි ඇඟිලි භාවිතා කිරීමේ ක්‍රමය මෙයට වඩා සාර්ථක අයුරින් වෙනස් කර ගැනීමේ නිදහස ඇත.

රිද්මයානුකූල අභ්‍යාස

1.	4/4	1 2 3 4	1 2 3 4	1 2 3 4	1 2 3 4
		C	F	G	C
2.	3/4	1 2 3	1 2 3	1 2 3	1 2 3
		C	F	G	C

ක්‍රියාකාරකම අංක 02 පහත දක්වා ඇති පරිදි වාදනයට පුහුණු කරවන්න.

Major Scale

ආරෝහණ

වමතින් ——	C	G	C	F	C	F	G	C
දකුණතින් —	ස	රි	ග	ම	ප	ධ	නි	ස̇

අවරෝහණ

වමතින් ——	C	G	C	F	C	F	G	C
දකුණතින් ——	ස̇	නි	ධ	ප	ම	ග	රි	ස

Minor Scale

ආරෝහණ	වමතින් ——	C^m	G^m	C^m	F^m	C^m	F^m	G^m	C^m
	දකුණතින් ——	ස	රි	ග	ම	ප	ධ	නි	ස̇
අවරෝහණ	වමතින් ——	C^m	G^m	C^m	C^m	C^m	F^m	G^m	C^m
	දකුණතින් ——	ස̇	නි	ධ	ප	ම	ග	රි	ස

ඇමුණුම අංක 03

පහත ගීතය chord සමඟ වාදනයට පුහුණු කරවන්න.

එකට සතුටු

ක්‍රියාකාරකම 03

C			G			C			C		
ස	ස	ස	රි	රි	රි	ග	-	රි	ස	-	-
C			G			C			F		
ස	-	ස	රි	-	රි	ග	-	ග	ම	-	-
F			C			G			C		
ම	-	ම	ග	-	ග	රි	-	රි	ස	-	-
C			F					C			
ස	රි	ග	ම	-	-	ම	ග	රි	ස	-	-

සැ.යු - ම ග රි සඳහා D minor chord එකද යොදා ගත හැකි බව සලකන්න.

ඇමුණුම - 04

සරළ ගී අතුරින් සුදුසු ගීතයක් හෝ කාලය අනුව, කීපයක් chord සමඟ වාදනය කරවන්න.

ඇගයීම - මෙහි ඇඟිලි භාවිතා කිරීමේ ක්‍රමය මෙයට වඩා සාර්ථක අයුරින් වෙනස් කර ගැනීමේ නිදහස ඇත.

ක්‍රියාකාරකම් සැලසුම 32

නිපුණතාව 3.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 : වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 3.1.2 : වාද්‍ය භාණ්ඩ වයමු.

කාලය : කාලච්ඡේද 07

ගුණාත්මක යෙදවුම් :
- සිසුන් විසින් සපයාගත් සංගීත භාණ්ඩ
- උසස් පෙළට ගැළපෙන ගීතයන්හි ස්වර ප්‍රස්තාර

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: උසස් පෙළ පන්තියට ඇතුළු වූ සියළුම සිසුන් 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා තමා විසින් තෝරාගත් වාද්‍ය භාණ්ඩයක යම්තාක් දුරට හෝ ප්‍රගුණ කොට ඇත. භාණ්ඩ වාදනය පිළිබඳ වූ දැනුම හුරුව තව දුරටත් පෝෂණය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය.

උසස් පෙළ සිසුනට ගැළපෙන අයුරින් ශිල්පීය කුසලතා වර්ධනය කළ හැකි ගීතයන් හි ස්වර ප්‍රස්තාර භාවිතයට ගනිමින් පාඩම සංවිධානය කර ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතුව ඇත. ඉදිරිපත් කරනු ලබන වාදනයේ මිහිරි බව හා භාවාත්මක බව වර්ධනය වන අයුරින්ද මෙම පාඩම සංවිධානය විය යුතු ය.

වාදන කුසලතා දියුණු කිරීම සඳහා කාලච්ඡේද 07 ප්‍රමාණවත් නොවන බැවින් පාසල් වේලාවෙන් පසු අතිරේක කාලයක් යොද ගැනීම වඩා ඵලදායීවේ. මසකට වරක්වත් වාදනය වර්ධනය වී ඇති ප්‍රමාණය විමසා බලන්න.

පහත දැක්වෙන නිර්දේශිත කොටස් සියල්ලම ආවරණය වන පරිදි ගීත තෝරා ගත යුතු ය.

1. කැමති සරල ගීතයක්
2. නූර්ති, නාඩගම්, නව නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට ගී
3. මධ්‍යලය ගීතයක් තානාලංකාර දෙකක් සමඟ

ස්වර වාද්‍ය භාණ්ඩයක් වෙනුවට තබ්ලාව තෝරා ගැනීමේ නිදහස සිසුනට ඇත. තබ්ලාව සඳහා නිර්දේශිත පහත දැක්වෙන කොටස් ආවරණය විය යුතු ය.

1. නිර්දේශිත තාල පද සමගුණයෙන් වාදනය කිරීම.
2. ත්‍රිතාලය ගුණ කරමින් වාදනය කිරීම (සම/දෙගුණ/සිවුගුණ)
3. ත්‍රිතාලය ආශ්‍රිත කායදා 02 වාදනය
4. වයනු ලබන ගී අනුවාදනයකට අලංකාර ලෙස තබ්ලාව වාදනය කිරීම.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ස්වර වාද්‍ය භාණ්ඩයකින් හෝ තබ්ලාවෙන් ඉහත නිර්දේශකර ඇති කොටස් වාදනය පුහුණු වීමට ගුරුවරයාගේ අභිමතය පරිදි සුදුසු මග පෙන්වීම් කරන්න. එක් එක් ශිෂ්‍යයාගේ වාදන ඉරියව් හා ඒ ඒ භාණ්ඩයට අදාළ හස්ත සාධන අභ්‍යාස ක්‍රමවත්ව වර්ධනය වී ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කරන්න. (කාලච්ඡේද 04 යි)

ඇගයීම

- කැමති සරල ගීතයක් වාදනය කරන්න.
- මධ්‍යලය ගීතයක් හෝ පාදයක් වාදනය කරන්න.
- ඔබ කැමති හින්දුස්ථානි තාල පදයක් වාදනය කරන්න.

ක්‍රියාකාරකම් 33

නිපුණතාව 3.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 : වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 3.1.3 : තත් භාණ්ඩ සුසර කරමු.

ඉගෙනුම් ඵල : • තත් වාද්‍ය භාණ්ඩ සුසර කරගැනීමේ මූලික ක්‍රම හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් : තත් වාද්‍ය භාණ්ඩ - ස්වර පුවරුවක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: සංගීත භාණ්ඩ නිවැරදි සුසර කිරීමකින් තොරව, නියමිත ස්ථානයන්ගේම ඇඟිලි තබා වාදනය කළ ද නිවැරදි ස්වර නූපදියි. මේ පිළිබඳව සිසුන් තුළ ද අවබෝධයක් ඇත. එහෙත් එම අවබෝධය ප්‍රායෝගිකව තව දුරටත් තහවුරු කොට අවම වශයෙන් තමා වාදනය කරනු ලබන තත් වාද්‍ය භාණ්ඩයවත් තනිව සුසර කර ගැනීමට යොමු කිරීම මෙම ක්‍රියාකාරකමේ අපේක්ෂාවයි.

තබ්ලාව වාදනය කරන සිසුනට තබ්ලාව සුසර කිරීමේ හුරුව ලබා දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් කාලච්ඡේද 4 තුළ අනුගමනය කර අවශ්‍ය, පුහුණුව ලබා දෙන්න.

භාණ්ඩය සුසර කර ගැනීමේ නිපුණතාවය කරා ලඟාවීම පහසු කාර්යයක් නොවන හෙයින් මෙම ක්‍රියාකාරකම අවසන් වීමෙන් පසුවද නිතර නිතර සිසුනට උපදෙස් දෙමින් මේ පිළිබඳව සොයා බැලීම අත්‍යවශ්‍යය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රවේශය භාවිතා කරන්න. ක්‍රියාකාරකම් 01 හි සිසුන් යොදවන්න. නිරතුරුව සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. (කාලච්ඡේද 01)
- ඇමුණුම 02 හි ඇතුළත් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න. (කාලච්ඡේද 01)
- ඇමුණුම 03 හි ඇතුළත් ප්‍රවේශය භාවිතයට ගන්න. ක්‍රියාකාරකම 03 හි සිසුන් යොදවන්න. (කාලච්ඡේද 01)

ඇගයීම

- ඔබ වාදනය කරනු ලබන සංගීත භාණ්ඩයේ තත් සුසර කරන පිළිවෙළ පැහැදිලි කරන්න
- උත්තරභාරතීය සංගීත භාණ්ඩ 4 ක තත් සුසර කරන අයුරු පැහැදිලි කරන්න.

- ඇමුණුම 04 හි ඇතුළත් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.(කාලච්ඡේද 01)

ඇමුණුම් අංක 01

ප්‍රවේශය - ඔබ වාදනය කරන තත් භාණ්ඩය සුසර කර ගීතයක් වයා පෙන්වන්න. එම භාණ්ඩයම ක්‍රමවත්ව සුසර නොකර පෙර වැයූ ගීතයම වයා පෙන්වන්න. එම අවස්ථා දෙක පිළිබඳව සිසුන්ගෙන් අදහස් විමසමින් සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම අංක 1-

- සුසර කරන ලද තත් වාද්‍ය භාණ්ඩ සිසුන් අතට පත් කරන්න.
- ස්වර පුවරු භාණ්ඩයක් සපයා දෙන්න.
- පහත සඳහන් කාර්ය පත්‍රිකාව සිසුන් අතට පත් කර එහි ඇති උපදෙස් අනුව කටයුතු කිරීමට පොළඹවන්න.

කාර්ය පත්‍රිකාව 01

පියවර 01 සුසර කරන ලද භාණ්ඩ ඇසුරින් ඔබ වාදනය කරන තත් භාණ්ඩයෙහි තත් සුසර කරන ස්වර සිහිපත් කරන්න. අවශ්‍ය නම් ගුරු උපදෙස් ලබා ගන්න.

පියවර 02 වාද්‍ය භාණ්ඩයේ තත් සුසර කර ඇති ස්වර එකින් එක මිතුරකු ලවා ස්වර පුවරුවෙන් වාදනය කරවා එයින් නිකුත්වෙන නාදය සමග තත්වල නාදය සමාන වී ඇති අයුරු හොඳින් ශ්‍රවණය කරන්න.

පියවර 03 ස්වර පුවරුවෙන් ස්වරය වාදනය කරන අතරතුරම අදාළ තත මදක් බුරුල් කරන්න. නැවත සමාන වනතෙක් තද කරන්න. හඬ වෙනස් වූ ස්වරය නැවත නියමිත හඬට සමාන වන අයුරු හොඳින් වැටහී යනතුරු මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

පියවර 04 පෙර සේ තත් තරමක් තද කරන්න. (තත නොකැඩෙන සේ) නැවත අවශ්‍ය පමණට බුරුල් කර ස්වර පුවරුවෙන් නිකුත් වන ස්වරයට සමාන කරන්න. මෙම ක්‍රියාකාරකමෙහිද හොඳින් වැටහී යනතුරු යෙදෙන්න.

පියවර 05 දැන් ඔබට සහාය වූ මිතුරාට සහාය වන්න. (ඔහු හෝ ඇයත් පෙර වූ උපදෙස් අනුවම ක්‍රියා කළ යුතු ය.

පියවර 06 වයලීනයේ 'ඇජස්ටර්ස්' නම් ඇණත්, සිතාරයේ ' මන්කා' නම් පබලුව ත් සුක්ෂම සුසර කිරීමට (Fine Tune) යොදා ගනු ලැබේ. ඒ අනුව සුසර කිරීමෙහි යෙදීමට උනන්දුවන්න.
නියමිත හඬට වඩා ඉහළ හඬක් ඇත්නම් එම තත බුරුල් කිරීමෙන් ද , පහළ හඬක් ඇත්නම් එම තත තද කිරීමෙන් ද, තන්ත්‍රිය භාණ්ඩ සුසර කළ හැකි ය.)

ක්‍රියාකාරකම අංක 02-

- සිසුන් අතැති භාණ්ඩ අක්‍රමවත්ව සුසර කර දෙන්න.
- පහත කාර්ය පත්‍රිකාව සිසුන් අතට පත්කර උපදෙස් දෙමින් එම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

කාර්ය පත්‍රිකාව- 02

පියවර 01 - (සුසර කරන ලද භාණ්ඩ ඇසුරින්) පෙර සේ මිතුරකු හවුල් කර ගන්නට ඔබ අතැති භාණ්ඩයෙහි එක් තතක් සුසර කිරීමට නියමිත ස්වරය ඔහු ලවා ස්වර පුවරුවෙන් වාදනය කරවා ගන්න.

පියවර 02 - ඔබ විසින් තෝරාගත් තතෙහි හඬ ස්වර පුවරුවෙන් නිකුත්වන ස්වරයේ හඬට වඩා වැඩි ද අඩුද යන බව සොයා ගන්න. (අවශ්‍ය නම් ගුරු උපදෙස් ලබා ගන්න)

පියවර 03 - අවශ්‍ය අයුරින් එම තත බුරුල් කර හෝ තද කර නියමිත ස්වරයේ හඬට සමාන කරන්න.

පියවර 04 - ඉහත පියවර 02 හා 03 හි උපදෙස් අනුව කටයුතු කරමින් ඔබ අතැති භාණ්ඩයෙහි සියලු තත් එකින් එක සුසර කරන්න. ගුරුතුමාට/ තුමියට පෙන්වා සදොස් තත් නිවරැදි කරගත යුතු අයුරු වටහා ගන්න.

පියවර 05 - පෙර දිනයන්හි සේ දැන් ඔබේ මිතුරාට සහායවන්න.

පිවිසුම - අහඹු ලෙස නම් කරන ලද සිසුවකුට ඔහු වයන භාණ්ඩය සුසර කිරීමට නියම කොට අවශ්‍ය සහාය ලබා දෙන්න ඔහු / ඇය විසින් සුසර කළ භාණ්ඩය සියලු සිසුන්ට වයා පෙන්වා එහි වැරැද්දක් ඇතොත් එය නිවැරදි කර ගන්නා අයුරු සාකච්ඡා කරන්න.

කාර්ය පත්‍රිකාව අංක 03

තත් භාණ්ඩයේ ''ස'' ස්වරයට අදාළ තත නිවැරදිව සුසර කරන්න. ඊට අනුරූපව ඉතිරි තත් සුසර කරන්න. ගුරු ආදර්ශය ලබා ගන්න.

ක්‍රියාකාරකම 04 - සුසර කරන ලද තත්වලින් නිකුත්වන ස්වර හා සම්බන්ධව අනෙක් තත්වලින් නිකුත් වන ස්වර ගැලපේ දැයි විමසා බලන්න.

Pitch pipe Tuner වැනි නවීන උපකරණ භාවිතයේ දී සුසර කරගත හැකි අයුරු ගුරුතුමාගෙන් / තුමියගෙන් විමසන්න.

ඇගයීම 08

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

2. විෂය සන්ධාරය -

- ස්වර පුවරු භාණ්ඩ වාදනය
- තෝරාගත් භාණ්ඩ වාදනය
- වාදනය කරනු ලබන භාණ්ඩය සුසර කිරීම

3. උපකරණයේ සවභාවය

- ප්‍රායෝගිකව ස්වර පුවරු වාදනයේ යෙදවීම
- ප්‍රායෝගිකව තෝරාගත් භාණ්ඩ වාදනයේ යෙදවීම.

4. කාලය

- කාලච්ඡේද 02

5. අරමුණු

- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩය උසස් පෙළට ගැළපෙන සේ වාදනය කරයි.
- තෝරාගත් වාද්‍ය භාණ්ඩය උසස් පෙළට ගැළපෙන සේ වාදනය කරයි.

6 උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් -

- ස්වර පුවරුවෙන් chord අල්ලමින් කැමති ගීතයක් වාදනය කිරීමට සලස්වන්න.
- තෝරාගත් වාද්‍ය භාණ්ඩය ශිෂ්‍යා විසින් ම සුසර කර ගනිමින් කැමති ගීතයක් වාදනය කිරීමට සලස්වන්න
- තබ්ලාව වයන්නන් සඳහා තබ්ලාවට ගැළපෙන ශ්‍රැතියකට සුසර කරගෙන ඔබ විසින් වයන ගීතයකට ගැළපෙන පරිදි වාදනය කිරීමට සලස්වන්න.

නිර්ණායක -

1	ගීතයේ තනුව නිවැරදිව වාදනය කරයි.	ලකුණු 04
2	ගීතයට ගැළපෙන ලෙස ගීතය සමඟ chord වාදනය කරයි	ලකුණු 04
3	වාද්‍ය භාණ්ඩය සුසර කර ගැනීමට (ස්වර වාද්‍ය / තබ්ලාව)	ලකුණු 04
4	ස්වර වාද්‍ය සඳහා ගීතයේ තනුව නිවැරදි ස්වරස්ථාන භාවිතයෙන් වාදනය කිරීමට තබ්ලාව සඳහා ගීතයට ගැළපෙන ලෙස වාදනයට	
5.	ස්වර වාද්‍ය සඳහා ශිල්පීය බව ප්‍රදර්ශනය කිරීමට	ලකුණු 04
	තබ්ලාව ශිල්පීයත්වය ප්‍රදර්ශනය කිරීමට	ලකුණු 04

ක්‍රියාකාරකම් සැලැස්ම 34

නිපුණතාව 4.0 : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ චින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි.

නිපුණතා මට්ටම 4.1 : රාගධාරී සංගීතයේ ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ගායන/වාදන විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි.

ක්‍රියාකාරකම 4.1.1 : රාගශ්‍රිත සරල ගී ගයමු... රස විඳිමු.

ඉගෙනුම් ඵල :
- රාගාශ්‍රිත සරල ගීත හඳුනා ගනියි.
- ගුණාත්මක බවින් යුත් ගීතයක තිබිය යුතු ගුණාංග හඳුනා ගනිමින් රස විඳියි.

කාලය : කාලච්ඡේද 10

ගුණාත්මක යෙදවුම් : අදාළ ගීත පටිගත කරන ලද කැසට් පට හා කැසට් යන්ත්‍රයක් සර්පිනාව, ගිටාරය, පදමාලා ලියූ දෘෂ්‍යාධාරයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: 11 ශ්‍රේණියේ දී සරල ගීතයක කොටස් සහ ආකෘතිය පිළිබඳව සිසුන් දැනුවත්ව ඇත. මේ ක්‍රියාකාරකම තුළින් අපේක්ෂාව වන්නේ සිසුන් රාගශ්‍රිතව නිර්මාණය වූ සරල ගී රසාස්වාදනයට හුරු කිරීමයි. ගායනයක වාදනයක සියුම් කොටස් විශ්ලේෂණාත්මකව පිරික්සීම මගින් රාග ඥානය මෙන්ම ව්‍යවහාරික සංගීතයේ තාක්ෂණික ක්‍රම ශිල්ප ගැන ද සිසුන් ට අවබෝධයක් ලබාදීම මෙහි තවත් අතුරු අපේක්ෂාවකි. ගීත ගායනය තුළින් සිසුන්ගේ ප්‍රායෝගික හැකියාව ද තවදුරටත් වර්ධනය වනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- 11 ශ්‍රේණියේ දී අධ්‍යයනය කළ සරල ගීතයක ආකෘතිය හා කොටස් පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 1 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. අනතුරුව ක්‍රියාකාරකම් අංක 01 හි සිසුන් යොදවන්න.

  (කාලච්ඡේද 01 යි)

- පසුපිට දැක්වෙන නිර්දේශිත රාගශ්‍රිත සරල ගී අතරින් තෝරාගත් ගීත 9 ක් හෝ වැඩි ප්‍රමාණයක් ගායනය පුහුණු කරවන්න. එක් ගීතයකට එක් කාලච්ඡේදය බැගිනි

  (කාලච්ඡේද 09 යි)

ඇමුණුම 01

ප්‍රවේශය -

- මාලකෞන්ස් රාගයට අයත් ස්වර ඛණ්ඩ දෙකක් සිසුන් සමඟ ගායනය කරන්න.
- ගීතය නැවත ශ්‍රවණයට යොමු කරන්න. '' හංසරාජිනී' ගීතයේ පූර්වාලාප කොටස ස්ථායි කොටස අතුරු වාදන, අන්තරා කොටස්, මධ්‍යලාප, තබ්ලා පද, ලගී කොටස් ආදි රාග ධාරි අංග යෙදෙන බවට සිසුන් දැනුවත් කරන්න.

ක්‍රියාකාරකම 01

සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් හංසරාජිණී ගීතය නිවැරදිව ගායනය පුහුණු කරන්න.

ගීත ලැයිස්තුව

1.	හංසරාජිනි -	සුනිල් එදිරිසිංහ	- මාලකෞන්ස්
2.	මුව මුක්තලතා -	එඩ්වඩ් ජයකොඩි	- රාගය පීළු
3.	හෝපළු වන පෙත -	වික්ටර් රත්නායක	- භාගේශ්‍රී
4.	මම දෙවිඳුනි -	සුජාතා අත්තනායක	- දර්බාරි කානඩා
5.	මන්නාරම් කන්‍යාරාමේ -	රශ්මි සංගීතා	- තෝඩි
6.	ඇවිලුණු ගිණිදැල් -	සනත් නන්දසිරි	- කලාවතී රාගය ජන සම්මෝහිණි/කලාශ්‍රී
7.	වස්දඬු රාවේ -	අමරා රණතුංග	- ශිවරංජනී
8.	ආසාවරී මනමෝහනී -	සුදත් සමරසිංහ	- දේස්
9.	සඳ සරා කුමාරි -	සුදත් සමරසිංහ	- හමීර්
10.	ලොවේ සැමදා -	හරූන්ලන්ත්‍රා	- ජෞනපුරී
11.	රාගාශ්‍රිත නාට්‍ය ගී -	පේමතෝ ජායති සෝකෝ -	

- ඉහත ගීත එක් ගීතයකට එක් කාල ඡේදය බැගින් වෙන්කරගෙන ගායනය වාදනය සමග හෝ ශ්‍රව්‍ය තැටි/පටි යොදා ගනිමින් හෝ සිසුන් සමග ගායනයේ යෙදෙන්න. තනුව, රිද්මය, බස සංගීත භාණ්ඩ ශිල්පක්‍රම විචිත්‍රාංග සමඟ අර්ථය උද්දීපනය වන අයුරු සාකච්ඡා කරන්න.

- පහත දැක්වෙන ශීර්ෂ සාකච්ඡාව සඳහා යොදාගන්න
  - ගීතයේ පදමාලාවෙන් ප්‍රකාශිත අදහස සැකවින්
  - තනු නිර්මාණයේ දී ආශ්‍රය කරගෙන ඇති රාගය
  - එම රාගයේ ස්වර සංගතිවලින් මතුවන මූලික හැඩය තනුවේ පිහිටා ඇති අයුරු ප්‍රායෝගිකව දක්වන්න.
  - ආශ්‍රය කරගත් රාගයේ විවිධ නාදමය හැඩතල
  - පෙරවාදන හා අතුරු වගු කොටස්වල ගැලපීම
  - යොදාගෙන ඇති විවිධ රාගධාරී ශාස්ත්‍රීය අංග

ඇගයීම

- ඉහත සඳහන් ගී අතුරෙන් කැමති ගීතයක් පදනම් කර ගනිමින් රාගධාරී සංගීතය නිර්මාණ කාර්යයන් හි යොදා ගැනීම පිළිබඳ අදහස් දක්වන්න.

ඇදුරුතුමා වන්න මගේ

ඇදුරුතුමා වන්න මගේ - නුදුන් නමුත් ශිල්ප ශාස්ත්‍ර
ජීවිතයේ ගිරි දුර්ගය - නගින්න අත් වැලක් දෙන්න //
මහට දෙන්න ගුරු උපදෙස් - වියෝ වෙතත් ඔබගෙන් //
නිරන්තර ව සිහියට එන - සමීපයෙන් ඉවත් නො වී
දුකටත් සැපටත් දෙකට ම - නො හරින හිත මිතුරෙකුසේ //



නාට්‍යය - පේමතෝ ජායතී සෝකෝ
පද රචනය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
තනු රචක - ජයන්ත අරවින්ද

ඇගයීම් 09

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

රාගධාරී සංගීතය ඇසුරෙන් නිර්මාණය වී ඇති ගායන වාදන විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයේ යෙදෙ යි.

2. විෂය සන්ධාරයට -

අධ්‍යතන සරල ගී 9 යි
රාගාශ්‍රිත නාට්‍ය ගී 1 යි
නිවැරදි ගායනය
ගීත රසාස්වාදය

3. උපකරණයේ ස්වභාවය -

- ප්‍රායෝගිකව ගායනයේ යෙදවීම
- රසාස්වාදන ක්‍රියාකාරකම්

4. කාලය - කාලච්ඡේද 02

5. අරමුණු - රාගාශ්‍රිත සරල ගී නිවැරදිව ගයයි
සරල ගීයෙහි අරුත් පැහැදිලි කරයි
රාගශ්‍රිත සරල ගී හා අනෙක් සරල ගී අතර වෙනස්කම් දක්වයි.
රාගාශ්‍රිත සංගීතයට අදාළ ශිල්පාංග සරල ගී තුළ ඇතුළත් වී ඇති අයුරු පැහැදිලි කරයි.
පදමාලාවේ අර්ථය විමසන්න. තර්කානුකූලව අදහස් දක්වයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් -

- ශ්‍රැතිය, ස්වර හා රාගධාරී ශෛලිය රැකගනිමින් සිසුන් කැමති රාගාශ්‍රිත සරල ගීයක් ගායනය/ වාදනය කිරීමට සලස්වන්න.
- පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු රැස් කරන්න.
- ඔබ තෝරාගත් ගීතයේ පදවලින් ප්‍රකාශිත අදහස ඔබේ බසින් ලියන්න.
  - එම අදහසට රාගධාරී ශෛලිය කෙතරම් දුරට ගැලපේ දැයි අදහස් දක්වන්න.
  - ඔබ තෝරාගත් ගීතයේ රාගධාරී ස්වර සංගති ඇතුළත් වී ඇති තැන් පැහැදිලි කරන්න.
  - රාගධාරී සංගීතයට අදාළ විශේෂ කොටස (ආලාප, මධ්‍යාලාප, තානාලංකාර , තබ්ලා, බෝල්, තිහාහි, තබ්ලා, ගී සංගත්පද) ගීතය තුළ අන්තර්ගත වී ඇති ආකාරයට පැහැදිලි කරන්න.

7. නිර්ණායක -

- ගීතය නිවැරදිව ගායනය කිරීම ල 04
- ගායනයේ දී මිහිරිතාවය ඇති කරලීමට විවිධ ශිල්පාංග යොදා ගැනීම (ශිල්පීය දක්ෂතා) ල. 04
- රසාස්වාදය හා සම්බන්ධ 1, 2, ප්‍රශ්නවලට අදාළව දැක්වූ අදහස්වල සාර්ථක බව ල. 04
- තෝරාගත් ගීතයේ ස්වර සංගති ඇතුළත් වී ඇති අයුරු පැහැදිලි කිරීම ල. 04
- තෝරාගත් ගීතයේ රාගධාරී සංගීතයට අදාළ කොටස් අන්තර්ගත කිරීමේ දී ඇතිවී ඇති වෙනස පිළිබඳ අදහස් දැක්වීම ල. 04

ක්‍රියාකාරකම් සැලසුම -35

නිපුණතාව 5.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 5.1 : ගැමි ගායනා පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වමින් ගැමී ගී ගායන වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.1 : ගැමි ගී විමසමු.

ඉගෙනුම් ඵල :
- ගැමි ගී නිර්වචනය කරයි.
- එක් එක් ගැමි ගායනා වර්ග සුවිශේෂව හඳුනා ගනියි.
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු විස්තර කරයි.

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් :
- ජාතික අධ්‍යාපන ආයතනයේ 'ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ ගැමි ගී'' මොඩියුලය 'හෙළ ගී මග, සිංහල ජන කවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

ජන ගී වර්ගීකරණය යටතේ එක් එක් වර්ගයට අදාල ජන ගී පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනයක් 10 ශ්‍රේණියේ 4.0 නිපුණතාවය යටතේ 4.2.1 ක්‍රියාකාරකම ආශ්‍රිතව මීට පෙර හදාරා ඇත. එසේ වුවද උසස් පෙළ හදාරන සිසුනට එක් එක් ගැමි ගී වර්ග සුවිශේෂව සිද්ධාන්තමය හා ප්‍රායෝගික වශයෙන් තර්කානුකූලව අදහස් දක්වමින් අධ්‍යයනයකට යොමු කිරීමද අපේක්ෂිතය. මේ සඳහා ඉහත ගුණාත්මක යෙදවුම් යටතේ දැක්වෙන පොත් පරිශීලනය කරන්න.

පහත දැක්වෙන විෂය කොටස් ආවරණය කිරීමට අවධානය යොමු කරන්න.
- ගැමි ගී හා සේ ගී වර්ගීකරණය
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු
- ගැමි ගී වර්ග හා විශේෂ ලක්ෂණ පිළිබඳව
- ගැමි ගී වල භාෂාව
- සාමූහික බව දැක්වෙන නිර්මාණ වශයෙන් ගැමි ගී
- ගැමි රිද්මය, තාලය හා ගති ලක්ෂණ
- සන්නිවේදන කාරකයක් වශයෙන් ගැමි ගී
- සමාජයීය හා සංස්කෘතික තොරතුරු හුවාදක්වන කැඩපතක් වශයෙන් ගැමි ගී
- සමාජය යහමගට යොමු කරන ශිල්ප ක්‍රමයක් වශයෙන් ගැමි ගී
- නිර්ව්‍යාජ කලා මාධ්‍යයක් වශයෙන් ගැමි ගී
- අධ්‍යාපනික කාරකයක් වශයෙන් ගැමි ගි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -
- පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ අවශ්‍ය අවස්ථාවන්හි දී සාකච්ඡාවක් ගොඩ නගන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන කරුණු ඔස්සේ සුදුසු සටහන් ගොඩ නගන්න.

  ක්‍රියාකාරකම සංවර්ධනය සඳහා ඇමුණුමේ දැක්වෙන ප්‍රවේශය හෝ සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

කාලච්ඡේද 03

ඇමුණුම 01

පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ සටහනක් ගොඩනගන්න.

- ගැමි ගී කෙටියෙන් විමසන්න.
- ගැමි ගී වල පවත්නා විශේෂතා
- ආසාතාත්මක හා අනාසාතාත්මක ගීත ඇතුළත් වීම
- මූලික කාරණා 3 ක් පදනම් කරගෙන ගැමි ගී නිර්මාණය වීම (විවිධ වෘත්තීන් ඇදහිලි විශ්වාස හා සමාජීය අවශ්‍යතා)
- වෘත්තීන් මත ගොඩ නැගුණ ගීතවල ස්වභාවය සහ විවිධ ගී එකතුවක්
- ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණ ගීතවල ස්වභාවය සහ විවිධ ගී එකතුවක්
- සමාජීය අවශ්‍යතා මත ගොඩනැගුණ ගීතවල ස්වභාවය සහ විවිධ ගී එකතුවක්
- ගැමි ගී වල යෙ දී ඇති භාෂාව පිළිබඳ අදහස්
- තනු රටාවල ස්වභාවය පිළිබඳ අදහස්
- ගායන ශ්‍රැතිය පිළිබඳ අදහස්
- ගැමි ගී වලින් මතුවන සිරිත්, ආචාර ධර්ම සහ සමාජ අගයන් පිළිබඳ අදහස්
- සන්නිවේදන කාරකයක් වශයෙන් යොදාගත් අවස්ථා
- දාර්ශනික අදහස් ගැබ් වී ඇති ආකාරය සනාථ කිරීමට තොරතුරු

- අධ්‍යාපනික කාරකයක් වශයෙන් ගැමි ගී යොදාගත් අවස්ථා

තකිරඟ කිරඟ කිරෙන්ද - දොමිකිට කිටිතක කුන්ද
කිටිතක තක්කිට කින්ද - ජෙනෙකිට ගුඳිත ගුඳන්

කැකුළු සහල් පිටියෙන් ද - වටකර ඔලු ඇට මෙන්ද
තම්බා කඩ පිම්මෙන් ද - සුරැකිව තබා යෙහෙන්

කිතුල් හකුරු පැණියෙන් ද - මඳක් සීනි සමඟින් ද
හැඳි ගා කකාරමින් ද - ලණු වැටෙනා පදමින්

තිවග දෙදුරු සමගින් ද - එක එක පමණ යසින් ද
බැද සුන්කර ගනිමින් ද - එකතුව සෑම දෙසින්

බඳුනක ලා සතොසින් ද - සමකර යස විලසින්ද
එදවස පසුව ගොසින් ද - ගනිමින් නැවත තොසින්

කැබලිව සැනින් කපාම - රඹකැන් සමඟ කදීම
ලොව සතහට සොඳකෑම - අසනුය නැණැති සියල්

උදය උදය සැමදාම - වළඳා උණුපැන් බීම
සතසින් වෙර පිනවාම - මියුරු දෙයකි සුවිපුල්

වැලිතලපය යන නාම - පැවසුය පෙරැදුරු සෑම
වාපිත් සමන කිරීම - කදිමට වේ නිරවුල්

මම	ම ම	ම - ග රි	රි -	- ග	ම - ග රි
සස	රි ග	රි ම ග රි	ස -	- -	රි - - -

ඇගයීම -

- සන්නිවේදන කාරකයක් වශයෙන් ගැමි ගී යොදාගත් අවස්ථා විස්තර කරන්න.
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු දක්වන්න.
- අධ්‍යාපනික කාරකයක් වශයෙන් යොදාගත් ගැමි ගී අගය කළ හැකි ආකාරය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

මූලාශ -

- 'ශ්‍රී ලංකාවේ ගැමි ගී'' - ජාතික අධ්‍යාපන ආයතනය -මොඩියුලය
  'හෙළ ගී මග, -සිංහල ජන කවිය

ක්‍රියාකාරම් 36

නිපුණතාව 5.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 5.1 : ගැමි ගායනා පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වමින් ගැමී ගී ගායන වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.2 : වැදි ගී ගයමු

කාලය : කාලච්ඡේද 02

ඉගෙනුම් ඵල :
- වැදි ගීවල පවත්නා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- වැදි සංස්කෘතිය, භාෂාව හා සංගීතය පිළිබඳ තොරතුරු දක්වයි.

ගුණාත්මක යෙදවුම් : සිංහල ජන කවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ (මර්සලීන් නිමල් ජේ ගමගේ)

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: ආදී වාසීන්ගෙන් පැවත එන ගීත විශේෂයක් වන වැදි ගී පිළිබඳ සංස්කෘතික පසුබිම හඳුන්වා දෙමින් වැදි ගීතවල පවත්නා සුවිශේෂ ලක්ෂණ විස්තර කරමින් ගීත ගායනය කිරීමේ හැකියාව උසස් පෙළ හදාරණ සිසුන් තුළ වර්ධනය කිරීම මින් අපේක්ෂිතය. සෑම වැදි ගීයකම නාද මාලාව ඒකාකාරී වේ. ඒඅනුව ' රි - රි රි/ස - ස ස' යන ස්වර ඛණ්ඩය සෑම වැදි ගීයකට ම තනුව සඳහා යොදා ගත හැකි ය. එම නාද මාලාව වේගවත්ව ගැයිය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ප්‍රවේශය ලෙස ඉදිරිපත් කර ඇති ඇමුණුම අංක 1 හි දැක්වෙන දෘශ්‍ය උපකරණයේ ගීතයක් තෝරා ගෙන රසවත්ව ඉදිරිපත් කරන්න.
  පහත සඳහන් ශීර්ෂ ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවමින් ගීත ගායනය කරන්න.
  1. වැදි සංසකෘතියේ ඉතිහාසය කෙටියෙන්
  2. භාෂාව
  3. ස්වර පරාසය
  4. ඉදිරිපත් කරන ආකාරය (නර්තනයේ යෙදෙමින්)
  5. වර්තමාන සරල ගී සඳහා උපයෝගීතාවය කාලච්ඡේද - 02

ඇමුණුම 01

වැදි දරු නැලවිලි ගී

පැට්ටී අඬන්නේ මොන්නටද දෝ බොල
පැට්ටී අඬන්නේ මොන්නට දෝ
කටුවල බොක්කට අඬන්නේ
ඒකත් දී පව් පැට්ටීටා //

පැට්ටි අඬන්නේ මොන්නටදෝ බොල//
හිරිතල තොබ්බිට අඬන්නේ
මොන්දි කුරේටයි අඬන්නේ
ගෝනල බොක්කිට අඬන්නේ
පැට්ටි .....
මොන්නට පැට්ටුනි අඬන්නේ
ඇයිදැයි පැට්ටුනි අඬන්නේ

රි - රි රි	ස - ස -	රි - රි රි	ස - ස ස
රි - රි රි	ස - ස ස	රි - රි රි	ස - - -
රි රි රි රි	ස - ස ස	රි - රි -	ස - - -

2. යමු යමු කැකුලේ යමු කැකුලේ //
බොට කඳා ඉඳිදෝ
කිය කියා බල බලා
යමු යමු කැකුලේ යමු කැකුලේ

දිය රැව්වේ රඳා රඳා - යමු යමු කැකුළේ
පොල් ඇව්වා ඉඳිදෝ කිය කියා බල බලා
යමු යමු කැකුලේ යමු කැකුලේ

වැද්දෙකු විසින් දඩයමේ යමින් ගයන ලද ගීයක්

වැල් කොබ්බා වැල - දුන්න නවාගෙන
තල් කොළ ඊතල් - අහුරක් අරගෙන
කොම්මල් ඊතල් - අහුරත් අරගෙන
වේවැල් ඉමකේ පිටේ දමාගෙන
කුක්කන් දෙන්නෙකි මං දක්කා ගෙන
ඔත්තෙන් පැනගිය මිල්ලානේ
ඔත්තෙන් පැනගිය මිල්ලානේ

රි - රි රි / ස - ස ස / රි - රි රි / ස - ස ස
වැ ල් කොබ් / බා s වල /දුන් න න / වා s ගෙ න

මංගල්‍ය අවසථාවක මනාල යුවල හා නෑ පිරිස ගිනි ගොඩක් වටා එක් රොක් වී ගායනා කරනු ලබන ගීයකි පහත දැක්වෙන්නේ.

අනියම් ඉනියම් කෝමල බෑවා
පෙතිවන් ගෝමර ඉච්චීලා
නංගිගේ ඇඟේ ඉච්චුණු ගෝමර
මාගේ බාදේ ඉච්චීයන්
නංගී තනියා තනියා තනියා
මාවත් යනවා නං සොදිනේ
නංගී උයන් කෙළිනා කලටා
මාවත් උයනේ කෙළිඤ්ඤා
නංගි උරපටදා වසනේ නම
මාමත් උරපට දවන්නම්
ආරා රාටා වැටිනේ බොලං
ආරා රාටා වැටීයයි බොලං

ඇමුණුම- 01

නූතන සරල ගී නිර්මාණයට වැදි ගී පදනම් වී ඇති අයුරු දක්වීමට නිදසුන් කිහිපයක්

1. නංගිට බැඳපු මල් වියනයි
2. කොටා දමඤ්ඤං මර මර කොටා දමඤ්ඤං
3. රාජා ඕ මංගලියා
4.(මල් වියනෙන් බැඳි මහ බැද්දේ උන්)
5. වාමිනි මා දෙයියා -

ක්‍රියාකාරකම

1. වැදි ගී ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගී කිහිපයක් නිදසුන් ලෙස දක්වමින් එම නිර්මාණයට පාදක වූ වැදි ගී වල
   භාෂාව
   තනුව
   අර්ථය
   ගායනයේ සුවිශේෂතා පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

ඇගයීම -

- ආදිවාසීන්ගෙන් දයාද ලද වැදි ගී සංස්කෘතිය ' මැයෙන් ලිපියක් සකස් කරන්න.
- වැදි ගී සංස්කෘතිය ගැමි ගීයේ පෝෂණයට කෙනෙක්' දුරට දායක වී ඇත්දැයි සාකච්ඡා කරන්න.

-

නිපුණතාව 5.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 5.1 : ගැමි ගායනා පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වමින් ගැමී ගී ගායන වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.3 : උඩරට, පහත රට, සබරගමු ශාන්ති කර්ම ගී ගයමු.

ඉගෙනුම් ඵල :
- උඩරට, පහත රට, සබරගමු, ශාන්ති කර්ම ගීවල නාද රටා, භාෂාව, ස්වර පරාස සුවිශේෂිව හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 08

ගුණාත්මක යෙදවුම් : උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන්ට අයත් අවනද්ධ භාණ්ඩ ගීත ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

උඩරට, පහත රට, සබරගමු ශාන්ති කර්ම ගී වල ගායනයෙහි පවත්නා වෙනස්කම් ගායනය කර පෙන්වමින් සුවිශේෂ නාදරටාවල ආවේනික ස්වරූපය හඳුන්වාදීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. එහිදී උඩරට, පහතරට, සබරගමු, ප්‍රදේශවල භූගෝලීය පිහිටීම, සංස්කෘතික පසුබිම, භාෂාව, යොදාගන්නා ලද සංගීත භාණ්ඩ පිළිබඳ හා නාද පරාසය ශ්‍රැතිය ගායන විධි, තනු, ස්වර පරාස, තාල ලක්ෂණ, රිද්මය ආදී ශීර්ෂ ඔස්සේ සම්ප්‍රදායයන් තුනෙහි විවිධතා සම විෂමතා සන්සන්දනාත්මකව සාකච්ඡා කරන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

- මුල් කාලයේ ගැමි සමාජය තුළ යකුන් දෙවියන් ඇදහීම ආරම්භ වීමට හේතු දක්වමින් විවිධ ශාන්තිකර්ම ගැන සාකච්ඡාවක් කරන්න.
- උඩරට පහත රට සහ සබරගමු ශාන්ති කර්ම හා බැඳුණු අවස්ථා ගායනා පහත දැක්වේ. මේ පිළිබඳව සුවිශේෂව විස්තර කරමින් සාකච්ඡාවක් ගොඩනගන්න.
  1 යකුන්ගේ පිහිට පතා පවත්වන ශාන්ති කර්ම
  2 දෙවියන්ගේ පිහිට ආරක්ෂාව පතා පවත්වන ශාන්ති කර්ම
  3 නව ග්‍රහයින්ගෙන් සිදුවන අපල හා උපද්‍රව වලින් මිදීම සඳහා පවත්වන ශාන්ති කර්ම

1. යකුන්ගේ පිහිට පතා -
   සන්නි යකුම, රටයකුම, සූනියම් යාගය, ඉරමුදුන් සමයම, මහසොහොන් සමයම, මහකළු කුමාර සමයම ආදී
2. දෙවියන්ගේ පිහිට ආරක්ෂාව පතා -
   දෙවොල් මඩු, ගම්මඩු, පුනාමඩු, ගිණි මඩු, ගරාමඩු, කිරිමඩු, බූතමඩු, පිදුම් මඩු, හත්දා මඩු, තුන්දා මඩු, යාතිකා මඩු ආදී.
3. නව ග්‍රහයින්ගෙන් සිදුවන අපල හා උපද්‍රව සඳහා -
   අත්බලි, අසුගැබේබලි, දියකොරහෙබලි ආදී

උඩරට ශාන්ති කර්ම වශයෙන්

මල් යහන් කවි, පොල්මලේ කවි, කඩවර කවි, කෝල්මුර කවි, ග්‍රහ ශාන්ති කර්ම, බලියාග, කඩතුරා කවි, ගම්මඩු යා ග

පහත රට ශාන්ති කර්ම වශයෙන්

සුනියම් යාගය, සන්නි යකුම, රට යකුම හෙවත් රිද්දියාගය, මහසොහොන් සමයම, ගම්මඩු ශාන්ති කර්ම, දෙවොල් මඩු, ගරා යකුම.

සබරගමු ශාන්ති කර්ම වශයෙන්,

සන්නියකුම, මහසොහොන් සමයම, ගම්මඩු, පුනාමඩු, ගිණිමඩුව, කිරිමඩු, නූතන අත්බලි, අසුගැබේ මල් බලි, දියකොරහෙ බලි,

කාලච්ඡේද 04 යි

ක්‍රියාකාරකම සංවර්ධනය

- උඩරට, පහතරට සහ සබරගමු ප්‍රදේශවලට ආවේණික ශාන්ති කර්ම ගී අතුරින් ගීත කිහිපයක් මේ සඳහා යොදා ගන්න.
- ඇමුණුම 01 හි සඳහන් ගීත අතුරින් උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්මවලට අයත් වනසේ අභිමත පරිදි ගීතයක් බැගින් තෝරා ගෙන ගායනය පුහුණු කරන්න

ඇමුණුම 01

උඩරට ශාන්ති කර්ම ගී

- සුරතට රැගෙන
- ඉන්ද්‍ර දිසාවට
- ඈත එපිට දීපංකර
- අකුණු දේවතාවා පන්දමේ වෙසේ
- රජ කුලයට මොන මලද

පහතරට ශාන්ති කර්ම ගී

- එර්දි වෙලා උඩු ගුවනෙ වඩින්නේ
- සුන්කර කෙළෙසුන් බෝ මුල උන්දා
- සිද්ධ දෙවොල් දෙවි එනවා දුටුවිට

සබරගමු ශාන්ති කර්ම ගී

- ශුද්ධෝදන රජුට දාව උපන් එනරවර
- සොඳින හඬ නගා දෙපයින් ගමන් යන
- ගුණ දැනේ බෝසත් අනේ
- හිස මුව තුල බෙල්ල දෙදර

ශාන්ති කර්ම ගී වල සංස්කෘතික පසුබම සාකච්ඡා කරන්න.

උදා -
- උඩරට ශාන්ති කර්ම ගී
- පහතරට ශාන්ති කර්ම ගී
- සබරගමු ශාන්ති කර්ම ගී

උඩරට ශාන්ති කර්ම ගී

අකුණු දේවතාවා පන්දමේ වෙසේ (සුරතට රැගෙන නාද මාලාව අනුව ගැයේ)
අග්නි දේවතාවා ගිණි ජාලෙ වෙසේ
කළ එළි දේවතාව ලෝකයේ වෙසේ
ඇවිලූ පන්දමෙන් සැමදෝස දුරු කෙරේ.

ඇත එපිට දීපංකර මුණි විවරණ දුන්නේ
මෑත කපේදී මතුබුදු වෙමැයි සිතා ගන්නේ
භූත පිසස් යක්ෂ රෝග භයදුක් දුරුවන්නේ
ජේතවානාරාමෙ බෙලෙන් කඩතිර හරිමින්නේ

පහත රට ශාන්ති කර්ම ගී

ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට හිරුදෙවි අධිපති වන්නේ
රන් සිරිවස ගෙන සුරත දරාගෙන තුරඟකු පිට වැඩ ඉන්නේ
ඇතියම් රෝදුක් දුරැර දමා නිති චිරාත් කලක් සැපදෙන්නේ
ඉන්ද්‍ර දිසාවෙන් හිරුදෙවි වැඩලා ග්‍රහ මෙදොස දුරලන්නේ

කිරි අම්මා ශාන්ති කර්මය

එර්දිවෙලා උඩු ගුවනේ වඩින්නේ
එර්දි සලුව ගෙන පවන් සලන්නේ
සුද්ද ඇතුව දෙන දන් පිළිගන්නේ
සිද්ද පතිනි දෙවි මේ පින් ගන්නේ

සුන්කර කෙලෙසුන් බෝ මුල උන්දා
මන්මැඩ ආවසවත් මන් බින්දා
තුන්ලොව සුරනර තම පද වන්දා
ඉන් සෙත සලසන් ඒ සුග තින්දා

සිද්ධ දෙවොල් දෙවි එනවා දුටුවිට
යුද්දෙට පත්තිනි මැව්වා ගිණි වැට
යුද්දෙට අණසක දෙවොල් සුරිඳුහට
ගත්තෙමි පන්දම අදමගෙ සුරතට

සබරගමු ශාන්ති කර්ම ගී

1. සුද්ධෝදන රජුට දාව උපන් එනරවර
ලද්ද එකිරි මව් දහසක් සතියෙන් පෙමකර
වැද්ද නොදී එන පිරිපත උවදුරු දුරහැර
බුද්ධ රත්නෙ අනුහසයෙන් කඩතුරාව හැර

ii ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ ගිරවකු මෙනේ
අඳ වුනේ දැසම අනේ මව් පියසෙනේ සිටිනා තැනේ
කෙතකිනේ කරලුත් ගෙනේ මිටි බඳිමිනේ දී රකිමිනේ
දුරලතේ දොස සතතිනේ මුණි ගුණ දැනේ බුද දිනයෙනේ

සොදින හඬ නගා දෙපයින් ගමන් යන
පොළොවෙන් අඩි හතක් ඇතින් දිවැස් ලන
පතල් වලම හැමවිට හොල්මන් කරන
පාතල භෛරවී දෝශය මුදාලන



ඇගයීම -

- උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්ම ගීත වල සමවිෂමතා සන්සන්දනාත්මකව සාකච්ඡා කරන්න.

මූලාශ්‍ර -

- ශාන්ති කර්ම සහ ආචාර විධි - ඥානසිරි පීරිස්
  හෙළ ගී මඟ - ඩබ්. බී. මකුලොළුව
  වරම් ගී - ආනන්ද ජයසිංහ

නිපුණතාව 5.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 5.1 : ගැමි ගායනා පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වමින් ගැමී ගී ගායන වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.4 : අනාඝාතාත්මක මෙහෙ ගී ගයමු

ඉගෙනුම් ඵල :
- අනාඝතාත්මක මෙහෙ ගීවල සංස්කෘතික හා සමාජයීය පසුබිම විස්තර කරයි.
- සම්ප්‍රදායික නාදමාලාවට අනුව ගායනා කරයි.

කාලය : කාලච්ඡේද 10

ගුණාත්මක යෙදවුම් : හෙළ ගී මග, සර්පිනාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: දේශීය ගැමි ගායන අතුරින් අනාඝතාත්මක මෙහෙ ගී යටතේ ගැල්, පැල්, පාරු, බඹර ,පතල් යන ගැමි ගී වලින් එක් ගීය බැගින් ගෙන ගායන වාදන දක්ෂතා වර්ධනය කරලීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය. මීට අමතරව එක් එක් ගැමි ගායනාවලට අනන්‍ය වූ සාම්ප්‍රදායික නාද මාලාව රැක ගැනීමේ වැදගත්කම් පිළිබඳ වද සාකච්ඡා කළ යුතු ය, නිර්දේශිත අනාඝාතාත්මක ගී වල බස නාදමාලා හා රිද්මය පිළිබඳ සාකච්ඡා කිරීමටත්, ඒවායේ සමාජයීය හා සංස්කෘතිකමය තොරතුරු වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කිරීමට හැකිවනු ඇත. එක් ගී වර්ගයක ට කාලච්ඡේද 02 බැගින් වර්ග 05 ට කාලච්ඡේද 10 ක් වෙන් කර ඇත.

හින්දුස්තානි රාගධාරී සංගීතය ශෛලියට වඩා වෙනස් වූ ශෛලියක් ජන ගී ගායනයේ පවත්න බව හෙළ ගී මග කතුවරයා පහත දැක්වෙන අයුරින් සඳහන් කර ඇත. "වගකිව යුත්තන්ගේ හා සංගීතඥයන්ගේ නොසැලකීම හේතු කොට ගෙන සිංහලයාට ආවේනික වූ ගායන විධි රාශියක් ම දැනට ම අභාවයට ගොස් ඇත. ඉතිරිව ඇති ගැයුම් ද සමාජයේ උසස් පෙළේ සංගීතඥයන්ගේ ගැරහීමට හා පීඩනයට බියෙන් පණ අදිමින් මුළු ගැන් වී ඇත. මේ ගැයුම් සොයා, ඒවා දැනට ගැයෙන සාම්ප්‍රදායික නාදමාලාවන් ගෙන් ම සුස්වරයෙන් ගයමින් මහජනයා අභිමුඛයේ තබා ඔවුන්ගේ ප්‍රසාදයටත්, අගය කිරීමටත් පාත්‍ර කිරීම මේ ක්‍රියා මාර්ගය වේ. මේ ස්වරඥානය, තාලඥානය හා හඬ පුහුණුව ලත් සංගීතඥයන් විසින් ම කළ යුතු යි. අපරට හැම සංගීතඥයකු ම වාගේ ස්වරඥානය හා හඬ පුහුණුව ලබා ඇත්තේ හින්දුස්ථානි සංගීත මාධ්‍යයෙනි. එහෙයින් ගැමි ගී ගැයීමේ දී හින්දුස්ථානි රාග හා තානාලංකාර ගයන ශෛලියට මේ ගැමි ගී නො ගැයීමට ද ප්‍රවේසම් විය යුතු යි. හඬ නිපදවීම, උච්චාරණය , ශෛලිය ලෙලවීම ආදී ගැමි ගායන ලක්ෂණ දැන ඒවා රැකෙන අයුරු ගැයීම ඉතා වැදගත් කොට සැළකිය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- නිර්දේශිත අනාඝාතාත්මක මෙහෙ ගී වලින් එකක් තෝරා ගන්න. එහි ගායන ශෛලිය හා සංස්කෘති ය පිළිබඳ සාකච්ඡා කරන්න. ගී වර්ගය පිළිබඳ රසවත් සංස්කෘතිකමය තොරතුරු ඇතුළත් කර සිසුන් ලවා සටහනක් ගොඩ නගන්න. ඇමුණුම 01 හි සඳහන් ගී අතරින් ඔබ කැමැති ගීයක් තෝරා ගන්න.

(කාලච්ඡේද 02 යි)

- ඉහත ක්‍රමවේද අනුගමනය කරමින් ඉතිරි ගැමි ගී වර්ග 4 ගායනය පුහුණු කරන්න. සටහන් ගොඩ නගන්න.

(කාලච්ඡේද 08 යි)

ඇමුණුම 01

ගැල්

1. කන්ද නගින කොට දෙවියනි බඩ දනවා
   තැන්නට නගන කොට ඒ රිය උඩ යනවා
   පල්ලං බසින කොට අතපය වේවලනවා
   විෂ්ණු කතරගම දෙවිඳුට නොපෙනනවා

2. දුප්පත්කමට ගොන් බැඳගෙන දක්නවා.
3. කළුගල් තලාලයි පාරට දමන්නේ
4. රත්නපුරේ තිරිවානා කැටියේ දී

ගැල් ගී සම්බන්ධ තොරතුරු

- අනාසාතාත්මක වීමට හේතු
- ඒකල ගායනයට උචිත වීම
- බස සරල වීම, පරිසර වර්ණනා ඇතුළත්ව මෙන්ම ගැඹුරු සංකල්පනා වලින් ද යුක්ත විම.
- සන්නිවේදන කාරකයක් ලෙස
- කාර්ය හා බද්ධ බව

පාරු

1. වගේ මම කියමි අසතොත් සිතු ලෙසින
   නුගෙ ලඟ නාන තොටුපොළ වෙත සිටින
   ඇගේ රුව - වරුණ මෙතෙකැයි නැත පමණ
   නගේ නුඹ ඉඳින් මම එනකල් ඔතන

2. පෙර බලලා පැදගෙන යන ඔරුව පිට
   පෙරබලලා පොඩි පට්ටම් උනයි වට
   පෙරලීලා ඌ ඉඳගෙන අනික් පිට
   පෙරලුන පිටට කදිමයි කීය මේ පිට

3. සූරිය උදාවනතුරු පිණි බෑවිල්ල

පාරු ගී සම්බන්ධ තොරතුරු

- ඒකල ගායනයට උචිත විම
- 'සන්නිවේදන කාරකයක් ලෙස භාවිතය හා ඊට හේතු
- කාර්ය හා බද්ධ වන බව
- වර්ණනාත්මක අදහස් මෙන්ම උපදේශාත්මක අදහස් ගැබ්ව තිබීම

පැල්

1. පෙරකාලේ කරපු අකුසල් පලදීලා
   මෙම කාලේ විඳිමු දුක් පැල් වලට වෙලා
   එම කාලේ පටන් පුරුදුයි පැල් රැකලා
   අපි රාලේ කියමු පැල් කවි තෝරාලා

2. ලස්සන හිමවතේ මාවී පැසෙන්නේ
3. අනේ දෙවියනේ මට උනු වියෝයා
4. අපෙ අම්මා දුර එනවා පෙනෙන්නා

- 'කාර්ය හා බද්ධව ගීතවල වචන හා නාදරටා නිර්මාණය වී ඇති බව
- දුෂ්කර හා දුක්ඛිත කාර්යයක් බව පදමාලාවෙන් ප්‍රකාශිත බව
- ඒකල ගායනය
  රාත්‍රී කාලයේ අසල්වාසී පැල් අතර සම්බන්ධතාවය ඇති කර ගැනීම සඳහා පැල් ගී ගැයීම.
- අව්‍යාජාත්මක අදහස් ගැබ්ව තිබීම
- සරල බව

බඹර ගී

1. කුසේ උපන් ලොකු අයියා කළ අයුතී
   ගසේ ඉඳිද්දී වැල් පොට කපා ගතී
   බඹරු සිය දහස් ඇඟලේ උරා බොතී
   පලයන් අයියන්ඩි මම එන ගමන් නැතී

2. බැද්ද වටට සුදු මොරමල් පිපීලා
   සද්ද කර බඹරු ඒ වග අසාලා
   ඉටිත් පැණිත් ලොව හැමටම බෙදාලා
   යන්නම් බඹරු දුක් මැසිවිලි කියාලා

3. ඕඩිහෙලෙයි හෙළවටකර මුළුල්ලා
   - සමාජීය තොරතුරු දත්ත මූලාශ්‍රයක් වන බව
   - පරිසර වර්ණනා ඇතුළත් වේ
   - සදාචාරාත්මක තොරතුරු ඇතුළත් බව
   - ගැමි සාර්ධර්ම
   - ගැමි සමාජයේ වටිනාකම් අගයයන් හා සිරිත් විරිත්

පතල්

1. රත්තරන් පනේ නුඹ එවු පත දුටුවා
   තිබුණට වැඩිය සොහෙයුරු ආලේ වැඩුවා
   එතකොට මගේ දෙනෙතින් කඳුලැලි ඉනුවා
   දවසම පුරා ඉඳනෙත් කඳුලැලි සැලුවා

2. කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
   මිණිරන් තෝරන්න දින ගනිනින් එනවා
   මිනිරන් තේරුවොත් ලඳෙ නුඹ කළු වෙනවා
   ළඟ නම් ගෙදර මුර ඇරුණම මම එනවා

3. එළිවෙලා කුකුළො හඬලන වෙලාවේ.
4. සබරගමුව එළියයි පෙරහැර දාට

- එවකට පැවති සමාජයීය තොරතුරු
- කාර්යයේ ඇති දුෂ්කර බව එළි දැක්වෙන බව
- ඓතිහාසික තොරතුරු ඇතුළත් මූලාරම්භය
- පතල් ගී වලින් හෙළිවන ගැමි සංස්කෘතික හා සමාජයීය තොරතුරු
- පරිසර වර්ණනා

ඇගයීම -

- එක් එක් ගැමි ගීය හා බැඳි සංස්කෘතික පසුබිම විස්තර කරන්න.

මූලාශ්‍ර -

- හෙළ ගී මග - ඩබ්. ඩී. මකුලොළුව

නිපුණතාව 5.0 : දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

නිපුණතා මට්ටම 5.1 : ගැමි ගායනා පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වමින් ගැමී ගී ගායන වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 5.1.5 : ටීකා සීපද ගයමු.

ඉගෙනුම් ඵල :
- ටීකා සීපද පිළිබඳව හඳුනා ගනියි.
- ටීකා සීපද රසවත්ව ගායනා කරමින් රස විඳියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : ස්වර වාද්‍ය භාණ්ඩයක් හෝ සර්පිනාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: ගද්‍ය පද්‍ය කොටස් රැගත් ටීකා සීපද පිළිබඳව තර්කානුකූලව අදහස් දක්වමින් ගායන කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය.

සී පද අතරට යම්කිසි ගද්‍යමය පාඨයක් එකතු කිරීමෙන් ටීකා සීපද නිර්මාණය විය. මෙය දෙදෙනෙක් අතර වන සංවාදාත්මක ගීත ශෛලියක් වූ අතර බොහෝ විට විනෝදාත්මකව සතුටින් කාලය ගත කරන අවස්ථාවන්හි මේවා ගායනය කරන ලදි. සාමාන්‍යයෙන් ටීකාව වේගවත්වද කවිය සාමාන්‍ය වේගයෙනුත් ගායනා කරයි. මීට අමතරව පහත සඳහන් ග්‍රන්ථ පරිශීලනය කරමින් වැඩි දුර තොරතුරු සකස් කර ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය -

- අනාඝාත්මක ජන ගීතයක් හා ගද්‍ය සැහැල්ලක් වෙන වෙනම ගයා පෙන්වන්න. ටීකා සීපදය ඉන් වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 1

ඇමුණුම 01 හි දක්වෙන ටීකා සීපද වලින් එකක් හෝ කිහිපයක් ගායනය කරන්න. සිසුන් ගායනයේ යොදවන්න. ගද්‍ය සැහැල්ල හා පද්‍ය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

i
ගද්‍ය කොටස — බැද්දේ ගියා වැලක් සොයාගන්නට කියා
ඉද්ද වැල් තිබෙන්නා, පෝට වැල් තිබෙන්නා, නොයෙක් වැල් තිබෙන්නා.
එයින් එකක් ගෙන වෙලුවා සේ ම
පද්‍ය කොටස — වෙලි වෙලි වෙලී හිස සිට දෙපතුළට වෙළී....

ii
ගද්‍ය කොටස — කන්දේ ගියා මලක් සොයා ගන්නට කියා, නාමල් තිබෙන්නා, සපුමල් තිබෙන්නා, පිච්ච මල් තිබෙන්නා, එයින් එකක් ගෙන පැලැන්දාසේම
පද්‍ය කොටස — මලි මලි මලී නුඹේ කොණ්ඩේ තිබෙන මලී..

iii
ගද්‍ය කොටස - වතුරේ ගියා රැලක් බලාගන්ට කියා
මුහුදු රැල තිබෙන්නා, ගංගා රල තිබෙන්නා, වැව් රල තිබෙන්නා,
එයින් එකක් ගෙන රිස්සේ බැලුවා සේම..
පද්‍ය කොටස - රැලි රැලි රැලි .. නුඹෙ නරුවේ තිබෙන රැලී

iv
ගද්‍ය කොටස - වෙනරටේ ගැනු කොල්ලෝ හතර පස් දෙනා නාවා කවා පොවාගෙන බලාගෙන
ඉන්නවා, මේ නෑම්බිට අතකොලුවක් විතර නැති කොලුවා බලාගන්නට බෑ
කියන්නා සේම ....
පද්‍ය කොටස - ලොලි ලොලි ලොලී .....බාලොලී ලොලී බාල ලොලී.

i
ගද්‍ය කොටස - වාරේ වාරේ කියනවා විනා කොස් වාරේද
අඹවාරේද දෙල් වාරේද මොන හත්තිලව් වාරයක් ද දන්නේ නෑ
පද්‍ය කොටස - වාරේ නොදැන ආවා අපි කුරුන්දට

ගද්‍ය කොටස - පාරේ පාරේ කියනවා විනා ඌවෙන්, බින්තැන්නෙත්
මඩකලපුවෙන් ඉදිපන් අතුපාරකින්
වැටුණු මොන හත්ඉලව් මඩගොහොරු පාරකින්ද මන් දන්නේ නෑ
පද්‍ය කොටස - පාරේ නොදැන බැස්සෙමු කටුගස්තොටට

ගද්‍ය කොටස - මාලේ මාලේ කියනවා විනා රිදියෙන් රත්තරනෙන්
තඹෙන් ලෝකඩෙන් කළ මොන හත් ඉලව් මාලයක් ද දන්නේ නෑ
පද්‍ය කොටස - මාලේ කරලාපු අඟනක් එගොඩ සිට

ගද්‍ය කොටස - හුරේ හූරේ කියනවා විනා අත්තා මුත්තා කිත්තා
තිරිකිත්තා කාලේවත් තිබුණ මොන හත්තිලව් නෑ කමක්ද දන්නේ නෑ
පද්‍ය කොටස - හූරේ ඔරුව පැදපන් කී දෑය මට

iii වාරේ කීවාට කජු වාරයද, කොස් වාරයද, දෙල් වාරයද , අඹ වාරයද, හිඹුටු
වාරයද , මොන ඉලව් වාරයක් ද දන්නේ නෑ
වාරේ කුරුඳු අරගෙන මම් යන කලට....

අලින් ගිය පාරක් ද කොටින් ගිය පාරක් ද, මුවන් ගිය පාරක් ද ගෝනුන් ගිය
පාරක් ද මොන විදියේ පාරක් ද දන්නේ නෑ
පාර නොදැන ගියාය කටුගස් තොටට...

රන් මාලයක්ද, රිදි මාලයක් ද, තඹ මාලයක් ද , පිත්තල මාලයක්ද,මුතු මැණික්
බැඳපු මාලයක් මෝනා කෙහෙල් මල් මාලයක්ද දන්නේ නෑ
මාලෙ කරලාපු අඟනක් එගොඩ සිට

තාත්තගේ නෑ කමක්ද, මුත්තගෙ නෑ කමක්ද, නත් තගේ නෑකමක්ද පනත්තගේ
නෑ කමක් ද මොන නෑ කමක්ද දන්නේ නෑ
හූරේ ඔරුව පැදපන් කීය මෙගොඩට

ඇගයීම - ටීකා සීපද වල පදමාලාවෙන් ප්‍රකාශිත අර්ථය තීව්‍ර කිරීමට ගැමියා කෙතෙක් දුරට සමත් වීද ? මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

මූලාශ්‍ර - හෙළ ගී මග - ඩබ්. ඩී. මකුලොළුව
ජන කවි වාරම් ජනකවි එකතුව - නිමල් ප්‍රේමතිලක (පි 258)

ඇගයීම 10

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන/වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

2. විෂය සන්ධාරය -

- නිර්දේශිත ගැමි ගී ගායනය/ වාදනය
- එම ගැමි ගී වල වෙනස්කම් හඳුනා ගැනීම
- නිර්දේශිත ගැමි ගී වල සංස්කෘතික පසුබිම පිළිබඳ අවබෝධය
- උඩරට පහතරට, සබරගමු වශයෙන් ශාන්ති කර්ම ගී වල වෙනස්කම්
- ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී
- අනාසාතාත්මක මෙතාගි (ගැල්, පැල්, පාරු, බඹර, පතල්, ටීක)

3. උපකරණයේ ස්වභාවය

- ප්‍රායෝගිකව ගායනය / වාදනයේ යෙදවීම
- ගැමි ගී වල තොරතුරු වගුගත කිරීම

4. කාලය - කාලච්ඡේද 03

5. අරමුණු -

- ගැමි ගීත නිවැරදිව ගායනය/වාදනය කරයි.
- ගැමි ගීවල ස්වභාවය පැහැදිලි කරයි
- ගැමි ගී වල සංස්කෘතික පසුබිම පිළිබඳ ව පැහැදිලි කරයි.
- ශාන්ති කර්ම ගී වලට සුවිශේෂ නාද රටා, ගායනය / වාදනය කරයි

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් -

- එක් කාල ඡේදයක දී ශාන්ති කර්ම ගී පිළිබඳ ඇගයීමක් කරන්න.
- අනෙක් කාල ඡේද / ජන ගී පිළිබඳ ඇගයීමක් කරන්න.
- වැදි ගීයක් ගායනයට සලස්වන්න.
- අහඹු ලෙස තෝරාගත් ශාන්ති කර්ම ගීයක් ගායනයට සලස්වන්න.
- අහඹු ලෙස තෝරාගත් මෙහෙ ගීයක් ගායනට සැලසීම
- ටීකා සීපදයත් ගායනයට සැලැස්වීම
- ජන ගී පිළිබඳ සපයන ලද ප්‍රශ්න 8 කට පිළිතුරු රැස් කර වන්න.

නිර්ණායක -

1	තෝරාගත් වැදි ගීතය නිවැරදිව ගායනය කිරීම	ලකුණු 04
2	අහඹු ලෙස තෝරා ගත් ශාන්ති කර්ම ගීය ගායනය කිරිම	ලකුණු 04
3	අනාසාතාත්මක මෙහෙ ගීයක් ගායනා කිරිම	ලකුණු 04
4	ටීකා සීපදය ගායනය කරන්න	ලකුණු 04
5.	සපයන ලද ප්‍රශ්න 8 කට සපයන නිවැරදි පිළිතුරු	ලකුණු 04

නිපුණතාව 06 : සංගීත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 6.1 : ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

ක්‍රියාකාරකම 6.1.1 : ලාංකික සංගීතයේ ගමන් මග යුග කිහිපයක් ඇසුරෙන් විමසමු.

ඉගෙනුම් ඵල :
- අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි සහ මහනුවර යන යුගයන්හි සංගීතය පිළිබඳ ව ලියැවී ඇති ග්‍රන්ථ හඳුනා ගනියි.
- එම යුගයන්හි භාවිත සංගීතයෙහි ස්වභාවය හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 12

ගුණාත්මක යෙදවුම් : ගවේෂණ පත්‍රිකාවල පිටපත්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: මෙහි දැක්වෙන ඇමුණුමේ සඳහන් එක් එක් යුගවලදී ඇති වූ සංගීත විකාශය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ඊට වටිනාකමක් ලබා දීම සඳහා මහාවංශය ආදි වංශ කතාවලත් , ටීකා ටිප්පණි ආදියෙහිත් ඒ සඳහා තොරතුරු ගාථා ආදිය ඉදිරිපත් කර ඇත. ඒවා කට පාඩම් කිරිම හෝ සවිස්තරාත්මක දැක්වීමක් අපේක්ෂා නොකරන අතර කෙටියෙන් කරුණු ඉදිරිපත් කිරිමත්, එම කරුණු සනාථ කිරිම සඳහාත් සිසුන් මෙහෙයවීම ප්‍රමාණවත් ය.

ශ්‍රී ලාංකික සංගීතය පිළිබඳව අනුරපුර, පොළෙන්නරු, දඹදෙණි හා මහනුවර යුග වලින් මතු කරගත හැකි ඓතිහාසික කරුණු වෙත අවධානය යොමු කරවීම මෙහි දී අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව තුළ රාජධානි වශයෙන් පැවති එකී යුගයන්හි භූගෝලීය පිහිටීමත්, රාජධානියක්ව පැවතුන කාල වකවානුත්,, පාලනය කරනු ලැබූ රජවරු සංඛ්‍යාවත්, පිළිබඳව මූලික අවබෝධයක් ලබා දීමෙන් පසු සංගීතය හා සම්බන්ධ තොරතුරු අනු පිළිවෙලින් ගවේෂණය කරලීමට සැලැස්වීම වැදගත් ය. මෙහිදී සාහිත්‍ය මූලාශ්‍රයක් වශයෙන් මහාවංශය ආදී කොට ඇති වංශ කතාත් පුරා විද්‍යාත්මක මූලාශ්‍රයන් වශයෙන් නටඹුන් යටතේ එන කැටයම් සහ වාමන රූපත් සලකා බැලෙන ආකාරයට ආරම්භයක් වශයෙන් මෙම පාඩම් මාලාව සකස් කොට ඇත. ඒ සඳහාද පරිශීලනය කළ හැකි පොත් පත් රාශියකි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලය -

1. ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානිය බිහිවන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා දීම - සඳහා ඇමුණුම් අංක 01 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ඒ ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩ නගන්න.

   (කාලච්ඡේද 01)

2. අනුරාධපුර යුගයේ සංගීතමය තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න. ගවේෂණ පත්‍රිකාව අංක 01 ලබා දෙන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

   (කාලච්ඡේද 01)

3. පොළොන්නරු රාජධානිය බිහිවන ආකාරය පිළිබඳ ව ඇමුණුම් අංක 02 හි ප්‍රවේශය යොදා ගෙන සාකච්ඡාවක් ගොඩ නගන්න.

   (කාලච්ඡේද 02)

4 එම යුගයේ සංගීතමය තොරතුරු පිළිබඳ ව අධ්‍යයනය කිරීම සඳහා ගවේෂණ පත්‍රිකාව අංක02 ඉදිරිපත් කරන්න. අංක 02 ක්‍රියාකාරකමෙහි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

(කාලච්ඡේද 02)

- දඹදෙණි රාජ්‍ය රාජ්‍යයේ බිහිවීම සම්බන්ධයෙන් ඇමුණුම අංක 03 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගනිමින් සාකච්ඡාවක් ගොඩ නගන්න.

(කාලච්ඡේද 02)

- එම යුගය හා බැඳි තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා ඇමුණුම් අංක 02 හි දැක්වෙන ගවේෂණ පත්‍රිකාව ඉදිරිපත් කරන්න. ක්‍රියාකාරකම් අංක 03 හි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

(කාලච්ඡේද 02)

- මහනුවර රාජධානියේ බිහිවීම සම්බන්ධයෙන් ඇමුණුම් අංක 04 හි ප්‍රවේශය යොද ගෙන සාකච්ඡාවක් ගොඩ නගන්න.

(කාලච්ඡේද 01)

- එම යුගයේ සංගීතය හා බැඳි තොරතුරු අධ්‍යනය කිරීම සඳහා ගවේෂණ පත්‍රිකා අංක 4 යොමු කරන්න. ක්‍රියාකාරකම අංක 04 හි යොදවන්න. ඒ සඳහා සහායවන්න.

ඇමුණුම - 01

ප්‍රවේශය - දැනට කොහොඹා කංකාරිය නම් ශාන්ති කර්මය තුළ භාවිත වෘත්ත ගන්ධි ශෛලියෙන් ප්‍රබන්ධ කොට ඇති කුවේණි අස්නෙහි එන ' අපගේ මුනි රජාණන් ඒ කුසිනාරා නුවර' ආදී වශයෙන් ඇති කුවේණියගේ විලාපනය නිරීක්ෂණයට යොමු කරන්න. හැකිනම් ශ්‍රවනයටද යොමු කරවන්න. එයින් මතුවන විජයාගමනය, සිංහල රාජාවලියේ ආරම්භය ද අලලා කථාවක් ගොඩ නගන්න. ඒ හා සම්බන්ධ සිංහබාහු කතා පුවතේ සිට පණ්ඩුකාභය කතා පුවත දක්වා ඇති විවිධ ජනප්‍රවාද ද එයට එක් කරන්න.

පහත දැක්වෙන 'කුවේණිඅස්න' ශබ්ද නගා කියවීමට සලස්වන්න.

අපගේ මුණි රජාණන්, එකුසිනාරා, නුවර වැඩම කර තුල්‍ය බුජ, මධ්‍යගේ සයන කර, නිවන් පුර වඩින දා , අනුරාග රස මහිමි, විඳ කලක් යන තුරුම, දැන් සොඳුර තනිව ඔබ, කිම්ද සැනසෙන් උතුම කොයි ගොසින් කොයි අනේ, රැකෙම්දෝ දෙවියනේ, සුසුම්ලා යකින්නී, නෙත් කඳුළු ඉසින්නී, මේ ලෙසට කියන්නී..,

සිංහ පුරවර සොඳා - රජ ඉසුරු විඳ විඳා
කරන නොපනත් රදා - නැව් නගාහල සඳා
ලක්දිවට ආ සඳා - නුගසෙවන වන මැදා
තනිව උන් සඳා රඳා - බත් බුලත් දී සොඳා
මවා වීමනක් එදා - රැදෙදෙත එහි නිදා
උන් සඳෙහි රිවි උදා - වෙළඹ වෙස් ගෙන සොඳා

යකුන්ගේ පුර වැදා - මරා උන් ලුහු බැඳා
රජ සැපත නුඹ සදා - දවසරින කල එදා
බිසෝකර මා සොඳා - නොපෙන්වන ලෙස සොඳා
දිවුට දෙන සඳ එදා - යකිනි බව නොදැනදා
දැන් මහිමි නුඹ සදා - මහත් දල පෙම් බැඳා
සමඟ වැය නුඹටදා - කොටම දරුවන් එදා

උන් මෙමා හැර අදා - දැන් සෙනේ වෙන සොදා
හිමි වියෝ වූ සඳා - සුපුන් සොමිවත කැළුම්
දිලියවටසේ පෙනේ - හමන මදනල සඳුන්

සිහිල් ගිනි සේ දැනේ - සුවඳ මල් පෙති අතුට
යහන කටු සේ දැනෙ - සැමද සැව් කොවුල් රැව්
තනට යව්ලෙව් අනේ - මදන රද යුදට දැන්
දැනෙයි සැර පස ගෙනේ - මෙසඳ මෙවියෝ දුකින්

ගවේෂණ පත්‍රිකාව අංක 01 (අනුරාධපුර යුගයේ සංගීතමය තොරතුරු)

මහාවංශය දක්වන අන්දමට ලංකාවේ ස්ථිර සමාජ පදනමක් ඇති වූයේ ක්‍රි. පූ. 543 දී පමණය. එනම් විජය ප්‍රමුඛ ආර්ය පිරිසගේ සම්ප්‍රාප්තියෙන් පසුවය. ඒ අනුව සිංහල රාජාවලිය ඇරඹෙන්නේ විජය රජුගෙනි. එහි සක වර්ෂ 106 ක් හෙවත් ක්‍රි. පූ. 543-437 දක්වා යුගය ප්‍රාග් අනුරාධපුරය යුගය වශයෙන් සැලකෙන අතර ක්‍රි.පූ 437 දී පණ්ඩුකාභය රජු සිය රාජධානය වශයෙන් අනුරාධපුරය තෝරා ගැනීමෙන් අනුරාධපුර යුගය ඇරඹෙන බව පිළිගැනේ. ප්‍රාග් අනුරාධපුර යුගයේ දී සහ පශ්චාත් අනුරාධපුර යුගයේ දී ශ්‍රී ලංකාව තුළ කිසියම් ආකාරයක ගායන වාදනයන්ගෙන් යුත් සංගීතමය මූලාශ්‍ර දක්නට ලැබෙන බව පෙන්වා දිය හැක.

- විජය කුමරු ලංකාවට පැමිණි දිනයේ සිරස වස්තු පුරයේ දී පැවැත්වූණේ යැයි කියන විවාහ මංගලෝත්සවය තූර්‍ය වාදනයන් ගෙන් යුක්ත වූ බව මහාවංශය දක්වයි. (තූර්ය සද්දංච සුත්වා ගීත රවංච - මහාවංශය 7 වැනි පරිච්ඡේදය 30 වැනි ගාථාව, බුද්ධ දත්ත සංස්කරණය)

- පණ්ඩුකාභය රජතුමා අනුරාධපුරයේ රාජධානිය පිහිටුවා ගැනීමෙන් පසු තමා කුසහොත් අවධියේ සිට තම මවට ආරක්ෂාව සැලසූ චිත්තරාජ සහ කාලවේල යන එකට මියගොස් සිටි යක්ෂයින් දෙදෙනාගේ දේවත්වයට පමුණුවා සිහසුනට සම උස් අසුන් හි තබා නැටුමෙන් සහ ගැයුමෙන් අලංකාර උත්සව පැවැත්වූ බවත් මහා වංශයේ සඳහන්ව ඇත (ද පේසිජජකාලෙතු චිත්තරාජෙන සොසත, සමාසනේ නිසිදිත්වා දිබ්බ මානුසනාටංක' මහාවංශය පරිච්ඡේද - 10 ගාථාව 07)

- දේවානම් පියතිස්ස රජු සිය යුද්ධ සහ රාජ්‍ය පාලනය කටයුතුවලදී ආචාර පිළිවෙත් ක්‍රමයක් ලෙස පවත්වා ගෙන ගිය ' තාලාවචාර' නම් වූ තූර්‍ය වාද්‍ය කණ්ඩායමක් ගැන සඳහන් වෙයි. මෙය ද සංගීතය හා සම්බන්ධ වැදගත් කමකින් යුතු කරුණක් වශයෙන් සැලකිය හැකි ය.

- රුවන්වැලි සෑයේ ධාතු නිධානෝත්සවයට නානාවිධ තූර්ය වාද්‍ය මධ්‍යයේ නාටිකාංගනාවන් පිරිවරාගෙන දුටු ගැමුණු රජතුමා සහභාගී වූ බව කියවේ. මෙම තූර්‍ය වාද්‍ය' පංච තූර්ය' යනුවෙන් මහා වංශයේ දක්වා නැතත් ඊට වසර 100 කට පමණ පසුව ලියැවෙන මහාවංශටීකාවේ ' ඊත්ථ පා වාගීකා තුරියා, නාම ආතනං, චිත්තං ආනත්. චිත්ත , සුසිරං, ඝනත්ති පංචම්විධො..' යනුවෙන් විස්තර කොට ඇත. (මහා වංශය 29 පරිච්ඡේදය 25 ගීතය)

- ලංකාවේ සංගීත ඉතිහාසය සම්බන්ධයෙන් පිරිත් සජ්ජායනය ද ඉතා වැදගත් බලපෑමක් ඇති කොට ඇත. පස්වන ශත වර්ෂය මැද භාග දී පමණ දෙවන උපතිස්ස රජ දවස ස්ථිර වශයෙන් ම උත්සවාකාරයෙන් පිරිත් සජ්ජායනා කොට ඇති බව චූල වංශයේ දක්වේ. එම අවස්ථාව ගංගා රෝහණ උත්සවය වශයෙන් විස්තර කොට ඇති අතර ගංගාරෝහණ සූත්‍රය වශයෙන් හැඳින්වෙන්නේ රතන සූත්‍රයයි. අනුරාධපුර යුගයේ දී ඇතිවූ පිරිත් සජ්ජායානයෙහි එන විවිධ නාද මාලා රාශියක් ජන ගායනා අතර දක්නට ලැබේ. (පිරිත් සියේ)

- අනුරාධපුර ඉතිහාසය තුළ දක්නට ලැබෙන උත්කෘෂ්ඨ බෞද්ධ උත්සවය වන්නේ ක්‍රි. ව. 9 -21 අතර මහානාග රජතුමා විසින් මල්වතුඔය අසබඩ පැවැත්වූ ගිරිහණ්ඩ පූජාවයි. නොයෙකුත් සංගීත සහ නැටුම් පැවැත්වීම සඳහා මඟ දෙපස වේදිකා ඉදි කොට ඇති අතර රනින් කළ බෙර අටක් වැයීමටද රජතුමා උපදෙස් දී ඇත. මේ බව මහා වංශයේ දක්වන්නේ මෙලෙසිනි. ..' (දීපමාලා සමුජ්තොං කාරයිත්වා සමන්තනෝ - නට නච්චානි ගීතානි වාදිතානිච කරයි - මගගෙ කදම්බ නදිතො යාව චෙතිය පබ්බතා - හාන්තුද ධොතෙහි පාදෙහි කාරයි ස්ථාරණත්ථතං - සනච්චගීත වාදති සමජ්ජම කරුජ තහි නගරස්ස කතුද්වාරෙ මහා දනඤ්ච දපයි මහා වංශ 34 පරිච්ඡේදය ගාථා 77-79) යනුවෙනි.

ක්‍රියාකාරකම 01. ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත සඳහන් පැවරුමට පිළිතුරු සාකච්ඡා කරන්න. පැහැදිලි සැලසුමකට අනුව පෙළ ගස්වන්න.

i 'ලාංකික සංගීතයේ ගමන් මඟ යන මැයෙන් ඇරඹෙන සඟරා ලිපි පෙළක අනුරාධපුරය හා සම්බන්ධ සමාරම්භක ලිපිය සකස් කරන්න.

ii එහි ඇති විෂය කරුණු පිළිබඳව පක්ෂව හෝ විපක්ෂව ලැබිය හැකි යැයි ඔබ සිතන පාඨක ප්‍රතිචාර ගොණුවක් පිළියෙළ කරන්න.

iii ලාංකීක සංගීතයේ ගමන මඟ මැයෙන් පැවැත්වෙන රූපවාහිනී සංවාදාත්මක වැඩ සටහන ඔබට පැවරී ඇත්තේ, අනුරාධපුර යුගය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට යැයි සිතා, එවැනි අවස්ථාවන් නිරූපණය කරන්න.

iv ඒ සම්බන්ධව දුරකථනය ඔස්සේ සම්බන්ධතා ප්‍රේක්ෂයන් විසින් ඉදිරිපත් කළ හැකි ප්‍රශ්නවල ගොනුවක් සකස් කරන්න.

ඇමුණුම - 02

පොළොන්නරු යුගය

ප්‍රවේශය - ප්‍රචලිත රබන් ගීතයක් සිසුන් සමග ගායනා කරන්න. අනතුරුව රබාන සහ රබන් නර්තනය පිළිබඳව සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න. රබන් උපත වෙතට අවධානය යොමු කරවමින් ලංකාවේ රබන් නර්තනය ආරම්භවීමට බලපෑ පසුබිම මතු කරන්න.

බුදු මඟුලට පොරණ	පළමුව මෙලක තුළ
පසඟ තුරු ගොස කරමින	විජයබානිරිඳු රජ කළ
පළමු වෙර එකැසිත	විවාබදිනා කළ
එයම නම් විය	රබන්නර්තනය
රබානක් යන	ලකට වියමුල

මේ අනුව පොළොන්නරු යුගයේ දී ද සංගීතය සම්බන්ධයෙන් වැදගත් කරුණු රැසක් මතුකරගත හැකි බව පෙන්වා දෙන්න. පොළොන්නරු යුගය ආරම්භක කාලවකවානුව, හින්දු ආගමික බලපෑම, දේශපාලනික ස්වභාවය ආදිය කෙටියෙන් සාකච්ඡා කරන්න.

ගවේෂණ පත්‍රිකාව- 02
(පොළොන්නරු යුගයේ සංගීතමය තොරතුරු)

අනුරාධපුරයෙන් පසුව ප්‍රථම වරට පොළොන්නරුව රාජධානියෙක් වශයෙන් තෝරා ගනු ලබන්නේ ක්‍රි. ව 781 දී vii වන අග්බෝ රජු විසිනි. එහෙත් එය වසර හයක් වැනි කෙටි කලකට සීමා විය. නැවතත් වසර 60 කට ආසන්න කාලයක් අනුරාධපුරයෙහි පැවැති රාජධානිය ක්‍රි. ව. 846 දී පළමුවන සේන රජතුමා පොළොන්නරුවට ගෙන එනු ලබයි. එතැන් සිට වර්ෂ 155 ක් පමණ අඛණ්ඩව පවතින පොළොන්නරු රාජ්‍යය ක්‍රි. ව 1001 දී නැවතත් අනුරාධපුරයටත්, එයින් රෝහණයටත් මාරු වෙමින් පැවත නැවත ක්‍රි. ව. 1055 දී මහා විජයබාහු රජතුමා විසින් යලි පොළොන්රුවට ම ගෙන එනු ලබයි. පොළොන්නරු යුගය විශේෂ කොට සැලකීම ඇරඹෙන්නේ මින් පසුවය. එබැවින් ඇතැම් විචාරකයින් පොළොන්නරු යුගය මහා විජයබාහු රජුගෙන් ආරම්භ වන්නේ යයි ද දක්වා ඇත. කෙසේ වෙතත් ලංකාවේ සංගීතය සම්බන්ධයෙන් ද වැදගත් වන කරුණු කිහිපය පවා මතුකර ගත හැක්කේ මින් පසුව බව පෙන්වා දිය හැකි ය.

රාජ්‍ය අනුග්‍රහය සහිතව හින්දු ආගමික බලපෑම මෙරට සංස්කෘතියට මිශ්‍ර වන්නේ ද, රාජ සභා සංගීතයෙහි ආරම්භය සනිටුහන් වන්නේ ද මෙම අවධියේදී ය.

හින්දු දේවාල 13 ක් ඉදිකරනු ලබන මහා පරාක්‍රම බාහු රජතුමා (ක්‍රි. ව1164-97) තවත් දේවාල විශාල සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර ඇති බව දූ චූලවංශයේ දැක්වේ. තවද එතුමන් විසින් ඉදිකර ලද මණ්ඩප අතර හින්දු ආගමික වත් පිළිවෙත් සඳහා කරවූ හේමගිරි මණ්ඩපය ද වීම විශේෂයකි. එමෙන්ම පිරිත් සජ්ඣායනය සඳහා පංච සත්තති මණ්ඩපය ද එතුමා විසින් ඉදිකොට ඇත. ලාංකික රාජ සභා සංගීතය වශයෙන් වඩාත් වැදගත් වන්නේ ඒ අතර එන සරස්වතී මණ්ඩපය යි. එය රන් ආලේප කළ කුළුනුවලින් සහ චීන පටසලු වලින් සරසන ලදුව සංගීත නැටුම් සඳහා ඉදිකරන ලද බව චූලවංශය

දක්වන්නේ මෙසේය.

' තතෝ හම්ම සමීපම්හි නෙක ගන්ධබ්බ ගීතිකං
ලයා පෙතං නිසා මෙතුං රම්මන් දූට්ඨු තද්දවං
සරස්සතී මණ්ඩපංච කාරාපෙසි නරාධිපො''

- චූලවංශ පරිච්ඡේදය 73, ගාථා 82, 86

සරස්වති මණ්ඩපයේ ක්‍රියාකාරකම් අතර

- මහා පරාක්‍රමබාහු රජතුමා විසින් යුද කටයුතු සඳහා පවත්වා ගෙන ගිය සංගීත බලකාය 'සිංහල ගන්දබ්බ' වශයෙන් හැඳින්වූ බවත්, එහි උසස් කුලීන තරුණ තරුණියන් රඳවාගෙන සංගීත, නැටුම් අත්කම්, රණ ක්‍රීඩා ආදිය පුරුදු පුහුණු කොට චරපුරුෂ සේවයේ යෙදවූ බවද චූලවංශයෙහි දැක්වේ. (චූල වංශය පරිච්ඡේදය 66 ගාථා - 132-33)

- ශිව ඇදහීමත් සමග ගණේස, කාර්තිකේය, පාර්වතී ඇදහීම් ද රාජ්‍ය අනුග්‍රහය සහිතව සිදුවී ඇත. ඒ සඳහා දේවාල වල පවත්වනු ලැබූ උත්සව වල නැටුම් ගැයුම් ද ඇතුළත් වී ඇති අතර මහරජතුමාද ඒ සඳහා සහභාගී වී ඇති බව දැක්වේ.

- බුදු සසුන පිරිහී තිබූ එම සමයේ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් දුසිල්වත් භික්ෂූන් පවා හැර සංඝ සාසනික ශෝධනයක්ද සිදු කොට ඇති අතර වෙසක් උත්සව 64 ක් පවත්වා ඇති බවත්, විශාල දළදා පූජාවක්ද පවත්වා ඇති බවත් දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා ඉදි කළ විශේෂ මණ්ඩපය අවට මනහර අබරණින් සැරසුන නාටක ස්ත්‍රීන්ද රඳවා, ඒ අසල තවත් වේදිකාවක් මත වීණා, බටනලා සහ විවිධ බෙර වර්ග වයන සංගීතඥයින් ද රඳවා සිටි බවද චූලවංශයේ දැක්වේ.

- එකල රාජකීයයන් තුළ පවා සංගීතය හා නැටුමට විශේෂ සැලකිල්ලක් තිබූ බව පැරකුම් රජුගේ රූපවති බිසව, නැටුම් ගැයුම් ප්‍රගුණ කොට තිබීමෙන් පෙනී යයි. නැටුමෙහි ගැයුමෙහි දක්ෂ එතුමිය 'නච්ච ගීතස්ස කුසලා' යන විරුදානාමයෙන්ද චූලවශංයෙන් 73 පරිච්ඡේදයේ 141, 142 ගාථා වලින් දක්වා ඇත.

- ක්‍රි.ව. 1202- 1208 රජකළ කළ්‍යාණවතී රැජිනගේ සමයේ පිහිට වූ රන්මැලි සෑ සෙල් ලිපියේ නටන්නන්, ගී කියන්නන් , බෙර ගසන්නන්, සක් පිඹින්නන්, පංචයන් ආදීන් රක්ෂා කර ඇති බව සඳහන් කර තිබීම ද සැලකිය යුතු කරුණකි.

ක්‍රියාකාරකම 02

- සංගීතය සම්බන්ධයෙන් පොළොන්නරු යුගයේ දී කැපී පෙනෙන දායකත්වයක් සැපයූ රජතුමා නම් කරන්න.

- ඒ බව සනාථ කර ලීමට ඇති හේතු සැකෙවින් දක්වන්න. (එම පිළිතුරු ඇසුරෙන් පහත සඳහන් පැවරුමෙහි යෙදෙන්න. එය පන්තිය වෙතට ඉදිරිපත් කර සමාලෝචනයක යෙදෙන්න.)

- ලාංකික සංගීතයේ ගමන් මග යන සඟරා ලිපි පෙළට පොළොන්නරු යුගය සම්බන්ධ කරවමින් ලිපියක් සකස් කරන්න. එයට උචිත නමක් යොදන්න.

- ලාංකික සංගීතයේ ගමන් මග සංවාදයට ලක් කෙරන රූපවාහිනී සජීවී වැඩ සටහනක සම්පත් දායකයෙකු ලෙස ඔබ සහභාගී වන්නේ යැයි සිතන්න. එහිදී පොළොන්නරු යුගයෙන් මතුවෙන සංගීතමය තොරතුරු අළලා ඔබ විසින් ඉදිරිපත් කරන අදහස් ප්‍රකාශ කිරීම නිරූපණය කරන්න.

ඇමුණුම අංක 03

(දඹදෙණි යුගය)

ප්‍රවේශය - දඹදෙණි කතිකා වතෙන් උපුටාගන්නා ලද පහත දැක්වෙන කොටස සිසුනට පැහැදිලිව කියවා ගත හැකි පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඒ අනුව කුමන ආකාරයක නිගමන වලට එළඹිය හැකිදැයි සාකච්ඡා කරන්න.

' කාව්‍ය නාටකදී ගර්හිත විද්‍යාවෙන් නම් තමන් විසින් නූගත යුතු අනුනනටත් නුගැන්විය යුතු' (දඹදෙණි කතිකාවත ' යනු දඹදෙණි යුගය් දි භික්ෂූන් වහන්සේලා ට මග පෙන්වීම සඳහා රචනා වී ඇති කුඩා නීති රීති සංග්‍රහයකි.)

ඇමුණුම අංක 03

ගවේෂන පත්‍රිකාව අංක 03 (දඹදෙණි යුගයේ සංගීතමය තොරතුරු)

- පොළොන්නරුවට පැමිණෙන චෝල ආක්‍රමණ හමුවේ ක්‍රි. ව. 1246 දී iii වන විජයබාහු රජ විසින් ආරක්ෂාව සඳහා රාජධානිය දඹදෙණියට ගෙනයනු ලැබීය. ඔහුගේ වර්ෂ 4 ක පාලනය ඇවෑමෙන් දෙවන පරාක්‍රමබාහු රාජත්වයට පැමිණෙන්නේය. එතුමා අතින් නිර්මිත 'කවි සිළුමිණ' ග්‍රන්ථය නිසා කලි කාල සාහිත්‍ය සර්වජ්ඤ පණ්ඩිත' යන ගෞරව නාමයෙන් පුදනු ලැබීය. වර්ෂ 35 ක රාජ්‍ය පාලනය නිමවීමෙන් පසු එතුමාගේ පුත් සය වන විජයබාහු නැවත පොළොන්නරුව රාජධානිය කොට ගත්තේ ය. ඉන් වසර 2 ට පසු 1 වන බුවනෙකබාහු රජතුමා නැවතත් දඹදෙණියටත් ගෙන එන ලදුව වර්ෂ 11 ක් ඇතුළත යාපාහුවේදී දඹදෙණි යුගය අවසන් වන්නේ ය. වර්ෂ 50 ක් පුරා දිවයන දඹදෙණි යුගය තුල 11 වන පරාක්‍රමබාහු චරිතය කැපී පෙනෙන අතර ආගමික, සංස්කෘතික හා සමාජීය වශයෙන් පොළොන්නරුවට බෙහෙවින්ම සමාන වේ. ඒ අනුව හින්දු ආගමික බලපෑම තවදුරටත් ප්‍රචලිත වන දඹදෙණි යුගය සාහිත්‍ය සම්බන්ධයෙන් වැදගත් ස්ථානයක් අත්කර ගන්නේ ය.

  සංගීතය සම්බන්ධයෙන්ද බොහොමයක් තොරතුරු ලැබෙන්නේ ද මෙමයුගයේ දී රචිත සාහිත්‍ය ග්‍රන්ථයන් තුළිනි. එවකකට ලැබී තිබුණ සංස්කෘතික සාහිත්‍යයේ බලපෑම නිසා එම කරුණුවල සත්‍ය අසත්‍ය තාවය සැකයට බඳුන්වීම ස්වභාවිකය. සමකාලීන භාරතයේ වත් භාවිතා නොවන, භාරතීය සංගීතය හා සම්බන්ධ පැරණි සංස්කෘත ග්‍රන්ථවල පමණක් දක්නට ලැබෙන මූලධර්ම සහ සංගීත භාණ්ඩ ඒ ආකාරයෙන්ම කවිසිළුමිණ, සද්ධර්මාලංකාරය, ධර්ම ප්‍රදීපිකාව වැනි ග්‍රන්ථවල දක්නට ලැබීම එ සඳහා බලපෑ ප්‍රධාන සාධකය වශයෙන් දැක්විය හැකිය.

- සප්ත ස්වරයෙහි නිපුණයෙකු ලෙස හඳුන්වන කරිකාල යන දමිළ පදය කලිකාල වශයෙන් ගෙන 11 වන පරාක්‍රමබාහු රජුට විශේෂණ කොට යෙදීම.

- දළදා පූජා කටයුතු සඳහා දළදා ගෙයි ධූරය සහ විජ්ජතුන් නමින් යුත් තූර්ය වාද්‍ය කණ්ඩායමකුත් රාජ සභා කටයුතු සඳහා රජගෙයි දූරය සහ විජ්ජතුන් නමින් කාණ්ඩායමකුත් 11 වන පරාක්‍රමබාහු රජ තුමා විසින් පවත්වා ගෙන ගොස් ඇත.

- රජතුමාගේ දින චරියාව දැක්වෙන කඳවුරු සිරිත තුළ දිනකට රජතුමා වෙනුවෙන් සතර අවස්ථාවක් සංගීත සහ නැටුම් මුර පවත්වා ඇත බව සඳහන් කරයි.

- භාරතීය සංගීතය හා සම්බන්ධ කරුණු රැසක් සිංහල සාහිත්‍යයට එක් වී ඇති බවක් එකල පැවැති අධ්‍යාපන ආයතනවල ගිහියන් සඳහා එබඳු විෂයන් පවත්වා ගෙන ගිය බවත් පැහැදිලි වේ.

ක්‍රියාකාරකම අංක 03

- ගවේෂණ පත්‍රිකාව ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට සැපයිය යුතු පිළිතුරු සාකච්ඡා කොට පෙළ ගස්වන්න.
- දඹදෙණි යුගයේ දී ලැබෙන සංගීතමය තොරතුරු අතර පිළිගත හැකි කරුණු මොනවාද ?
- මෙම යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ වල එන බොහෝ කරුණු මත භේදයකට තුඩු දෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න (පිටු අංක 104-122) ලංකාවේ සංගීත සම්භවය සී. ද එස් කුලතිලක)
- ලාංකික සංගීතයේ ගමන් මග සඟරාව සඳහා දඹදෙණි යුගය සම්බන්ධ කරමින් ලිපියක් සකස් කොට උචිත නමක් යොදන්න.
- එ නමින් ඇති රූපවාහිණී සජීවී සංවාදාත්මක වැඩ සටහන සඳහා දඹදෙණිය යුගය බලපා ඇති ආකාරය දක්වමින් කෙරෙන ඔබගේ අදහස් දැක්වීම නිරූපණය කරන්න.

ඇමුණුම අංක 04

මහනුවර යුගයේ සංගීතමය තොරතුරු

ප්‍රවේශය - ප්‍රචලිත රාජ ප්‍රශස්තියක්, නාඩගම් ගීතයක් හෝ උඩරට දහ අට වන්නමට අයත් වන්නමක් සිසුන් සමඟ ගායනා කරන්න. ඒ සඳහා බලපා ඇති දේශපාලන සංස්කෘතික සහ සමාජීය පසුබිම පිළිබඳව සාකච්ඡාවක් ගොඩ නගන්න. ලාංකික සංගීතය සම්බන්ධයෙන් වැදගත් කරුණු රැසක් මහනුවර යුගයෙන් මතු කර ගත හැකි බව පෙන්වා දෙන්න.

ගවේෂණ පත්‍රිකාව - අංක 04

මහනුවර යුගයේ සංගීතමය තොරතුරු

ක්‍රි. ව. 1692 දී දොන් ජුවන් කොනප්පු බණ්ඩාර 1 වන විමල ධර්ම සූරිය නමින් සෙංකඩගලදී අභිෂේක ලැබීමෙන් පසු මහනුවර රාජසමය ආරම්භ වන්නේ ය. එතැන් සිට වර්ෂ 46 ක් පවති. සිංහල රාජ වලිය ක්‍රි. ව 1705 දී රජ පැමිණෙන ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ගෙන් පසුව 1738 දී නිම වන්නේ ය. පියාගේ ඇවැමෙන් රජ වීමට පුත් කුමරෙකු නොසිටීමේ හේතුවෙන් සිංහල රාජ්‍යය අග මෙහෙසියගේ සොහෙයුරාට හෙවත් නායක්කාර වංශිකයන් අතට පත්වන්නේ ය. ශ්‍රී. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා අවස්ථා තුනකදීම දකුණු ඉන්දියානු නායක්කාරි වංශික කුමාරිකාවන් තිදෙනෙක්ම විවාහ කර ගැනීමෙන් ද

අවසානයේ රාජ්‍යත්වය පවා භාර දීමට සිදු වීමෙන් ද ශ්‍රී ලාංකික ජන සමාජයට දකුණු ඉන්දියානු හින්දු බලපෑම නොමඳව ලැබෙන්නට විය. ඒ අතර නිසි පූජෝපාහාර ලබමින් පෝෂණය වීමද සැලකිය යුතු කරුණකි. කෙසේ වෙතත් 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසින් අතට පත්වීමෙන් පසු අවසන් වන මහනුවර යුගය ශ්‍රී ලාංකික සංගීතයේ විකාශය කෙරෙහි බලපෑ ප්‍රවණතා රාශියකින්ම සමන්විත බව පෙනේ.

- රාජ සභාව හා සම්බන්ධ සංගීත හා නැටුම් ආයතන මහනුවර යුගයේ දී දක්නට ලැබේ. එනම්,

i කවිකාර මඩුව, ii නැටුම් ඉලංගම iii වාහල ඉලංගම iv පුරම්පෙට්ටුකාර අංශය vi සිංගාරක්කාර අංශය

- පොළාන්නරු යුගයෙන් ඇරඹෙන රාජ සභා සංගීතය වඩාත් විචිත්‍රවත්ව භාවිත වන්නේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ සමයේ පිහිටුවන කවිකාර මඩුවෙනි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමය දක්වාම අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබන මෙම ' කවිකාර මඩුව තුළ නායක්කාර් බිසෝවරුන් ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතාවයන් මත කැඳවා ගනු ලැබූ ගණිතාලංකාර, නාරසිංහ, අලගනායිදු වැනි කරණාට සංගීතඥයින් පවා සේවය කොට ඇත. නරේන්ද්‍රසිංය රාජාධි රාජසිංහ රජ සමයේ තෙළිඟු බසින් රඟ දක්වනු ලැබූ 'හරිශ්චන්ද්‍ර' නාඩගම අලගනායිදු විසින් කරන ලද්දක් බව සඳහන් ය. කෙසේ වෙතත් ප්‍රශස්ති, හටන් ගී, විරහ ගී, වන්නම් , සව්දම්, සින්දු ආදී ගායනා රැසක් අංග චලනයන් සහිතව කවිකාර මඩුවේදී රජු සඳහා ඉදිරිපත් කොට ඇති බව සඳහන් ය. ඒ සඳහා නිත්‍ය සේවක මණ්ඩලයක් ද, නිළමේ වරයෙක් ද පත් කොට ඇත.

- ස්ත්‍රීන් ගෙන් සමන්විත විශාල ආයතනයක් වූ නැටුම් ඉලංගමද යුද හරඹ, පිනුම්, ඉන්ද්‍රජාල හා වෙනත් නව නාටක වලින් සුසැදි වාහල ඉලංගමද සිංහල ගායන වාදන හා නර්තන යන්හි පෝෂණයට බලපෑවේ ය.

- දේශීය බෙර වර්ගවලට සහ සුෂිර වාද්‍ය භාණ්ඩවලට අමතරව තොම්බ්‍රොන්, ට්‍රම්පට් වැනි විදේශීය තූර්ය වාද්‍ය භාණ්ඩවලින් සමන්විත විදේශීය තානාපති වරුන් පිළිගැනීමේ අවස්ථාවන් වැනි රාජකීය අවස්ථාවන් සඳහා යොදා ගනු ලැබූ තඹුරු පුරප්පෙට්ටුකාර අංශයද රජුගේ පරිවාර වාදක කණ්ඩයමකි. සිංගරක්කාර අංශය වශයෙන් සලකන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් පිහිටුවා ගත් පෝය හේවිසි ආදිය වාදනය සඳහා වූ බෙර දවුල්, හොරණෑ ද සහ තම්මැට්ටම් ආදියෙන් සුසැදි ආයතනයකි.

- මහනුවර යුගයේ පවත්වන ලද අවුරුදු මංගල්‍යය, ඇසල පෙරහර සහ අලුත් සහල් මංගල්‍ය වැනි සමාජ උත්සව තුළින් ද සංගීතයේ ප්‍රගතියට තුඩු දුන් සාධක දැකිය හැකි ය.

- දඹදෙණි යුගයේ දී ඇරඹී දිවි දොස් ශාන්ති කර්මය, කොහොඹා කංකාරිය ලෙස වර්ධනය වන්නේ ද එතෙක් පැවැති පත්තිනි ඇදහීම, පත්තිනි හැල්ල, පත්තින උපත, සත් පත්තිනි, කථා ආදියෙන් පෝෂණය ලැබීම වැනි ජන ජීවිතයේ විවිධ ඇදහිලි හා විශ්වාස මත පදනම් වූ හින්දු දේවාල වලින් අභාෂය ලද සැහැලි , සන්ත , චූර්ණිකා, යාදිනි වැනි සංගීතමය වටිනා කමකින් යුතු ගායනා ද මහනුවර යුගයේ දී ව්‍යාප්ත වී ඇති බව පෙනේ.

- ගණිතාලංකාර නම් කේරළ සංගීතඥයාගෙන් පිටපත් කරගනු ලැබූ 'වාදාංකුස රත්නමාලය' නම් ග්‍රන්ථයෙන් මහනුවර යුගයේ සංගීතය සම්බන්ධ මූලධර්ම කීපයක් දැක්වේ. ඒ අතර ගායනය හා සම්බන්ධ රාග 32 ක් ද ගීත 64 ක් ද වන්නම් 18 ද තාලම් 32 ක්ද ඇති බව දක්වා තිබේ.

ක්‍රියාකාරකම 04

ගවේෂණ පත්‍රිකාව ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- මහනුවර යුගයට දකුණු ඉන්දියානු බලපෑම එල්ලවීමට බලපෑ සාධක මොනවා ද?
- රාජ සභා සංගීතය සඳහා පිහිට වූ ආයතන 3 ක් නම් කරන්න.
- එයින් නරේන්ද්‍රසිංහ රජතුමා පිහිටවනු ලැබූ ආයතනයෙන් බිහිවූ වර්තමානයේ පවා දක්නට ලැබෙන ගායනා මොනවාද ?
- එම ආයතවල සේවය කළ කර්ණාට සංගීතඥයින් තිදෙනෙක් නම් කරන්න.
- වාදාංකුසයේ දැක්වෙන ගායන වාදන මූලධර්ම 3 බැගින් දක්වන්න.
- ලාංකික සංගීතයේ ගමන් මග යන මැයෙන් පැවැත්වෙන රූපවාහිනී සංවාදාත්මක වැඩ සටහනක ඔබට පැවරී ඇත්තේ මහනුවර යුගය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට යැයි සිතා එවැනි අවස්ථාවන් නිරූපණය කරන්න.
- ඒ සම්බන්ධව දුරකථනය ඔස්සේ සම්බන්ධ වන ප්‍රේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ හැකි ප්‍රශ්නවල ගොණුවක් සකස් කරන්න.

ඇගයීම -

ලාංකීය සංගීත ගමන් මගේ, දඹදෙනි යුගයේ සංගීතය පිළිබඳ තොරතුරු කෙටියෙන් පෙළ ගස්වන්න.

තාලා වචාර, සිංහල ගන්ධබ්බ, හේමගිරි මණ්ඩපය, මෙවැනි වදන් සඳහා පසුබිම් වූ සංගීත තොරතුරු හඳුන්වා දෙන්න.

මූලාශ්‍ර -

ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - සී. ද. එස් කුලතිලක
විශ්ව සංගීත ක්ෂෙත්‍ර - සී. ද. එස් කුලතිලක

නිපුණතාවය 06 : සංගීත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 6.1 : ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

ක්‍රියාකාරකම 6.1.2 : නටඹුන් අතර ඇති මියැසි සළකුණු සොයා විමසමු.

කාලය : කාලච්ඡේද 04

ඉගෙනුම් ඵල :
- ඓතිහාසික තොරතුරු සොයා ගැනීම සඳහා අවශ්‍ය මූලාශ්‍ර හඳුනා ගනියි.
- එම මූලාශ්‍ර අයත් යුග සහ දක්නට ලැබෙන සාධක, භාණ්ඩ පිළිබඳව හඳුනා ගනියි.

ගුණාත්මක යෙදවුම් : ගවේෂණ පත්‍රිකා සඳහා නියමිත කොටස්වල ඡායා පිටපත්, කියවීම් පත්‍රිකා සහ රූප සටහන් සහිත පත්‍රිකා වල ඡයා පිටපත්, පංචතූර්ය වාදන ඇතුළත් ශ්‍රව්‍ය පට, අදාළ ධාවන යන්ත්‍ර.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: ඉතිහාසය ගවේෂණය කිරීමේ දී පුරා විද්‍යාත්මක සාධකද බෙහෙවින් ම වැදගත් ය. ඒ අනුව පුරා විද්‍යාත්මක සාධකයක් වශයෙන් ගැනෙන නටඹුන් අතර එන කැටයම් සහ වාමන රූප අවධානයට ලක් කොට ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳව විචාරාත්මක අත්දැකීමක් ලබාදීම මෙහි දී අපේක්ෂා කෙරේ.

ඇමුණුම් අංක 01 පළමුවැනි ක්‍රියාකාරකම් ගවේෂණ පත්‍රිකාව සඳහා සී. ද එස් කුලතිලක මහතා ගේ ' ලංකාවේ සංගීත සම්භවය' කෘතියේ 83 පිට අවසාන ඡේදයද, 84 පිට. පළමු ඡේදයද යොදා ගන්න. 02 වන ක්‍රියාකාකරමෙහි එන ගවේෂණ පත්‍රිකාව සඳහා එම කෘතියේ 168 පිටුව සහ 179 පිටුවෙහි මුල් ඡේදය යොදා ගන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

1. ශ්‍රී ලංකාවේ දැනට සොයා ගෙන ඇති නටඹුන් අතරින් සංගීතය හා සම්බන්ධ කැටයම් සහ වාමන රූප කිහිපයක් හඳුනා ගැනීම සඳහා ඇමුණුම් අංක 01 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ඓතිහාසික කරුනු ගවේෂණයක දී එවැන්නක ඇති වැදගත්කම අළලා සාකච්ඡාවක් ගොඩ නගන්න.

   එම මූලාශ්‍ර වලින් සමාජ පසුබිම සහ සංගීතමය භාවිතය පිළිබඳව එළඹිය හැකි නිගමන සඳහා ක්‍රියාකාකරම අංක 01 සහ 02 හි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

   කාලච්ඡේද 02

2. කැටයම් තුළ දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩ සහ දැනට භාවිත වන වාද්‍ය භාණඩ අතර සම්බන්ධය දැක්වීම සඳහා ඇමුණුම් අංක 02 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ඒ ඇසුරෙන් හෙළිවන සංගීතමය තොරතුරු පිළිබඳ සාකච්ඡා කරන්න.

   කැටයම් සහ වාමන රූපවලින් හෙළි වන සංගීතමය තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා 1, 2 සහ 3 යන ක්‍රියාකාරකම් හි යොදවන්න. ඒ සඳහා සහාය වන්න.

   කාලච්ඡේද 02

ඇමුණුම අංක 01

ප්‍රවේශය - ශ්‍රී ලංකවේ සංගීතයේ ප්‍රභවය සහ විකාශය විවිධ යුග ඔස්සේ මෙතෙක් හදාරා ඇත්තේ කුමන මූලාශ්‍ර පදනම් කර ගෙන දැයි සහ එසේ කරුණු සොයාගත හැකි තවත් මූලාශ්‍ර මොනවාදැයි සාකච්ඡාවක් ගොඩ නගන්න. මේ සඳහා පහත දැක්වෙන කියවීම් පත්‍රිකාව යොදා ගන්න.

කියවීම් පත්‍රිකාව

ඓතිහාසික කරුණු ගවේෂණයේ දී යොදා ගනු ලබන ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.

අ) සාහිත්‍යය මූලාශ්‍ර
ආ) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර
මෙය තවත් ප්‍රභේදයන්ද සහිතව මෙසේ දැක්විය හැකි ය.



මෙහි දී 'විදේශීය' යනුවෙන් දක්වා ඇති සාහිත්‍යමය මූලාශ්‍රය යටතට ' දේශීය ' යන්න සඳහා ඇති ශීර්ෂවලට අමතරව විදෙස් සංචාරකයන්, සිරකරුවන් ආදීන්ගේ ලිපි ලේඛන වාර්තා ආදිය ද සැළකිය හැකිය. නාණක වශයෙන් දක්වන්නෙ කාසි ආදී භාවිත උපකරණයන්ය. මේ ආදී වශයෙන් විවිධ මූලාශ්‍ර ඔස්සේ ඓතිහාසික කරුණු විමසා බැලිය හැක.

ක්‍රියාකාරකම 01

අංක 1, 2, 3, 4 යන කැටයම් සහ වාමන රූප වල රූප සටහන් සහිත පත්‍රිකා නිරීක්ෂණයට යොමු කරන්න. ඒවා අයත් මූලාශ්‍රයන්හි ස්වභාවය (මාධ්‍ය) පිළිබඳව පැහැදිලි කොට අංක 05 ගවේෂණ පත්‍රිකාව ඉදිරිපත් කරන්න. අංක 01 ගවේෂණ පත්‍රිකාව සැකසීමට මග පෙන්වීම ගුරු උපදෙස් තීරයේ සඳහන් කර ඇත.)

එම ගවේෂණ පත්‍රිකාවේ සඳහන් තොරතුරු අදාළ වන්නේ කුමන වාමන රූප හෝ කැටයම් වලට දැයි සාකච්ඡා කරන්න.

'වාමන රූපවලින් හෙළිවන ලාංකික සංගීතය' යන මැයෙන් සංක්ෂිප්ත ලිපියක් ඉහත තොරතුරු ඇසුරින් පිළියෙල කරන්න. එය පන්තිය වෙත ඉදිරිපත් කරන්න.

ක්‍රියාකාරකම -02

- අමුණා ඇති රූප සටහන් සඳහා සී. ද එස් කුලතිලක මහතා ගේ ' ලංකාවේ සංගීත සම්භවය' යන කෘතියේ අංක 168 පිටුව සහ 170 පිටුවෙහි මුල්ඡේද යොද ගනිමින් ගුරුවරයා සැකසූ ගවේෂණ පත්‍රිකාව අංක 02 ඉදිරිපත් කරන්න. මෙරට භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳව කුමන නිගමන වලට එළඹිය හැකිදැයි සාකච්ඡා කරන්න. එය අනු පිළිවෙලින් සංක්ෂිප්ත සටහනක් ලෙස ගොනු කොට පන්තියට ඉදිරිපත් කරන්න. සංවරධනාත්මක අදහස් දක්වමින් සමාලෝචනයක යෙදෙන්න.

කාලවඡේ ද 02

1. [illegible]
2. [illegible]
3. [illegible]
4. [illegible]
5. [illegible]
6. [illegible]



ඇමුණුම අංක 02

ප්‍රවේශය - පංච තූර්ය වාදනයක් ශ්‍රවණයට යොමු කොට පංච තූර්ය වාද්‍ය භාණ්ඩ දක්වෙන අංක 01 පත්‍රිකාව නිරීක්ෂණයට යොමු කරන්න. එහිදී ශ්‍රවනය කළ වාද්‍ය භාණ්ඩයත්, රූප සටහනේ දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩත් කැටයම් සහ වාමන රූප තුළ දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩත් අතර ඇති සම්බන්ධයෙන් සුවිශේෂ ලක්ෂණ පිළිබඳව සංවාදයක යෙදෙන්න.

ක්‍රියාකාරකම 01

- පහත දක්වෙන වගුව මෙතෙක් උගත් දෑ ඇසුරෙන් සම්පූර්ණ කරන්න.

ස්ථානය හා කැටයම	යුගය	මාධ්‍ය	දක්වෙන සංගීත භාණ්ඩ	අද පවතින සං. භාණ්ඩවලට ඇති සම්බන්ධය

ක්‍රියාකාරකම 02

- මෙරට සංගීතයේ ගමන් මග සම්බන්ධයෙන් පැවැත්වෙන රූපවාහිනී සංවාදයේ සම්පත් දායකයකු ලෙස ඔබ සහභාගි වන්නේ යැයි සිතන්න. සාහිත්‍යමය මූලාශ්‍රවලට අමතරව පුරා විද්‍යාත්මක මූලාශ්‍ර යටතේද එහි විනාශය සිදුවී ඇති අයුරු කැටයම් සහ වාමන රූප ඇසුරෙන් දක්වන ආකාරය නිරූපණය කරන්න.

- වැඩ සටහන මෙහෙයවන්නා විසින් ඇසිය හැකියයි නිගමනය කළ හැකි ප්‍රශ්න කීපයක් නිර්මාණය කරන්න.

ක්‍රියාකාරකම 03

- ලාංකික සංගීතයේ ගමන් මග යන සඟරා ලිපි පෙළට කැටයම් හා වාමන රූප තුළින් හෙළිවන සංගීතමය තොරතුරු යන මැයෙන් ලිපියක් සකස් කරන්න.

ගිතයට ලැබුණ පැදි විරිත් පුනරුදය

බෙන්තර ගලපාත විහාර උළුවස්සෙහි කැටයම් කර ඇති
භාණ්ඩ වාදක රූප—කෝට්ටේ යුගය

බෙන්තර ගලපාත විහාර උළුවස්සෙහි
ඉහළ හරස්කඩයේ දක්වා ඇති
ගී කියන රූපයක්.

ඇම්බැක්කේ දේවාලයේ
(කින්නරි කිඳුරි කැටයම)

ඇගයීම -

- පැරණි නටඹුන් ඇසුරෙන් ලංකාවේ භාවිතා වී ඇති සංගීත භාණ්ඩ දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව වර්ග කරන්න.
- දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය ට අයත් නොවන සංගීත භාණ්ඩවල නාමාවලියක් සකස් කරන්න.

මූලාශ්‍ර -

- ලංකාවේ සංගීත භාණ්ඩ - සී. ද. එස්. කුලතිලක

ඇගයීම - 11

1. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -**

ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.

2. **විෂය සන්ධාරය**

ඒ ඒ යුගවලට අයත් සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු රැස් කරයි.
(අනුරාධපුර, පොළොන්නරු, දඹදෙනි, මහනුවර,)

- නටඹුන් කැටයම් වලින් හෙළිවන සංගීතමය තොරතුරු සොයා බලයි.

3. **උපකරණයේ ස්වභාවය**

- පැවරුම

4. **කාලය -** කාලච්ඡේද 02

5. **අරමුණු -**

- අධ්‍යයනය කළ කරුණු සංවිධානාත්මකව භාවිත කරයි.
- තොරතුරු රැස් කරයි.
- රැස්කරගත් තොරතුරු සංවිධානාත්මකව හා නිර්මාණාත්මකව සංවිධානය කරයි.
- විෂයය කරුණු ක්‍රමවත් ගොනුවක් ලෙසට පිළියෙල කරයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් -**

ගුරු උපදෙස් -

- මෙම නිපුණතාවයට අනුව සිසුන් විසින් ඉටු කරනු ලබන සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි පොත් පිංචක් සකස් කරවා ගැනීම අපේක්ෂිතය.
- ආරම්භයේ දී ම සිසුන්ට ඒ පිළිබඳ ව දැනුවත් කරන්න.
- එක් එක් යුගය අවසානයේ සිසුන් විසින් නිමාකර ඇති සඟරා ලිපි පෙළ එකතු කර පොත් පිංචක් ලෙස ගොනු කිරීමට මඟ පෙන්වන්න.

සිසුන්ට උපදෙස් -

- ගුරුවරයාගේ මඟ පෙන්වීම අනුව ඔබ අධ්‍යයනය කළ විෂයය කරුණු තව දුරටත් සංවර්ධන කරමින් පරිශීලනයට සුදුසු පොත් පිංචක් සකස් කරන්න.
- පුස්තකාලය හා සම්පත් පුද්ගලයින් ප්‍රයෝජනය ගන්න. මෙසේ කරුණු සංවිධානය කරන්න.
- පහත දැක්වෙන පරිදි පොත් පිංචේ ආකෘතිය සකස් කර ගන්න.

  නම හා මුල් පිටුව
  පිදුම
  පටුන
  අන්තර්ගතය පහත දැක්වෙන පරිදි කොටස් කරන්න.
  1 අනුරාධපුර යුගයේ සංගීත ඉතිහාසය (සකසා ඇති ලිපිය)
  2. පොළොන්නරු යුගයේ සංගීත ඉතිහාසය (සකසා ඇති ලිපිය)
  3. දඹදෙණි යුගයේ සංගීත ඉතිහාසය (සකසා ඇති ලිපිය)
  4. මහනුවර යුගයේ සංගීත ඉතිහාසය (සකසා ඇති ලිපිය)
  5. කැටයම් හා වාමන රූපවලින් හෙළිවන තොරතුරු (සකසා ඇති ලිපිය)
- අවශ්‍ය අවස්ථාවන්වලදී ඉදිරිපත් කර ඇති කරුණු සනාථ කිරීමට රූප සටහන් හෝ උපුටන භාවිත කරන්න.
- නිමාවකින් යුතුව පොත් පිංච මසක් ඇතුළත භාර දෙන්න.

නිර්ණායක -

- අනුරාධපුර යුගයේ සංගීත තොරතුරුවල නිවැරදි බව, ප්‍රමාණවත් බව, සංවිධානාත්මක බව හා ක්‍රමවත් බව — ලකුණු 04
- පොළොන්නරු යුගයේ සංගීත තොරතුරුවල නිවැරදි බව, ප්‍රමාණවත් බව සංවිධානාත්මක බව හා ක්‍රමවත් බව — ලකුණු 04
- දඹදෙනි යුගයේ සංගීත තොරතුරුවල නිවැරදි බව, ප්‍රමාණවත් බව සංවිධානාත්මක බව හා ක්‍රමවත් බව — ලකුණු 04
- මහනුවර යුගයේ සංගීත තොරතුරුවල නිවැරදි බව, ප්‍රමාණවත් බව සංවිධානාත්මක බව හා ක්‍රමවත් බව — ලකුණු 04
- කැටයම් හා වාමන රූප වලින් හෙළිවන කරුණු — ලකුණු 04

නිපුණතාව 7.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳී සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ /වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 7.1.1 : සොකරි රංග ශෛලීයේ ගීත ගායනය සහ එහි රඟ සොබාව.

ඉගෙනුම් ඵල : • සොකරි රංග ශෛලීයේ රංග ස්වභාවය හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 03

ගුණාත්මක යෙදවුම් : සොකරි රංගනයේ අවස්ථා දක්වෙන ඡායාරූප, සර්පිනාව, පද ලියන ලද පත්‍රිකා

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: 10, 11 ශ්‍රේණිවලදී ලංකාවේ ගැමි නාටක වන කෝළම්, නාඩගම් නුර්ති රංග ශෛලීන් හඳුන්වා දී ඇතත් සොකරි පිළිබඳව සඳහන් වන්නේ මෙම පාඩමේ දී පමණි. මෙම ක්‍රියාකාරකමින් පසුව සිසුනට සොකරි ගීත ගායනය / වාදනය කිරීමටත් , එහි රංග ස්වභාවය විස්තර කිරීමටත්, රංග ශෛලිය පිළිබඳව රසාස්වාදයේ යෙදීමෙන් නිපුණතා මට්ටමට ලඟා වීමට හැකිවීමත් අපේක්ෂා කෙරේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- සොකරි රංගනය ශ්‍රී ලංකාවේ තවත් එක් ගැමි නාටක ශෛලියක් බව සිසුන් හා සාකච්ඡා කරන්න. ඇමුණුම අංක 01 හි දක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරමින් සොකරි ගීයක් ගායනය සඳහා හුරු කරන්න..

  කාලච්ඡේද 01 යි

- සොකරි නාටකය පිළිබඳව තොරතුරු රැස් කිරීමට ඇමුණුම අංක 02 සිසුන්ට ඉදිරිපත් කරන්න. එය අවසානයේ අසා ඇති ප්‍රශ්න වල පිළිතුරු ලිවීමට උපදෙස් දෙන්න.

  කාලච්ඡේද 01 යි

- සොකරි කථා පුවත සාකච්ඡාවට ලක් කරන්න. සොකරි රංග සම්ප්‍රදාය ශාන්ති කර්මයක් ලෙසට සනාථ කිරීමට කරුණු දක්වන්න.

  කාලච්ඡේද 01

ඇමුණුම 01

ප්‍රවේශය

වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬ ලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

ක්‍රියාකාරකම 01

- ඉහත දැක්වෙන ගීතය සිසුන් සමග ගායනය කරන්න
- සිසුන් ලවා එය අනුකරණය කරවන්න.
- අවශ්‍ය නම් ස්වර ප්‍රස්තාරය ද ගයන්න
- වෙනත් පද මාලාවන් කීපයක් සිසුන්ට සපයන්න
- සෑම කවියක්ම සොකරි වල ගායනය වන්නේ ඒකාකාරී තනුවකට බව සිසුන් දැනුවත් කරන්න.
- අහඹු ලෙස තෝරා ගත් සිසුන් කීප දෙනෙක් ලවා ගායනය කරවන්න.

ඇමුණුම 02

පහත සඳහන් කියවීම් පත්‍රිකාව සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

- සොකරි නාටකය උඩරට පළාතෙන් වන්නියෙත් සතර කෝරළේ ඇතැම් පෙදෙස්වලටත් සීමා වූවකි.
- එහි විශේෂ ලක්ෂණයක් වන්නේ අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් කීමයි.
- කණ්ඩායම් නායකයා (බෙරකරු) කිසියම් සිද්ධියක් කවියෙන් විස්තර කරන විට නළුවෝ එය අනුකරණාත්මක නැටුමෙන් රඟ දක්වති.
- ගද්‍ය සංවාද දක්නට ඇත.
- සමහර චරිත කොළපත්වලින් සාදා වෙස් මුහුණු පළඳිති.
- උඩරට ගැටබෙරය තාල වාදනය සඳහා යොද ගනියි.
- සමහර පළාතක ඒ සඳහා දවුල භාවිත කරන අතර වන්නියේ දී උඩැක්කිය වයනු ලබයි.
- සොකරි කථාව පළාත් බදව වෙනස් වේ.
- සොකරි නාටකයේ මුල් ස්වරූපය තවම රදා පවතින්නේ ලග්ගල, ඉළුක්කුඹුර, බදුල්ල වැනි ප්‍රදේශවලයි.
- අස්වැන්න කපා පාගා ගත් කමත සොකරි රංගනය සඳහා ඉතා යෝග්‍යය.
- කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සශ්‍රීකත්වය හා බැඳි පවතින නාටකයක් ලෙසද හැඳින්වේ.
- මෙහි කථා පුවත පත්තිනි දෙවියන් හා සම්බන්ධවයි. නැතිවූ සොකරිය සොයා ගැනීමට කතරගම දෙවියන්ගේ පිහිට ලබාගත් බවත් නාටකයේ ඇතුළත් වේ.
- ශාන්ති කර්මය ස්වරූපයෙන් සොකරි නාට්‍ය අවසානයේ දේව දානයක් පිරි නැමීමද කරනු ලැබේ.
- තනු රටා උඩරට ශාන්ති කර්ම හා සම්බන්ධ වේ.

ක්‍රියාකාරකම 02- පහත දැක්වෙන ඡේදයේ හිස්තැන් පුරවා සකසන්න.

සොකරි රංග ශෛලිය

ලංකාවේ පළාත් කීපයක් අතරින් ඉස්මතුව ආ සොකරි නාටකය උඩරට .....,....., ගම්මානවලටත් වන්නියේ හා සතර කෝරලේ ....., ..., සහ ගම් මට්ටමේ නාටක කණ්ඩායම් අතර අද ද ජනප්‍රියව පවතී. සමහර කණ්ඩායම් මේ සඳහා ....., බෙරය යොදා ගනියි. ස්වර වාද්‍ය භාණ්ඩයක් වාදනය වන්නේ නැත. තවත් පළාත්වල ..... සහ ..... යන භාණ්ඩ ද යොදා ගනී.

ශාන්ති කර්ම අංග මේ නාටකය ට ඇතුළත් වී ඇතැයි යන මතයට හොඳම උදහාරණ වන්නේ මේ නාටකයේ එන ....., ..., ..., ආදී රංගන අවස්ථාවන් වේ.

තවද සොකරි නාටකය ....., දෙවියන් හා සම්බන්ධිත බවත් එයට ....., දෙවියන් හා සම්බන්ධ කොටස් ඇතුළත් කර ඇති බවත් පොත් පත්හි සඳහන් වේ.

ක්‍රියාකාරකම 04

සොකරි කතා පුවත සැකෙවින්

දඹදිව කාසි රටේ ගුරු හාමි නම් ආඬ්‍ය ගුරෙක් වාසය කරයි. රූමත් යුවතියක වූ සොකරි සරණපාවා ගන්නා ගුරුහාමිගේ මෙහෙකරුවා වූයේ පරයා නම් පුද්ගලයෙකි. ජීවනෝපාය සඳහා රටින් රට යන ඔවුන් කෙළවරදී ලක්දිවට පැමිණේ. (එහිදි මුහුදු සතක් තරණය කරන බවත් ශ්‍රීපාද ස්ථානයට ගොස් වැඳපුදාගත් බවත් සඳහන් වේ.) තඹරාවිට ගමට පැමිණෙන ඔවුන් එහි පැලක් සාදා එහි වාසය කරයි. ගුරුහාමි බත් පිසීම සඳහා හාල් ගෙනත් දී වතුර සෙවීම සඳහා ගමට යන විට කකුල බල්ලකු විසින් සපා කයි. අමාරුවෙන් ගෙදරට පැමිණ වැතිර සිටින විට ගුරුහාමි මළා යයි සිතූ පරයා සොකරිය අනාචාරයට පොළඹවා ගැනීමකට උත්සාහ කරයි. කකුල සුවපත් කිරීම සඳහා කැඳවාගන්නා වෙදරාළ සමඟ සොකරි පළා යයි. සොවින් පෙළෙන ගුරුහාමි කතරගම දෙවියන්ට කන්නලව් කොට භාරහාර ඔප්පු කළ පසු ගුරුහාමිට වෙදරාලගේ ගෙදරදී ඇය හමුවේ. මේ වන විට ඇය දරුවකු ලබා නළවමින් සිටී. (පාට වරුණ පුත පරමණ්ඩල පුත..) දරුවා සමඟ සොකරිය නැවත භාර ගන්නා ගුරුහාමි දරුවා ප්‍රේක්ෂක ජනතාව අතට පත්කරයි. අවසානයේ දේව දානයකින් සොකරිය දරුවා ප්‍රේක්ෂකයන් අතට ලබාදීමෙන්, සශ්‍රීකත්වය නැවත ජනතාවට ලබාදීම සංකේතවත් කරයි.

ඇගයීම -

- සොකරි නාට්‍ය ශෛලීයේ සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න
  සොකරි නාටකයේ ඇති ශාන්ති කර්ම අංග පිළිබඳව විමසන්න.

මූලාශ්‍ර

- සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
  ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් - මහාචාර්ය රෝලන්ඩ් අබේපාල
  සිංහල නාටකයේ විකාශය - මහාචාර්ය තිස්ස කාරියවසම්

නිපුණතාව 7.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳී සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ /වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 7.1.2 : කෝළම් ගීත ගයමු.

ඉගෙනුම් ඵල :
- කෝළම් රංග සම්ප්‍රදාය පිළිබඳව හඳුනා ගනියි.
- කෝළම් ගීත ගායනය කරයි.

කාලය : කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් : කෝලම් ගීත කිහිපයක් පටිගත කරන ලද කැසට් පටයක්, කැසට් යන්ත්‍රයක්, සර්පිනාවක්, පහත රට බෙරයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: කෝළම් පිළිබඳ රූප සටහන් ද සහිත ව විස්තරයක් 7 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ එළි දක්වා ඇත. එය ද මේ පාඩම සඳහා ප්‍රයෝජනයට ගන්න. එහි සඳහන් කෝළම් මුහුණු ඡායාරූප සහ පින්තූර සිසුන් ට පෙන්වීම සඳහා උපයෝගී කළ හැක.
- විවිධ තාල රූපවලට ගොඩනැගී ඇති කෝළම් ගීත තෝරා ගැනීම පාඩම් සංවර්ධනයට මහත් පිටුවහල් වේ.
- කෝළම් ගීත ගායනයට වාදනයට සිසුන් පෙළඹවීම තුළින් ලංකාවේ ගැමි රංග සම්ප්‍රදායන් අගය කිරීමටත් එම ගීත රස විඳීමටත් සිසුන් යොමු කිරීම සමබර පෞරුෂයකින් යුත් සිසු පිරිසක් බිහිකිරීමට හේතුවනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- 7 ශ්‍රේණියේ කෝළම් පාඩම නැවත සිහිපත් කරන්න. එම කෝළම් මුහුණු සහ පින්තූර පෙන්වමින් කෝළම් රංග සම්ප්‍රදාය පිළිබඳ කෙටි සාකච්ඡාවක යෙදෙන්න. මේ අවස්ථාවේ දී කෝළම් ගීතයක් ශ්‍රවණයට යොමු කරන්න. මේ සඳහා ඇමුණුම 01 හි ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.
(කාලච්ඡේද 02)

- ගීතය 01 - ජසයා හා ලෙන්චිනා කෝළමින් ලෙංචිනා ගයන ගීතය , ගුරුවරයා සර්පිනාවෙන් වයා ගයමින් ශ්‍රවණයට සලස්වන්න. සම්පූර්ණ ගීතයම සිසුන්ට ගැයීමට පුහුණු කරවන්න. තාල වාදනය හුරු සිසුන් සිටී නම් පහත රට බෙරය වැයීමට සලස්වා සමූහය සමඟ ගායනය පුහුණු කරවන්න. ස්වර වාද්‍ය භාණ්ඩ වාදනය සඳහා ද සිසුන් යොදවන්න.
කාලච්ඡේද 01 යි

- නිර්දේශිත සඳ කිඳුරු කෝළමේ ගීතය ක් ද ජසලෙංචිනා කෝළම් ගීතයක් ද යොදා ගනිමින් ඉහත ආකාරයට ම ගායනය කිරීමට සිසුන් පුහුණු කරවන්න.
කාලච්ඡේද 01 යි

ඇමුණුම - 01

ප්‍රවේශය -

වෙස්මුහුණු ඇතුළත් වර්ණ පින්තූරයක් හෝ ඡායාරූප සිසුන්ට සපයන්න. එක් එක් වෙස් මුහුණ ගැළපෙන චරිතය නම් කිරීමට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම අංක 01

පහත දැක්වෙන ශීර්ෂ අළලා කෝළම් රංග සම්ප්‍රදාය පිළිබඳ ලිපියක් සකස් කරන්න.

කෝළම් රංග සම්ප්‍රදායේ උපත පිළිබඳ ජනප්‍රවාද හා ප්‍රචලිත ප්‍රදේශ

කෝළම් රංග සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණ

- රංග භූමිය පිළිබඳ
- චරිත පිළිබඳ
- රංග වස්ත්‍රාභරණ
- කථා පුවත්
- යොදාගත් කාලය
- රඟ දක්වන පිළිවෙල

කෝළම් රංග සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ

- පහත රට ශාන්ති කර්ම වල ආභාෂය
- තනුවල ස්වර පරාසය හා ස්වභාවය
- ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගායනා
- යොදාගත් සංගීත භාණ්ඩ
- ගීත වල තාල ලක්ෂණ , ගමන් තාල , බෙර පද

චරිත ලක්ෂණ කියා පෑමට වෙස් මුහුණු වලින් ලැබෙන පිටිවහල

- හාස්‍ය ජනක බව උපහාසාත්ක බව ගැබ්වී ඇති අයුරු
- කෝළම් සංගීත ශෛලිය හෝ රංග ශෛලිය නූතන නිර්මාණ කෙරෙහි බලපා ඇති ආකාරය

නිර්දේශිත කෝළම් ගීත

මං ලෙස සොබනා - (ලෙංචිනා ගයන ගීතයක්)
මිණි විසිරිය - මුදලි ගයන ගීතය
සඳගිරි මුදුනා - (සඳකිඳුරු කෝළම් ගීතයක්)
පෙමාදර වූ මගේ - (සඳුකිඳුරු කෝළම් ගීතයක්)

මං ලෙස සොබනා
බලනු මගේ රන්රුව ලෙසිනා
බබලමින නීලවරල සිකිපීල ලෙසින් බැඳ
වළායටින් චන්ද්‍රය පැයු ලෙද

සඳ කිඳුරු කෝලම

කිඳුරා - පෙමාදර වූ මගේ රූසිරු ලඳලිය මෙවදනා කන්
යොමා අසනු නුඹ කෝපය නොවසිත් කුළුනිනා
අමා සැපක් විඳ සිටියෙමු එක පන විලසිනා - අපි
ළමා වයසේ සිට කල් බැඳ එකතැන වැජඹුනා

කිඳුරි - චිරාකලක් වසනෙමි කල් බැඳ සෙනෙහස මෙනා - ඔබ
හැරා වෙනත් හිමි නොපතම් මමනම් කිසි දිනා
චිරා ලෙසට පතිදම් සුරකිමි මතු සැප ගැනේ - හිමි
කඳා මෙමගේ දිවි නැසුනත් එකසිත මයි අනේ

කිඳුරා කැළුම් විහිදි දිගු වරලස සිකිපිල විලසිනා - යස
නුවන් දිලෙයි දිගු නිල්මිණි පරදන අයුරිනා
සුරංගනක් වැනි නුඹ ගැන මගෙ සිත තුටු උනා - අද
යමන් සොඳුර අපි සඳගිරි පව්වට එකඟිනා

කිඳුරි රුවන් සපිරි සුර කුමරෙක් දැයි ඔබ සිරි දැරූ - මම
නිරන්තරව ඔබෙ තෙපුලට වෙමි සිත පියකරු
ගිමන් නිවා අපි සෙවනක ඉඳ යමු මන පිරූ - අනේ
කියන් මහිමි ඔබ සඳගිරි පව්වෙහි විසිතුරු

පෙමාදරවු මගේ රුසිරු ළඳලිය ගීතයේ ස්වර ප්‍රස්තාරය

+ + +	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
- - -	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	- - - -

මං ලෙස සොබනා ගීතයේ ස්වර ප්‍රස්තාරය

+ + +	[illegible]	[illegible]	[illegible]
- - -	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
- - -	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
- - -	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	[illegible]
[illegible]	[illegible]	[illegible]	- - - -

ඇගයීම -

- පූර්ව රංගනය සඳහා යොදා ගත් කෝළම් චරිත කිහිපයක් හඳුන්වන්න.
- අපර රංගනය සඳශා යොදා ගත් කෝළම් කථා වස්තු දෙකක් නම් කරන්න.

මූලාශ්‍ර

- කෝළම් - එම්. එච්. ගුණතිලක
  සිංහල ගැමි නාටකය - එදිරිවීර සරත්චන්ද්‍ර
  සිංහල කෝළම් සම්ප්‍රදාය - ගාමිනි දැලබණ්ඩාර

නිපුණතාව 7.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳී සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ /වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 7.1.3 : නූර්ති ගීත අසා රස විඳිමු.

ඉගෙනුම් ඵල :
- නූර්ති රංග ශෛලිය පිළිබඳව විස්තර කරයි.
- නූර්ති සංගීතයේ ඇති විවිධ ලක්ෂණ හඳුනා ගනිමින් නූර්ති ගීත ගායනය කරයි.

කාලය : කාලච්ඡේද 07

ගුණාත්මක යෙදවුම් : නූර්ති ගීත තැටි ගත කළ කැසට් පට, කැසට් යන්ත්‍ර, සර්පිනාවක් තබ්ලාවක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

: පහළ ශ්‍රේණිවල සිට 12 ශ්‍රේණිය තෙක් සිසුන් විසින් මේ වනවිට නූර්ත ගීත කිහිපයක් ගායනය වාදනය කිරීමේ හැකියාව ලබා ඇත. එම විවිධ නූර්ති ගීත හා දැනට ප්‍රචලිතව නූර්ති ගීත කෙරෙහි අවධානය යොමු කරලීමටත් එම ගීත රසාස්වාදය කිරීමටත් පෙලඹවීමක් ඇති කිරීම මේ ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. මේ පිළිබඳව වැඩිදුර අධ්‍යාපනය සඳහා පහත සඳහන් පොත් පරිශීලනය කිරීම ඔබට පහසු වනවා ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ඇමුණුම 01 හි දැක්වෙන වගුව ප්‍රදර්ශනය කර එහි ඇති ගීත කොටස් ගයා වයා පෙන්වා. අදාළ රාග සොයා ගැනීමට සිසුන්ට සහායවන්න. රාගශ්‍රීත නූර්ති ගී ඇතුළත් ලැයිස්තුවක් සපයන්න. එහි ඇති ගීත හා ඒවා බැඳුනු රාග නම් කරන්න.
- ක්‍රියාකාරකම 2 යොදා ගනිමින් නූර්ති ගීත වල හින්දුස්ථානි ශිල්පාංග ඇති අවස්ථා සිසුන් සමග සාකච්ඡා කරන්න. විවිධ තාල භාවිත වූ අවස්ථා දැක්වෙන නූර්ති ගීත විමසන්න. (තානාලංකාර, දොහොරා, (බෝල් ආලාප) විවිධ තාලරූප භාවිත කළ ගීත වෙන්කර හඳුන්වා දෙමින් දැනුවත් කරන්න.

  කාලච්ඡේද 02 යි
- මාධ්‍ය මගින් නිතර ඇසෙන නූර්ති ගී පිළිබඳව සිසුන් ගෙන් විමසන්න. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට ක්‍රියාකාරකම 3 යොදාගන්න. සිසුන් දන්නා ගීත සිසුන් සමග ගායනා කරන්න.

  කාලච්ඡේද 01 යි
- ප්‍රායෝගික ඇගයීම් සඳහා පහත දැක්වෙන නූර්ති ගීත අතරින් ගීත දෙකක් රසවත්ව ගායනයට යොමු කරන්න.

බන්දා මා දේදො පියාණෝ	- රාමායණය
සීතා මා සිරියා ඉන්නේ	- රාමායණය
සෝබ මාන දේව පුරා	- පත්මාවතී
සිරියාවී කීව දේ හරි	- ශ්‍රී වික්‍රම
සිරසා පුදාලා පාරමී දම්	- සිරිසඟබෝ
පායන මේ බැද්දෙ	- රාමායණය
යමු දේවී බොහොම මාන්සිවී	- වෙස්සන්තර

කාලච්ඡේද 01 යි

ඇමුණුම 01

පහත දැක්වෙන වගුව ප්‍රදර්ශනය කර එක් ශීර්ෂය ඔස්සේ සිසුන් සමග සාකච්ඡා කරමින් වගුව සම්පූර්ණ කිරීමට අවස්ථාව සලස්වන්න. ගීත කොටස් ගායනය කර මින් ආශ්‍රය කරගෙන ඇති රාගයේ ස්වභාවය පැහැදිලි කරන්න.

ගීතය	ස්වර ප්‍රස්තාර කොටස - විශේෂතා	රාගයේ නම
ලෝනා මුනි රාජගේ	ස, රිම, පධමප ප ඊ රි ස, ප ධ ම ප, ධ නි ස්,	ජෞනපුරී
අප ගුණ සරු සිංහල	කෝමළ, රි ග ධ නි ඇතුළත් විම ශුද්ධ ස්වර -- ස්වර වශයෙන් ඇතුළත් වීම තී ව්‍ර ම යෙදීම	භෛරවී
තුම් ශ්‍රී සෝබනා	ම ප ම පධප, ම සමගපමධප	කේදාර්

රාගාශ්‍රිත නූර්ති ගී සමහරක් අතරින් පහත දැක්වෙන ගීත කොටස් ගයා, වයා පෙන්වන්න. ගීතය හා බැඳි රාගයේ විශේෂ ස්වර සංගති කිහිපයක් ද ගයා වයා පෙන්වමින් නූර්ති ගීත රාග පදනම් කරගෙන නිර්මාණය වී ඇති අයුරු පහදා දෙන්න.

සිරි සංඝබෝධි - පීළු රාගය
පුත්‍ර පුත්‍රී (වෙස්සන්තර) - කාලිංගඩා
දැන් භාරි තේරී - ජිංජුටි
මිහිරි නාද - සෝරට්

ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන ගීත ගයා දොහොරාව, තානාලංකාර, තිහායි, ධ්‍රැපද් ශෛලිය ආදි හින්දුස්ථානි අංග ඇතුළත්ව ඇති ආකාරය විමසන්න. එම ගීත කොටස් ගායනය කර එම විශේෂ ශිල්පාංග සිසුන්ට හඳුන්වා දෙන්න.

ගීතය	විශේෂිත කොටස යෙදෙන ස්ථානය	විශේෂිත කොටස
සෝබමාන දේව පුරා	සදිසි සාරල ක් දිවේ අතීත කාලේ සෝ ..... බ නා	තානාලංකාර
වාසනා දිනෙකි	කෝමළ මධුර බසිනී	දොහොරාව
මෝක්ෂාචාර්ය තිලෝනාගේ	චෞතාලය මත බැඳුනු	ධ්‍රැපද් (ධ්‍රැපද්) ශෛලිය
පායන මේ බැද්දෙ	ඛ්‍යාල් ශෛලිය	විලම්භලය ගී
දීපේ ථූප විහාරා	එකම පද කොටසක් විවිධ තාලවලට ගැයීම	ගායකී ශෛලිය

විවිධ තාල සහ තාල රූප කිහිපයක් භාවිත කළ නූර්ති ගීත ගයා වයා පෙන්වන්න.
පෙම්බර දේවී (කෙහෙර්වා - බෙම්ටෝ)
වාසනා දිනේකි (බෙම්ටො - කෙහෙර්වා)

ක්‍රියාකාරකම් 03

මාධ්‍ය තුළින් ජනප්‍රියව ඇති පහත දැක්වෙන නූර්ති ගීතවල තනුව සර්පිනාවෙන් වයන්න. ගායනය කර පෙන්වන්න. එය ශ්‍රවණයට සලස්වන්න.

- දැක්කොත් පද්මාවතී
- ශ්‍රියා මනමත්වී
- හරිමි රජ සැපා
- අඹ දඹ නාරං
- සීතා මා සිරියා ඉන්නේ
- දන්නෝ බුදුන්ගේ
- බෝ දොස් කියා
- ආරන්නේ ඉන්නා
- ඇයි තරහෙන්
- සෝකෙන් පල නෑ
- ඇස ප්‍රීති කරන
- දන්න වංහුං
- මා ළද වත තාරපතී.

ඇගයීම -

- දාදරා, කෙහෙර්වා , ත්‍රිතාල් , දීප් චන්ද හා බෙම්ටෝ තාලවලට ගැළපෙන නූර්ති ගීත පෙළ ගස්වන්න.
- වාදනය කරන සිසුන් නූර්ති ගීතයක් වාදනය කරන විට ගායනය කරන සිසුන් සාමූහිකව එය ගායනය කිරීමට යොමු කරන්න.

මූලාශ්‍ර -

- ස්වර ලිපි සහිත සිංහල නෘත්‍ය ගීත - විල්මට් පී විජයතුංග
- ශතක සත්සර ටවර් ගී සරණිය - ස්ටැන්ලි පෙරේරා
- නෘත්‍ය ගීත ශතකය - ලයනල් ගුණතිලක

ක්‍රියාකාරකම් සැලසුම -45

නිපුණතාව 7.0 : ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳී සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

නිපුණතා මට්ටම 7.1 : ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ /වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 7.1.4 : නාඩගම් රංග ශෛලිය සහ ගීත රසාස්වාදය

ක්‍රියාකාරකම සංවර්ධනය :
- නාඩගම් රංග ශෛලිය පිළිබඳව හඳුනා ගනියි.
- නාඩගම් සංගීත ශෛලියට අයත් විවිධ ශිල්පීය කොටස් හඳුනා ගනිමින් ගායනා කරයි.

කාලය : කාලච්ඡේද 06

ගුණාත්මක යෙදවුම් : සර්පිනාවක්, තබ්ලාවක්, මද්දලයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: 10, ශ්‍රේණියේ දී සහ 11 වන ශ්‍රේණියේ දී නාඩගම් සහ නූර්ති සංගීතයේ සංසන්දනාත්මක වෙනස්කම් පිළිබඳ ළමුන් අධ්‍යයනය කර ඇත. 12 වන ශ්‍රේණියේ දී නාඩගම් රංග ශෛලිය සහ එහි සංගීත ශෛලියට ඇතුළත් විවිධ ශිල්පීය කොටස් අඩංගු ගීත ගායනය වාදනය කිරීම සිසුනගේ නිපුනතවයන් වර්ධනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ඉලක්කයකි. වැඩි දුර අධ්‍යයනය සඳහා පරිශීලනය කළ හැකි පොත් කිහිපයක් පහත දැක්වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- 10, 11 ශ්‍රේණිවලදි අධ්‍යයනය කළ නාඩගම් සම්බන්ධ පාඩම්වල එන නව නාට්‍ය ගී හා නාඩගම් ගී පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. අළුතින් එක්වූ කරුණු සම්බන්ධයෙන් සිසුන් හා සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම් අංක 01 හි යොදවන්න.

  කාලච්ඡේද 02 යි

- නාඩගම් සංගීතය භාවිතයෙන් ඉන්නිසය ගායනය ගැන කෙටියෙන් හඳුන්වා දෙන්න. මේ සඳහා පටිගත කළ කොටසක් ශ්‍රවණයට සලස්වන්න. ඇමුණුම අංක 02 භාවිතා කරන්න.

  කාලච්ඡේද 01 යි

- නාඩගම් සංගීතයේ භාවිතා වන්නා වූ තෝඩායම කොටස ගැන කෙටියෙන් හඳුන්වා දෙන්න. මේ සඳහා පටිගත කළ කොටසක් ශ්‍රවණයට සලස්වන්න. ඇමුණුම අංක 02 භාවිතා කරන්න.

  කාලච්ඡේද 01 යි

- පොතේ සින්දු ඇතුළත් ගීයක් ශ්‍රවණය කිරීමට සලස්වා එය ගායනය කිරීමට හුරු කරවන්න.

  කාලච්ඡේද 01 යි

- උරුට්ටුව සහිත නාඩගම් ගීතයක් ශ්‍රවණය කිරීමට සලස්වා එය ගායනය කිරීමට හුරු කරවන්න. ඇමුණුම් අංක 2 භාවිතයට ගන්න.

  කාලච්ඡේද 01 යි

ඇමුණුම අංක 01

නාඩගම්වල ආරම්භය.

- වසර 200 කට ආසන්න ඉතිහාසයකට නාඩගම නැකම් කියයි.
- ජනප්‍රවාදයේ ඇත්තේ පැරණිතම ග්‍රන්ථාරූඪ නාඩගම් රචනය පිලිප්පු සිංඤෝ නම් අයකුගේ බවට යි.
- ඔහු විසින් රචනා කරන ලදැයි සඳහන්ව ඇති නාඩගම් මෙසේ දක්වමු.
- ඇහළේපොළ, මාතලන්, සෙංගප්පු, සිංහවල්ලි, ජුසේපුත්, සුසේච්, හෙලේනා, විශ්ව කර්ම, රජතුන්කට්ටුව, සුලඹාවතී, හුණුකොටුවේ යන නාඩගම් හැඳින්විය හැකිය.

  (මේවායේ නිර්මාණ කරුවන් පිළිබඳ කතා බහ විවිධ නිසා මේ සියල්ලම පිලිප්පු සිංඤෝ මහතා, විසින් නිර්මාණය කරන ලදැයි කීමද අපහසු ය.)
- ඉන්දියාවේ තෙරුක්කුත්තු නම් වීදී නාට්‍ය ගී තනුවල ආභාෂය ලංකාවේ නාඩගම් තනු සඳහා බලපා ඇති බව ද පොත් පත් වල සඳහන් වේ.
- සමහර නාඩගම් තනුවලට කතෝලික කන්තාරු ගී තනු බලපා ඇත.
- ලංකාවේ වෙන්නප්පුව, හලාවත, මීගමුව, තංගල්ල, හික්කඩුව හා බලපිටිය යන ප්‍රදේශවල ව්‍යාප්තවුණි.
- හරිස්චන්ද්‍ර නමින් ලංකාවේ නිපදවූ ප්‍රථම නාඩගම සඳහා අලගනායිදු නම් ද්‍රවිඩ සංගීතඥයෙකු සම්බන්ධ වී ඇත.
- ප්‍රථම සිංහල නාඩගම පිලිප්පු සිංඤෝ ගේ ඇහැළේපොල නාඩගමයි.
- චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාසේ විසින් වෙස්සන්තර, විදුර , දික්තල කාලගෝල වැනි නාඩගම් රඟ දක්වා ඇත්තේ ඊට පසුව යි.
- පසු කාලීන ව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් එම නාඩගම් ආශ්‍රිතව මනමේ, සිංහබාහු නාට්‍ය නිපදවීය.
- නාඩගම් සංගීතය සඳහා මද්දල් දෙකකින් අඩුතාල්, වැඩිතාල් වාදනය කිරීම විශේෂ ලක්ෂණයක් විය.
- නාඩගම් චරිත අතර පොතේ ගුරු, සෙල්ලම් ළමා වැනි චරිත දක්නට ලැබේ.
- නාඩගම් රංග සම්ප්‍රදාය ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායට අයත් වේ.
- දකුණු ඉන්දීය කර්ණාටක සංගීතය මේ සඳහා බලපා ඇත.
- දෙබස් ගායනය, ගමන් තාල ඒ ඒ චරිත සඳහා වෙන් වූ මද්දල් පද භාවිතා කිරීම නාඩගම් හි විශේෂ ලක්ෂණය කි.
- සිංහල රාජ වංශයේ අවසන් රජතුමා වූ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ දී එතුමාගේ නායක්කාර් වංශික බිසව ගේ පරිවාර සෙනඟ සමග මෙරටට පැමිණි , ද්‍රවිඩ සංගීතඥයෙකු වූ, අලගනායිදු විසින් ලංකාවේ නාඩගම් ප්‍රචලිත කළ බවද තවත් මතයකි.

නාඩගම් සංගීතය.

ප්‍රධාන සංගීත සම්ප්‍රදාය වන්නේ දකුණු ඉන්දීය කර්ණාට සංගීතයයි.
සමහර නාඩගම් තනු කතෝලික කන්තාරු ගී ආභාසයෙන් ගැයේ.

නාඩගම් ගී තනු සඳහා පාදක වී ඇති දක්ෂිණ භාරතීය මේල

1. ශංකරාභරණම් මේලය (බිලාවල්)
   ස රි ග ම ප ධ නි
2. හරිකාම් භෝජ - (බමාජ්)
   ස රි ග ම ප ධ නි
3. කරහරප්‍රිය - (කාෆි)
   ස රි ග ම ප ධ නි
4. හනුමත්තෝඩි (භෛරවී)
   ස රි ග ම ප ධ නි

නාඩගම් ගී වල ස්ථායි අන්තරා ගීත ආකෘතිය වෙන් කොට දැක්විය නොහැක.
උරුට්ටුව නමින් හැඳින්වෙන අලංකරණය හෙවත් ආභරණය අරුත් ඇති ලය, රිද්මය, තනු රටාව වෙනස් විශේෂ තනු කොටසක් ඇත.
නාඩගම් ගී පාදයක හෝ ඛණ්ඩයක අග පිහිටන කිසියම් ගීතාක්ෂරයක් උච්ච ස්වර රටාවක් අනුව තාලය නොබිඳෙන සේ ඇද පැද ලෙලවා ගැයීම අංගහාරන් වශයෙන් සැළකේ.

ලංකාවේ සින්දු නාඩගම් අතර වඩාත් ප්‍රචලිත නාට්‍ය නිෂ්පාදන හා රචකයින් (නිෂ්පාදකයින්)

නාඩගම	නිෂ්පාදක හෝ රචකයා
ඇහැළේපොල මාතලන් සිංහවල්ලි ස්ථාක්කි	පිලිප්පු සිංඤෝ '' ''
රජ තුන්කට්ටුව ඉයුජීන් බැලසන්ත බ්‍රම්පෝඩ් වෙස්සන්තර බුවනෙකබාහු ජොහානා	ක්‍රිස්තියන් පෙරේරා
වෙස්සන්තර විදුර දික්තල කාලගෝල සිංහ වල්ලි	චාල්ස් සිල්වා ගුණසිංහ
කටු ඔටුන්න සුලඹාවති	ක්ලෙමන්ට් මිහිඳුකුළසූරිය අධිනීතිඥ ස්ටීවන් අතුකෝරළ

රචකයින් නිර්ණාමික නාඩගම් කෘති

මුවන් තිස්ස, ලියනෝරා, ලෙන්චිනා, පත්මමාලා, කැකිල්ලේ, චූලනී

ක්‍රියාකාරකම් සංවර්ධනය 01

පහත දැක්වෙන ඡේදය හොඳින් නිරීක්ෂණය කරන්න. ඇමුණුම අංක 01 හි තොරතුරු මගින් ඡේදය සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

ලංකාවේ ප්‍රථම සිංහල නාඩගම. නිර්මාණය කළේ ..... එය නමින් ..... විය. ඊට අමතරව ....., ... , ... වැනි නාඩගම් ද සඳහන් කළ හැක. මේ නාඩගම් තනු නිර්මාණය සඳහා ..... සහ ..... හි ආභාසය බලපා ඇතැයි මතයක් වේ. ..... සංගීත සම්ප්‍රදායේ ..... හා ..... ද ඒ සඳහා ම වෙන් වූ ..... නම් අවනද්ධ භාණ්ඩය ද මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ හැක. නාඩගම් ගීත වල ..... ආකෘතිය දක්නට නොලැබේ. විශේෂ අලංකාර කොටසක් වූ ..... නම් කොටසක් මගින් තාල, ලය අලංකාරවත් වේ. ....., ..., ... වැනි සුවිශේෂී අංග ගායනයේ දී ඉස්මතු වේ.

ගුරුවරයාට උපදෙස්-

ඔබට අභිමත පරිදි ක්‍රියාකාරකම් අංක 01 වෙනස් කර ගත හැක.

ක්‍රියාකාරම් අංක 02

- මේ සඳහා පුණ්‍යසේන ගුණසිංහ මහතා ගේ සිංහල නාඩගම් ගී සරණිය ග්‍රන්ථයේ එන ගීත යොදා ගන්න.
- මේ අනුව ඉන්නිසය, තෝඩායම, පොතේ සින්දුව, උරුට්ටුව ඇතුළත් ගීත තෝරා සිසුන්ට ගායනය හුරු කරවන්න.
- මීට අමතරව ඉහත ගායනා සඳහා සුදුසු ගීත වෙනත් නාඩගම් ආශ්‍රයෙන් ද තෝරා දැක්විය හැකි ය.
- ඉන්නිසය සහිත ගීතය ගායනය/වාදනයට හුරු කිරීම

  කාලච්ඡේද 01

- තෝඩායම සහිත ගීතය ගායනය/වාදනයට හුරු කිරීම

  කාලච්ඡේද 01

- පොතේ සින්දුව ගායනය/වාදනයට හුරු කිරීම

  කාලච්ඡේද 01

- උරුට්ටුව ඇතුළත් ගීතය ගායනය/වාදනයට හුරු කිරීම

  කාලච්ඡේද 01

පොතේ ඉන්නිසය

පළල් දිගු අත්වලින් යුත් සුදු ලෝගුව හා හිසට සුදු ජටාව පොතේ ගුරුන්නාන්සේගේ සාම්ප්‍රදායික වේශය වේ. ප්‍රේක්ෂකයන්ට නළු නිළියන් හඳුන්වාදීම මෙන් ම වේදිකාව මත දර්ශනය නොවන අවස්ථා ද ගීතයෙන් ඉදිරිපත් කිරීම කරනු ලබන්නේ පොතේ ගුරුන්නාන්සේ ය. මොහු ගයන ගීත ඉන්නිසය නම් වන අතර එය අපතාලාත්මක ව ගයනු ලැබේ. ඉෂ්ට දේවතාරාධනාවෙන් යුක්ත වූ මෙම ගීතය මූලාරම්භය කියාත්, පොතේ කවිය කියාත්, පූර්ණ විරිදුව කියාත් හැඳින්වේ. මෙහි දැක්වෙන්නේ වෙස්සන්තර නාඩගමෙහි එන පොතේ ඉතිහාසයයි.

නාඩගම් - වෙස්සන්තර
රචක - චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

සසර සයුරෙහි
පොතේ ඉන්නිසය.

සසර සයුරෙහි සරණ නොවිතර සතන් වෙත මෙත් කුළුණි — නා
විතර නොවු ඉස් - මස් - ලේ සුතනඹුන් දන් දෙමින් පෙරුමන් ම — නා
සපුරමින බුදු පදවි ලැබතුම් දෙසු සද්ධර්ම වාස — නා
වැතිර නමදිමි මුනිඳු සිරිපද අපරිමිත භක්ති ප්‍රේමෙ — නා



තෝඩායම

ප්‍රාරම්භක ගීය ගයනු ලබන්නේ තාල රහිත ව කවියකට සමාන ලෙසට ය. පොතේ ගුරුන්නාන්සේ විසින් ගායනා කරනු ලබන මෙය තාලානුරූප වූ ගීතයකි. ප්‍රාරම්භ ගීයේ ම අවශේෂ කොටසක් සේ සැළකිය හැකි මෙය තෝඩායම නමින් හැඳින්වෙන දේවාරාධනවකි. පොතේ සින්දුව, පූර්ණ සින්දුව වශයෙන් හැඳින්වෙන්නේ ද මෙය ම ය. තෝඩායමෙන් කෙරෙන්නේ නමස්කාරය හා ප්‍රේක්ෂකයන්ගෙන් සමාව අයැදීම ය.

නාඩගම් - වෙස්සන්තර
රචක - චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

අවිදු ගණ අඳුර බිඳ
- තෝඩායම -

අවිඳු ගණ අඳුර බිඳ - බුදුව මරසෙන් පැරදු
සැදුව නිවන් පුර සොඳ - මුනිඳු සිරිපා නමෝ නමා
දෙවනු වැඳ දම් රුවන - එමෙන සඟරත්නෙ ගරු
නැමැද සිත බෝ බැතින - ගොතමි පද මේ ලෙසා
බ්‍රහ්ම සුරවර නිතර - පත්මපාල කඳ කුමරු
නිතනේ සිරි මෙ දෙවිවර - ගැත් අපට පිහිටනා

තාලය - කෝබහාරා පසන්



නාඩගම - ජොහානා
රචක - නිර්නාමිකයි

උත්තමවන් ලොව
සින්දුව

සෙන්පති - උත්තමවන් ලොව පතලා
එංගලන්ත නමින් යුතු විපුලා
තුංග සිරින් රැන්දු සකලා
දේස ලන්ඩන් පුරවර නිමලා

ඉන්නේ රජ සෙවනේ නිති ගම්භිර ...
ලන්නෙ රුපුන් ආවොත් යුධ සූන්කර
පෙන්න විකුම් මාගේ තෙද මහිමේ බලපා මේ
පන්නා බිඟු පන්නා යන වැන්නා කෙසරින්දු
සුන්නා කර ලන්නා බල පෙන්නා අද තීන්දූ

දක්ෂ විකුම් අප්‍රමාණා
ඇත ලක්ෂ ගණන් යුද්ධ සේනා
රක්ෂණයෙන් මුලු දෙරණා
භීත නිස්ස ලෙසින් නෂ්ඨ කරනා
ගත්ත කගිත් පරසක් වන සන්නට
දුෂ්ඨ දනන් සැම භංග කරන්නට
පෙන්න විකුම් මාගේ තෙද මහිමේ බලපාමේ

බහුබූතයා

නාඩගමක ප්‍රථමයෙන් ප්‍රේක්ෂක හමුවට පැමිණෙන්නේ බහුබූතයා ය. ඔහුට කෝමාලි, බහුබූත කෝලමා, කෝලමා, කෝනාංගි යනාදී නම් ද ව්‍යවහාර කෙරේ. සිංහල නාඩගමෙහි බහුබූතයා පැළඳ ආවේ හාස්‍ය ජනක ඇඳුමකි. තද කලිසමක් ද මඳක් බුරුල් හැට්ටයක් ද හැඳ හිසෙහි උල්වූ, වක් ගැසුණු තොප්පියක් පැළඳ රැළි දමන ලද ඉන හැඩයක් ද ඔහුගේ ඉඟටියෙහි බැඳ ගනී. කලිසමෙහි හා හැට්ටෙහි වර්ණ අල්ලි පේළියට අල්ලා ඇත. මොහු පැසුණු රැවුලකින් ද යුක්ත ය.

පොතේ විරුදුවෙන් පසු පොතේ ගුරුන්නාන්සේ ගායනා කරන පොතේ සින්දුවේ තාලයට නටමින් කරලිය දෙපසින් වේදිකාවට පිවිසෙන බහුබූතයන් දෙදෙනාගේ ගී මගින් දැක් වේ.

පූර්ව රංගය - බහුබූත කෝලම නොහොත් කෝනංගි
රචක - නිර්නාමිකයි.

පොතේ සින්දුව

කේස පැසී වඳුරෙක්සේ //
මූගේ වාසෙ නිතර පිළිකනු අගු අස්සේ
දෑස ඔරව රකුසෙක් සේ
නිති පහස විඳින්නට මයි සිතු ආසේ
ජැන්ඩිය මූ පෙන්වන්නේ
රා මණ්ඩි සොයා තැන තැන ඇවිදින්නේ
කන්ඩ නැතිව කුස ගින්නේ
මුගෙ කැතේ දුටුව කව්රුත් නොව කිට්ටු
සිතේ බොහොම ඕරුට්ටු ...

ප	ප	-	ප	-	ම	-	ග	රි	-	ශ	-	රි	-
කේ	ස	ස	ස	ස	පැ	ස	සි	ස	ස	ව	ස	දු	ස
ප	නි	-	ස	-	-	-	-	-	-	ස	-	නි	-
රෙ	කු	ස	සේ	ස	ප	ස	ස	ස	ස	මූ	ස	ගේ	ස
ප	රි	-	ග	-	රි	-	ග	ම	-	ම	-	ම	-
වා	ස	ස	සේ	ස	නි	ස	න	ර	ස	පි	ස	ළි	ස
ග	ම	-	ග	-	පි	-	ප	රි	-	ග	-	-	-
කු	ස	නු	අ	ස	ගු	ස	අ	ස්	ස	සේ	ස	ස	ස
ග	ප	-	ප	-	ම	-	ග	රි	-	ග	-	රි	-
දැ	ස	ස	ප	ස	ම	ස	ර	වා	ස	ර	ස	කු	ස
ප	නි	-	ප	-	-	-							
යක	ක්	ස	සේ	ස	ස	ස							

ඇගයීම -

- නාඩගම් නාට්‍ය ශෛලීයේ සුවිශේෂී ලක්ෂණ 3 ක් නම් කරන්න.
- ඉන්නිසිය, තෝඩායම, පොතේ සින්දුව, උරුට්ටුව උදාහරණ දක්වමින් විස්තර කරන්න.

මූලාශ්‍ර

- සිංහල නාඩගම් ගී සරණිය - පුණ්‍යසේන ගුණසිංහ
  සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

ඇගයීම 12

1. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -**

ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

2. **විෂය සන්ධාරය -**

නිර්දේශිත රංග සම්ප්‍රදායන්හි ගීත ගායනය වාදනය

3. **උපකරණයේ සවභාවය**

ප්‍රායෝගිකව ගායනයේ / වාදනයේ යෙදවීම.

4. කාලය - කාලච්ඡේද 04

4. අරමුණු -

- රංග සම්ප්‍රදායන්හි ගීත නිවැරදිව ගායනය වාදනය කරයි.
- එම රංග ස්වභාවයන් පැහැදිළි කරයි.
- නාඩගම් සම්ප්‍රදායේ හා නූර්ති සම්ප්‍රදායේ විවිධ අංග වලට ඇතුළත් ගීත තනු ප්‍රායෝගිකව ඉදිරිපත් කරයි.
- හින්දුස්ථානි සංගීතයේ වාදන ශෛලියේ ගත් ගීතවලට පරිවර්තනය වූ අවස්ථා පිළිබඳව සොයා බලයි.

උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- ශ්‍රැතිය, ස්වරස්ථාන රැකගනිමින්, සොකරි හා කෝළම් රංග සම්ප්‍රදායනට අයත් ගීත දෙකක් ගයවන්න.
- එම රංග ශෛලීන් පිළිබඳව වගුව සම්පූර්ණ කිරීමට සලස්වන්න.

රංග සම්ප්‍රදාය	රංග ශෛලිය කෙටියෙන්	සංගීතය පිළිබඳ අදහස්	ගැමි නාටකයේ විශේෂතා
සොකරි			
කෝළම්			

- පහත සඳහන් ප්‍රශ්නවලට ලිඛිතව හා ප්‍රායෝගිකව පිළිතුරු ලබා ගන්න.
- දොහොරාව සහිත නූර්ති ගීතයක දොහොරාව කොටස ගැයීමට සළස්වන්න.
- ඉන්නිසය සහිත නාඩගම් ගීතයක් ගයවන්න.
- නූර්ති සංගීතය ශෛලියේ හින්දුස්ථානි සංගීතයේ බලපෑම පිළිබඳ කරුණු හතරක් දක්වන්න.

නිර්ණායක -

1	සොකරි හා කෝළම් ගීත නිවැරදිව ගායනා කිරීම	ලකුණු 04
2	එම රංග ශෛලීන් පිළිබඳව ලිඛිත අදහස් දැක්වීම	ලකුණු 04
3	දොහොරාව සහ නූර්ති ගීතයක් ගායනයට	ලකුණු 04
4	ඉතිහාසසය සහිත නාඩගම් ගීතය ගායනයට	ලකුණු 04
5	නූර්ති සඳහා හින්දුස්ථානි සංගීත ශෛලියේ බලපෑම දැක්වීමට	ලකුණු 04

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.1 : රිද්මය, තාලය ලය සහ ස්වර නිර්මාණයකදී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූලව නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.1.1 : නිර්මාණකරණය සඳහා රිද්මය හා තාලය

ඉගෙනුම් ඵල :
- තාලයේ සහ රිද්මයේ ගති ලක්ෂණයන්හි වෙනස හඳුනා ගනියි.
- සංගීත නිර්මාණයේ දී යොදා ගන්නා විවිධ රිද්ම රටා පිළිබඳව හඳුනා ගනිමින් නිර්මාණයෙහි යෙදෙයි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : රිද්ම රටා වාදනය කිරීමට සුදුසු උපකරණ හෝ අවනද්ධ භාණ්ඩ

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: සංගීත නිර්මාණයක තනුවේ නිර්මාණාත්මකභාවය මෙන්ම යොදා ගන්නා තාලයේ සහ රිද්මයේ ගති ලක්ෂණය ද භාව ප්‍රකාශනය සඳහා වැදගත් වේ එකම තාලයක් වුවත් යොදා ගන්නා රටාවේ වෙනස්කම් නිසා ඉන් මතුවන හැඟීමේ ස්වභාවය එකිනෙකට වෙනස් වේ. නිර්මාණකරණය සඳහා යොමුවන සිසුන්ට මේ පිළිබඳ අත්දැකීම් ලබාදීමටත් විවිධ රිද්ම රටා නිර්මාණ සංගීතයේ දී යොදා ගැනීමට මග පෙන්වීමත් මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :

ප්‍රවේශය - සපයාගෙන ඇති උපකරණ හෝ අවනද්ධ භාණ්ඩ මගින් සිසුන් ලවා වාදනය කර එහි ස්වභාවය විමසමින් ක්‍රියාකාරකමට පිවිසෙන්න. ඇමුණුම අංක 01 ක්‍රියාකාරකම මේ සඳහා යොදා ගන්න.

ක්‍රියාකාරකම 01

01 පියවර -

1. පහත දැක්වෙන තේමාවන් හා බැඳි ප්‍රචලිත ගීත නාමාවලියක් සිසුන් සමග ගොඩ නගන්න.
   - වීර රසය ඉස්මතු වන ගීත සහ එම සමස්ත ගීතයම නිර්මාණයට පදනම් වී ඇති රිද්මය සහ ලය පාලනය
   - ශෝක රසය මතු වී ඇති ගීත සහ එම සමස්ත ගීතය නිර්මාණයට පදනම් වී ඇති රිද්මය සහ ලය පාලනය
   - මව් - පිය ගුණ වර්ණනා ඇතුළත් ගීත සහ එම සමස්ත ගීතය නිර්මාණය වී ඇති රිද්මය
2. ඉහත ගීත නිර්මාණය වී ඇති රිද්මය ලය පාලනය සහ කාල පරිහරණය, එම ගීත වල අදහස සමග ගැලපීම පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න.
3. පහත දැක්වෙන අදහස් සමග රිද්මයේ ගති ලක්ෂණ සම්බන්ධ වී ඇති අයුරු ප්‍රායෝගිකව රිද්මය සහ තාල නිරූපණය පිළිබඳ සාකච්ඡා කරන්න.
   - ප්‍රසංගාත්මක නර්තන අවස්ථාවකට ගැලපෙන රිද්මය සාකච්ඡා කරන්න.

- මළ බෙරය වාදනයේ දී යොදා ගන්නා රිද්ම රටා
- යුද්ධමය අවස්ථාවකට සෙබලුන් මෙහෙය වීමට හෝ හමුදා ආචාර පෙළපාලියකට ගැළපෙන රිද්ම රටා.
- අප්‍රිකානු ගෝත්‍රික වැසියන් තම පණිවිඩ අන් අයට යැවීමට යොදා ගන්නා විවිධ රිද්ම රටා උදා -

  1. (සතුරු උවදුරක්
  2. සුදානම් වන්න
  3. සැඟවෙන්න
  4. නො දැනෙන්න
  5. ලං වෙන්න
  6. සටනකට
  7. පෙළඹවීමක්
  8. ඥාතියා මිය ගිහින්)

4. ඉහත අංක 03 ඡේදයේ දැක්වෙන අවස්ථාවකට සුදුසු රිද්ම රටා නිර්මාණය කරවන්න. ගැළපෙන නො ගැළපෙන බව සාකච්ඡා කරන්න.

ඇගයීම -

- අධ්‍යතන සංගීත නිර්මාණ තුළ විවිධ අදහස් ප්‍රකාශ කිරීම සඳහා රිද්ම රටා භාවිතා කර ඇති අවස්ථා පිළිබඳ ගීත කොටස් මගින් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.1 : රිද්මය, තාලය ලය සහ ස්වර නිර්මාණයකදී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූලව නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.1.2 : තාලය සහ ලය නිර්මාණයකදී වැදගත් වන අයුරු

ඉගෙනුම් ඵල :
- භාව ප්‍රකාශනයේ දී තාලය සහ ලය යන සංකල්පයන්හි වැදගත්කම හඳුනා ගනියි.
- සංගීත නිර්මාණයකදී , තාලය සහ ලය නිවැරදිව භාවිත වන අයුරු හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : තබ්ලාවක් හෝ සුදුසු තාල වාද්‍ය භාණ්ඩයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: නිර්මාණකරණය යනු පවත්නා සාම්ප්‍රදායික තත්ත්වයෙන් ඔබ්බට යාමයි. මෙහිදී පවත්නා නීති රීති සම්මතයන් සහ සම්ප්‍රදායන් සමතික්‍රමණය කළ යුතුය. සංගීත නිර්මාණයකදී සිදුවන්නේද යම් කිසි භාව ප්‍රකාශයකි. මෙහිදී නිර්මාණකරුවා විසින් ඉදිරිපත් කරන්නට යන භාවප්‍රකාශනය සඳහා ඉතා වැදගත් අංගයකි තාලය සහ ලය මෙම අංක ද්වයේ ගැලපීම නිසා නිර්මාණයක් සාර්ථක වීමත් නො ගැලපීම නිසා අසාර්ථක වීමත් යන කාරණා දෙකම සිදුවේ. මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කරනුයේ එවැනි නිර්මාණ කිහිපයක් පිළිබඳව විචාරාත්මකව විමසීමක් කිරීමත් නිර්මාණයකදී තාලය සහ ලය නිවැරදිව යොදාගන්නේ කෙසේද යන්න සහ එය වැදගත් වන ආකාරය පිළිබඳවත් සාකච්ඡා කිරීමය මෙහිදී ඉදිරිපත් කර ඇති ගීත හෝ උදාහරණවලට වඩා සුදුසු යයි ගුරුවරයාට හැගෙන වෙනත් නිර්මාණ තිබේ නම් ඒවා භාවිත කිරීමේ පූර්ණ නිදහස ගුරුවරයා සතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- තාලය සහ ලය යන සංකල්ප පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

(කාලච්ඡේද 02 යි)

ඇමුණුම් අංක 01

ප්‍රවේශය - දරු නැලවිලි ගීතයක් ගයා පෙන්වන්න. දෙවනුව වෙනත් ගීතයක් ගයා පෙන්වන්න. මෙම ගීත දෙකෙහි තාලය සහ ලය පිළිබඳවත් භාව ප්‍රකාශනය පිළිබඳවත් අදහස් විමසන්න.

ක්‍රියාකාරකම -

1. ගී වර්ග අංක 1 හි දැක්වෙන ගීත ගයා වයා පෙන්වන්න.
2. ඔබ කැමති ගීතයක පදමාලාවෙන් ප්‍රකාශිත අදහස සිසුන්ගෙන් විමසන්න.
3. අදහසට ගීතය නිර්මාණයේ දී යොදා ගෙන ඇති තාලය හා ලය ගීතයේ ප්‍රස්තුථාර්ථය තීව්‍ර කිරීමට සමත් වන්නේ ද යි සිසුන්ගෙන් අදහස් විමසන්න.
4. අනෙකුත් ගීත වල සාමාන්‍ය අදහස මතු කරමින් එම අදහසට ගීතයේ තාලය හා ලය ගැළපෙන හෝ නොගැළපෙන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
5. අංක 2 හි දැක්වෙන ගී වර්ග අතරින් ඔබ කැමති ගීතයක් රසවත්ව ගයා වයා පෙන්වන්න.
6. එම ගීතයේ පදමාලාවෙන් ප්‍රකාශිත අදහස පිළිබඳ සිසුන් විමසන්න.
7. එම අදහස තීව්‍ර කිරීමට තාලය හා ලය වැදගත් වී ඇති ආකාරය පිළිබඳ සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
8. සාකච්ඡා කරන්න.
9. අංක 2 ගී වර්ගයේ දැක්වෙන ගීත පහත දැක්වෙන තේමා වලට වෙන් කරවන්න.
   - බුදු ගුණ ඇතුළත් ගීත
   - මව් ගුණ
   - ජාතිකාභිමානය දනවන ගීත
   - විරහව ඇතුළත් ගීත
   - ජීවන අරගලය ඇතුළත් ගීත
10. වෙන් කරන ලද තේමාවලට ගීතයේ කාලය හා ලය කෙතෙක් දුරට ගැලපේදැයි සිසුන්ගේ අදහස් විමසන්න.
11. ගැලපීම හෝ නො ගැලපීම පිළිබඳ විචාරාත්මක අදහස් දැක්වීමට සිසුන් පොළඹවන්න.
12. තෝරාගත් ගීතයක් භාව ප්‍රකාශනය ඇතිවන අයුරින් සිසුන් සමග ගායනය / වාදනය කරන්න.
13. අංක 3 හි ගී වර්ගයේ දැක්වෙන ගීත ගයා වයා ඉදිරිපත් කරමින් ඒවායේ තාලය හා ලය අදහස සමග කෙතෙක් දුරට ගැලපේ දැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.

අංක 01 ගී වර්ගය

නැලවෙන මව් උකුලේ
බලන්න බුදු සාමිනේ
අහෝ දුක් වන්ට බෑ (වෙස්සන්තර)
මම බොහොම බය වුණා
කඳුළු ගංගා ගලා
සමු දෙන්න සමුගන්න නම්
සඳ කුමාරියක් දීගෙක යනවා
දුරස් වන්නට සිතන සැම විට

අංක 02 - ගී වර්ගය

අම්මාවරුනේ
පෙරදිනයක මා
ඇසේ මතුවන
ආදරයේ උල්පත
දෛවයෝගයකින්

මිහිමඬලේ
ලංකා ලංකා
රත්න දීප
මන රංජනීය
ගිලෙම් ඔබේ ගුණ
කැරකෙන රෝදේ
දුක හාදු දෙන රැයේ
උන්මාද සිතුවම්

ගී වර්ග 03 - ගී වර්ගය

තාලය හා ලය බලපෑ ඇති සාම්ප්‍රදායික ගීත

අඩු	වැඩි
දරු නැළවිලි ගීත	හටන් ගී
නෙළුම් ගී	ප්‍රශස්ති ගී
වැලපුම් ගී	කමත් ගී
	කෙළි ගී

තාලය සහ ලය නූර්ති ගීත වලට ද බලපා ඇත

අඩු	වැඩි
සෝකෙන් පල නෑ	අද වෙස්සන්තර රාජ පුතා
බන්දා මා දේදෝ	වාසනා දිනේකි
පාද පාද දැන් නගා	මෙම ගිම්හාන
සෝබමාන දේව	සිරි සංඝ බෝධි
මගේ මන්ද්‍රි නම් බිසෝගේ	දැක්කොත් පද්මාවති
දන්නෝ බුදුන්ගේ	අඹදඹ නාරං

ඇගයීම -

- මව්ගුණ දැක්වෙන තේමාවකට නිර්මාණය වූ ගීයක් ලියා, එහි තාලය හා ලය කෙතෙක් දුරට ගැලපේදැයි විමසන්න

ක්‍රියාකාරකම් සැලසුම -48

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.1 : රිද්මය, තාලය, ලය සහ ස්වර නිර්මාණයකදී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූලව නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.1.3 : ශ්‍රැතිය, ස්වර පරාස සහ ස්කේල් සංගීත නිර්මාණයකදී වැදගත් වන අයුරු ප්‍රායෝගිකව අත්හදා බැලීම

ඉගෙනුම් ඵල :
- සංගීත නිර්මාණකරණයේදී වැදගත්වන ශිල්පීය අංග හඳුනා ගනියි.
- විවිධ ශ්‍රැති භාවිත කරමින් එම ශිල්පාංගවල වෙනස හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : සර්පිනාවක් හෝ keyboard එකක් කැසට් හෝ CD ධාවකයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: මෙහි දැක්වෙන ඇමුණුමේ සඳහන් එක් එක් යුගවලදී ඇති වූ සංගීත විකාශය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ඊට වටිනාකමක් ලබා දීම සඳහා මහාවංශය ආදි වංශ කතාවලත් ටීකා. ටිප්පණි ආදියෙහි ඒ සඳහා තොරතුරු, ගාථා ආදිය ඉදිරිපත් කර ඇත. ඒවා කට පාඩම් කිරීම හෝ සවිස්තරාත්මක දැක්වීමක් අපේක්ෂා නොකරන අතර කෙටියෙන් කරුණු ඉදිරිපත් කිරීමත්, එම කරුණු සනාථ කිරීමටත් සිසුන් මෙහෙයවීම ප්‍රමාණවත් ය.

ඉහත සඳහන් ශිල්පීය අංග සංගීත නිර්මාණකරණයේදී බලපාන අයුරු සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිතය. මෙම කරුණු පිළිබඳ සිසුන් දැනුවත් කිරීම ඔවුන්ගේ නිර්මාණ කුසලතා දියුණු වීමට උපකාරී වේ. ස්කේල් පිළිබඳව 6 -11 වසරවලදී අධ්‍යයනය කර ඇත. භාවිතයේ පවත්නා විවිධ නිර්මාණවලදී මෙම අංග යොදාගෙන ඇති ආකාරය පිළිබඳ දැනුවත් වීමද මෙයින් සිදුවේ. එකම ගීතය විවිධ ශ්‍රැති ඇසුරු කොට ගෙන ගායනය වාදනය කිරීමේ ශිල්පීය ප්‍රාගුණ්‍යය ගුරුවරයා සතු විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- 6 -11 ශ්‍රේණිවලදී අධ්‍යයනය කර ඇති ස්වර, ශ්‍රැති සහ ස්කේල් පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇතිවූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

  කාලච්ඡේද 02

- ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. ශුද්ධ ස්වර ආශ්‍රිත සංගීත නිර්මාණයක යොදවන්න. එම නිර්මාණය ක්‍රියාකාරකමේ දැක්වෙන පරිදි විවිධ ශ්‍රැති භාවිත කරමින් ප්‍රස්තාර කරණයේ යොදවන්න. ඇතිවන වෙනස්කම් සාකච්ඡා කරන්න.

  කාලච්ඡේද 04

ඇමුණුම් - 01

ප්‍රවේශය - එකම ගීතයක් ශ්‍රැති කීපයකින් ගායනය කර පෙන්වන්න. මෙහිදී ඇතිවූ වෙනස සාකච්ඡා කරන්න. සිසුන්ට ද එම ගීත හෝ වෙනත් සුදුසු ගීත ගායනය කිරීමට අවස්ථාව දෙන්න. එහි ඇති සුදුසු හෝ නුසුදුසු බව සහ පහසු අපහසු බව සිසුන්ට දැනෙන්ට ඉඩ හරින්න.

ක්‍රියාකාරකම අංක 01 - පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- අම්මාවරුනේ ගීතය සහ සඳකඩ පහනක යන ගීත කෝමළ ගාන්ධාරය ශ්‍රැති කරගෙන ද මන්ද්‍ර ධෛවතය ශ්‍රැති කර ගෙනද ගයා වයා පෙන්වන්න. නිර්මාණයේ දී තෝරා ගත් ශ්‍රැතිය ගැළපෙන හෝ නොගැළපෙන හෝ ආකාරය සාකච්ඡා කරන්න.

- සිනිඳු සුදුමුදු තලාවේ ගීතය ඇසුරින් ස්වර පරාසය ගැන පුළුල් සාකච්ඡාවක් කරන්න (වෙනත් සුදුසු ගීත ද මේ සඳහා යොදා ගත හැක)
- හින්දි ගීත වල ස්වර පරාසය පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කළ හැකි ය.
- විවිධ ගායක ගායිකාවන් තමන්ට ආවේණික ශ්‍රැති භාවිත කරන බව අවධානය යොමු කරන්න.
- (බොහෝ විට පහළ ශ්‍රැති ඇසුරු කරන අය සහ ඉහළ ශ්‍රැති ඇසුරු කරන අය පිළිබඳව)
- ගායනයේ දී මෙන්ම වාදනයේදීත් ශ්‍රැතිය ස්වර පරාසය වැදගත් වන බව. ගායනයේදී ඇති සීමා වාදනයේ දී බලනොපාන බව. එහෙත් වාද්‍ය භාණ්ඩවල ස්වර පරාසය පිළිබඳ සැළකිලිමත් විය යුතු බව පැහැදිලි කරන්න.
  උදා - Violin Family ස්වර පරාසය වැඩිබව.

- සුෂිර භාණ්ඩවල ස්වර පරාසය සීමා සහිත බව.
- ඒ බව වැළැක්වීමට එකම භාණ්ඩය විවිධ ශ්‍රැති මත නිර්මාණය වී ඇති බව.
- උදා - B^b - E^b ක්ලැරිනට් , සැක්සෆෝන් හඬතල අනුව වයලින් පවුල - Flute , Picalo
- විවිධ ස්වර පරාසයන් වාදනය සඳහා එකම භාණ්ඩය නිමවී ඇති බව.

ක්‍රියාකාරකම 02

ශුද්ධ ස්වර ආශ්‍රිත නිර්මාණයක් කිරීමට සිසුන් මෙහෙයවන්න. ස්වර පරාසය සීමා කරන්න. 'ස - ම' හෝ 'ස - ප' ආදී වශයෙන් එම නිර්මාණය B^b- C - E^b E F G ආදී ශ්‍රැතිවලට පෙරලන්න. ඉන්පසුව එම ගීතය විවිධ ශ්‍රැති වලින් ගායනය කරන්න. විවිධ ශ්‍රැති වලින් ගායනය කර එහි ස්වර පරාසය, ගායනා පහසුව සහ රසභාවය ආදී කරුණු සැලකිල්ලට ගනිමින් එම ගීතය ගායනය සඳහා වඩාත් සුදුසු ශ්‍රැතිය තෝරන්න.

ඇගයීම -

- කැමති සරල ගීයක් විවිධ ශ්‍රැති පාදක කර ගනිමින් ගයා වයා පෙන්වන්න.

ඇගයීම 13

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම :

රිද්මය තාලය සහ ලය, ස්වර, නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

2. විෂය සන්ධාරය : රිද්මයේ විවිධ ගති ලක්ෂණ සහ ප්‍රකාශනය
තාලය සහ ලය නිර්මාණයක දී වැදගත් වන අයුරු
ශ්‍රැතිය ස්වර පරාසය සහ scale නිර්මාණයක දී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම

3. උපකරණයේ ස්වභාවය: ප්‍රායෝගික නිර්මාණකරණයේ යෙදීම

4. කාලය - කාලච්ඡේද 2

5. අරමුණු :

- දෙන ලද පදමාලාවකට තනුවක් නිර්මාණය කරයි.
- නිර්මාණයක දී තාලය හා ලය බලපාන අයුරු විස්තර කරයි.
- නිර්මාණකරණයේ දී ස්කේල්වල වැදගත්කම විස්තර කරයි.
- විවිධ ශ්‍රැති වලින් විවිධ රසභාවයන් ඉපදීම් පිළිබඳ අදහස් දක්වයි.
- දෙන ලද මාතෘකාවකට අනුව සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරයි.

6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :

- පහත සඳහන් ඒවායින් දක්වෙන පරිදි එකක් තෝරාගෙන සංගීත නිර්මාණය කිරීමට සලස්වන්න.
- සරල පදමාලාවකට තනුවක් යෙදීම.
- පහත සඳහන් මාතෘකාවලින් එකකට සංගීත නිර්මාණය කිරීම (මුහුද, සුළඟ ,වැස්ස නියඟය.)
- පහත දක්වෙන චේදිකා නාට්‍ය කියවන්න.
  (කැලේ මැදින් ගස් කපන්නෙක් යයි. ඔහුට මගදී සත්තු, දියපාරවල්, කානු, මුණ ගැහෙනවා, වැස්ස ලැබෙනවා, සත්තු කලබල වෙනවා)
- ඉහත සඳහන් නාට්‍යමය අවස්ථාව ගැළපෙන පරිදි පාද 4 ක් හෝ 5ක සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරන්න.

නිර්ණායක :

1. නිර්මාණයට අදාළව ගැළපෙන ශ්‍රැතිය තෝරා ගැනීම	ලකුණු 04
2. මාතෘකාව යොදා ස්වර නිර්මාණයේ ගැලපීම	ලකුණු 04
3. අදාළ නිර්මාණයේ රිද්මය හා තාලය ගැලපීම	ලකුණු 04
4. මාතෘකාවට අදාළව නිර්මාණාත්මක ගුණය	ලකුණු 04
5. නිර්මාණය කියවීමට සුදුසු පරිදි ප්‍රස්තාර කිරීම	ලකුණු 04

ක්‍රියාකාරකම් සැලසුම -49

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.2 : කටහඬ නිර්මාණයක දී වැදගත්වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.2.1 : '' **හඬතල හඳුනාගනිමු.** ''

ඉගෙනුම් ඵල :
- සංගීත නිර්මාණයක දී හැඬතල භාවිතයෙහි ඇති වැදගත්කම හඳුනා ගනියි.
- විවිධ හඬතල හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව හෝ විදුත් ස්වර පුවරු භාණ්ඩයක්.ඇමුණුමේ සඳහන් දෘශ්‍ය උපකරණ, ඔපෙරාවක කොටසක් හෝ සංධ්වණනියක කොටසක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක්/තැටියක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: බටහිර සංගීත නිර්මාණ වන සංධ්වණි, ඕකෙස්ට්‍රා ,ක්වීන්ටඩ් ක්වාටඩ් ආදී වාi නිර්මාණවලත්, ඔපෙරා ආදී ගායන නිර්මාණවලත්. හඬතල කිහිපයක් යොදාගනු ලැබේ. ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ශූරීන් අතින් නිර්මිත '' මානසවිල '' '' අග්නි '' ආදී නිර්මාණ වල හඬතල උපරිම අන්දමින් යොදා ගෙන ඇත. එම හඬතල හඳුනාගැනීමටත්, ඒ මගින් ඉදිරි අනාගතයේ සිසුන් කරනු ලබන නිර්මාණ වලට ඒවා දායක කරගැනීමේ හැකියාව ඇතිකිරීමටත් මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. මේ එක් එක් හඬතලයේ ගායනා ඉදිරිපත් කිරීමට වසර කිහිපයක් අභ්‍යාස කළ යුතු බවද මතකයේ තබා ගන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලගාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය. මෙම මාතෘකාව පිළිබඳ වැඩිදුරටත් අධ්‍යයනය කිරීමට සිංහලෙන් රචිත බටහිර සංගීත ග්‍රන්ථ පරිශීලනය කරන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

කාලයඃ කාලඡේද 02

ඇමුණුම 01.

ප්‍රවේශය.

01. සපයා ගෙන ඇති ශ්‍රව්‍ය පටය/තැටිය මගින් ඔපෙරාවක් කොටස හෝ සංධ්වනියක කොටස ශ්‍රවණයට සලසන්න. සප්තක කිහිපයක ස්වර එකවර භාවිත වන අයුරු විමසීමට සිසුන් යොමුකරන්න.

ක්‍රියාකාරකම 01

කියවීම් පත්‍රිකාව

01. බටහිර සංගීත ගායන වාදන නිර්මාණ වල උච්ච, මන්ද්‍ර, අතිඋච්ච, අතිමන්ද්‍ර ආදී සප්තක ගණනාවක ස්වර ඇසුරු කරනු ලබන බව ඊට සවන්දීමෙන් හඳුනාගත හැකිය. සංඛ්‍යාතය 16 සිට 16000 දක්වා පරාසයක විහිදෙන ස්වර සප්තක ගණනාවකි. ග්‍රැන්ඩ් පියානෝවක සප්තක 7 ක් පමණ ඇත. ඒවා මධ්‍යසප්තකයෙන් ඉහළට සප්තක 3 ක්ද, පහළට සප්තක තුනක්ද වශයෙන් පිහිටා ඇත. පියානෝව හැරෙන්නට සප්තක කිහිපයක් එකම භාණ්ඩයකින් වැයිය හැකි ලෙස සැකසූ සංගීත භාණ්ඩ භාවිතයේ දක්නට නැත. මේ නිසා සප්තක කිහිපයක ස්වර එකවර වාදනය කිරීමට භාණ්ඩ කිහිපයක් යොදා ගැනීමට සිදුවේ. එසේම ගායනයකදී හෝ වාදනයක දී සප්තක කිහිපයක ස්වර එකවර යොදා ගැනීමෙන් අමුතු අලංකාරයක් ඇතිවේ.

මේ නිසා විශාල පරාසයක පිහිටන නාද නැතහොත් ස්වර සියල්ල කෙටි පරාස 4 කට ප්‍රධාන වශයෙන් බෙදා ඇත. මේවා Vocal Range නැතහොත් හඬතල වශයෙන් නම් කෙරේ. ඉහළ සිට පහලට මෙම හඬ තල හතර Soprano, Alto, (Contralto) Tenor, Bass වශයෙන් නම් කෙරේ. මෙම හඬතල 4 අතරට තවත් දෙකක් ඇතුලුවී හඬතල 6 ක් පිහිටන ආකාරයක් ද දක්නට ඇත.

02. පහත දක්වෙන රූප සටහන් හොඳින් අධ්‍යයනය කරන්න. එහි මුල් කොටසේ හඬතල 4 ට අයත් වන ස්වර පරාසය දක්වා ඇත. දෙවන කොටසේ හඬතල 6ක් දක්වා පිහිටන අයුරු දැක්වේ. තේරුම් ගැනීමට අපහසු කොටස් පිළිබඳ ව ගුරුතුමා/තුමිය ගෙන් විමසන්න.



03. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ගොනු කරන්න.

1. මූලික හඬතල 4 නම්කරන්න.
2. එම හඬතල 4 තුළට තවත් තල දෙකක් එකතුවන්නේ කුමන ස්ථාන වලට ද ?
3. එක් එක් හඬතලයට අයත් ස්වර සීමාව දක්වන්න.
4. එක් එක් හඬතලයේ ස්වර ඔබට ගායනය කළ හැකි ද යි, උත්සාහයක යෙදෙන්න.

04. පහත දැක්වෙන රූප සටහනින් හඬතල වල ස්වර පරාසය දැක්වේ. ස්වර පරාස දැක්වීමේ දී එක් එක් ග්‍රන්ථ වල කුඩා වෙනසක් තිබිය හැකිය. ඉහළ හඬතල තුන ගැහැණු අය සඳහා ද, පහළ හඬතල තුන පිරිමි අය සඳහාද වඩාත් ගැලපේ.



05. හඬතල 4 ට අනුව සංගීත භාණ්ඩ නිර්මාණය වූවාට පසුව ඒ එක් එක් සංගීත භාණ්ඩයට වෙන වෙනම ස්වර ප්‍රස්තාර ලිවීමට සිදුවිය. මේ නිසා ස්වර ප්‍රස්තාර කිරීමේ දී වෙනම යතුරක් නැතහොත් Clef එකක් භාවිත විය. එක් එක් යතුරට අනුව මධ්‍ය ස ස්වරය රේඛා මණ්ඩලයේ පිහිටන ස්ථාන එකිනෙකට වෙනස්ය. ඒ පිළිබඳවත්, ක්ලෙෆ් වල හැඩය පිළබඳවත් 'ඒවා රේඛාමණ්ඩලයේ පිහිටන ආකාරය පිළිබඳවත් හඳුනා ගැනීමට පහත රූප සටහන අධ්‍යයනය කරන්න.



06. රේඛා මණ්ඩලයක් ඇඳ ඒ මත, එක් එක් ක්ලෙෆ් එක ඇඳ දක්වන්න. එක් එක් ක්ලෙෆ් එක අයත් හඬතලයේ ස්වර පරාසය ක්‍රොචට් සංකේතය යොදා ගනිමින් ඇඳ දක්වන්න.

ඇගයීම -

- එක් එක් හඬ තලයන්ට අදාළ ස්වර කණ්ඩායම් වශයෙන් ගායනය කරන්න.

මූලාශ්‍ර

- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London)
  RUDIMENTS AND THEORY OF MUSIC (Royal Schools of Music)

අග්නි ඔපෙරාව

සංගීත නිර්මාණය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස
ලිබ්‍රෙතෝව - එරික් ඉලයප්ආරච්චි
(liberto) - ඉතාලි භාෂාවෙන් ඔපෙරාවේ ගායනයට භාවිතා කරන වචන ලියා ඇති කෘතිය
ස්වර ප්‍රස්තාරය සැකසීම - සාගර විජේසිංහ

ශ්‍රීයා ආරියාව



Introduction

(D) full orchestrat

| R G+ G M'+ | M' P+ P D+ | D P+ P M'+ | M' G+ G

Chorus (D)

Harmony

R G+ G M'+	M' P+ P D+	D P+ P M'+	M' G+ G R+
D N+ N R+	R G+ G M'+	M' G+ G R+	R N+ N D+
ම ල මැ ත	ම ල මැ ත	ම ල මැ ත	ම ල මැ ත

(Dm)

2nd time

D - D D	D - N -	D ——	++++
M' - M' M'	M' - G -	M' ——	++++
R - R R	R - D -	R ——	++++
අ ද ම ත	ත ද ම ත	ද ත ---	++++

(Dm) Dulcimer ffff

| ṘṘ ṠD Ġ ṘṘ | —:— | —:— | —:— | +Ṙ —— |

Violins | DR SG RM GP | MD PṠ DṘ ṠĠ | +Ṙ ——

Adlib (Dm) ff

ශ්‍රී --- යා ---
Ġ — Ṙ —

("ශ්‍රී" අකුරය භාවිතයෙන් ඉංදියානු ආභාතයේ ආලාපය)

DṠ DP MP MG RG RS

DSRG SRGM RGMP GMPD MPDṠ DṠ ṘĠ Ṁ ——

(Dm) f (C) (Dm) (Dm) orchestra (C) fff (Dm)

ගී --- නී --- ප නී ---
Ṁ — Ġ — Ṙ Ṙ —

Ṁ --- Ġ - Ṙ Ṙ ---

(Dm) (C) (Dm) (Gm) (Dm)

+ සොයුරි --- මා --- ද ---
+ D Ṙ Ṙ — Ġ — Ṁ —

මුළු ලෝ ---- අ ඉ - ල - න
RR P —— M G - R - R

(G) (G) (A) (Dm)

ගිනි සිල මා ----
PP PP D - P M —

නී - නී - සී - ල - මා ---
N - N - Ṙ - Ṙ - Ṙ ---

ගී - නී - සී - ල - මා ---
Ṗ - Ṗ - Ṁ - Ġ - Ṙ —

Flute

| RP MP GM RG | R —— |


violins
vocal
Dulcimer
fff orchestra
with rak berays
dialoge form
Orchestra
fff
(vocal Alaap Indian style) - Tabla three thal
Alaap



අස්වනු මංගල්‍යය —.

Introduction

Allegro

violins

| SR GM PD NŚ | ṘĠ ṀṖ ḊṄ Ṡ- |
| GM PD NŚ ṘĠ | ṀṖ ḊṄ ṠṘ Ġ- |

Adlib

folk singing style

dialogue form

සිසිරය, නිමාවුණ

with Drums

orchestra

orch. with santure

orch. bit

rit.

Adlib

අම්බරුවෝ - - - -

P-PD N — DN DP

අම්බරුවෝ - - - —

P-PD N — DND P —

අම්බරුවෝ - - - -

P-PD N — DNDP

මිත් - - (සැවුම් බව දකමින් ගුස්මක්)



with dyalog

| අම්බරුවෝ | - - - - |
| +P Ṡ-Ṡ | Ṡ - - N | DN DP P- | — |


Orchestra bit
Allegro
vocal
Orch. bit
Dialog form
Orch. bit (with Sanitare)
Cello/D. bass
Orch. bit

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.2 : කටහඬ නිර්මාණයක දී වැදගත්වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.2.1 : " **හඬතල යොදමින් නිර්මාණ කරමු** "

ඉගෙනුම් ඵල : • විවිධ හඬතල භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදීමේ වැදගත්කම හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 04 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව හෝ විදුත් ස්වර පුවරු භාණ්ඩයක්.ඇමුණුමේ සඳහන් දෘශ්‍ය උපකරණ, ඔපෙරාවක කොටසක් හෝ සංධ්වණියක කොටසක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක්/තැටියක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: හඬතල 4 ක් පිළිබඳව මීට පෙර ක්‍රියාකාරකමින් හඳුනාගෙන ඇත. මේ එක් එක් හඬතලයේ ගායනා ඉදිරිපත් කිරීමට වසර කිහිපයක් අභ්‍යාස කළ යුතු බවද අපි දනිමු. එහෙත් කුඩා ස්වර පේලියක් හෝ දෙකක් නිර්මාණය කර ඒ මත විවිධ හඬතල යොදා ගැනීමේ අභ්‍යාසයක යෙදවීම මෙයින් අපේක්ෂිතය.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලගාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය. මෙම මාතෘකාව පිළිබඳ වැඩිදුරටත් අධ්‍යයනය කිරීමට සිංහලෙන් රචිත බටහිර සංගීත ග්‍රන්ථ පරිශීලනය කරන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාකරකම අංක 01 හි යොදවන්න.

කාලයඃ කාලඡේද 01

ක්‍රියාකාරකම අංක 2 හි යොදවන්න. නිර්මාණය කදී විවිධ හඬතල යොදා ගැනීමේ දී සිදුවන මිහිරිතාවය සහ හඬතල කිහිපයක් එකවර යොදා ගැනීමේ දී සිදුවන අපහසුතා පිළිබඳ සාකච්ඡා කරන්න.

ඇමුණුම 01.

ප්‍රවේශය.

01. සපයා ගෙන ඇති ශ්‍රව්‍ය පටය/තැටිය මගින් ඔපෙරාවක් කොටස හෝ සංධ්වනියක කොටස ශ්‍රවණයට සලසන්න. සප්තක කිහිපයක ස්වර එකවර භාවිත වන අයුරු විමසීමට සිසුන් යොමුකරන්න.

ක්‍රියාකාරකම 01

කියවන්න.

01. පහත රූප සටහනේ මුල් කොටසින් හඬතල 4 ම සඳහා නිර්මාණය කළ සංගීත කොටසක් මහා රේඛා මණ්ඩලයේ නැතහොත් ට්‍රෙබල් සහ බේස් ක්ලෙෆ් දෙක පමණක් යොදා ගෙන ප්‍රස්තාර කර ඇති ආකාරයත්, එම කොටසම හඬතල 4 ම දක්වෙන ලෙස ක්ලෙෆ් 4 යොදා ප්‍රස්තාර කර ඇති ආකාරයත් අධ්‍යයනය කරන්න.

81. A piece of 4-part writing written on two staves may be rewritten in "OPEN SCORE" as for four voices and using C clefs for alto and tenor parts, each part having its own stave:

The same passage in Open Vocal Score:



02. පහත දක්වෙන රූප සටහන් හොඳින් අධ්‍යයනය කරන්න. එහි මුල් කොටසේ හඬතල 4 ට අයත් වන ස්වර පරාසය දක්වා ඇත. දෙවන කොටසේ හඬතල 6ක් ද්කවා පිහිටන අයුරු දක්වේ. තේරුම් ගැනීමට අපහසු කොටස් පිළිබඳ ව ගුරුතුමා/තුමිය ගෙන් විමසන්න.

82. Here is the first example in the previous paragraph rewritten for string quartet; in this case remember that the two upper parts are written for two violins using the G Clef, the third part is written for viola in the alto clef and the bass is written for 'cello in the F clef or possibly the tenor clef if the notes are exceptionally high:



83. To rewrite a piece of music in short score on two staves from a piece in open score is simple. See that the stems of the treble and tenor parts go upwards and those of the alto and bass downwards. Then check over all the accidentals and see that there are none that are redundant.

ක්‍රියාකාරකම 02.

03. පහත දැක්වෙන්නේ හඬතල 4 යොදා ගනිමින් නිර්මාණය කල තනු කණ්ඩයකි එහි එක් එක් කොටස් ගුරුවරයා සමග ගයා වයා පුහුණු වන්න. හොඳින් පුහුණු වූ පසු හඬතල 4 ට අයත් කොටස් එකි නෙකා වෙන්කරගෙන එක වර ගයා වයා අත්දැකීම් ලබන්න. ගුරුවරයාගේ මග පෙන්වීම් මත ගායනය හෝ වාදනය කළ යුතු අතර එකිනෙක තනුකොටස් හාර්මනීවීම නැතහොත් සුසංගත වීම පිළිබඳව විමසා බලන්න.



04 කණ්ඩායම් 4 කට බෙදී ඉහත තනුකොටසේ සෑම හඬතලයකට ම ගැලපෙන සේ පාද දෙක බැගින් නිර්මාණය කරන්න. එහි එක් එක් කොටස් ගුරුවරයා සමග ගයා වයා පුහුණු වන්න. හොඳින් පුහුණු වූ පසු හඬතල 4 ට අයත් සම්පූර්ණ කොටස් එකි නෙකා වෙන්කරගෙන එක වර ගයා වයා අත්දැකීම් ලබන්න. ගුරුවරයාගේ මග පෙන්වීම් මත ගායනය හෝ වාදනය කළ යුතු අතර එකිනෙක තනුකොටස් හාර්මනීවීම නැතහොත් සුසංගත වීම පිළිබඳව විමසා බලන්න.

05. නිර්මාණයක දී විවිධ හඬතල යොදා ගැනීමේ දී සිදුවන මිහිරිතාවය සහ හඬතල කිහිපයක් එකවර යොදා ගැනීමේ දී සිදුවන අපහසුතා පිළිබඳ සාකච්ඡා කරන්න.

ඇගයීම -
- කුඩා ස්වර පේළියක් හැඩතල හතරට අදාළව ලියා දක්වන්න.
- එම ස්වර පේළිය රේඛා මණ්ඩලය මත ලියා දක්වන්න.

මූලාශ්‍ර
- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London)
  RUDIMENTS AND THEORY OF MUSIC (Royal Schools of Music / School music Hand book)

ක්‍රියාකාරකම් සැලසුම -51

නිපුණතාව 08 : සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 8.1 : කටහඬ නිර්මාණයක දී වැදගත්වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 8.2.3 : **" සංගීත භාණ්ඩ සහ හඬතල"**

ඉගෙනුම් ඵල :
- බටහිර සංගීත භාණ්ඩ , විවිධ හඬතල මත නිර්මාණය වී ඇති අයුරු හඳුනා ගනියි.
- වයලීන් පවුලට අයත් භාණ්ඩ සුසර කිරීමේ දී ඇතිවන වෙනස්කම් හඳුනා ගැනීම
- හඬතල මත බටහිර සුෂිර වාද්‍ය භාණ්ඩ වර්ග කෙරෙන අයුරු හඳුනා ගනියි.

කාලය : කාලච්ඡේද 02 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව හෝ විjත් ස්වර පුවරු භාණ්ඩයක්. ඇමුණුමේ සඳහන් දෘශ්‍ය උපකරණ, 7 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 57 පිට විශාල කරන ලද ඡායා පිටපතක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: හඬතල 4 ක් පිළිබඳව ද, හඬතල යොදා ගනිමින් කුඩා නිර්මාණයක් ද කරමින් පසුගිය ක්‍රියාකාරකම් තුළින් සිසුන් හඬතල පිළිබඳ අත්දැකීම් ලබා ඇත. වයලීන පවුල සහ බටහිර සුෂිර වාi භාණ්ඩ පහත හඬතල මත නිර්මාණය වී ඇති අයුරු විමසීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. බටහිර සුෂිර වාi භාණ්ඩ අතරින් පාසල් තූර්යවාදක කණ්ඩායම් වල භාවිත වන භාණ්ඩ පමණක් සාකච්ඡාව සඳහා යොදා ගැනේ. මෙම ක්‍රියාකාරකම අවසානයේ සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාව වර්ධනය කිරීමත්, ඔවුන් විසින් කරනු ලබන සංගීත නිර්මාණ සඳහා වයලීන පවුල හෝ බටහිර සුෂිර වාi භාණ්ඩ යොදා ගන්නා ආකාරය පිළිබඳවත් අත්දැකීම් ලබනු ඇත. ඊට අමතරව දැනට හමුදා සහ පොලිස් තූර්ය වාදක කණ්ඩායම් වල භාවිත වන බටහිර සුෂිර වාi භාණ්ඩ පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද ලබනු ඇත. මෙමගින් හමුදා හෝ පොලිස් තූර්යවාදක කණ්ඩායම්වල රැකියා අපේක්ෂිත සිසුන්ට වඩා වාසිදායක වනු ඇත.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලගාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

කාලච්ඡේද 01 යි

ක්‍රියාකාරකම අංක 2 හි යොදවන්න. නිර්මාණයකදී බටහිර සුෂිර වාi භාණ්ඩ යොදා ගැනීමේ දී සිදුවන වෙනස හෝ අපහසුතා පිළිබඳව සාකච්ඡා කරන්න

කාලච්ඡේද 01 යි

ඇමුණුම 01.

ක්‍රියාකාරකම 01

ප්‍රවේශය

01. තෝරාගත් වාi ඛණ්ඩයක් හෝ ගීතයක කොටසක් මන්ද්‍ර මධ්‍ය ස්වර ඇසුරු කරමින් වයන්න. එම කොටසම උච්චc අතිඋච්ච ස්වර ඇසුරු කරමින් වයන්නී ඇති වූ වෙනස සාකච්ඡා කරන්න.

02. 7 ශ්‍රේණිය ගුරු මාර්ගොපදේශ සංග්‍රහයේ 57 පිට විශාල කරන ලද ඡායා පිටපත ප්‍රදර්ශනය කරන්න. වයලින්, වියෝලා, චෙලෝ සහ ඩබල්බේස් භාණ්ඩ වලට අයත් හඬතල සාකච්ඡා කරන්න.

03. පහත දැක්වෙන වගුව සිසුන් ලවා සම්පූර්ණ කරවන්න.

	තත් සුසරකරන පිළිවෙළ (බටහිර ක්‍රමයට)	පහසුවෙන් වාදනය කළ හැකි ස්වර පරාසය	අයත්වන හඬතලය
වයලින්			
වියෝලා			
චෙලෝ			
ඩබල්බේස්			

04. වයලින් වියෝලා චෙලෝ යන සංගීත භාණ්ඩ 4 ම යොදා ගෙන එකවර වාදනය කළ සංගීත ඛණ්ඩයකට සුදුසු තනුවක පළමු පාදය පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගනිමින් නිර්මාණය කරන්න.

(අ) සංගීත භාණ්ඩ 4 ම එකවර වාදනය කරන ලෙස එක් එක් භාණ්ඩයට වෙනවෙනම ස්වර පාදයක් බැගින්
(ආ) "C"- Major හෝ "C"-Minor ස්කේලයට අයත් වන ලෙස.
(ඇ) සියලුම ස්වර පාද එකිනෙක හාර්මනි වන ලෙස
(නිර්මාණයක දී එක් එක් විභාගවල අනෙකුත් ස්වර පාද හා හාර්මනි නොවන ස්වර උපරිම ලෙස 1 ක් හෝ 2 ක් තිබිය හැකිය. මෙම ස්වර ක්ෂණයකින් හඬ නැති වී යන ලෙස යෙදේ. මේවා Passing Notes වශයෙන් සැළකේ.)

05. නිර්මාණය කළ තනුව ගුරුතුමා/තුමිය සමග ගයා/වයා බලන්න.

ක්‍රියාකාරකම 02

01. පහත ගැලීම් සටහනට අනුව වරහන්තුළ ඇති බටහිර සුෂිර වාi භාණ්ඩ වර්ග කරන්න. එක් එක් භාණ්ඩය ඉදිරියෙන් එය අයත් වේ යැයි ඔබ සිතන හඬතලය භාණ්ඩය ඉදිරියෙන් ලියන්න. (හඬතල නමේ ඉංග්‍රීසි මුල් අකුර දෙක ඉදිරියෙන් රතුපාටින් ලිවීම ප්‍රමාණවත්ය) (Trumpet, Cornet, Trombone , Tuba, Flute, Piccolo , Euphonium , French Horn, Clarinet, Oboe, Tenor Saxophone , Alto Saxophone, CorAnglais)



02. වයලින් පවුල සඳහා ඔබ නිර්මාණය කළ ස්වර පාදය හා සම්බන්ධව (හඬතල 4 ට පාද 4 ක් එකවර වයන ලෙසට) දෙවන පාදය නිර්මාණය කරන්න.

03. එක් එක් ස්වර පාදය දකුණු පසින් එය වාදනයට වඩාත් සුදුසු සුෂිර භාණ්ඩයේ නම ලියන්න. වඩාත්ම ගැලපෙන හඬතලය එම ස්වර පාදය අවසානයේ ලියාදක්වන්න.

ඇගයීම -

- එක් එක් හැඩතලයට අදාළව සංගීත භාණ්ඩ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

මූලාශ්‍ර

- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London)
  RUDIMENTS AND THEORY OF MUSIC (Royal Schools of Music)
- Encyclopedia Britanika , Microsoft ENCARTA - CD

ඇගයීම් 14

1. ඇගයීම් අවස්ථාව :- 13

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:- 8.2 කටහඬ නිර්මාණයක දී වැදගත්වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය.
   - කටහඬෙහි විවිධ තල
   - සරල ප්‍රස්තාර කොටසක් ඇසුරින් විවිධ හඬතල භාවිතයෙන් ප්‍රායෝගික ක්‍රියා
   - හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු.

4. කාලය - කාලච්ඡේද 3

5 උපකරණයේ ස්වභාවය:-
   - පැවරුමකි.
   - හඬතල ඇසුරින් කළ නිර්මාණ කොටසක් ද ඇතුළත් ව හඬතල පිළිබඳ තොරතුරු සහ විවිධ හඬතල හා සම්බන්ධ සංගීත භාණ්ඩ දැක්වූ පොත් පිංචක් සැකසීම.

6. අරමුණු.
   - විවිධ හඬතල නම්කරයි.
   - එකිනෙක හඬතල වලට අයත් ස්වර පරාසයන් හා ක්ලෙෆ් ඇඳ දක්වයි.
   - හඬතල 4 ට අයත් වන ආකාරයට සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරයි.
   - එම නිර්මාණ කොටස වයලින් පවුලට අයත් භාණ්ඩ වලට සහ බටහිර සුෂිර වාi භාණ්ඩ වලට බෙදා දක්වයි.
   - බටහිර සුෂිර වාi භාණ්ඩ වර්ගීකරණය දක්වා භාණ්ඩ නම්කරයි.
   - නම්කරන ලද භාණ්ඩ වලට අයත් රූප සටහන් ඇඳ දක්වයි.
   - නිර්මාණශීලිව විස්තර ගොනුවක් ඉදිරිපත් කරයි.

7 උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්
   - පහත අනුමාතෘකා ඔස්සේ කරුණු රැස්කරමින් පොත් පිංචක් නිර්මාණයට උපදෙස් දෙන්න.
      - විවිධ හඬතල නම්කරන්න.
      - රේඛා මණ්ඩලයක් මත එකිනෙක හඬතල වලට අයත් ක්ලෙෆ් ඇඳ දක්වා ස්වර පරාසයන් සෙමිබ්‍රේව් සංකේතය යොදා ඇඳ දක්වන්න.
      - හඬතල 4 ට අයත් වන ආකාරයට සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරන්න.
      - එම නිර්මාණ කොටස වයලින් පවුලට අයත් භාණ්ඩ වලට සහ බටහිර සුෂිර වාi භාණ්ඩ වලට බෙදා දක්වන්න.
      - බටහිර සුෂිර වාi භාණ්ඩ වර්ගීකරණය දක්වා භාණ්ඩ නම්කරන්න.
      - නම්කරන ලද භාණ්ඩ වලට අයත් රූප සටහන් ඇඳ පෙන්වන්න.
      - එම භාණ්ඩ වලට අයත් හඬතල දක්වන්න.
      - නිර්මාණශීලිව විස්තර ගොනුවක් ඉදිරිපත් කරන්න.

   - පහත රූප සටහනේ දැක්වෙන පරිදි ස්වර නිකුත් කිරීම සඳහා වැල්ව් තුනක් පමණක් භාවිත වන භාණ්ඩ නම්කරන්න. එම රූපසටහනේ වැල්ව් පිහිටන අයුරු අනුව නිකුත්වන ස්වර දක්වන්න.



7 ඇගයීමේ ක්‍රමය:

නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකය ට ලකුණු 04 බැගින් නිර්ණායක පහට මුලු ලකුණු 20 ක් පිරිනැමේ, ලකුණු පරාසය මෙසේය.

- ඉතා හොඳයි - ලකුණු 04.
- හොඳයි - ලකුණු 03.
- දුර්වලයි - ලකුණු 02.
- ඉතා දුර්වලයි - ලකුණු 01.

නිර්ණායක

(1)	තොරතුරු වල නිරවi තාවය හා ගුණාත්මක බව	-	ලකුණු 04.
(2)	තොරතුරු සංවිධනාය කර තිබීම	-	ලකුණු 04.
(3)	ගොඩ නගා ඇති සංගීත ඛණ්ඩයේ නිර්මාණාත්මක බව	-	ලකුණු 04.
(4)	රූප සටහන් ආදියෙන් විචාරාත්මකව කරුණු දැක්වීමට	-	ලකුණු 04.
(5)	සමස්ත නිමාව	-	ලකුණු 04.
		මුලු ලකුණු	ලකුණු 20

ඇගයීම් 15

1. ඇගයීම් අවස්ථාව :- 13
2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:-** නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී නිර්මාණ කරණයේ දී භාවිත කරයි
3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය**
   - පරිගණකය සංගීත අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන්
   - පරිගණකය සංගීත නිර්මාණයේ මෙවළමක් ලෙස
   - විදුත් ස්වර පුවරුව
   - සංගීත භාණ්ඩ වල ධ්වණිගුණය කෙරෙහි බලපාන හේතු

4. **උපකරණයේ ස්වභාවය:-**
   - පරිගණකාශ්‍රිත සංගීත නිර්මාණයක් හෝ Powerpoint Presentation එකක් හෝ බිත්ති පුවත් පතකට ලිපියක්
5. **අරමුණු**
   - පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙස පිළිගනියි
   - පරිගණකය යොදාගනිමින් සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරයි
   - සංගීත කොටසක් පරිගණක ගත කරයි
   - විදුත් ස්වර පුවරුවක නිර්මාණයක් කරයි
   - සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු විමසයි

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

   ගුරු උපදෙස්
   - පරිගණක ඇති පාසල් වල සිසුන් පරිගණකය ආශ්‍රයෙන් සංගීත කොටසක් නිර්මාණය කරවන්න
   - විදුත් ස්වරපුවරුව යොදා ගනිමින් සංගීත කොටසක් නිර්මාණය කරවන්න
   - සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු දැක්වීමට සාකච්ඡාවක් කරන්න

     නැතහොත්
   - පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙෂ පරිගණකය හා විදුත් ස්වර පුවරුව '' යන මැයෙන් Powerpoint Presentation එකක් හෝ බිත්ති පුවත් පතකට ලිපියක් සිසුන් ලවා සකස් කරන්න

7. **ඇගයීමේ ක්‍රමය:**

   නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයක ට ලකුණු 04 බැගින් නිර්ණායක පහට මුලු ලකුණු 20 ක් පිරිනැමේ ලකුණු පරාසය මෙසේය
   - ඉතා හොඳයි - ලකුණු 04.
   - හොඳයි - ලකුණු 03.
   - දුර්වලයි - ලකුණු 02.
   - ඉතා දුර්වලයි - ලකුණු 01.

නිර්ණායක

(1)	නිර්මාණය කළ සංගීත ඛණ්ඩයේ ගුණාත්මක බවට	- ලකුණු 04.
(2)	විදුත් ස්වරපුවරුව යොදා ගනිමින් සංගීත කොටසක් නිර්මාණය ට	- ලකුණු 04.
	සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු දැක්වීමට සාකච්ඡාවක් කිරීම	-ලකුණු 04.
(4)	පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙෂ පරිගණකය හා විදුත් ස්වර පුවරුව '' යන මැයෙන් Powerpoint Presentation එකක්	ලකුණු 04.
(5)	උචිත අනුචිත භාවය දැක්වීමට -	ලකුණු 04.
	මුලු ලකුණු	ලකුණු 20

නිපුණතාව 9.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්. දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

නිපුණතා මට්ටම 9.1 : විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර කරණයේ යෙදෙයි

ක්‍රියාකාරකම 9.1.1 : '' **නි** '' සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ප්‍රස්තාර කරමු. ගීත ගයමු.

ඉගෙනුම් ඵල :
- ප්‍රස්තාර කරණයේ දී විවිධ ස්වර ශ්‍රැති කර ගැනීමේ අවශ්‍යතාවය හඳුනා ගනියි.
- එම ශ්‍රැති ස්වරවලින් ගායනය වාදනය කිරීමේ කුසලතාව වර්ධනය කර ගනියි.

කාලය : කාලච්ඡේද 08 යි

ගුණාත්මක යෙදවුම් : සර්පිනාව හෝ ස්වර පුවරු භාණ්ඩයකි. ස්වර පුවරුව අඳින ලද පත්‍රිකාවක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

: 10, 11 ශ්‍රේණි වලදී සඩ්ජභාවයෙන්, මධ්‍යමභාවයෙන් සහ පංචමභාවයෙන් ගීත ගායනය හෝ වාදනය කිරීමටත්, ස්වර ප්‍රස්තාර පෙරලා ප්‍රස්තාර කිරීමටත් සිසුනට හැකියාව ලැබී ඇත. මෙම ක්‍රියාකාරකම තුළ දී ශුද්ධ ස්වර පමණක් යෙදෙන ජන ගීතයක් හෝ සරල ගීතයක් '' **නි** '' ස්වරය සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන පෙරලා ප්‍රස්තාර කිරීමේ හැකියාව ඇති කිරීමටත්, එම ශ්‍රැති ස්වර වලින් ගායනය හෝ වාදනය කිරීමේ හැකියාව ඇති කිරීමත් අපේක්ෂිතය.

මීට අමතරව මෙම ස්වර හා බැඳුණු " B^b " Major Scale සහ " E^b " Major Scale යන දෙකෙහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය පිළිබඳ වැටහීමක් ද ලැබෙනු ඇත. මෙම ස්කේල දෙක මත පිහිටා කිසියම් ගීතයක්, හෝ ජනගීතයක් ගායනය කිරීමටත්. සර්පිනාව වැනි ස්වර පුවරු භාණ්ඩයකින් මෙම ස්කේල දෙක මත ගීත වාදනය කිරීමටත් සිසුනට හැකිවනු ඇත. යෝජිත ප්‍රවේශයේ දී සර්පිනාවේ යතුරු සිසුනට පෙනෙන සේ වාදනය කිරීම වඩාත් ඵලදායි වේ. සිසුන්ගේ නිදහස් වේලාවන් වල දී සර්පිනාවේ ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය වාදනය කිරීමට සිසුන් යොමු කිරීම වැඩි දුර අධ්‍යයනයට සුදුසුය. එහිදී අතැඟිලි හැසිරවීම පිළිබඳව ද අවධානය යොමුකරවන්න. මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ලගාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය.

07. ක්‍රියාකාරකම සංවර්ධනය -

- 10, 11 ශ්‍රේණි වලදී අධ්‍යයනය කර ඇති සඩ්ජභාවය හා මධ්‍යමභාවය යන්න පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න. (කාලජේද 02)

- ඇමුණුම අංක 02 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. වගුවේ ඇති සී මයිනර් ස්කේලයන් ගොඩ නැගී ඇති අයුරු වටහා ගැනීමට සහාය වන්න. 10, 11 ශ්‍රේණි වලදී අධ්‍යයනය කළ විෂය කරුණු වෙනස් වන ආකාරය පිළිබඳ අවධානය යොමුකරන්න. තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

(කාලඡේද 02)

- ඇමුණුම අංක 03 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ගීතයක භාවය හා රසවත් බව රැකීමට ශ්‍රැතිය වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න. විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කරගත් ගීත කිහිපයක් යොදාගන්න. ගීතයේ පදමාලාවෙන් ප්‍රකාශිත අර්ථය වඩාත් උද්දීපනය වීමට ශ්‍රැතිය බලපාන ආකාරය සහ එය නිර්ණායකයක් වන ආකාරය පිළිබඳ නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. කෝමළ නි සහ කෝමළ ග ශ්‍රැති කරගනිමින් තෝරාගත් ගීත ප්‍රස්තාර කිරීමට යොමු කරන්න. වාදන අභ්‍යාසයේ යොදවන්න.

(කාලඡේද 04).

ඇමුණුම් අංක 01

ප්‍රවේශය

01. පහත දැක්වෙන ගීතය '' **ස** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ (සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින්) වයා පෙන්වන්න. වාදනය සමග ගීතය ද ගයන්න.

ස ස ස / රි රි රි / ග - රි / ස - - /
ස - ස / රි - රි / ග - ග / ම - - /
ම - ම / ග - ග / රි - රි / ස - - /
ස රි ග / ම - - / ම ග රි / ස - - /

එකට සතුටු සාගරේ
පීන පීන නාන සේ
සෑමදාම මේ ලෙසේ
නටමු ගී ගය ගයා

02. එම ගීතයම '' **නි** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ (සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින්) වයා පෙන්වන්න. වාදනය සමග ගීතය ද ගයන්න.

නි නි නි / ස ස ස / රි - ස / නි - - /
නි̇ - නි / ස - ස / රි - රි / ග̇ - - /
ග - ග̇ / රි - රි / ස - ස / නි - - /
නි̣ ස රි / ග - - / ග රි ස / නි̣ - - /

03. එකම ගීතයේ ස්වර ප්‍රස්තාර දෙකෙහි ඇති වූ වෙනස සාකච්ඡා කරන්න. ප්‍රස්තාර දෙකක් වුවද කණට ඇසෙන ගීතය එකම බව සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 01.

01. පහත දැක්වෙන වගුව අධ්‍යයනය කිරීමට සලස්වන්න. එහි '' ස රි ග ම ප ධ නි ස් '' යන ආරෝහණය ට අයත් ස්වර අන්තරයන් හඳුනාගැනීමට සහාය වන්න. වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

පෙරදිග	අපරදිග														
		1	2	3	4	5	6	7	8	9	10	11	12	13	
'' ස '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" C " Major Scale	ස ස C	රි	රි රි D	ග	ග ග E	ම ම F	ම/	ප ප G	ධ	ධ ධ A	නි	නි නි B	ස ස C	
'' රි '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" D " Major Scale	රි D		ග E		ම $F^{\#}$	ප G		ධ A		නි B		රි̇ $C^{\#}$	රි D	
'' **නි̇** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" B^{b} " Major Scale														
'' **ග** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" E^{b} " Major Scale														

- '' **නි̇** '' ස්වරය සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය ගායනය කරවන්න.
- '' **නි̇** '' ස්වරය සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය ස්වර පුවරුවක වාදනය කරවන්න.
- එකට සතුටු සාගරේ '' ගීතය කෝමළ නි සහ කෝමළ ග ස්වර ශ්‍රැති ස්වර වශයෙන් ගෙන ප්‍රස්තාර කරවන්න.
- ශුද්ධ ස්වර පමණක් යෙදෙන මෙතෙක් අධ්‍යයනය කළ ජන ගීතයක් හෝ සරල ගීතයක කොටසක් '' **නි̇** '' ස්වරය සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන නැවත ප්‍රස්තාර කරන්න.
- පෙරළා ප්‍රස්තාර කළ ගීතයේ ස්වර ප්‍රස්තාරය පන්තිය ඉදිරියේ ගයා වයා පෙන්වීමට අවස්ථාව සළසන්න. වඩාත් ගැලපෙන ශ්‍රැතිය පිළිබඳ අදහස් විමසන්න.

ඇමුණුම - 02.

ප්‍රවේශය.

01. සර්පිනාවෙන් " C - F - G " Major Minor Chords වයා පෙන්වන්න වෙනස්කම් විමසන්න. 10, 11 ශ්‍රේණි වල දී අධ්‍යයනය කළ Major Minor Chords සහ Scale පිළිබඳ සාකච්ඡාවක් කරන්න. නැවත මතකයට නැගීමට සහාය වන්න.

ක්‍රියාකාරකම 02.

01. පහත දැක්වෙන කියවීමේ පත්‍රිකාව සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.

- ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වර වශයෙන් ගෙන '' සරිගමපධනිස'' වශයෙන් ශුද්ධ ස්වර සප්තකය යෙදා ගැනීමේ දී ශ්‍රැතිය වශයෙන් යොදාගත් ස්වරයේ නමින් Major Scale යක් සෑදේ. එ අනුව Major Scale 12 ක් සෑදේ. සර්පිනාව වැනි ස්වරපුවරු භාණ්ඩවලින් ඕනෑම Major Scale යක් පහසුවෙන් වාදනය කළ හැකිය.

- Minor නමින් ස්කේල් විශේෂයක් ද ගොඩ නැගේ. 11 ශ්‍රේණියේ දී අධ්‍යයනය කළ මයිනර් ස්කේල් වලට වඩා වෙනස් ස්වරූපයකින් අද මයිනර් ස්කෙල් හඳුනාගත හැකි වනු ඇත. එම ස්කේල් වල කෝමළ ස්වර අඩංගුය. ප්‍රධාන වශයෙන් මයිනර් ස්කේල් කොටස් 2 කට බෙදේ. ඒවා Melodic Minor සහ Harmonic Minor වශයෙන් නම් කෙරේ. ඉන් එක් ප්‍රභේදයක ආරෝහණ ස්වර ඒ ආකාරයෙන්ම අවරෝහණයේ දී යෙදෙන්නේ නැත. මෙය තරමක් සංකීර්ණ විෂය කරුණකි. වැඩි දුර අධ්‍යයනය සඳහා ඉංග්‍රීසියෙන් රචිත පොත්පත් පරිශීලනය කරන්න.

02 පහත දැක්වෙන වගුව අධ්‍යයනය කරන්න. අර්ධ ස්වරයක් Semi Tone ඇති තැන ⌊___⌋ ලකුණ යෙදා ඇත.



'' සරිගමපධනිස'' යන ශුද්ධ ස්වර සියල්ල '' ධනිසරිගමපධ '' වශයෙන් යොදා ගත්විට එය " A " Minor Scale නමින් හැඳින්වේ. එම ස්වර " C " Minor Scale යට පෙරලුවිට ලැබෙන ස්වර මෙසේය.

'' ස රි ග ම ප ධ නි ස් -

ස් නි ධ ප ම ග රි ස

මෙම ස්වර අපේ ආශාවරී මේලයට සමානය. " A " Minor Scale යට සහ " C " Major Scale යට කිසිම ෆ්ලැට් ස්වරයක් හෝ ෂාප් ස්වරයක් යෙදෙන්නේ නැත.



03. '' **නි** '' ස්වරය සහ '' **ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන Melodic & Harmonic Minor ස්වර සප්තක ගොඩනගන්න. ස්වර පුවරුවක වාදනය කරවන්න.

04. මයිනර් ස්කේල් ප්‍රභේද දෙක අතර ඇති වෙනස පන්තියට ඉදිරිපත් කිරීමට සළස්වන්න.

ඇමුණුම 03.

ප්‍රවේශය.

01. පහත දැක්වෙන වගුව පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඉන් එක් ගීතයක් තෝරා ගන්න. තෝරාගත් ගීතය අදාල නියමිත ශ්‍රැතියෙන් ගයා වයා පෙන්වන්න. එම ගීතයම '' ස '' ස්වරය ශ්‍රැති කරගනිමින් ගයා වයා පෙන්වන්න. ඇති වන වෙනස හා රසවත් භාවය අඩු කිරීමට හෝ වැඩි කිරීමට ශ්‍රැතිය බලපාන අන්දම සාකච්ඡා කරන්න.

අනු අංකය	ගීතයේ මුල් කොටස	ශ්‍රැති ස්වරය	ස්කේලය	ප්‍රධාන Chord ti
01	අම්මාවරුණේ	ග	E ᵇ Minor	E ᵇ Minor Sus
02	සඳකඩ පහනක	ධ	A Minor	A Minor
03	කුරුවුලු ගැ ගී පොතේ	නි	B ᵇ Major	B ᵇ Major
04	අකුරු මැකී නෑ	ග	E ᵇ Major	E ᵇ Major
05	කරදිය ගැඹරේ	ග	E ᵇ Minor	E ᵇ Minor

02. තෝරාගත් ගීතයේ ස්වර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. යෙදී ඇති ස්වර පිළිබඳ විමසන්න. සිසුන් සමග ස්වර ප්‍රස්තාරය ගයන්න.

03. එම ස්වර ප්‍රස්තාරය සඩ්ජ භාවයට පෙරලා ප්‍රස්තාර කිරීමට සලස්වන්න. ප්‍රස්තාර දෙකේ සබඳතා විමසීමට යොමු කරන්න.

04. සඩ්ජය ශ්‍රැති ස්වරය වූ තෝරාගත් ප්‍රස්තාරයක් කෝමළ නි සහ කෝමළ ග ශ්‍රැති ස්වරය ලෙස ගෙන පෙරලා ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.

05. යතුරු පුවරුවෙන් සහ තෝරා ගත් භාණ්ඩයකින් වාදනය කර පුහුණු වීමට සලස්වන්න.

ඇගයීම -

- MELODIC., Minor ක්‍රමයට B^{bm}, D^{m},A^{m} ලියන්න.
- භාරතීය ආශාවරී මේලයට බොහෝ සෙයින් සමාන වන බටහිර මයිනර් ස්කේල් වර්ගය හඳුන්වා එය Harmonic Minor Scale ට අනුව Treble Celff හි ප්‍රස්තාර කර දක්වන්න.

මූලාශ්‍ර

- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London)
  RUDIMENTS AND THEORY OF MUSIC (Royal Schools of Music)

ක්‍රියාකාරකම් සැලසුම -53

නිපුණතාව 9.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

නිපුණතා මට්ටම 9.2: විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර කරණයේ යෙදෙයි.

ක්‍රියාකාරකම 9.2.1 : '' මධ්‍යමය '' සහ '' පංචමය ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ප්‍රස්තාර කරමු. ගීත ගයමු.

ඉගෙනුම් ඵල :

- ම සහ ප, ස්වර ශ්‍රැති ස්වරය ලෙස පෙරලා ප්‍රස්තාරකරණයේදී ඇතිවන වෙනස හඳුනා ගනියි.

කාලය : කාලඡේද 08 යි.

ගුණාත්මක යෙදවුම්: සර්පිනාව හෝ ස්වර පුවරු භාණ්ඩයක්. ස්වර පුවරුව අඳින ලද පත්‍රිකාවක්,

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

මීට පෙර ක්‍රියාකාරකම තුළින් කෝමළ නි සහ කෝමළ ග යන ස්වර ශ්‍රැති ස්වර ලෙස ගෙන පෙරලා ප්‍රස්තාර කිරීමේ හැකියාව ලබා ඇත. මෙම ක්‍රියාකාරකම තුළ දී ශුද්ධ ස්වර පමණක් යෙදෙන ජන ගීතයක් හෝ සරල ගීතයක් '' **ම**'' ස්වරය සහ '' **ප** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන පෙරලා ප්‍රස්තාර කිරීමේ හැකියාව ඇති කිරීමටත්, එම ශ්‍රැති ස්වර වලින් ගායනය හෝ වාදනය කිරීමේ හැකියාව ඇති කිරීමත් අපේක්ෂිතය.

මීට අමතරව මෙම ස්වර හා බැඳුණු " F" Major Scale සහ " G" Major Scale යන දෙකෙහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය පිළිබඳ වැටහීමක් ද ලැබෙනු ඇත මෙම ස්කේල දෙක මත පිහිටා කිසියම් ගීතයක්, හෝ ජනගීතයක් ගායනය කිරීමටත්, සර්පිනාව වැනි ස්වර පුවරු භාණ්ඩයකින් මෙම ස්කේල දෙක මත ගීත වාදනය කිරීමටත් සිසුනට හැකිවනු ඇත. යෝජිත ප්‍රවේශයේ දී සර්පිනාවේ යතුරු සිසුනට පෙනෙන සේ වාදනය කිරීම වඩාත් ඵලදායි වේ. සිසුන්ගේ නිදහස් වේලාවන් වල දී සර්පිනාවේ ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය වාදනය කිරීමට සිසුන් යොමු කිරීම වැඩි දුර අධ්‍යයනයට සුදුසුය. එහිදී අතැඟිලි හැසිරවීම පිළිබඳව ද අවධානය යොමුකරවන්න. මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ළඟාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මග හැරීමට පියවර ගත හැකිය. මේජර් ස්කේල වලට අමතරව මයිනර් ස්කේලයන් ද අධ්‍යයනයට යොමු කිරීම අපේක්ෂිතය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- මීට පෙර කළ ක්‍රියාකාරකම සහ මේජර් මයිනර් යන්න පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න.

  කාලඡේද 02 යි

- ඇමුණුම අංක 02 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. වගුවේ ඇති 'සී මයිනර්' ස්කේලයන් ගොඩ නැගී ඇති අයුරු වටහා ගැනීමට සහාය වන්න. 10, 11 ශ්‍රේණි වලදී අධ්‍යයනය කළ විෂය කරුණු වෙනස් වන ආකාරය පිළිබඳ අවධානය යොමුකරන්න. තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

  කාලඡේද 02 යි

- තෝරා ගත් ජන ගීතයක් සඩ්ජභාවයෙන් හා මධ්‍යම භාවයෙන් ගයා වයා පෙන්වන්න. ජන ගී ගායනයට ඉහළ ශ්‍රැතියක් යොදා ගැනීමේ අවශ්‍යතාවය, ඊට බලපානා හේතු (එකාකාරී තනුරටා, අවකාශය, නිදහස් බව ආදී) සිසුන් සමග සාකච්ඡා කරන්න. මෙතෙක් අධ්‍යයනය කළ සියලුම ජනගී මධ්‍යම භාවයෙන් සහ පංචමභාවයෙන් ගායනය වාදනය කරවන්න. තෝරා ගත් ජන ගීයක් හෝ කිහිපයක් සඩ්ජභාවයෙන්', ප්‍රස්තාර කර එය මධ්‍යමභාවයට සහ පංචමභාවයට පෙරලා ප්‍රස්තාර කරවන්න, ස්වර පුවරුවෙන් සහ තෝරාගත් භාණ්ඩයෙන් වාදනය කරවන්න.

කාලච්ඡේද 04 යි

ඇමුණුම 01.

ප්‍රවේශය.

01. තෝරා ගත් ගීතයක් කෝමළ නි, කෝමළ ග ස්වර ශ්‍රැති ස්වර ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ (සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින්) වයා පෙන්වන්න. මධ්‍යමය හා පංචමය ශ්‍රැතිස්වර ලෙස ගෙන ගීතයක් වාදනය කරන්න. ඇති වන වෙනස සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම අංක 01

02. පහත දැක්වෙන වගුව පුරවන්න.

පෙරදිග	අපරදිග	1	2	3	4	5	6	7	8	9	10	11	12	1
		ස	රි	රි	ග	ග	ම	ම'	ප	ධ	ධ	නි	නි	ස
" ඒ " ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" F " Major Scale	F												
" ප " ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය	" G " Major Scale	G												
" ඒ " ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන කෝමළ ස්වර ඇතුළත් සප්තකය	" F " Minor Scale	F												
" ප " ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන කෝමළ ස්වර ඇතුළත් සප්තකය	" G " Minor Scale	G												

03. සර්පිනාව වැනි යතුරු පුවරුවකින් " F " Major සහ G " Major වාදනයට යොමු කරන්න.
04. තෝරාගත් ගීතයක් " F " Major සහ G " Major වාදනය කරවන්න.
05. තෝරාගත් ශුද්ධ ස්වර පමණක් යෙදෙන ජන ගී දෙකක් " F " Major සහ G " Major ස්කෙල්යන් මත වාදනයට යොමුකරන්න.
06. ඉහත වගුව මෙන් සුදුසු ආකාරයකට මයිනර් ස්කේල සඳහා වගුවක් ගොඩනගන්න.
07. " F " Minor සහ G " Minor ස්කේල ගොඩනගන්න .
08. තෝරාගත් කොමළ ස්වර යෙදෙන ජන ගී දෙකක් " F " Minor සහ G " Minor ස්කේලයන් මත වාදනයට යොමුකරන්න.
09. තෝරාගත් වාi භාණ්ඩයේ තෝරාගත් ජන ගී " F " Minor සහ G " Minor ස්කෙල්යන් මත වාදනයට යොමුකරන්න.
10. මෙතෙක් අධ්‍යයනය කළ ජන ගීවල සඩ්ජභාවයෙන් සකස්කළ ප්‍රස්තාර මධ්‍යමභාවයෙන් සහ පංචමභාවයෙන් පෙරලා ප්‍රස්තාර කරවන්න.
11. ස්වරපුවරුවෙන් සහ තෝරාගත් වාi භාණ්ඩයෙන් මෙතෙක් අධ්‍යයනය කළ ජනගී මධ්‍යමභාවයෙන් සහ පංචමභාවයෙන් වාදන අභ්‍යාසයන්හි යොදවන්න.

ඇගයීම -

- මධ්‍ය ෂඩ්ජයට සුසර කරන ලද වයලීනයක සහ මධ්‍යමය ශ්‍රැතිකරගෙන වයන සර්පිනාවක් සඳහා ජන ගීතයක් එම භාණ්ඩ දෙක සඳහා වෙන වෙනම ප්‍රස්තාර කරන්න.
- මධ්‍යමය ශ්‍රැති කරගෙන සර්පිනාවකින් වයන ජන ගීයක ස්වර ප්‍රස්තාරයකින් ප රි ධ ග් යනුවෙන් සුසර කරන ලද වයලීනයක් සඳහා නැවත සකසා ලියන්න.

මූලාශ්‍ර

- A HANDBOOK OF MUSICAL KNOWLEDGE (Trinity College of Music London)
  RUDIMENTS AND THEORY OF MUSIC (Royal Schools of Music)

ඇගයීම - 16

1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -

විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර නිරූපණය කරණය

2. විෂය සන්ධාරය

කෝමළ ග, කෝමළ නි ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර කරණය
මධ්‍යමය හා පංචමය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය
මේජර් සහ මයිනර් ස්කේලයන්

3. උපකරණයේ ස්වභාවය

- ගායන වාදන ප්‍රායෝගික ක්‍රියා

4. කාලය - කාලච්ඡේද 02 යි

5. අරමුණු

- විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.
- මේජර් මයිනර් ස්කේලයන් නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- තෝරා ගත් ගීතයක් විවිධ ශ්‍රැති වලින් ප්‍රස්තාර කර ගායනය හෝ වාදනය කරයි.

උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ශිෂ්‍ය උපදෙස් -

- ඔබ කැමති ගීත කොටසක් (සරල ගී, නූර්ති ගී) සඩ්ජභාවයෙන් ප්‍රස්තාර කරන්න.
- එහි ස්කේලය දක්වන්න.
- එම ප්‍රස්තාරය කෝමළ, නි, කෝමළ ග, ශ්‍රැති කරගනිමින් පෙරලා ප්‍රස්තාර කරන්න.
- එම ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් පෙරලා ප්‍රස්තාර කරන්න.
- කුමන හෝ ස්වරයක් ශ්‍රැති කර ගනමින් සැකසූ ප්‍රස්තාර ඇසුරින් අහඹු ලෙස තෝරා ගත් ප්‍රස්තාරයක් ස්වර පුවරුවෙන් වයා පෙන්වන්න.
  එම ප්‍රස්තාරය ගයා හෝ වයා පෙන්වන්න.

7. ඇගයීම් ක්‍රමය

නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයකට ලකුණු 4 බැගින් නිර්ණායක පහට මුලු ලකුණු 20 ක් පිරිනැමේ. අවශ්‍ය වූ විටෙක ශිෂයා 20 න් ලබා ගත් ලකුණු 10 පරිමාණයට පරිවර්තනය කර විභාග දෙපාර්තමේන්තුවේ සහතික කරණය සඳහා වාර්තා කළ හැකි ය.

ඉතා හොඳයි - ලකුණු 04
හොඳයි - ලකුණු 03
දුර්වලයි - ලකුණු 01

නිර්ණායක

පෙරලා ප්‍රස්තාර කළ කොටස් වල නිවැරදි භාවය	- ලකුණු 04
ස්වර පුවරුවෙන් වාදනය කිරීම	- ලකුණු 04
ගායනය / වාදනය කර ඉදිරිපත් කිරිම	- ලකුණු 04
තෝරාගත් ශ්‍රැතියට අනුව ආරෝහණ අවරෝහණ	- ලකුණු 04
මිහිරිතාවය	- ලකුණු 04
මුළු ලකුණු	- ලකුණු 20

නිපුණතාව 10 : සංගීතයේ භෞතික විාත්මක පදනම සහ ජීව විාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංග හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි

නිපුණතා මට්ටම 10.1: නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී හා නිර්මාණයේ දී භාවිත කරයි.

ක්‍රියාකාරකම 10.1 : '' **පරිගණකය තුළින් සංගීතය උගනිමු** ''

ඉගෙනුම් ඵල :
- පරිගණකය හ බද්ධ වී ඇති සංගීත ක්‍රියාකාරකම් හඳුනා ගනියි.
- පරිගණකය තුල ඇති උපාංග නම් කරයි.
- අන්තර්ජලය තුලින් සංගීතමය තොරතුරු සපයා ගනියි.

කාලය : කාලඡේද 06 යි

ගුණාත්මක යෙදවුම්: පරිගණක, ඇමුණුමේ දැක්වෙන රූපසටහන්, පරිගණක ආශ්‍රිත ව සංගීතය නිර්මාණය කළ CD තැටි.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

10 සහ 11 ශ්‍රේණි වල දී මෙම මාතෘකාව හා සම්බන්ධව සිසුන් අධ්‍යයනය කර ඇති විෂය කරුණු නැවත වරක් පුනරීක්ෂණයට ලක් කරමින් අලුත් බවකින් අධ්‍යයනයට යොමු කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂිතය. නූතන ලෝකයේ ගෝලීයකරණය සමග සියලුම විෂයන් හා සමග පරිගණකය බද්ධ වී ඇත. දැනුම සොයා පීරා යෑමටත් '' නව දැනුම ලෝකය වෙත සම්ප්‍රේෂණය කිරීමටත් පරිගණකය අත්‍යවශ්‍ය මෙවළමක් වී හමාරය.

මීටත් අමතරව පරිගණකය සිසුන්ට ස්වයං අධ්‍යයනයට මග පෙන්වන උපකරණයක් එය ගුරුවරයාගේ භූමිකාව ද වරෙක ඉටුකරනු ලබයි. එබැවින් සංගීතය හදාරන දරුවන්ද ඊට යොමු කිරීම සහ පරිගණකාශ්‍රිත සංගීත ක්‍රියාකාරකම්වල යෙදීමට පෙළඹවීම මේ මගින් අපේක්ෂිතය.

බොහෝවිට සංගීතය විෂය උසස්පෙළ සඳහා ඉගැන්වීමට යොදා ගන්නා පාසල් සම්පත් වලින් තරමක හෝ පෝෂණය වූ පාසල් නිසා මෙම ක්‍රියාකාරකම් සඳහා පරිගණකයක් යොදා ගැනීම එතරම් අපහසු නොවනු ඇත. ඒ අතරම මේ වන විට තරුණ සිසුන් ජංගම දුරකථන හා සම්බන්ධ '' රින්ටෝන් '' සකස් කරමින් , පරිගණකය හා සම්බන්ධව සංගීත කොටස් නිර්මාණය කරමින් අවිධිමත්ව මේ සම්බන්ධව දැනුම රැස්කර ගෙන ඇත.

මෙම ක්‍රියාකාරකම හා සම්බන්ධව පරිගණකය ප්‍රායෝගික ව යොදා ගැනීමේ හැකියාව ගුරුවරයා වශයෙන් ඔබට නැත්නම්, ඒ සම්බන්ධ දැනුම ඇති ගුරුභවතෙක් හෝ සම්පත් පුද්ගලයෙක් යොදවා ගත හැකිය. ගුණාත්මක යෙදවුම් මුදලේ HOP කොටසින් අදාල මුදල් යොදවා ගත හැකිය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- ඇමුණුම අංක 01 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. පරිගණකාශ්‍රිත සංගීත නිර්මාණකරුවන් ගේ සංගීත නිර්මාණ වල ඇති ගුණාත්මක වෙනස සිසුන් සමග සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01 හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

කාලච්ඡේද 02 යි

- ක්‍රියාකාරකම අංක 02 හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

කාලච්ඡේද 02 යි

- ක්‍රියාකාරකම අංක 03 හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

කාලච්ඡේද 02යි

ඇමුණුම 01.

ප්‍රවේශය

01. පරිගණක ආශ්‍රිතව සංගීතය නිර්මාණය කළ සංගීත ඛණ්ඩ ඇතුළත් තැටියකට හෝ ශ්‍රව්‍ය පටියකට සවන් දීමට යොමු කරන්න. (ජපන් ජාතික Kitaro නම් ලෝක ප්‍රසිද්ධ සංගීතඥයා විසින් The Silk Road ආදී නම්වලින් පරිගණකයම යොදා ගනිමින් කළ සංගීත නිර්මණ රාශියක් ඇත. මීට අමතරව ශ්‍රී ලංකාවේ සංගීතඥයින් විසින් ද සත්සමුදුර තේමා වාදනය පරිගණකය පමණක් ම යොදා ගනිමින් කළ නිර්මාණ වෙළඳ පොලේ ඇත)
02. එම සංගීතයේ ඇති තත්වයත්, සාම්ප්‍රදායික සංගීත භාණ්ඩවලින් නැගෙන රාවයත් සවන් දෙමින් ඒ පිළිබඳ සාකච්ඡාවක් කරන්න.
03. මෙම ක්‍රියාකාරකම් සම්බන්ධව පරිගණකය හා එහි ඇති කොටස් පිළිබඳ මූලික දැනුම විමසීමට පහත දැක්වෙන ක්‍රියාකාරමෙහි යොදවන්න.

ක්‍රියාකාරකම 01.

01. පරිගණකයක පින්තූර සටහනක් ප්‍රදර්ශනය කර හෝ පරිගණකයක් අසලට කැඳවා එහි ඇති විවිධ කොටස් නම් කිරීමට සලස්වන්න.

02. පහත දැක්වෙන කොටස් කෙටියෙන් හඳුන්වන්න.
   a) Monitor.
   b) Key Board
   c) Mouse
   d) System Unit
   e) Speaker

03. සිස්ටම් යුනිට් කොටස ඇතුළත ඇති උපාංග හඳුනා ගැනීමට හා එවා සංගීත නිර්මාණ කාර්යයන් වලදී දායක වන අයුරු විමසන්න.
   a) Mother Board
   b) RAM
   c) Hard Disk

d) Sound Card
e) VGA Card
f) MODEM
g) TV Card

04. පරිගණකය හා සම්බන්ධ පහත දැක්වෙන මූලික කොටස් මොනවාද යි හඳුන්වන්න.
1. Hard Ware
2. Soft Ware
   a. Application Soft Ware
   b. Opreting System (OS) Software

05. පරිගණකය හා සම්බන්ධව තොරතුරු තාක්ෂණයේ දී කරනු ලබන පහත දැක්වෙන ක්‍රියාවලීන් මොනවාදැයි විස්තර කරමින් එම ක්‍රියාවලීන් ඉටු කරලීමට සහාය වන උපාංග හඳුන්වන්න.
1. Input
2. Process
3. Store
4. Out Put

06. සංගීත නිර්මාණය හා ගායන වාදන හා සම්බන්ධ පහත දැක්වෙන කරුණු හඳුන්වන්න.
1. MIDI File Format හා ඊට වැය වන Kilo Byte, Megabite ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු
2. Wave File Format හා ඊට වැය වන Kilo Byte, Megabite ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු
3. MP3 File Format හා ඊට වැය වන Kilo Byte, Megabite ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු
4. Divex File Format හා ඊට වැය වන Kilo Byte, Megabite ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු

ක්‍රියාකාරකම 02.

01. පරිගණකය භාවිතා කර සංගීත අධ්‍යාපනයේ යෙදීමට පහත දැක්වෙන කාර්යයන් නිමකරන්න.

i. Encarta , Britannica, **වැනි** Encyclopedia සපයා ගන්න. ඉන් එකක් යොදා ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකකට අදාළ කරුණු හා රූපසටහන් සොයන්න. සිසුන් ප්‍රමාණය වැඩි නම් කණ්ඩායම් 03 කට පැවරිය හැකිය.

1 සංගීත භාණ්ඩ වර්ගීකරණය
- i. String Instrument
- ii. Wind Instrument
- iii. Percussion Instrument

2 බටහිර සංගීත 'කෘති.
- i. Ballet
- ii. Symphony
- iii. Opera

3. බටහිර සංගීතඥයෝ
- i. Beethoven
- ii. Mozart
- iii. Haydon

ii. සපයා ගත් තොරතුරු ඇතුළත් කර අලංකාරවත් M S PowerPoint Presentation එකක් නිර්මාණය කරන්න.

ක්‍රියාකාරකම 03.

01. අන්තර්ජාලය තුළට පිවිස පහත දැක්වෙන මාතෘකා Search කරන්න.
- a) Indian Music
- b) Ravi Shankar
- c) Vishva Bharathi University

02. සපයාගත් තොරතුරු ලිඛිත හෝ විද්‍යුත් ක්‍රමයකට ගබඩා කරන්න.

ඇගයීම -
- පරිගණකය ආශ්‍රය කරගනිමින් උතුරු ඉන්දියානු සංගීතය හා සම්බන්ධ විෂය නිර්දේශයට අදාළ රාගධාරී සංගීත කෘති ශ්‍රවණය කරන්න.
- පරිගණකය ආශ්‍රිතව ලබාගත් නව දැනුම පිළිබඳ ඔබේ අදහස් දක්වමින් පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

නිපුණතාව 10 : සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම සහ ජීව විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංග හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 10.1: නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී හා නිර්මාණයේ දී භාවිත කරයි

ක්‍රියාකාරකම 10.1.3 :- ' විද්‍යුත් ස්වරපුවරුව අධ්‍යයනය කරමු "

ඉගෙනුම් ඵල :

- MIDI සහිත විද්‍යුත් ස්වර පුවරු හඳුනා ගනියි.

කාලය : කාලඡේද 04 යි.

ගුණාත්මක යෙදවුම්:- ඇමුණුමේ දැක්වෙන රූපසටහන්. පරිගණක ආශ්‍රිත ව සංගීතය නිර්මාණය කළ CD තැටි, සංගීත සංස්කරණය හා සම්බන්ධ මෘදුකාංග ඇතුළත් පරිගණක MIDI සහිත විද්‍යුත් ස්වර පුවරුවකි.)

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

අද බහුලව භාවිත වන MIDI සහිත විද්‍යුත් ස්වර පුවරුවක ඇති කොටස් හඳුනාගැනීමටත්, ඒ මගින් සංගීත නිර්මාණයක් කර ගැනීමටත් මඟ පෙන්වීම සඳහා යොදා ඇති ක්‍රියාකාරකමකි. මේ සම්බන්ධව 10, 11 ශ්‍රේණිවලදී අධ්‍යයනය කළ කොටස් නැවත මතකයට නංවාලමින් පාඩමට පිවිසෙන්න. මිඩි යනු සංගීත නිර්මාණය සඳහා යොදා ගැනෙන ලෝක සම්මත ක්‍රමවේදයකි. මිඩි තත්වයෙන් නිර්මාණය කළ සංගීත ඛණ්ඩයක් මිඩි යන ස්වභාවයට ගැලපෙන වෙනත් පරිගණකයකින් හෝ, වෙනත් ස්වර පුවරුවකින් හෝ, වෙනත් ප්ලේයරයකින් ප්‍රතිවාදනය කිරීමට හැකියාව ඇත. සෑම විද්‍යුත් ස්වරපුවරුවක ම මිඩි තත්වය නොමැති වීමට පුලුවන. එහෙත් තරමක් ප්‍රමාණයෙන් විශාල වූ ස්වරපුවරු වල මෙ තත්වය ඇත. (MIDI – Musical instruments Digital Interface) . මෙවැනි කොටස් පිළිබඳ හැඳින්වීමත්, සංගීත නිර්මාණයේ දී සහ ගබඩා කිරීමේ දී වැදගත් වන විවිධ කොටස් පිළිබඳ හඳුන්වා දීමත් හැකි අවස්ථාවක දී මෙවැනි ස්වරපුවරුවකින් කුඩා සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරගැනීමට හෝ තමා දන්නා ගීතයක අනුවාදනයක් කර එය ගබඩා කර තබා ගැනීමට ත් පෙළඹවීම මෙම පාඩමින් අපේක්ෂිතය.

එවැනි පහසුකම් ඇති විද්‍යුත් ස්වර පුවරුවකින් කිසියම් සංගීතමය කොටසක් නිර්මාණය කර ගැනීමටත්, එය නිවැරදිව ගබඩා කර ගැනීමටත් මෙමගින් හැකිවනු ඇත. වැඩි දියුණු කළ මෙවැනි ස්වරපුවරු පරිගණකය හා සෘජුවම සම්බන්ධ කළ හැකියි විවිධ සංගීත භාණ්ඩ වල ධ්වණිගුණය බොහෝදුරට ඊට සමානවම මෙවැනි ස්වරපුවරුවලින් නිකුත් වේ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- කියවීමේ පත්‍රිකාව හා දෘශ්‍ය උපකරණ සපයන්න. අධ්‍යයනයට සලසන්න. සිසු අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දෙන්න.

(කාලඡේද 02 යි.)

- විද්‍යුත් ස්වර පුවරුවේ විවිධ කොටස් පැහැදිලි කරන්න. නිර්මාණයක යොදවන්න. එහි සමාලෝචනයක යෙදෙන්න.

(කාලඡේද 03 යි.

ඇමුණුම 1.

සැ. යු. මෙම කියවීම් පත්‍රිකාව ඡායා පිටපත් කර සිසුනට ලබා දෙන්න.

ක්‍රියාකාරකම 1. කියවීමේ පත්‍රිකාව.

MIDI සහිත විදුත් ස්වරපුවරු වෙළඳපොලේ ජනප්‍රිය වෙළඳ නාම කිහිපයකින් නිෂ්පාදනය කර ඇත. ඒ අතරින් Corg , YAMAHA , Casio යන ඒවා වඩාත් ජනප්‍රියය. මේවා බොහෝමයක් සෘජුවම පරිගණකය හා සම්බන්ධ කර සංගීතමය කටයුතු සඳහා යොදාගත හැකිය. මෙහිදී වෙනම ම මිඩි කේබලයක් යොදා ගනිමින් ස්වරපුවරුව පරිගණකයට සම්බන්ධ කර ගැනීමට සිදුවේ. ඉතා මෑතකාලයේ වෙළඳපලට එක් වූ ස්වරපුවරු USB කෙවෙනි හරහා පරිගණකයට සම්බන්ධ කළ හැකිය.

මුල් කාලයේ මෙම ස්වරපුවරුවල ට ම වෙනම සම්බන්ධ කළ හැකි කුඩා කොටසක් ඇතුලු කර සකස් කළ සංගීත ඛණ්ඩය ගබඩා කිරීමටත්, නැවත එම කොටසම හරහා එය ප්‍රතිවාදනය කිරීමටත් හැකියාව තිබුණි. පසු කාලයේ දී මෙම පහසුකම ස්වරපුවරුවේ ම එක් පසකින් දත්ත ගබඩා කිරීමට යොදාගන්නා Floppy Diskette නම් නම්‍ය තැටි යොදා ගැනීමට හැකියාව ඇති කර තිබුණි. වාදනය කරන කොටස එම තැටිතියක් ස්වරපුවරුවටම ඇතුලු කර ගබඩා කිරීමට හෝ තැටිතියේ ගබඩා කළ කොටසක් ස්වරපුවරුව හරහා නැවත ප්‍රතිවාදනය කිරීමට හෝ හැකියාව ඇති කර තිබුණි දැන් දැන් වෙළඳ පළට එක්වන විදුත් ස්වර පුවරුවල මෙම පහසුකම U S B Pendrive නැතහොත් Data Traveler එකක් සම්බන්ධ කර ඉටුකරගත හැකිය. මෙම U S B Pendrive එකක ගිගාබයිට 1 ක පමණ ධාරිතාවක් ඇත්නම් සාමාන්‍යයෙන් ගීත 1000 ක් පමණ MIDI ක්‍රමයෙන් ගබඩා කළ හැකිය.

මෙවැනි විද්‍යුත් ස්වරපුවරුවක බොහෝවිට එකිනෙකට වෙන්වූ පථ (MIDI Tracks) 6 ක් 8ක් , 10 ක් , 12 ක් වශයෙන් පවතින ඒවා ඇත. එම ට්‍රැක්ස් වල වෙන වෙනම විවිධ සංගීත භාණ්ඩ වල හඬ ඇතුළ කර තැටිගත කළ හැකිය. පසුව ඒවා වෙන වෙනම නැවත නැවත වෙනස් කළ හැකිය. Electronic Drums හඬ කිසියම් තාලයකට අනුව වෙනමත්, Guitar , Bass , හඬ වෙනමත්, Melody , Counter , Bits වෙනමත් ඔබට අවශ්‍ය ඉලෙක්ට්‍රොනික භාණ්ඩ වලින් ගබඩා කළ හැකිය.

ඒ අනුව කිසියම් වාi ඛණ්ඩයක් ඔබගේ කැමැත්ත පරිදි පරිගණකයකින් තොරව විදුත් ස්වර පුවරුවක් පමණක් යොදා ගෙන නිර්මාණය කර ගැනීමට හැකිය. නිදසුනක් ලෙස ඔබ දන්නා ගීතයක් එහි ඇතුළත් සියලු අංග සහ සංගීත භාණ්ඩ යොදා ගනිමින් වාදනයක් ලෙස සකසා ගබඩා කරගත් පසු එය නැවත ප්‍රතිවාදනය කරමින් එ මත ඔබට අදාළ ගීතය ගායනය කළ හැකිය. එවිට සම්පූර්ණ වාදක මණ්ඩලයක් සමග ගීතයක් ඉදිරිපත් කරන සේ ඔබට දැනේවි.

මෙවැනි සංගීත නිර්මාණ සකස් කිරීමේ දී තවත් කොටසක් අලුතින් පරිගණක ලෝකය සමග එකතු වී ඇත. එය මේ අවස්ථාවේ දී ඔබට ඉදිරිපත් කරණුයේ ඒ පිළිබඳ හැකි අවස්ථාක දී අධ්‍යයනය කරන්නටය. මිඩි යන ක්‍රමවේදය තුළ නියමිත සංගීත භාණ්ඩ වල හඬ ඒ ආකාරයෙන්ම අසන්නට ලැබෙන්නේ ඉතා අඩුවෙන්ය. එහි ඇත්තේ ඉලෙක්ට්‍රොනික හඬකි. එබැවින් කිසියම් සංගීත භාණ්ඩයක ධ්වණි වර්ණය ඒ ආකාරයෙන්ම ලබා ගැනීමට පරිගණක විද්‍යාඥයින් උත්සාහ ගනිමින් පවතී. ඒ අනුව මෑතක දී තවත් අලුත් කොටසක් මේ සම්බන්ධව එකතු වී ඇත. එනම් Sound Fonts ආශ්‍රයෙන් සංගීත නිර්මාණය කිරීමය නිදසුනක් බලමු. තබ්ලාවේ විවිධ අවනද්ධාක්ෂර ,වෙන වෙනම කුඩා කොටස් වශයෙන් එම හඬින්ම Sound Fonts වශයෙන් ගබඩා කර ඇත. එම කොටස් එකිනෙක අපගේ අවශ්‍ය තාවය මත එක් කරමින්, මිශ්‍ර කරමින් තබ්ලාවේ නිකුත්වන හඬටම කිසියම් තබ්ලා වාදන කොටසක් තබ්ලාවක් භාවිත නොකර නිර්මාණය කර ගැනීමේ හැකියාව ඇත. සාමාන්‍ය මිනිසෙකුට ඉටු කළ නොහැකි අන්දමේ වාi කොටස් ද මේ අයුරින් නිර්මාණය කර ගත හැකිය. මෙවැනි කාර්යයන් කිරීමට ඊටම විශේෂ වූ මෘදුකාංග දැන් දැන් භාවිතයේ පවතී.

පහත දක්වෙනුයේ විවිධ කොටස් නම්කරන ලද විශේෂ අංග ඇතුළත් විදුත් ස්වර පුවරුවක රූප සටහනකි. එක් එක් කොටසේ සාමාන්‍ය විස්තරයක් ද ඇතුළත් වේ. එය අධ්‍යයනය කරන්න. ඔබට මෙවැනි විදුත් ස්වර පුවරුවක් සපයා ගත හැකි නම් එය උපයෝගී කරගනිමින් සංගීත කොටසක් නිර්මාණය කරන්න.

ඉදිරි පස



පිටුපස



ක්‍රියාකාරකම 2.

1. විද්‍යුත් ස්වරපුවරුවේ දක්නට ලැබෙන පහත දැක්වෙන කොටස් හෝ සංකල්ප විස්තරාත්මකව හඳුන්වන්න.

a) Power pac
b) On-Off Switch
c) Style (ගබඩා කර ඇති විවිධ තාල හෝ රිද්ම රටා)
d) Voice (වයලින්, සිතාර්, ෆ්ලූට්, ට්‍රම්පට්, ගිටාර්, පියානෝ ආදි වශයෙන් ගබඩා කර ඇති විවිධ සංගීත භාණ්ඩ වල හඬ)
e) Tempo
f) Transpose
g) Auto Accompaniment
h) Intro
i) Registration Memory
a) DEMO
b) Menu
c) RECORD
d) Start/Stop
e) MIDI in/out
f) Headphone

2. විද්‍යුත් ස්වරපුවරුවක් යොදා ගනිමින් සුදුසු තාලයකට ට්‍රැක්ස් කිහිපයකට සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරන්න.

නිපුණතාව 10 : සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම සහ ජීව විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංග හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 10.1: නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී හා නිර්මාණයේ දී භාවිත කරයි.

ක්‍රියාකාරකම 10.1.4 : ''සංගීත භාණ්ඩවල ධ්වනි ගුණය කෙරෙහි බලපාන හේතු විමසමු.''

ඉගෙනුම් ඵල :
- සංගීත භාණ්ඩවල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු හඳුනා ගනියි.

කාලය : කාලඡේද 04 යි.

ගුණාත්මක යෙදවුම්: වර්ග 4 ට අයත් සංගීත භාණ්ඩ එක බැගින්, සංගීත භාණ්ඩ වර්ගීකරණය සහ භාණ්ඩ රූප සටහන් ඇතුළත් දෘශ්‍ය උපකරණයක්, සපයා ගත හැකිනම් කොටස් ගැලවුණු වයලීනයක් හෝ සිතාරයක් වැනි භාණ්ඩයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

තන්ත්‍රීය, සුෂිර, ඝණ, අවනද්ධ යන භාණ්ඩ වර්ග හතරේ ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු සහ තෝරා ගත් භාණ්ඩ කිහිපයක ධ්වනි ගුණය එකිනෙක වෙනස් වීමට බලපාන හේතු සිසුන් සමග සාකච්ඡා කිරීමත් මෙමගින් අපේක්ෂිතය. සාර්ථකව සාකච්ඡා කිරීමෙන් තමාගේ සංගීත භාණ්ඩ නිවැරදිව පරිහරණය කිරීමට සිසුනට හැකිවනු ඇත. සුලු අලුත්වැඩියාවන් කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

- සංගීත භාණ්ඩ වර්ගීකරණය සහ රූප සටහන් දැක්වූ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න. එය අධ්‍යයනයට සලසන්න. භාණ්ඩ වර්ගය අනුව ධ්වනි ගුණය එකිනෙක වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න. සිසු අදහස් දැක්වීමට ඉඩකඩ ලබා දෙන්න.

  කාලඡේද 02 යි

- කොටස් ගැලවී ගිය භාණ්ඩය හෝ ඇතුළත කොටස් ප්‍රදර්ශනය වනසේ ගොඩනැගූ දෘශ්‍ය උපකරණ සපයා හෝ භාණ්ඩයක ධ්වනි ගුණය ඇති කරලීමට බලපාන හේතු විමසන්න.

  කාලඡේද 02 යි

ඇමුණුම 01.

ක්‍රියාකාරකම 1.

- තන්ත්‍රීය භාණ්ඩ වල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
  - වාදන ඉරියව් මොනවාද?
  - තත් කම්පනය වී නාද හටගන්නේ කෙසේ ද?
  - බෝව උපයෝගී කරගනිමින් හෝ මිස්‍රාබ් එකකින් හෝ පික් එකකින් හෝ වැයීමෙන් නිකුත්වන නාදය වෙනස් වන අයුරු.

- සුෂිර භාණ්ඩ වල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
  - වාදන ඉරියව් මොනවාද?

- ○ නාද හටගන්නේ කෙසේ ද?
- අවනද්ධ භාණ්ඩ වල ධ්වණි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
  - ○ වාදන ඉරියව් මොනවාද?
  - ○ නාද හටගන්නේ කෙසේ ද
- ඝණ භාණ්ඩ වල ධ්වණි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
  - ○ වාදන ඉරියව් මොනවාද?
  - ○ නාද හටගන්නේ කෙසේ ද?

ක්‍රියාකාරකම 2.

- පහත දැක්වෙන කරුණු භාණ්ඩයේ ගුණාත්මක බව කෙරෙහි බලපාන්නේ කෙසේද?

ක්‍රියාකාරකම 2.

- පහත දැක්වෙන කරුණු භාණ්ඩයේ ගුණාත්මක බව කෙරෙහි බලපාන්නේ කෙසේද?
- වයලීනය
  - ○ වයලීනයක බ්‍රිජ් එක උසින් වැඩිවීම.
  - ○ ගට් කොටසට ලෝහ කම්බියක් දැමීම.
  - ○ සවුන්ඩ් පෝස්ට් එක ගැලවී තිබීම හෝ නිවැරදි ස්ථානයේ ස්ථාපිත නොකිරීම.
  - ○ බෝ එකේ කෙඳි අවශ්‍ය පරිදි තද කිරීමට නොහැකි වීම.
  - ○ බෝ එකේ රොසින් හොඳහැටි ගෑවී නොතිබීම.
  - ○ බෝ වේ කෙඳි ඉතා ස්වල්පයක් පමණක් තිබීම.
  - ○ වයලීනයේ තත් සහ ඇඟිලි පුවරුව අතර වැඩි පරතරයක් තිබීම.
- සිතාරය
  - ○ සිතාරයේ ජවාරී හරිහැටි නොතිබීම.
  - ○ නායකී තත ඝණකමින් වැඩි වීම.
  - ○ ෆ්‍රේරෙට්ස් සහ නායකී තත අතර පරතරය වැඩිවීම.
  - ○ වට්ටක්කා තුම්බාව සහ ලී දණ්ඩ ෆයිබර් ග්ලාස් වලින් නිපදවීම
- තබ්ලාව
  - ○ බද්ධි ඝට්ටාවලින් ඉවත්ව තිබීම.
  - ○ ස්‍යාහි ගැලවී තිබීම.
  - ○ චාන්ටිය තැනින් තැන ඇදවී තිබීම.
  - ○ බායාවේ ගැඹුර අඩුකම
  - ○ දායාව සැකසීමට බුරුල් ලී විශේෂයක් බාවිත කර තිබීම.
  - ○ බායාවේ බද්ධි සඳහා සම් පටි නොදමා නයිලෝන් නූල් දමා තිබීම.
  - ○ බද්ධි පළළ අඩුකම.
- ගිටාරයේ ගුණාත්මක බව අඩුවීමට බලපානා කරුණු පෙළ ගසන්න. විස්තර කරන්න.
- බටනලාවේ ගුණාත්මක බව අඩුවීමට බලපාන කරුණු පෙළ ගසන්න. ඒවා එකිනෙක විස්තර කරන්න.

ඇගයීම - • ඔබ ප්‍රගුණ කරන සංගීත භාණ්ඩයේ ගුණාත්මක භාවය රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු මූලික ක්‍රියා පිළිවෙල පෙළ ගස්වන්න.

ඇගයීම් 17

1. ඇගයීම් අවස්ථාව :-
2. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:-** නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී නිර්මාණ කරණයේ දී භාවිත කරයි.
3. **ආවරණය කෙරෙන විෂය සන්ධාරය-**
   - පරිගණකය සංගීත අධ්‍යාපන මාධ්‍යයක් වශයෙන්.
   - පරිගණකය සංගීත නිර්මාණයේ මෙවළමක් ලෙස.
   - ව්‍යුත් ස්වර පුවරුව.
   - සංගීත භාණ්ඩ වල ධ් වණිගුණය කෙරෙහි බලපාන හේතු
4. **කාලය :-** කාලච්ඡේද 02
5. **උපකරණයේ ස්වභාවය :-**
   - පරිගණකාශ්‍රිත සංගීත නිර්මාණයක් හෝ Powerpoint Presentation එකක් හෝ බිත්ති පුවත් පතකට ලිපියක්.
6. **අරමුණු**
   - පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙස පිළිගනියි.
   - පරිගණකය යොදාගනිමින් සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරයි.
   - සංගීත කොටසක් පරිගණක ගත කරයි.
   - ව්‍යුත් ස්වර පුවරුවක නිර්මාණයක් කරයි.
   - සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු විමසයි.

7. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.**

   ගුරු උපදෙස්
   - පරිගණක ඇති පාසල් වල සිසුන් පරිගණකය ආශ්‍රයෙන් සංගීත කොටසක් නිර්මාණය කරවන්න.
   - ව්‍යුත් ස්වරපුවරුව යොදා ගනිමින් සංගීත කොටසක් නිර්මාණය කරවන්න.
   - සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු දැක්වීමට සාකච්ඡාවක් කරන්න.

     නැතහොත්
   - පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙස පරිගණකය හා ව්‍යුත් ස්වර පුවරුව '' යන මැයෙන් Powerpoint Presentation එකක් හෝ බිත්ති පුවත් පතකට ලිපියක් සිසුන් ලවා සකස් කරන්න.
8. **ඇගයීමේ ක්‍රමය:**

   නිර්ණායක පහක් මත තක්සේරු කළ යුතු අතර එක් නිර්ණායකයක ට ලකුණු 04 බැගින් නිර්ණායක පහට මුලු ලකුණු 20 ක් පිරිනැමේ. ලකුණු පරාසය මෙසේය.
   - ඉතා හොඳයි - ලකුණු 04.
   - හොඳයි. - ලකුණු 03.
   - දුර්වලයි - ලකුණු 02.
   - ඉතා දුර්වලයි - ලකුණු 01.

නිර්ණායක-

(1)	නිර්මාණය කළ සංගීත ඛණ්ඩයේ ගුණාත්මක බවට -	ලකුණු 04.
(2)	ව්‍යුත් ස්වරපුවරුව යොදා ගනිමින් සංගීත කොටසක් නිර්මාණය ට -	ලකුණු 04.
(03)	සංගීත භාණ්ඩ වල ධ්වණි ගුණය කෙරෙහි බලපාන හේතු දැක්වීමට සාකච්ඡාවක් කිරීම -	ලකුණු 04.
(4)	පරිගණකය සංගීත අධ්‍යාපනයේ මෙවළමක් ලෙස පරිගණකය හා ව්‍යුත් ස්වර පුවරුව '' යන මැයෙන් Powerpoint Presentation එකක් -	ලකුණු 04.
(5)	උචිත අනුචිත භාවය දැක්වීමට -	ලකුණු 04.
	මුලු ලකුණු -	ලකුණු 20

පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම-ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට පමිප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙලකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්සාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ සන්තතික ව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත

ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය:

01. පැවරුම්	02. ව්‍යාපෘති
03. සමීක්ෂණ	04. ගවේෂණ
05. නිරීක්ෂණ	06. ප්‍රදර්ශන/ ඉදිරිපත් කිරීම
07. ක්ෂේත්‍ර චාරිකා	08. කෙටි ලිඛිත පරීක්ෂණ
09. ව්‍යූහගත රචනා	10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්	12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්	14. කථනය
15. ස්ව නිර්මාණ	16. කණ්ඩායම් ක්‍රියාකාරම්
17. සංකල්ප සිතියම	18. ද්විත්ව ජර්නල
19. බිත්ති පුවත්පත්	20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්	22. විවාද
23. සාකච්ඡා මණ්ඩල	24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා	26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක්ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයටම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතුය; වග බලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි ඉගෙනුම්-ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදා ගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

ඇගයීම

ඇගයීම 1	- රාගධාරි සංගීතයට අදාළ සම්භාව්‍ය ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම	31
ඇගයීම 2	- උත්තර භාරතීය සංගීතයට අයත් රාගකිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.	44
ඇගයීම 3	- සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගීවන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍ය ප්‍රදර්ශනය කරයි.	56
ඇගයීම 4	උත්තර භාරතීය සංගීතයට අයත් රාගකිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.	73
ඇගයීම 5	සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මකව දැක්වීමට තොරතුරු රැස් කරයි.	105
ඇගයීම 6	භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගිකව අධ්‍යයනයට පෙළඹෙයි.	108
ඇගයීම 7	භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයකට පෙළඹෙයි	123
ඇගයීම 8	වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි	132
ඇගයීම 9	රාගධාරී සංගීතය ඇසුරෙන් නිර්මාණය වී ඇති ගායන වාදන විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයේ යෙදෙ යි	136
ඇගයීම 10	ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන/වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.	153
ඇගයීම 11	ශ්‍රී ලංකාවේ සංගිත ඉතිහාසය පිළිබඳව තොරතුරු ගවේෂණය කරයි.	172
ඇගයීම 12	ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.	192
ඇගයීම 13	රිද්මය තාලය සහ ලය, ස්වර, නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල නිදසුන් මගින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.	192
ඇගයීම 14	කටහඬ නිර්මාණයක දී වැදගත්වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.	200
ඇගයීම 15	නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී නිර්මාණ කරණයේ දී භාවිත කරයි	213
ඇගයීම 16	විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාර නිරූපණය කරණය	222
ඇගයීම 17	නව තාක්ෂණික උපකරණ සංගීත අධ්‍යයනයේ දී නිර්මාණ කරණයේ දී භාවිත කරයි.	242